# බුදු දහමේ අධ්‍යාත්මය

## (මූලපරියාය සූත්‍රය)



ශ්‍රී කල්‍යාණධර්ම ග්‍රන්ථකාර මණ්ඩලය

# බුදු දහමේ අධ්‍යාත්මය

## (මූලපරියාය සූත්‍රය)

# ශ්‍රී කල්‍යාණධම් ප්‍රකාශන

ශ්‍රී කල්‍යාණධම් ග්‍රන්ථකාර මණ්ඩලය විසින් පහත සඳහන් ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කරවා පළ කරනු ලැබ ඇත.

බුදු දහමේ අධ්‍යාත්මය ග්‍රන්ථමාලා — අංක 1
**කරණීය මෙත්ත සූත්‍රය**

බුදු දහමේ අධ්‍යාත්මය ග්‍රන්ථමාලා — අංක 2
**නිබ්බේධික සූත්‍රය**

බුදු දහමේ අධ්‍යාත්මය ග්‍රන්ථමාලා — අංක 3
**චූළ වේදල්ල සූත්‍රය**

බුදු දහමේ අධ්‍යාත්මය ග්‍රන්ථමාලා — අංක 4
**මහා මංගල සූත්‍රය**

බුදු දහමේ අධ්‍යාත්මය ග්‍රන්ථමාලා — අංක 5
**කල්‍යාණධම් සංග්‍රහය**

බුදු දහමේ අධ්‍යාත්මය ග්‍රන්ථමාලා — අංක 6
**චක්ක සූත්‍රය**

බුදු දහමේ අධ්‍යාත්මය ග්‍රන්ථමාලා — අංක 7
**රතන සූත්‍රය**

බුදු දහමේ අධ්‍යාත්මය ග්‍රන්ථමාලා — අංක 8
**අජිත සූත්‍රය**

බුදු දහමේ අධ්‍යාත්මය ග්‍රන්ථමාලා — අංක 9
**මහා සතිපට්ඨාන සූත්‍රය**

**Karaniyametta Sutta** — **Vol. 1**

**Maha Mangala Sutta** — **Vol. 2**

ග්‍රන්ථ මාලා අංක 10

# බුදු දහමේ අධ්‍යාත්මය

## (මූලපරියාය සූත්‍රය)

සැකසුම හා ප්‍රකාශනය

**ශ්‍රී කල්‍යාණධම් ග්‍රන්ථකාර මණ්ඩලය**

ශ්‍රීදේවී මුද්‍රණයකි

පළමු වැනි මුද්‍රණය 2002 සැප්තැම්බර්

සියලු හිමිකම් ඇවිරිණි

ISBN 955 - 8414 - 19 - 0

මුද්‍රණය

SRIDEVI

ශ්‍රීදේවි ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
නො. 27, පැපිලියාන පාර
නැදිමාල, දෙහිවල
දුරකථන : 01-716709

# පොත ගැන වචනයක්

සම්මා සම්බුදු පියාණන් වහන්සේ විසින් උක්කට්ඨා නුවරදී භික්ෂූන් අමතා දේශනාකරන ලද **මූල පරියාය සූත්‍රය** සූත්‍ර පිටකයේ මජ්ඣිම නිකායේ මූල පණ්ණාසකයෙහි මූලපරියාය වග්ගයට අයත් ශ්‍රී මුඛ දේශනාවකි. පින්වතුන් බොහෝ දෙනකුගේ භක්ති පූර්ව ආරාධනාව මත අපගේ ගුරුදේව **පූජ්‍ය කෝට්ටේ දේවානන්ද හිමිපාණන් වහන්සේ** විසින් ඉදිරිපත් කරන ලද මේ සූත්‍ර විග්‍රහය වර්ෂ 1985 පෙබරවාරි මස 14 වැනි දින සිට බ්‍රහස්පතින්දා දින දහසයකදී දේශනා කොට නිම කරන ලද්දකි. මිනිසා ඇතුළු සජීවී, අජීවී සියලු වස්තු හැදෙන හැටි සහ කැඩෙන හැටිත් දුකින් මිදීම සඳහා අවශ්‍ය දේ හදන හැටි සහ කඩන හැටිත් මෙයින් පෙන්වා දෙන බැවින් දුකින් නිදහස් වීමට උත්සාහ දරන්නාට මේ සූත්‍රයේ සඳහන් කරුණු මහත් සේ ප්‍රයෝජනවත් වේ. මෙය පොතක් වශයෙන් මහා ජනතාව අතට පත් කිරීමට **ශ්‍රී කල්‍යාණධම් ග්‍රන්ථකාර මණ්ඩලය** අදහස් කළේ එ බැවිනි.

සූත්‍රයේ මුලට ම ඇති **"අස්සුතවා පුථුජ්ජනෝ"** යන්නට දෙන ලද අර්ථ විග්‍රහය පමණක් වුව ද මේ පොතෙන් කෙනකුට ගත හැකි ප්‍රයෝජනය සපුරා ලීමට සෑහේ. මීට අමතර ව, නවීන විද්‍යාව පරමාණුව නමින් හඳුන්වන මූල ශක්තිය බුදු රජාණන් වහන්සේ හැඳින්වූයේ කවර නමකින් ද, ලෝකයේ මූලික ශක්ති ප්‍රභව ලෙස සැලකෙන තාප, විද්‍යුත්, කාන්දම් සහ රසායන උන් වහන්සේ හැඳින්වූයේ කවර නම්වලින් ද, ඒවා ලෝකයේ ක්‍රියාත්මක වෙන්නේ කිනම් න්‍යායයක් යටතේ ද, කාන්දම් නිෂ්පාදනය නො කරන විද්‍යුතයක් තිබේ ද, එහි සිද්ධාන්තය කුමක් ද, මිනිස් සිතේ ක්‍රියාකාරීත්වය කෙරෙහි පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන මහා භූත සතරේ සහ ආකාස භූතයෙහි කෘත්‍ය ස්වරූපය කුමක් ද වැනි ප්‍රශ්න රැසකට ක්‍රමානුකූල සහ විද්‍යානුකූල පිළිතුරු මේ පොතේ අන්තර්ගත වී ඇත්තේ බුද්ධ වචනය අනුසාරයෙනි. ලෝකයේ පවතින විවිධ ශක්තිවල ක්‍රියාකාරීත්වය පිළිබඳ බුදු

ඇසට පෙනුණු දර්ශනය ගැන මේ පොතෙන් කැරෙන විග්‍රහය මින් පෙර වෙනත් කිසි ම ප්‍රාඥයකු පාඨක ලෝකයට ඉදිරිපත් කර ඇති බවක් දැනගන්නට නැත. ඒ බැවින්, පොත, වැදගත් කම අතින් දරන්නේ අද්විතීය ස්ථානයකි. ප්‍රත්‍යක්‍ෂය සහ අත්දැකීම තුළින් මිස දැනීම හෝ උගත්කම තුළින් සත්‍යය නො පෙනෙන බව මේ කෘතියෙන් ඉස්මතු කොට දැක්වෙන තවත් වැදගත් කරුණකි.

සිය වටිනා කාලය සහ ශ්‍රමය වැය කොට, පටිගත දේශනාවට අනුව, පිටපත සපයන ලද්දේ එම්. එච්. ඩයස් මහතා විසිනි. ගුරු දේවයාණන් වහන්සේගේ භාෂා ශෛලිය සහ වාග් ව්‍යවහාරය ආරක්‍ෂා වෙන අයුරු පිටපත ශුද්ධ කොට, පොතකට සුදුසු පරිදි ගළපා සංස්කරණය කිරීමෙන් සහ සෝදුපත් බැලීමෙන් ද දේසනා පාළිය ගොනුකර දීමෙන් ද පී. සමරවීර සිරිවඩීන මහතා මහත් කැප වීමකින් යුතු ව සහාය විය. ගරු භාණ්ඩාගාරික කේ. එම්. ආරියරත්න මහතා මුද්‍රණ කටයුතු ගැන සොයා බලා, මුද්‍රණාලය සමග නිතර සාකච්ඡා කොට, කලට වේලාවට මුදල් ගෙවීමෙන් සහාය විය. මේ හැම කරුණකදී ම ශ්‍රී කල්‍යාණ ධර්ම පෙරමුණේ ගරු අනුශාසක **පූජ්‍ය මිරිහානේ නන්ද මහා ස්ථවිර පාදයන් වහන්සේගෙන්** ලැබුණු සහාය අනල්ප ය. අපට අවශ්‍ය කෙරෙන පරිදි මුද්‍රණ කටයුතු හොඳින් සිදු කර දීමෙන් දෙහිවල, නැදිමාලේ **ශ්‍රීදේවී මුද්‍රණාලයේ අධිපති මහේන්ද්‍ර සේනානායක මහතා ඇතුළු කාර්ය මණ්ඩලය** ඉටු කළ මෙහෙය අගනේ ය. ලෝකයට යහපතක් සිදුවෙන වැඩකට සහාය වීම මහත් පිනකි. එ බැවින්, මේ හැම, තමන් කළ පිනේ ශක්තිය නො අඩු ව ලබත්වා!

එක් පාඨකයකු හෝ මේ පොත කියවීමෙන් සිතේ සැනසීම උදා කර ගනිතොත් එය ම පොත පළ කිරීමේ උත්කෘෂ්ට ඵලය ලෙස අපි සලකමු. සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා!

**ශ්‍රී කල්‍යාණධර්ම ග්‍රන්ථකාර මණ්ඩලය**

ශ්‍රී කල්‍යාණධර්ම ආශ්‍රමය,
417, බෞද්ධාලෝක මාවත,
කොළඹ - 07
වර්ෂ 2002 සැප්තැම්බර් මස 04 වැනි දින

## (දේසනා පාළිය)

# මූලපරියාය සුත්තං

1. එවං මෙ සුතං එකං සමයං භගවා උක්කට්ඨායං විහරති සුභගවනෙ සාලරාජමූලෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච;

2. සබ්බධම්ම මූලපරියායං වො භික්ඛවේ දෙසෙස්සාමි. තං සුණාථ. සාධුකං මනසිකරොථ. භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච.

3. ඉධ භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී, අරියධම්මස්ස අකොවිදො, අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී, සප්පුරිසධම්මස්ස අකොවිදො, සප්පුරිසධම්මෙ අවිනීතො පඨවිං පඨවිතො සඤ්ජනාති. පඨවිං පඨවිතො සඤ්ඤත්වා පඨවිං මඤ්ඤති. පඨවියා මඤ්ඤති. පඨවිතො මඤ්ඤති. පඨවිං මෙති මඤ්ඤති. පඨවිං අභිනන්දති. තං කිස්ස හේතු? අපරිඤ්ඤාතං තස්සාති වදාමිං.

4. ආපං ආපතො - පෙ - ආපං මඤ්ඤති. ආපස්මිං මඤ්ඤති - පෙ- ආපං අභිනන්දති -පෙ- වදාමි.

5. තෙජං තෙජතො -පෙ- තෙජස්මිං -පෙ- තෙජං අභිනන්දති - පෙ- වදාමි.

6. වායං වායතො -පෙ- වායස්මිං -පෙ- වායං අභිනන්දති - පෙ- වදාමි.

7. භූතෙ භූතතො -පෙ- භූතෙසු -භූතෙ අභිනන්දති -පෙ- වදාමි.

8. දෙවෙ දෙවතො -පෙ- දෙවෙ-මඤ්ඤති -පෙ- දෙවෙ අභිනන්දති -පෙ- වදාමි.

9. පජාපතිං පජාපතිතො -පෙ- පජාපතිං මඤ්ඤති පජාපතිස්මිං -පෙ - පජාපතිං අභිනන්දති -පෙ- වදාමි.

10. බ්‍රහ්මං බ්‍රහ්මතො -පෙ- බ්‍රහමනි -පෙ- බ්‍රහමං අභිනන්දති -පෙ- වදාමි.

11. ආභස්සරෙ ආභස්සරතො -පෙ- ආභස්සරෙසු මඤ්ඤති -පෙ- ආභස්සරෙ අභිනන්දති -පෙ- වදාමි.

12. සුභකිණ්ණෙ සුභකිණ්ණතො -පෙ- සුබකිණ්ණෙ අභිනන්දති -පෙ- වදාමි.

13. වෙහප්ඵලෙ වෙහප්ඵලතො -පෙ- වදාමි.

14. අභිභුං අභිභුතො -පෙ- අභිභුස්මිං -පෙ- අභිභුං අභිනන්දති -පෙ- වදාමි.

15. ආකාසානඤ්චායතං ආකාසනඤ්චායතනතො -පෙ- ආකාසානඤ්චායතනස්මිං -පෙ- වදාමි.

16. විඤ්ඤාණඤ්චායතනං විඤ්ඤානඤ්චායතනතො -පෙ- වදාමි.

17. ආකිඤ්චඤ්ඤායතනං ආකිඤ්චඤ්ඤායතනතො සඤ්ජානාති -පෙ- වදාමි.

18. නෙවසඤ්ඤා නාසඤ්ඤායතනං නෙවසඤ්ඤා නාසඤ්ඤායතනතො සඤ්ජානාති -පෙ- වදාමි.

19. දිට්ඨං දිට්ඨතො සඤ්ජානාති -පෙ- වදාමි.

20. සුතං සුතතො සඤ්ජානාති -පෙ- වදාමි.

21. මුතං මුතතො සඤ්ජානාති -පෙ- වදාමි.

22. විඤ්ඤාතං විඤ්ඤාතතො සඤ්ජානාති -පෙ- වදාමි.

23. එකත්තං එකත්තතො සඤ්ජානාති -පෙ- වදාමි.

24. නානත්තං නානත්තතො සඤ්ජානාති -පෙ- වදාමි.

25. සබ්බං සබ්බතො සඤ්ජානාති -පෙ- වදාමි.

26. නිබ්බානං නිබ්බානතො සඤ්ජානාති -පෙ- වදාමි.

27. යො පි සො භික්ඛවෙ භික්ඛු සෙඛො අප්පත්තමානසො අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානො විහරති, සොපි පඨවිං පඨවිතො

අභිජානාති. පථවිං පථවිතො අභිඤ්ඤාවො පථවිං මාමඤ්ඤි. පථවියං මාමඤ්ඤි. පථවිතො මාමඤ්ඤි. පථවිං මෙති මාමඤ්ඤි. පථවිං මාභිනන්දි. තං කිස්ස හේතු? පරිඤ්ඤෙය්‍යං තස්සාති වදාමි.

28. ආපං -පෙ-, තෙජං -පෙ-, වායං -පෙ-, භූතෙ -පෙ-, දෙවෙ -පෙ-, සුභකිණ්ණෙ -පෙ-, වෙහප්ඵලෙ -පෙ-, අභිභුං -පෙ-, ආකාසානඤ්චායතනං -පෙ-, විඤ්ඤාණඤ්චායතනං -පෙ-, ආකිඤ්චඤ්ඤායතනං -පෙ-, නෙවසඤ්ඤානාසඤ්ඤායතනං - පෙ- දිට්ඨං - පෙ - මුතං - පෙ - සුතං -පෙ- විඤ්ඤාතං - පෙ-, එකත්තං -පෙ-, නානත්තං -පෙ-, සබ්බං -පෙ-, නිබ්බානං නිබ්බානතො අබිජානාති. නිබ්බනං නිබ්බානතො අභිඤ්ඤාවා නිබ්බානං මාමඤ්ඤි. නිබ්බානතො මාමඤ්ඤි. නිබ්බානං මෙති මාමඤ්ඤි. නිබ්බානං මාභිනන්දි. තං කිස්ස හෙතු? පරිඤ්ඤෙය්‍යං තස්සාති වදාමි.

29. යො පි සො භික්ඛවෙ භික්ඛු අරහං ඛිණාසවො වුසිත වා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්ත සදත්ථො පරික්ඛීණ සභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො, සොපි පථවිං පථවිතො අභිජානාති. පථවිං පථවිතො අභිඤ්ඤාය පථවිං න මඤ්ඤති. පථවියා නමඤ්ඤති. පථවිතො නමඤ්ඤති. පථවිං මෙති නමඤ්ඤති. පථවිං නාභිනන්දති. තං කිස්ස හේතු? පරිඤ්ඤාතං තස්සාති වදාමි.

30. ආපං - පෙ- තෙජං පෙ - නිබ්බානං -පෙ- පරිඤ්ඤාතං තස්සාති වදාමි.

31. යො පි සො භික්ඛවෙ භික්ඛු අරහං ඛීණාසවො -පෙ- තං කිස්ස හොතු? ඛයා රාගස්ස වීතරාගත්තා.

32. යොපි සො -පෙ- ආපං -පෙ- තෙජං -පෙ- නිබ්බානං -පෙ- ඛයා රාගස්ස වීතරාගත්තා.

33. යොපි සො -පෙ- සම්මදඤ්ඤා විමුත්තො, සො පි පථවිං පථවිතො අභිජානාති - පථවිං -පෙ- තං කිස්ස හේතු? ඛයා දොසස්ස වීතදොසත්තා.

34. යොපි සො -පෙ- ආපං -පෙ- තෙජං -පෙ- නිබ්බානං -පෙ- නිබ්බානං නාභිනන්දති. තං කිස්ස හේතු? ඛයා දොසස්ස වීත දොසත්තා.

35. යොපි සො -පෙ- පඨවිං පඨවිතො අභිජානාති. -පෙ- පඨවිං නාභිනන්දති. තං කිස්ස හෙතු? ඛයා මොහස්ස වීතමොහත්තා.

36. යොපි සො -පෙ- නිබ්බානං -පෙ- නිබ්බානං නාභිනන්දති. තං කිසස හේතු? ඛයා මොහසස වීතමොහත්තා.

37. තථාගතොපි භික්ඛවෙ අරහං සම්මාසම්බුද්ධො පඨවිං පඨවිතො අභිජානාති -පෙ- පඨවිං නාභිනන්දති. තං කිස්ස හෙතු? පරිඤ්ඤාතං තං තථාගතස්සාති වදාමි.

38. ආපං -පෙ- තෙජං -පෙ- නිබ්බානං -පෙ- තං කිස්ස හෙතු? පරිඤ්ඤාතං තං තථාගතස්සාති වදාමි.

39. තථාගතොපි -පෙ- නාභිනන්දති. තං කිසස හෙතු? නන්දි දුක්ඛස්ස මූලන්ති ඉති විදිත්වා, භවා ජාති, භූතස්ස ජරාමරණන්ති. තසමාතිහ භික්ඛවෙ තථගතො සබ්බසො තණ්හානං ඛයා විරාගා නිරොධා චාගා පටිනිස්සග්ගා අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධො'ති වදාමි.

40. ආපං -පෙ- තෙජං -පෙ- නිබ්බානං -පෙ- අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධොති වදාමීති. ඉදමවොච භගවා න තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

**(මූලපරියායසුත්තං නිට්ඨිතං)**

# මූලපරියාය සූත්‍රය

# 01

සෑම ධර්මයක ම, සෑම දෙයක ම මුල් පිළිවෙල තේරුම් කරන්ට යි බුදුහාමුදුරුවෝ මේ සූත්‍රය දේශනා කළේ.

මේ දේශනාව කරන්ට හේතු වූ නිදාන කතාව මෙසේ ය:

මේ ශාසනයේ පැවිදි වෙලා සිටියා නොයෙකුත් තාලයේ පුද්ගලයෝ. ශ්‍රද්ධාවෙන් පැවිදි වූ අයත් හිටියා. එදිරිවාදිකම් පිරිමහන්නට මහණ වූ අයත් හිටියා. ධර්ම දේශනාවල කරුණු බොරුකරන්ට ඕන කම නිසා පැවිදි වූ අයත් හිටියා. ජීවක වෙද මහත්තයා ජේතවනාරාමයේ සඟ පිරිසට බේත් කරන නිසා ලෙඩ සනීප කරගන්ඩ මහණ වූ අයත් හිටියා. ඔය අතර හිටියා මහා මාන්නක්කාර බමුණු පිරිසකුත්. ඒ අයගේ හැඟීම වී තිබුණේ බුදු හාමුදුරුවන්ගේ දේශනාවට කොහොම හරි නිගරු කරලා, ඒක එ තරම් දෙයක් නො වෙයි කියලා ඔප්පු කරන්න. ඒ පිරිස නිතර ම සංසයා සමඟ කතා කරනවා. ඔය දේශනාවල කරුණු අපි කලිනුත් අහලා තියෙනවා, ඒවා අපි දන්නවා, ඒක යි අපි මේවාට උනන්දුවක් නැත්තේ කියලා නිකම් පාච්චල් කරලා කතා කළා. බුදු හාමුදුරුවන්ට වුවමනා වුණේ මේ අය රහත් කරන්ඩ නො වෙයි. මේ ඉන්න අයගේ මාන්න සහගත සිතුවිලි සහ හැඟීම් නැති කරන්ට උදව්වක් කරන්න යි. ඒක යි අදහස.

සසරෙ යන පුද්ගලයා එක එක තැන හැප්පි-හැප්පී තමා ළඟ දුක් විඳීමට තිබෙන හේතු මොන මොන ආකාරයෙන් හරි කඩා ගන්නා තුරු එයාට සැනසිල්ලක් ලබන්ට බැහැ. කොහේ කොහේ හරි හැප්පිලා මොන මොන දේ එක්ක හෝ සිත සම්බන්ධ කරලා ඒකෙන් උදව් අරගෙන හැදිච්ච තරමට එයාට සැනසිල්ල ලබන්ට පුළුවනි. බුදු වරයෙක් ලොව පහළ වූ සමයක උපත්

පුද්ගලයන් උන්වහන්සේ හමුවේ සිටි නිසා ඒ අයට උදවු වීමට උන්වහන්සේ ඉදිරිපත් වුණා.

එක දවසක් මේ පන්සියයක් දෙනා වහන්සේට උක්කට්ඨා නුවරදී බුදු රජාණන් වහන්සේ මේ දේශනාව කරලා තිබෙන්නේ. බුදු රජාණන් වහන්සේ භික්ෂූන්ට කතා කරලා **"සබ්බධම්ම මූල පරියායං වො භික්ඛවෙ දෙසෙස්සාමි"** යනුවෙනුයි දේශනාව කරලා තිබෙන්නේ. සියලු ධර්මයන්ගේ මුල් පිළිවෙල දේශනා කරනවා, හොඳින් අහ ගන්ට කියල යි දේශනා කළේ. ඉන් පසු ව අහනවා එම ශ්‍රාවකයින්ගෙන් දේශනාව තේරුණා ද කියලා. අපට නම් මේ දේශනාව මෙලෝ දෙයක් තේරුණේ නැහැ කියලා පැවසුවා. යම් දෙයක් වැටහෙන ප්‍රමාණයෙන් සියල්ල වැටහෙනවා කියලා හිතන්ට එපා. ඒක වැරදි යි. කො පමණ අපට නො වැටහෙන දේ තියෙනව ද? ඒ අවබෝධය විතර යි ඒ ඇත්තන්ට දුන්නේ. ඒ අය ටිකක් නුවණක් ඇති පුද්ගලයන් වුණත් ඒ අයගේ සිතීමේ ශක්තිය දුර්වල නිසා ඒ අයට වටහා ගන්ට බැරි වුණාට බොහොම නුවණින් කල්පනා කරලා ඒ කාරණයට බැස ගත්ත පුද්ගලයාට **සබ්බ ධම්ම මූල පරියාය** - සියලු ධර්මයන්ගේ මුල් පිළිවෙල කී විට හොඳාකාර තේරුණා.

යම්කිසි කෙනෙක් කියනවා නම් ලෝකයේ ආරම්භය බුදු හාමුදුරුවෝ දේශනා කළේ නැහැ කියලා ඒක වැරදි යි. උන් වහන්සේ වදාරලා තිබෙන්නේ සංසාරේ කෙළවර පෙනෙන්නෙ නැහැ කියල යි. පෙනෙන්නේ නැහැ කීවේ කෙළවරක් නැති කමට නො වෙයි. ඒක බලන්ට - උන් වහන්සේගේ ඥාන පථයෙන් බලන්ට - කල් නැහැ. කල් නැහැ කියන්නේ එක පුද්ගලයෙකුගේ උත්පත්තිය, ආරම්භය කො තැන ද කියලා බලන්ට එයාගේ ජීවිතයෙන් පන්න - පන්නා පස්සට යන්ට ඕන. එක පුද්ගලයෙක් සංසාරේ එක ගමනක එයාට ඇති වූ අයිතිවාසිකම් බලන්ට අවුරුදු කෝටි ගණනක් යනවා. ඒවා හොයන්ට කාලෙකුත් නැහැ. එහෙම එකක් සෙවීමෙන් ඇති වැඩකුත් නැහැ. එක් කෙනෙක් අල්ලා ගෙන එයාගේ දුර්වලකම් හොයලා හොයලා අන්තිමේදී බුදු හාමුදුරුවෝ පිරිනිවන් පාලා හමාර වෙයි. ලෝකෙට කරන්ට තිබෙන දේ කරන්ට හම්බවෙන්නේ නැහැ. අර විදියේ සෙවීම නිකම් තේරුමක් නැති වැඩක්. අන්න ඒක නිසා බුදු හාමුදුරුවෝ ඒක හොයන්ට ගියේ නැහැ.

උන් වහන්සේ ලෝකයේ යමක් නිර්මාණය වෙන හැටි කී විට මේ ලෝකය ඇති වෙන්නේ මේ න්‍යාය යටතේ යි කියා සහ මේ න්‍යාය යටතෙ යි නැති වෙන්නෙත් කියලා ඕනෑ ම කෙනෙකුට හිතාගන්ට පුළුවනි. ඒ නිසා කාට කාටත් හිතා ගන්ට ඉඩ දුන්නා මිස උන් වහන්සේ මේකම යි කියලා කියන්ට ගියේ නැහැ. හිතන්ඩ පුළුවන් ඉඩකඩ සලසලා දුන්නා. යමෙකුට හිතන්ඩ පුළුවන් නම් එයාගේ අවබෝධය හිස් කර නො ගෙන ඉන්ට පුළුවනි. එයා දන්නවා ඒක වෙන්නෙ මෙහෙම යි කියලා හිතන්ඩ.

සියලු ධර්මයන්ගේ කීවාම මේ "ධර්ම" යන වචනයෙන් පෙන්වන්නේ යමක ගැබ් වෙලා අඩංගු වී තියෙනව යි කියන එක නො වෙයි. ඒවා එක් වීම නිසා යමක පැවැත්මක් රඳවනවා. රඳවන්නේ ඒ ඒ කොටස් විසිනුයි. ඒ රඳවන කොටස් සියල්ල ධර්ම යි. ඒ කොටස් විසින් දරන්නා වූ දේ තමයි තනි වස්තුවක් වශයෙන් අපි ගන්නේ. ඒක දරාගෙන සිටින්නේ ඒකත් සමඟ මිශ්‍ර වී ඇති අර ධර්ම වශයෙන් කියන ඒ කොටස් ටික යි. දැන් අපි ඒකට සාක්ෂියක් වශයෙන් ලී කැල්ලක් ගනිතොත් ලී කැල්ල යන ස්වභාවය රඳවා සිටින ශක්ති කොටස් එතනින් අයින් වුණු හැටියේ "ලී කැල්ල" යන සම්මතය අයින් වෙනවා. ලී කැල්ලට තිබෙනවා තද ගතිය. යම්කිසි වර්ණයක්, එක්තරා බර ගතියක්, සැහැල්ලු ගතියක් තිබෙනවා. එසේ ම, විකන විට යම්කිසි රසක් ද තියෙනවා. ඒකෙන් ලබා දෙන ගුණයක් හෝ අගුණයක් හෝ මොකක් හරි තියෙනවා. මේවා සියල්ල ම එකතු වූ තැන ඒ එකතුවීමෙන් ඇති වූ එකට කියනවා ලී කැල්ල කියලා. ලී කැල්ලේ තද ගතිය, වර්ණය සහ ඒකේ අඩංගු වෙලා තිබෙන සියල්ල අස් කළ හොත් ලී කැල්ල කියලා එකක් නැහැ. මේ බුදු දහමෙන් මිනිසාට අවබෝධ කරවන්ට උන් වහන්සේ උත්සාහ ගන්නේ පරමාර්ථය යි. ඒකට යි මේවා අවුස්සා පෙන්වන්නේ. ඒවා ලෝකයේ තියෙන දේවල්. හැදුණු හැටි අපට වුවමනාවක් නැහැ. අපට ඕන අපේ ප්‍රශ්නය නිරවුල් කරගන්ට යි. ප්‍රශ්නය නිරවුල් කර ගැනීමට වුවමනා කරන උත්තර යි අර බාහිර දේවලින් උපුටා අරගෙන ඉදිරිපත් කළේ.

ලී කැල්ල පිළිබඳ නිගමනය ගත්තා නම්, ලී කැල්ල යන සම්මතය දරා සිටියේ යම් දෙයක් නම්, ඒවාට කියනවා ධර්ම කියලා. දරන ධර්මවල නොහොත් දරා සිටින දේවල ස්වභාවයක්

සකස් වුණේ කොහොම ද කියලා බලන විට ධර්මය යි කියලා කියන්ට දෙයකුත් නැති වෙනවා. කියන්ට බැරි වෙනවා. ඇයි? ඒකත් යම්කිසි ශක්තියකිනුයි අර බලපෑම ඇති කරන්නේ. ඒ ධර්ම විග්‍රහ කරන්ටත් අර ලී කෑල්ල විග්‍රහ කරපු හැටියට විග්‍රහ කරන්ට වෙනවා. ශක්තියක් හැදුණු දෙයක්. ඒක හදපු දේ ගැන කියන කොටත් ඒක හැදුණේ නැත්නම් ලෝකයේ දෙයක් හෝ ලෝකයක් නැහැ නේ ද කියන එක යි එ තැනදී උන් වහන්සේ ඔප්පු කරන්නේ. ඒකෙන් ඔප්පු වෙන්නේ කුමක් ද? මේ බෞද්ධයන්ගේ පරමාර්ථය වෙන නිවීම කියන්නේ කුමක් ද? ඕනෑ ම දෙයක පැවැත්ම රඳවා ගන්නා ශක්තිය යි රත්වීම. තාපය මුල්වෙල යි සියලු නිර්මාණ ලෝකයේ ඇති වෙන්නේ. නිර්මාණය කිරීමට, ගොනු කරගන්න - බඳවා ගන්න - ඒක ඒ විදියට පවත්වන්න - ඒ සියල්ල ම අයිති අර කී තාපයට. ඒ තාප ශක්තිය උපකාර වෙල යි යම්කිසි ධර්මයක පැවැත්ම රඳවන්නේ. ධර්මයන් එකතු වීමේදී නැත්නම් ඒ ධර්ම කියන ස්වරූප එක්කාසු වීමේදී කෙරෙන්නේ මොකක් ද? යම්කිසි තාප ප්‍රමාණයක් ඒ ක්‍රියා මාර්ගයෙන් ගොනු කර තබා ගැනීම යි කෙරෙන්නේ. ඒ ගොනු වීම් යටතේ විවිධ ආකාරවල නිර්මාණ ලෝකයේ ඇති වෙනවා. පාට වර්ග තිබෙනවා. ශබ්ද වර්ග තිබෙනවා, නොයෙක් වර්ග තිබෙනවා. මේ සියල්ලේ ම මුල ඒවා දරා සිටින ශක්තිය සතු යි. ඒ ශක්තිය සෑදීම සඳහා මුලින් ම බුදු හාමුදුරුවෝ පෙන්වා වදාළේ රූප කලාප. රූප කලාප කීවේ නිතර වෙනස් වෙන පොදිය.

ධාතු, ධර්ම කියා දෙකක් තිබෙනවා. ධාතු කියන්නේ යම්කිසි ධර්මයක් රඳවන ආකාරය යි. රැඳෙන දෙයට කියන්නේ ධර්ම කියල යි. රඳවන ආකාරයක් තිබෙනවා. ක්‍රමයක් තිබෙනවා. ඒකට කියන්නේ ධාතු කියල යි. ධර්ම රඳවන්ට කිසියම් ක්‍රියා මාර්ගයක්, යම්කිසි ක්‍රමයක් සිද්ධ වෙනවා නම් ඒ සිද්ධිය තුළ ධර්ම කියන එක සකස් වෙනවා. මේ ධර්ම රඳවන නිසා මේක ධාතු කොටස නමින් හැඳින්වුවා. ස්වාක්ඛාත නිසා බුද්ධ දේශනාවේ කොතනක වත් අඩුවක් නැහැ. තවත් කෙනෙකුට මේකේ නිර්වචන කියන්ට කිසි දෙයක් නැහැ.

ධර්මයක් හැදීමේදී අපට ගන්ට වෙනවා **අග්ගඤ්ඤ සූත්‍රයේ** එන යම්කිසි අදහසකුත්. මේ ලෝකයේ දේවල් කැඩිලා, බිඳිලා,

නැතිවෙලා ගිහින් අවසානයේ ලෝකයේ කිසිවක් නැතිවෙන තත්ත්වයක් එනව යි කියලා බුදු හාමුදුරුවෝ වදාළා. ඒ යමක් නැතිවෙන තත්ත්වය යි. ඊළඟට යමක් හැදෙන තත්ත්වය යි. කිසිවක් නැතැ යි කීවේ මොක ද? අර කීවා වූ ධාතුත් ධර්මත් නැහැ. ඒවා තිබෙනවා නම් යමක් හැදෙනවා. ඒක නැති වුණා කීවේ, ශූන්‍ය වුණා කීවේ, ඕක යි. සම්පූර්ණයෙන් මොකුත් නැති වෙලා තිබී යමක් හැදෙන අවස්ථාව යි ලෝකයේ අරම්භය වශයෙන් සලකන්ට පුළුවන් වෙන්නේ. මේ ලෝකය අහවල් දවසේ ඉඳලා හැදුණ යි කියන්ට මේ ලෝකයේ කෙනෙක් උපදින්නෙ නැහැ. බුදු වරයෙක් උපන්නා නම් කවදා හරි ඒ පැත්ත කපලා දාල යි ඉතිරි හරිය කරන්නේ. හේතුව කවදත් දේවල් හැදුණා, තිබුණා, කැඩුණා. උත්පාද, ථිති, භංග කියන මේ නීතිය කොයි දේටත් බලපෑවා. මේ සත්වයා ඔහුගේ අර පරිණාම ශක්තියෙන් යම්කිසි දවසක පරිනිබ්බාණ ධාතුවෙන් අවසන් වුණාට ඒ වගෙ තවත් සත්වයෝ හැදිලා අවසන් වෙලා නිවන් දැක - දැක ලෝකය හැදි - හැදී යනවා ඇති. ඒක නවතින්නේ නැහැ. ඒකෙන් පේනවා මේ ලෝකය තුළ හැදුණු එක්තරා ශක්තියකුයි මේ අපි සත්වයා කියලා ගත්තේ. එහෙම නැතුව, යම් කිසි ආනුභාවයකින් හැදුණා නො වෙයි. ලෝකයේ තිබෙන ධාතු, ධර්ම යන වර්ග දෙකේ තිබෙන හපන් කම් විදහා පෑමකුයි ඒ ඒ වස්තු නිර්මාණය වීම.

යම් යම් වස්තු ලෝකය තුළ ඒකට යෙදෙන හැටියට නිර්මාණය වෙනවා. දැන් මුහුද උදාහරණයකට ගත්තොත් එහි නා නා වර්ගයේ ගල්මල් තිබෙනවා. මුහුද තියෙන්නේ ගල්මල් හදන්ට නො වෙයි. ගල්මල් හදන එකක් වශයෙන් මුහුද වෙන් වෙලා ඇත්තේත් නැහැ. මුහුදේ තියෙන ඒ ලුණු වර්ග සහ රසායනයනික වර්ග එක එක තැන්වල එකතු වෙලා ඒවා අස්සෙන් වතුර ඇතුල් වෙලා ඔය ගල්මල් රටාවල් ඇති වුණා. මේවා මුහුදේ තිබුණු ස්වභාවය නිසා හැදුණු දේවල්. නැතුව මුහුදේ ගල්මල් හැදෙන්ට ම ඕනැ යිකියලා කියන්ට බැහැ. නැහැදි තියෙනවම යි කියල කියන්ටත් බැහැ. ඒ ශක්තිය තුළින් නා නා ප්‍රකාරවල හැඩ ඇති ඒවා හැදෙනවා. ඒ අනුව, ජීවිතය පිළිබඳ තතු යථාර්ථයෙන් තේරුම් ගන්ට පුළුවනි. මේ ලෝකයේ ශක්ති තුළින් හැදුණු තවත් ශක්තියක පැවැත්මක් එක එක දේ තුළ තියෙනවා. හැම එකක ම පරම්පරාවක් තියෙනවා. මුලින් හැදුණු දේ තුළින් පැවැත්ම ගෙන

යන දේවල් නිර්මාණය වෙනවා. ඒවායින් ඒ පරපුර ගෙනයනවා. ඒවා කො පමණ කලක් තිස්සේ කෙරුණා ද කීවොත් දැන් මිනිස් පරපුර, කොටි පරපුර ආදි සත්ව පරපුරවල් තිබෙනවා. මේ පරපුරවල මුල කාට ද අයිති කීවොත් මේ ලෝකයේ ක්‍රියාත්මක වූ ක්‍රියා ශක්තියකට, හැඩයකට අයිති යි. ඒ ක්‍රමයට අයිති ඒ විදියට ක්‍රියාකළ නිසා යි. මේ අනිකුත් සියලු ම වස්තු ඒ ආකාරයෙන් හැදුණා. සත්වයා කියන මේ ජීව ශක්තිය හැදුණෙත් එහෙම යි. එ සේ නැති ව නිර්මාණය කළ කෙනෙක් නැහැ. සමහර ලෝක තියෙනවා. ඒවායේ සත්වයෝ නැහැ. ජීවීන් නැහැ. මේ ලෝකයේ ඔය සියල්ල ම තිබෙනවා. දැන් මේ විස්තරයෙන් වැටහෙනවා මේ ජීවිතය ගැන මෙහෙම විය යුතු යි, මෙහෙම අයිතිවාසිකම් තිබිය යුතු යි, කියලා හිතන්ට, තීරණය කරන්ට, අපට අවසරයක් - හිමි කමක් නැති බව. මෙහෙම වෙන්ට ඕනෑ යි කියල හිතුවට එහෙම සිදු වුණා ද? නැහැ. ඉතින් මොනව කරන්ට ද කියල හිතනවා. ඒ හිතන්නේ අර බණ පදය යි.

අපට කරන්ට දෙයක් ඕන නැහැ. කෙරෙන එක පිළිගන්ට යි ඕන. එක එක වර්ණ අපි හැදුව ද? නැහැ. ඒවා ලැබුණු හැටියට අපි පිළිගත්තා. ලැබුණු එක දැන් පිළිඅරන් ඉන්න අතර ඊට පස්සේ අපි ඒක ඇතුළේ ඉඳගෙන ඕන දේවල් හොයනවා. ලැබුණු දෙය ඒ ආකාරයෙන් පිළිගත්තා නම් ඒ මැදදී වෙනත් නීතියක්, වෙනත් පාලනයක් දාන්ට බැහැ. එක එක අයිතිවාසිකම් ඒ ඒ පුද්ගලයින්ට තිබෙනවා. ඒ ඒ ලැබුණු දේවල් පිළිඅරගෙන ඊට පසුව එහෙම බෑ, මෙහෙම ඕන යනුවෙන් පාලනයක් යටතේ නීති හදාගෙන ක්‍රියා කරන්ට යනවා. ඒක එ සේ ඉටු නො වීමෙන් දුක් ගොඩක් මැද ජීවත් වෙන්ට සිදු වෙනවා. ලැබුණු දෙය පිළිගන්නේ නැති ව, අපට ඕන විදියට හදන්ට යන එක යි අපේ අවනීතිය, අපේ නුසුදුසුකම. ඒ ඒ හමු වූ දේ පිළිගත්තා නම්, ඒ න්‍යායයෙන් ම අපි අද ලෝකයේ පවතිනවා නම් අපට පීඩනයක් නැහැ. මේ මැදදී යම්කිසි දෙයක් අයිති කරගෙන ඒකට ඕනෑ ක්‍රමයට අරවා කරන්ට යන නිසා, අපට පීඩන ගොඩක් එක්ක පොර අල්ලමින් අවසන් හුස්ම හෙළන්ට වෙනවා. එ තැනදී ඒක පොරයක්. මෙ තැනදී මැරෙන්නට හදනවා. මිනිහා නො මැරී ඉන්ට හදනවා. ඒ ක්‍රමය යටතේ බුදු හාමුදුරුවෝ දේශනාවන් ඉදිරිපත් කරලා තිබෙන්නේ සිතිය යුතු පිළිවෙලට සිතලා, නීති

විරෝධී ව සිතන්නේ නැති ව, ඉන්න ටික වත් හොඳින් හිටපල්ලා කියන එක උගන්වන්ට යි. ජීවිතයෙන් යම්කිසි සැනසිල්ලක් ලබන ක්‍රමය උන් වහන්සේ පෙන්නුවා.

බුදු හාමුදුරුවෝ මේ දේශනාව ආරම්භයේදී **"අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරිය ධම්මෙ අකොවිදෝ"** යනුවෙන් දේශනා කොට වදාළා. බොහොම අමාරු එකක් මේ දේශනාව අවබෝධයක් ඇති ව ඉදිරියට ගෙන යන එක. මෙය සම්මුති වශයෙන් තෝරන්නේ බුදු දහම අහපු නැති පෘථග්ජන පුද්ගලයෙකු ගැන යි. එ සේ කී විට මේ හැදිච්ච වැඩිච්ච මේ මහා විශාල ගොනුව ගැන යි මේ කථා කරන්නේ. බුදු හාමුදුරුවෝ මුලින් ම කියලා තියෙන්නේ ධර්‍මයන්ගේ මූල කියන එක යි. එහෙත් මෙ තැනදී සම්මුතියෙන් විග්‍රහ කරලා තිබෙන්නේ මිනිසකු පිළිබඳව යි. සම්මුතිය සාමාන්‍යයෙන් වටහා ගන්නවා නම් එය මෙ සේ නිදසුන් කළ හැකි යි. සාමාන්‍යයෙන් දැන් වැස්සක් වහින කොට වැදගත් තාලයේ ගෙයක් ළඟට ගියොත් වැස්සෙන් නො තෙමෙන්ට ගේ අයිනෙන් ඉන්නවා. මේක ඇතුළට යන්ට තරම් ඒ මිනිසාට තත්ත්වයක් නැහැ. අර එ වැනි මිනිසාට අගුව වගේ තමයි සම්මුති අර්ථය. එහෙම ඉඳලා වැඩක් නැහැ. ගේ ඇතුළට ම රිංගන්ට ඕන. රිංගලා ඕන මෙවා කරන්ට, එයින් ප්‍රයෝජනය ගන්ට නම්. සම්මුතියෙනුත් සෑහෙන සේවයක් සිදු වුණා.

මේ මිනිසුන්ගේ ගොනු වීම, මේ මිනිසුන්ගේ එක් රැස් වීම, සම්මුතිය ඔස්සෙ යි වෙලා තියෙන්නේ. පරමාර්ථයෙන් ඕක කරන්ට බැහැ. පරමාර්ථයෙන් කරන්නේ අවබෝධය. අවබෝධ වෙන්ට ළං වෙන්ට ඕන. කිට්ටු වෙන්ට ඕන. කිට්ටු වෙන තුරු සාකච්ඡාවෙන් හෝ යම් මගකින් හෝ කිසිවක් කරන්ට බැහැ. සම්මුතිය තියෙන්නේ ගොනු කරන්ට. පරමාර්ථය තියෙන්නේ ගොනු වූ ක්‍රමය විදහා පාලා, පෙන්නලා, විසුරුවා හරින්ට යි. ගොනු වීම යි විසුරුවා හැරීම යි කියා ලෝකයේ තියෙන්නේ දෙක යි. ගොනු වෙනවා විසිරී යනවා. සසරට වැටෙනවා. නිවන් දකිනවා. බුබුලක් මතු වෙනවා. ඒක පිපිරී යනවා. ඒ නිසා සම්මුතියෙන් ගොනු කර ගැනීම සඳහා කාටත් එකතු වෙන්ට ඉඩ දුන්නා. පරමාර්ථයට වැටුණු පුද්ගලයා ඒ ගොනුවෙන් අයින් වුණා. ඒ විදියට නො කර කවදා වත් මේක කරන්ට බැහැ. ඒක නිසා, අපි සම්මුතියට ගරු කරන්ට ඕන. මේ වගේ මූලධර්‍ම ගැන සාමාන්‍ය පුද්ගලයෙකුට

කීවොත් "මොනවාදෝ කියනවා! මෙලොව දෙයක් තේරෙන්නේ නැහැ!" යි කියාවි. අර බමුණන් බුදු හාමුදුරුවන්ට කී දෙය වගෙ යි මේ දේශනාව ගැනත් කියන්නේ. ඒක නිසා, ඒක එහෙම තියෙන්ට ඕන. නමුත්, ඒක නො වෙයි මෙහි සම්පූර්ණ ඇත්ත. මෙයින් පෙන්වන්නේ අපි මුලින් කතා කළ රූප කලාපය යි බුදු හාමුදුරුවන් එක්තරා ප්‍රමාණයක මූල ධර්ම හැටියෙන් පෙන්නුවේ.

චිත්ත, චෛතසික, රූප, නිබ්බාණ යනුවෙන් දේශනාවක් තියෙනවා. පරමාර්ථ කියලා අමුතු දේශනාවක් කළේ නැහැ. හැම දෙයක ම සම්මුති - පරමාර්ථ යන පැති දෙක ම බුදු හාමුදුරුවෝ පෙන්වා වදාළා. චිත්ත, චෛතසික, රූප, නිබ්බාණ කියලා ධර්මවල තිබෙන ගම්භීර කොටස් වෙන් කරපු මහ රහතන් වහන්සේලා මේ සියලු ධර්ම කොටස් ගොනු වී ගන්නා රාමුවේ පැති හතර පෙන්නුවා. බුදු දහම යම් රාමුවක් තුළ විස්තර වේ නම්, ඒ රාමුවේ පැති හතර යි චිත්ත, චෛතසික, රූප, නිර්වාන යන හතර. චිත්ත, චෛතසික කී විට අපි දැන් හිතන විදියට සිතක් තියෙන්නේ අපිට යි. චෛතසික තිබෙන්නේ සිතෙ යි. රූප කියන කොටස ශරීරයේ තිබෙන ඒවා. නිබ්බාණ කියන්නේ මහා සැප ඇති අයිතිවාසිකමක්. ඒ අන්දමට ගන්නා විට අපට මේක සාධාරණ විදියට තෝරා ගන්ට බැහැ. චිත්ත, චෛතසික, රූප, නිබ්බාණ කීවේ අද කතා කරන බසින් පරමාණුවට යි. මේ ලෝකයේ තිබෙන හැම දෙයක ම තිබෙන්නේ අල්ලන ශක්තියක්. අල්ලන්නේ නැති - කාන්දම් නැති කිසි දෙයක් ලෝක ධාතුවේ නැහැ. යම් යම් ප්‍රමාණවලින් අල්ලන ශක්ති තිබෙනවා. එහෙම නැත්නම් ඒක ලෝකයෙන් අයින් වූ එකක්. දැන් බුදු හාමුදුරුවන්ගේ ධාතු තිබෙනවා. ඒ ධාතුවල කාන්දම් නැහැ. ඇයි ඒ? ඒක ලෝකෙට අයිති නැහැ. ඒක යි ඒකෙ තිබෙන නීතිය. ඒක යි ඒකට ලොකෝත්තර කීවේ.

චිත්ත කියන්නේ අල්ලන ශක්තිය යි. චෛතසික කියන්නේ ඇල්ලීමට උදව් දෙන කොටස්. රූප කියන්නේ ඒ දෙක ගොනු කරන්නා වූ ක්‍රමය. නිබ්බාණ කියන්නේ ඔය තුන ම නැති කම යි. මුළු ලෝකෙ ම ඔය පද හතරට ගොනු වෙනවා. දැන් අපේ හිතෙන් කරන්නේ කුමක් ද කියා බලමු. ඒකෙන් තේරුම් ගන්ට පුළුවනි චිත්ත කියන්නේ කුමක් ද කියලා. චිත්ත කියන්නේ අල්ලන ශක්තිය නම් අප ළඟ තිබෙන හිතෙත් ඇත්තේ හැම

වෙලාවෙ ම අල්ලන ශක්තිය යි. චෛතසික තියෙනවා කීවේ චෛතසිකවලින් හිත හදනවා කියන එක නො වෙයි. හිත හදන්ට චෛතසික නො වෙයි යෙදෙන්නේ. හිත හදන්ට වෙන ම ක්‍රමයක් තිබෙනවා. පංචස්කන්ධ ක්‍රියාකාරීත්වයෙනුයි හිත හැදෙන්නේ. චෛතසික කියන්නේ නොයෙක් ඇල්ලීම් ස්වරූප යි. මොන විදියෙන් ද අල්ලන්නේ ? මොකට ද අල්ලන්නේ ? මොකක් ද අල්ලන්නේ ? ඇයි අල්ලන්නේ ? ආදි වශයෙන් ඇල්ලීමක තිබෙනවා එහි ගැබ් වූ යම් වට්ටෝරුවක්. ඒ වට්ටෝරුවේ තිබෙන කොටස්වලට යි චෛතසික කියන්නේ. සිතක් පහළ කරන්ට චෛතසික එකතු වෙලා සිත කියන වෙඩිල්ල පත්තු වුණා වගේ නො වෙයි. එතකොට චිත්ත, චෛතසික, රූප, නිර්වාන කියලා පෙන්නුවේ කුමක් ද? ඒ අල්ලන ශක්තියේ විවිධත්වය නිර්මාණය කරමින් ඒ අල්ලන ශක්තිය හැදෙන්නේ එක්තරා රුප්පණ මාධ්‍යයකින්. රුප්පණ මාධ්‍යයෙනුයි ඔය තුන කෙරෙන්නේ. ඔය රුප්පණ මාධ්‍යය නැති වූ දාට නිබ්බාණ කියන ඒ රුප්පණයට යටත් වූ දෙය, ඒවා සියල්ල ම නැති වී යනවා. එ විට, ලෝක නිර්මාණයත් ලෝක නිර්මාණය තුළ තිබෙන විවිධත්වයත් ඒ විවිධත්වයේ තිබෙන සියලු දේ නැති වීමත් චිත්ත, චෛතසික, රූප, නිබ්බාණවලින් පෙන්නුවා. අර ඇතිවීම, පැවතීම, නැතිවීම යටතේ මේවා සිදු වුණා. "**මේ අස්සුතවා පුථුජ්ජනො**" යනුවෙන් පෘථග්ජන කතාව යි මෙතනට එන්නේ. යම් තැනක ද ඔය ඇල්ලීමත්, ඇල්ලීමේ විවිධත්වයත් තිබෙන්නේ, ඒ විවිධත්වය ඒ ශක්තිය රඳවන යමක් ලෝකයේ සකස් වෙනවා නම් එ තැන පෘථග්ජන යි. හැම වෙලාවෙ ම පැවැත්ම රැඳවීම සඳහා - පැවැත්ම රඳවමින් විවිධත්වයට පත්වීම සඳහා - නිෂ්පාදනය වෙන ශක්තිය ඇති තැනක් වේ ද එ තැන පෘථග්ජන යි.

ජීවිතයේ පැවැත්ම රැඳවීමට ක්‍රියාත්මක වෙන මූල ශක්තිය වෙනුයේ මොන මොන ආකාරයෙන් හෝ රත්වීම යි. ඒ රත්වීම දෙන එක යි සිත යි කියන්නේ. රත්වීම විවිධ ආකාරයෙන් මතුකිරීම සඳහා ඒ වේගවලට උදව් වෙන යම් මහක් තිබේ නම්, යම් උපකාරයක් ලැබේ නම්, ඒ උපකාර කරන කොටස්වලට යි චෛතසික කියන්නේ. සිත ලෝභයක් නැති ව තබාගන්ට පුළුවනි. ලෝභය සිතට ඕන නැහැ. රහතන් වහන්සේලාට ලෝභය නැහැ. සිත සමඟ ලෝභය කියන කෘත්‍ය ස්වරූපය එකතු වුණු විට ඉතා

තදින් අදින්ට පටන් ගන්නවා. ලෝභය චෛතසිකයක්. ඒක රඳවා ගන්නා වේගය සිත යි. මේවා මේ ආකාරයට විග්‍රහ නුණොත්, අප ඉන්නේ කොහේ ද කියා අපට කියන්ට බැහැ. ලෝකයේ හැම තැන ම මේ එක්තරා න්‍යායයක් යටතේ සකස් වූ දෙයක් කියලා හිතන්ට පුළුවන් වෙන තුරු මේක අත්හරින්ට හිතක් පහළ වෙන්නේ නැහැ. ඇයි මේවා අපේ නේ ? අපේ ඒවා අදින්ට ඕන නේ ? අපි දැන් මෙහෙම විසිරී ගියාට මේ තරාතිරම් - භේදවලින් වෙනස් වී තිබුණට මෙතන තියෙන්නෙත් එක න්‍යායයක් යටතේ සකස් වූ නිර්මාණයක්. ඉතින් අපි මොනව ද මේ තරම් ඇහිලි බැඳගෙන, එල්ලිලා, ලැටි ගගා ඉන්නේ කියලා හිතවන්ට පුළුවන්. ඕක හිතවන්ට යි බුදු හාමුදුරුවෝ මෙ පමණ දේශනා කළේ.

බුදු හාමුදුරුවෝ එච්චර කීවේ ඇයි.? එ පමණ කියන්ට හේතු වුණේ ඇයි? ගින්න ඇතුළේ වතුර තියෙනවා කියන එක කරන්ට පුළුවන් එකක් නො වෙයි. වතුර දැම්මාම ගිනි නිවෙනවා. ගින්න තියෙන කොට වතුර තියෙන්ටත් බැහැ. ඒ වගේ හැම වේලේ ම ඇලීම් ශක්තියක් නිර්මාණය වෙමින් පවතින එකක් ඇතුළට නො ඇලීමක් ගැන කතා කරන කොට අර එළිය ඇතුළේ කරුවල ගහන්ට ගියා වගේ වැඩක්. නමුත් එක වරට බුදු හාමුදුරුවෝ ඒක කළේ නැහැ. එළිය යි අඳුර යි දෙක කිට්ටු කර කර ඇවිල්ලා එළියත් අඳුරත් දෙක ම නැහැ කියන තැනට වැඩ හැදුවා. ඒක යි මේ අපට මේ තරම් මහන්සි වෙන්ට වෙලා තියෙන්නේ, අපේ ජීවිතයේ අවසානේ හදන්ට. එකට කරන්ට බැහැ. දැන් ඔය මදසාරය සියයට සියයක් මදසාරය කරන්ට ගියොත් ගිනි ගන්නවා. එහෙම කරන්ට බැහැ. ඒකේ වතුර බිංදුවක් තිබෙන්ට ඕන. නමුත්, බුදු හාමුදුරුවෝ ඒක සියයට සියය වෙන තුරු ඒ වැඩේ කරන හැටි පෙන්වලා ගිනි ගන්න වෙලාවේ ගිනි ගන්ට දීපන් කියල බුරුල් කරන තත්ත්වයක් මිනිහට කියා දුන්නා. පෘථග්ජන යන වචනය කියන්ට යි මෙතෙක් වේලා කතා කළේ. කෙලෙස් ජනිත කරන නිසා පෘථග්ජන කීවා. පැවැත්ම රඳවන ශක්තියට කීවා කෙලෙස් කියලා. පැවැත්ම රඳවන ශක්තිය ගෙන ගියේ මොකේ පැවැත්ම ද? ඒක විසින් නිර්මාණය කළ එකේ පැවැත්ම යි එයා රඳවන්නේ. අපට කේන්ති ගියා නම් ඒ කේන්තිය විසින්ම යි කේන්තිය රඳවන්නේ. ආශාව විසින්ම යි ආශාව රඳවන්නේ. මෝඩකම විසින්ම යි මෝඩකම රඳවන්නේ. ඒ මිනිහා

ළහට ඥානවන්ත කමක් දැම්ම හැටියේ මෝඩකම පතිනවා "ඕකත් එක්ක මට ඉන්ට බැහැ" කියලා. ඒ නිසා පැවැත්ම රඳවනවා කියන්නේ ඒක විසින්, නිර්මාණය කළ එක විසින්, එහි තත්ත්වය පවත්වනවා කියන එක යි.

"දුක් විඳින්ට එපා! බස්සපන්!!" බුදු හාමුදුරුවෝ වදාළා. ඒ බස්සපු තරමට සැනසිල්ල තියෙනව යි කියලා වදාළා. දැන් **"පුථුජ්ජනො"** කියන වචනය ගැන පමණ යි කතා කළේ. හෙමිහිට හෙමිහිට යමු.

මේ ටිකෙන් ජීවිතය පිළිබඳ ව යමක් හිතාගන්ට පුළුවනි, අරක ගැන දොස් කියන්ට යි මේක ගැන විපරම් කරන්ට යි අරක ඕනෙ යි මේක එපයි කියන්ට යි වෙලා තියෙන්නේ මොකක් නිසා ද කියලා මොකක් ද ඒ කරන්නේ? කවුද ඒ කරන්නේ? ඇතුළේ තිබෙන වැඩ කරන එක මම ප්‍රකාශ කරනවා. ඕනැයි, එපයි කියලා මේවා කියව කියවා ඉන්නවා හරියට ගුවන් විදුලිය වගේ.

# 02

**"අස්සුතවා පුථුජ්ජනො"** යන ශබ්දයක් එක්ක යි සූත්‍රය ආරම්භ කෙරෙන්නේ. ඒ පුථුජ්ජන යන වචනයට අර්ථය දෙන්නේ සාමාන්‍ය මිනිසුන් යනුවෙනි. එ තැනින් එහා අපි පුථුජ්ජන ස්වභාවයක් ගැන හිතන්නේ ම නැහැ. හිතන්ට අවස්ථාවක් නැහැ. ඒකට කාරණයක් එළඹෙන්නේ ම නැහැ. ලෝකයේ තිබෙන ස්වාභාවික තත්ත්වය, ලෝකයේ තිබෙන සියල්ල ම බුදු හාමුදුරුවෝ අනාත්ම යි කියලා වදාළා. ඒ අනාත්ම යි කියා වදාළේ යම් වස්තුවක් යම්කිසි දෙයක් නිරූපණය කරනවා නම්, පෙන්වනවා නම්, ඒ වස්තුවෙන් ඒ වස්තුවට ඒ කිසිවක් අයිති නැහැ. අපට අනාත්ම වාදය දැනට තේරිලා තිබෙන්නේ "මම නො වෙයි, මගේ නො වෙයි" කියන අදහසෙනුයි. මම නො වෙයි, මගේ නො වෙයි කියන එක අර කී අයිතියක් නැතිකම ය කියන අනාත්මයට සේන්දු වෙනවා. ඒකත් එක්ක ගැළපිලා ගියාට ඒ සම්පූර්ණ අදහස ගැබ් වෙන්ට ඕන. අනාත්මීය තත්වයක් යටතේ සෑම දෙයක ම ඒ වස්තූන් විසින් නිපදවා ගනු ලැබූ කිසි දෙයක් නැති බව පෙනෙනවා. වස්තුව විසින් නිපදවූ කිසිවක් නැතැ යි කීමට හේතුව කුමක් ද? වස්තුව කියන්නේ ක්‍රියා රාශියක ප්‍රතිඵලයක්. යම්කිසි වස්තුවක් දරා ගැනීමට උපකාර වෙමින් කරන ක්‍රියා ස්වරූපයට "ධර්ම" කියලා කියන බව මුලින් සඳහන් වුණා. ඒවා තමයි ඒක දරන්නේ. එ විට දරන තත්ත්වය කියලා වස්තුවකුත් නැහැ.

ක්‍රියාවක් විතරක් අර ස්වරූපය දරා ගැනීමට උදව් දෙමින් ක්‍රියා කරනවා. ඒක යි අනාත්ම ලක්ෂණයේ අනෙක් ස්වරූපය.

වස්තුව ක්‍රියා පිළිගන්නවා නම් ඒක දරාගෙන සිටින ස්වරූප ක්‍රියාවට යි අයිති. ඒ වස්තුව කියන සංවිධානය ඔතනින් ගත් විට ඒකේ තිබෙන **"සබ්බ ධම්ම මූල පරියාය"** යි වදාරන්නේ. සියලු ධර්මයන්ගේ මුල් පිළිවෙල යි. එ විට, සියලු ධර්මයන්ගේ මුල්

පිළිවෙල එක ම නීතියක්, න්‍යායයක් යටතෙ යි සංවිධානය වෙන්නේ. බුදු හාමුදුරුවෝ මේ සංවිධානාත්මක වැඩ පිළිවෙල විග්‍රහ කර පෙන්නුවා පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්‍ණ, ගන්ධ, රස, ඕජා කියලා කොටස් අටකින්. ඒ කොටස් අට පහසුවෙන් තේරෙන්ට ඔන නිසා අපට පරමාණුවක උදව්ව ගන්ට සිද්ධ වෙනවා. මුල් ධර්‍මය ලෝකයේ සංවිධානය වුණේ කොහොම ද කියලා නැත්නම් සියලු දේවල නිෂ්පාදනයේ මූල ධර්‍මය කුමක් ද කියලා කියන්ට යි පරමාණුව ඕන කරන්නේ. පරමාණුවක විස්තරේ බුදු හාමුදුරුවෝ දෙසූ විස්තරයට සම්පූර්ණයෙන් ම සැසඳෙනවා. ඒකේ කිසි ම පරතරයක් හෝ මොන ම වෙනසක් හෝ නැහැ. බුදු හාමුදුරුවෝ මීට වඩා සියුම් ලෙස විග්‍රහ කරලා තිබෙනවා. පරමාණුවේ පැත්තෙන් කියන්නේ ඉලෙක්ට්‍රෝන්, ප්‍රෝටෝන්, නියුට්‍රෝන්, එනර්ජි වශයෙනුයි. බුදු හාමුදුරුවෝ පඨවි ඇති වෙන්නේ කොහොම ද කියලා තේරුම් ගන්ට ඉඩ තිබ්බා.

**"අස්සුතවා පුථුජ්ජනො"** යන වචන දෙක යි බුදු හාමුදුරුවෝ පාවිච්චි කළේ. කෙලෙස් ජනනය කරන නිසයි පුථුජ්ජන කියල කීවේ. කෙලෙස් කීවේ පීඩා දෙන පැවැත්මක් රඳවන දෙය යි. පීඩා දෙන පැවැත්මක් රඳවන දේ අත්හැරලා සම්පූර්ණ පැවැත්ම නැති කරන්ට යි කියන නිගමනය යි බුදු හාමුදුරුවෝ දේශනාවෙන් පෙන්වන්නේ. අපි දැනට පාවිච්චි කරන කෙලෙස්වල ස්වරූපය කුමක් ද? අපේ කෙලෙස් නිසා යම්කිසි වැරදි තත්ත්වයක් අප සිත ඇතුළේ ඇති වුණා නම් ඒ සිත ඇතුළේ ඇති වූ වැරදි තත්ත්වයේ මූල ධර්‍මය රත්වීම යි. යමෙකුට කාම හැඟීමක් ආවා. ද්වේෂ හැඟීමක් ආවා. ඒ පුද්ගලයා සාමාන්‍ය සෞම්‍ය ස්වභාවයෙන් ඉඳලා අර කාම හැඟීම නමැති ලෝභ චේතනාව ආපු හැටියේ ඇඟ රත්වෙලා, උණුසුම් වෙලා, එනවා. සිතුවිලි ස්වරූපය නිෂ්පාදනය වෙන්නේ, හැඟීම් මතුවෙන්නේ, නැඟී එන තේජසේ හැටියට යි. බුද්ධාගමේ නිවන කියා උගන්වන්නේ තේජස නිවන එක යි. නැති ව වෙන කුමක් හෝ අයිතියක් ලබන එකක් නො වෙයි. තමන්ට දුක් දෙන්නා වූ තේජස නිවා ගැනීම යි බුද්ධාගමේ උගන්වන **"සදාකාලික සැපය"** කියලා පෙන්නුවේ. ද්වේෂය සිතට ආ විට මිනිහාට උහුලන්ට බැරි වෙන කොට යි මිනිහා ගඟේ - මුහුදේ පැනලා ජීවිතය නැති කරගන්නේ. එහෙම කරන්නේ රත්වීම තියාගෙන ඉන්ට බැරි නිසයි. ඒ තරම් රත්වෙලා. ඒක

පාවිච්චි කරන්ට බැහැ. ඒ කාල සීමාවට, ඒ අවස්ථාවට, එයාට මුළු ජීවිතය ම එපා වෙනවා. එයින් වැටහෙනවා කෙලෙස් කියන්නේ රත්වීම වැඩිවෙන ප්‍රමාණය බව. දැන් මෙයින් පැහැදිලි වෙනවා රත්වීම වැඩිකරන, එක්කාසුව නැත්නම් සංවිධානය, ලෝකයේ මුලින් ම සියලු ධර්මයන් හැදීමට මුල් වුණු බව. රත්වීම නිෂ්පාදනය කරන ක්‍රියා මාර්ගයකුයි මුලින් ම හැදිලා තියෙන්නේ. ඒ ක්‍රියාව බුදු වදනින් කීවා පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා, කියලා. අනිත් අය පරමාණු පැත්තෙන් කීවා ඉලෙක්ට්‍රෝන්, ප්‍රෝටෝන්, නිව්ට්‍රෝන්, එනර්ජි ආදි වශයෙන්.

ලෝකයේ පළමුවෙන් ම හැදුණෙ ඉතා ම නරක ක්ලේශ ස්වරූපය යි. ලෝකයේ ය කීවා ම දැන් අපි ගනිමු මා ගැන. මා අද මේ ජීවිත තත්ත්වයේ ඉන්නවා. නමුත්, මගේ මූල ධර්මය හට ගැනීම ගැන, මගෙ යි කියන පුද්ගලයා ලොවේ එළිදරව් වූ මුල් අවස්ථාව ගැන, බැලුවොත් අන්තිම නරක තත්වයෙනුයි ලෝකයට ඇතුල් වී තියෙන්නේ. "මම" කියන හැඟීම ලබා දෙන එකමුතුව ලෝකයට සම්බන්ධ වෙලා තිබෙන්නේ ඉතා ම රෞද්‍ර විධියට යි. කර්කශ විධියට යි. මා වෙනුවෙන් හැදුණු එකක් නො වෙයි ඒක. ඒක ලෝකයේ හැදිලා තියෙන එකක්. මේ ගොල්ල එක්කාසු වෙලා ඒක අරන් තියනවා මගෙ යි කියලා. ඇමෙරිකාවට ගිය මිනිහා ඒ වෙලාවේ කීවා නම් "මේ ටික මගේ, අර ටික තමුසෙගේ" කියලා, වෙන් කළ වෙලාවේ ඉඳලා අරයා මේකට එයි කියල බය යි. මෙයා ඒකට යයි කියලා බය යි. බෙදාගත්තට පස්සෙ යි මේ කරදර සියල්ල ඇති වුණේ. ලෝකයේ පෘථග්ජන ස්වරූපය, කෙනෙකු නිෂ්පාදනය කරන තේජස, සෑම තැන ම ඇති වෙලා තිබෙන්නේ ඔය ක්‍රමයට යි. මේ වර්ග පහේ තේජස - කාම පහ - එකතු වූ තැනදී ඒක තුළින් නිෂ්පාදනය වුණු ශක්තිය විසින් කියලා තියෙනවා "මේක මගේ" කියල. මම යි - මගෙ යි කිවූ අයට වගකීම බාරගන්ට වෙලා තිබෙනවා. ඒක සකස් වුණු වෙලාවේ තිබුණු ඉතා සියුම් වායු පොදියේ - අර වැඩ කළ කාන්දමේ - ජීව බලයේ - ඒ කාම කියන ශක්තියේ - ක්‍රියාකාරීත්වය තිබුණු හැටියට මම යි නො කියා බැරි වුණා. ඒක ඒ ශක්තිය විසින් දෙන ලද හැඟීමක්. හැම එකක් ම අදින ශක්තිය යි ඒකේ තියෙන්නේ. ඇතුළෙන් යමක් අදින ශක්තිය ආපු හැටියේ කියනවා "ඒක මට ඕනැ" යි කියල. අපට ඕන වෙලා නො වෙයි. අර

ඇතුළෙන් ආපු එකත් එක්ක ආකර්ෂණය වෙලා, ඒකේ වැඩියෙන් එල්ලෙන්ට හදන එකට කියනවා "ඔන්න ඕක මට දෙන්ට" කියලා. ඒ ශක්තියත් මේ ශක්තියත් විග්‍රහ කිරීමක් - නැත්නම් තේරුම්කර දීමක් අපි කරන්නේ. මමෙ යි කීවේ කාට ද? "මම" කීවේ ඒ නිෂ්පාදනය කරන වස්තුවට. නැත්නම් "මම" යි කියලා වෙනම කෙනෙක් නැහැ. ඒ ශක්තිය නිෂ්පාදනය කරන වස්තුවට ඒකෙන් දොට්ට එන ශබ්දය මගෙ යි කියල යි හඳුන්වන්නේ.

ශබ්දය එන්නේ කොහොම ද? ඒක සංවිධානය වෙන්නේ කොහොම ද? ඒකට තවත් විග්‍රහයකට බසින්ට වෙනවා. **අස්සුතවා පුථුජ්ජනො** කීවේ කුමක් ද? අර කී ඉතා ම සැර මට්ටමෙන් ලෝකයේ පරමාණුව හැදුණු බව කියන්ට බුදු හාමුදුරුවෝ **"අස්සුතවා පුථුජ්ජනො"** කියන එක ඉදිරිපත් කළා. පරමාණුවක් හැදෙන විට ප්‍රෝටෝන් එකක්, නිව්ට්‍රෝන් එකක් තියෙන පෙදෙස බලාගෙන ඉලෙක්ට්‍රෝන් එක එන්ට ඕන. ඉලෙක්ට්‍රෝනය ඇවිත් ඒකේ භ්‍රමණය යි භ්‍රමණ ගමන යි සිද්ධ වෙන සෙව්වට ආ විට යි පරමාණුව කීවේ. ඒක සිද්ධ වෙන තුරු පරමාණුවක් නැහැ. අර සංයෝගය එකතු වී ක්‍රියාකාරිත්වයට වැටුණු හැටියේ ඒක පරමාණු නාමයෙන් හඳුන්වනවා. අපට පුළුවන් වෙන්ට ඕන බුදු හාමුදුරුවෝ කී වචනවල තිබෙන අදහස මේ පරමාණුව ඇතුළෙන් පෙන්වන්ට. **"අස්සුතවා"** කීවේ මොකක් ද? අසා නැති යන අදහස යි. ඇහෙන්නේ ශබ්දයකුයි. අද ලෝකයේ ශබ්ද ඕන හැටියේ තියෙනවා. ලෝකයේ ශබ්ද හෝ මොනවා හෝ නැති කාල සීමාවක් ගැන **අග්ගඤ්ඤ සූත්‍රයේ** දක්වා තියෙනවා. කැඩිලා කැඩිලා ගිහින් ලෝකයේ කිසිවක් නැති අවස්ථාවක් එම සූත්‍රයේ පෙන්වනවා. ඊට පසු ව බුදු හාමුදුරුවෝ පෙන්වනවා හැදෙන හැටි. කැඩෙන හැටිත් දන්නවා. හැදෙන හැටිත් දන්නවා. කැඩෙන හැටිත් හැදෙන හැටිත් දෙකම දන්නවා. මේ මහා විද්‍යාඥයාගේ දැනීමේ ප්‍රමාණය ශ්‍රේෂ්ඨ යි.

**අරියානං අදස්සාවී** - මේ ලෝකයේ ගමන් කළ යුතු නිර්දෝෂ ශබ්ද තරංගවලිනුයි පරමාණුවේ බලය දුර්වල කරන්ට පුළුවන් වෙන්නේ. ආලෝක තරංගයෙන් නො වෙයි. 'අරිය' යනු නිර්දෝෂ යනු යි. ඉලෙක්ට්‍රෝන් එක ප්‍රෝටෝන් එකට ගමන් කරන කොට එ තැන නියුට්‍රෝන් එකක් තියෙන්ට පුළුවන්. නිකම් තනියට ඉන්නවා වගෙ යි. ඒකේ ඒ තරම් බලයක් නැහැ. අනික් දෙකෙ යි

බලය තියෙන්නේ. බෞද්ධයන් කවුරුත් ඔය නියුට්‍රෝන් එකේ බලය වැඩි කරන්ට යි හදන්නේ. ඒ නියුට්‍රෝන් එකේ බලය කුමක් ද? ඇත් කරන එක යි. ප්‍රෝටෝන් එකේ බලය අදින එක යි. ඉලෙක්ට්‍රෝන් එකේ බලය ඇදෙන එක. අදින එකෙන් වැඩක් නැහැ ඇද්දට එන්ට එකක් නැත්නම්. මෙයා අදින්නත් අරයා ඇදෙන්නත් දෙන්නාගේ තිබෙන ප්‍රබල ශක්තිය නිසා ඒ දෙන්නා හැකි තාක් දුරට කිට්ටු වෙනවා. ඒ කිට්ටු වෙන-කිට්ටු වෙන ප්‍රමාණයට අවකාශ ධාතුව අඩු වෙනවා. එහෙම අඩු වෙන්ට - අඩු වෙන්ට, අර භ්‍රමණයේදී බැමරීමෙන් රත්වීම වැඩි කරනවා. ඒ විට මේ ඉලෙක්ට්‍රෝන් එකට තනියෙන් පුළුවන් කමක් නැහැ රත්වීම අඩු කරන මට්ටමට ගන්ට. ඒකට ශක්තියක් නැහැ.

යන්තම් දෙන්නා ඈත් කරලා තියන්ට පමණ යි දෙන්නට ම පුළුවන්. දෙන්නා එකතු වුණොත් ඉලෙක්ට්‍රෝනය ඉවර වෙනවා. ඒ විට පරමාණුවේ අයිතිය තියෙන්නේ නියුට්‍රෝන් එකට යි. නියුට්‍රෝන් නැත්නම් ඒක ඇලෙනවා. මෙයාගේ තල්ලුව යි එයාගේ ඇදිල්ල යි නිසා යම්කිසි සීමාවක් ඇතුළේ අරයගේ ක්‍රියාකාරීත්වය කරන්ට සිදු වී තිබෙනවා. මේ බලපෑම් දෙකෙන් ඇතුළේ උපදිනවා ජවය කියල එකක් - රත්වීමක්. රත්වීම ඇතුළෙ යි අපි කියන විද්‍යුත් බලය - කාන්දම් රසායන බලය වැඩ කරන්නේ. ඒක එකතු වෙන වෙලාවේදි බුදු හාමුදුරුවෝ වදාරණවා ඔය තරම් කර්කශ විධියට එකතු වුණේ මොක ද කියලා. ඒක ඈත් කරලා පරතරයක් තියන්ට පුළුවන් උදව්වක් ලෝකයෙන් ලැබුණේ නැති නිසා බව වදාරනවා. එහෙම වදාළේ මුලින් ම හැදුණු හැටි පෙන්වන්න.

මේ හැම එකක් ම ශක්ති ස්වරූප. ඉලෙක්ට්‍රෝනය ශක්තියක් - සුළියක් වශයෙනුයි හඳුන්වන්ට වෙන්නේ. ප්‍රෝටෝනයත්, නියුට්‍රෝනයත් ශක්ති විශේෂ. නැති ව එහෙම ජාති නැහැ. **"අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී"** ඒ මූල ධර්මය යි. පරමාණුව හැදෙන වෙලාවට සෞම්‍ය තත්වයෙන් නො හැදෙන්ට ඇති හේතුව මොක ද? ඒක ඈත් කරන ශබ්ද තරංගයක් ඒකට අහුවුණේ නෑ. ශබ්ද තරංගය අහුවුණා නම් ඒක ඈත් කරන්ට පුළුවන් වෙනවා. අහුනුණු නිසා කිට්ටු වෙන්ට පුළුවන් ප්‍රමාණයට කිට්ටු වුණා. දැන් මේ අපි කරන්නේ අපේ සිත්වල කෙලෙස් අඩු වෙන විධියට පිළිපැදීම යි. අපේ ජීවිතය පවත්වන පරමාණුවල වැඩි රත්වීමක්

නිෂ්පාදනය කරන තාලයෙන් එක්කාසු කරපු ඒවා අඩු කිරීමට යි උත්සාහ කරන්නේ. කාමය නවත්වපු විට සසර ගමන නවතිනවා. කාමය නවත්වන්ට බුදු හාමුදුරුවෝ පෙන්වලා තිබෙන්නේ හැම එකක ම සම්බන්ධයෙන් අයින් වෙන්ට කියල යි. සම්බන්ධයෙන් ඈත් වෙන්ට පුළුවන් වෙන්නේ සම්බන්ධ වෙන ශක්ති නිෂ්පාදනය කරන දේවල ආශ්‍රය නැති කිරීමෙනුයි. කාන්දම් හදන්ට යම් ප්‍රමාණයක තේජසක් අවශ්‍ය ද, ඒ තේජස නිෂ්පාදනය වෙන තාක් ඒ කාන්දම හැදෙනවා. බුද්ධාගමේ උගන්වන්නේ කාන්දම නො හැදෙන තත්වයට තේජස අඩු කරන්ට යි. ඒ තේජස කාන්දම නිෂ්පාදනය නො කරන නිසා ඒ ජීවිතයේ අණුවල (රූපකලාපවල) ටිකක් වත් කාන්දම් නැහැ.

බුදු හාමුදුරුවෝ වදාරන්නේ, ඇයි අපි දුක් විඳින්නේ කියලා. බුදු දහම කියලා එකක් පිළිබඳ ව අපි කතා කරනවා. ඒකෙන් මිනිස් ජීවිතයට ගෙන එන විද්‍යාත්මක ස්වරූපය කුමක් ද, ඒක කෙරෙන්නේ කොහොම ද, කියලා වදාළා. **"අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මෙ අකොවිදො"** ඒ කුමක් ගැන ද මෙතන කියන්නේ? ඒ විදියට නිදොස් වීමට කෙලෙස් වැඩි නො වෙන විදියෙන් වැඩ කිරීමට ඒ වස්තුවේ කිසි ම හුරුවක් හෝ පුරුද්දක් හෝ දැනීමක් නැහැ. අපට වැටහෙනවා ඒ අවස්ථාවේදී වස්තුවේ මිනිහෙක් නැති බව. පරමාණුව (රූප කලාපය) මිනිහෙක් නො වෙයි. ඇහැක් වත් පේන්නේ නැහැ. මේ කතා කරන්නේ පරමාණුවක් ගැන යි. මෙ තැන මේ දන්නවා, දන්නේ නැහැ, දැනිලා නැහැ කීවේ මොකක් ද? ඒක නිසයි අපි අර වස්තු තුන - කොටස් තුන - ඉලෙක්ට්‍රෝන්, ප්‍රෝටෝන්, නියුට්‍රෝන් ගැන කතා කළේ. මේ තුනේ තිබෙනවා විවිධ වෙනස් කම්. ඒ විදියේ සම්සම්බන්ධතාවයක්, ඒ විදියේ ශබ්ද තරංගයක සම්බන්ධතාවයක්, අර ඉලෙක්ට්‍රෝනය හැදෙන වෙලාවේදී ඉදිරිපත් වුණා නම්, ඒකේ හැදෙන ශක්තිය තුළ කෙලෙස් අඩුවෙන් ක්‍රියාත්මක කිරීමට ඒ උදව්ව උපකාර වෙනවා.

ඉලෙක්ට්‍රෝන්, ප්‍රෝටෝන්, නියුට්‍රෝන් යන කොටස් ලෝකයේ හැදුණු දේවල්. කවුරුත් හැදුවා නො වෙයි. ඒවා හැදෙන කොට ඒ ශක්ති ප්‍රබල වෙන්ට හෝ දුබල වෙන්ට එක්කාසු වෙන ශක්තිවල තිබෙන සංයෝග ද උපකාරී වෙනවා. ඒ ඒ සංයෝග තිබෙන පොළොවේ හැදෙන කෑම රස යි. සමහර තැන්වල හැදෙන කෑම

දිය රසයි. ඒ සකස් වීමට ලැබෙන උදව්ව - උපකාරය තමයි රස, විරස වෙන් කළේ. එයින් පෙන්වනවා බුදු හාමුදුරුවෝ අසුරු සණක් ගහන පමණ කාලයක් මෛත්‍රී චේතනාවෙන් සිටියා නම් එයින් පිටවෙන චිත්ත තරංගවලට වටිනාකම ඉතා මහත් බව. අසුරු සණක් ගහන වෙලාවට චිත්ත වේග චිත්ත ක්ෂණ, චිත්ත වීථි ගණනාවක් හටගන්නවා. ඒ චිත්ත වීථි ගණනාවෙන් මෛත්‍රී චේතනාව ඇති ව නිකුත් වෙන චිත්ත තරංගය පිටවෙන විදියට යම් භික්ෂුවක් පිළිපැදලා අසුරු සණක් වෙලා හිටියොත්, ඒ භික්ෂුවගෙන් ලෝකෙට ලැබෙන උදව්ව අති විශාල යි. ඒ උදව්ව නිසා, තුන් ලෝක ධාතුවේ තිබෙන සියලු ආමිස ඒ භික්ෂුවට දුන්නත් උන් වහන්සේ කළ උදව්වට සරිලන්නේ නැහැ කියලා බුදු හාමුදුරුවෝ පෙන්වනවා. ඒක ඒ තරම් ආනිශංසදායක යි. ඒ ආර්ය භාවයට තුඩු දෙන, ඊට බොහොම කිට්ටු නැකම් තියෙන චිත්ත තරංග ලෝකෙට යන විට ලෝකයේ සිදු වෙන්නේ කුමක් ද? අර කර්කශ විදියට හැදුණු ඒවාට මේවා වැටුණු විට කර්කශ තත්ත්වය සෞම්‍ය බවට පත් වෙනවා. මේක "මම කී නිසා අදහන්න" කියලා බුදු හාමුදුරුවෝ කීවේ නැහැ. හරි නිගමනයක් මත ඉඳල යි කතා කරන්නේ. මේ ලෝකයේ කෙනෙක්ම යි බුදු හාමුදුරුවෝ. මේ තැනට ආවේ අතන ඉඳල යි. උන් වහන්සේගේ ශක්තියත් සසරට වැටුණේ මහා කර්කශ මට්ටමකිනුයි. මේක හැදුණේ එහෙම යි. ඒ එකතු වීමේ මුල් අවස්ථාවේදී තිබුණු තත්ත්වය මේ ආකාරයෙන් පෙරළි - පෙරළී ඇවිත් මේ විදියේ, මිනිසුන් පුදුමයට පත් කරන, අර්ථයක්, වස්තුවක් හැදුණා.

ඒ කොණේ ඉඳලා මේ කොණට කියන්ට ආ විට විග්‍රහ කළේ **"පුබ්බාකෝටි න පඤ්ඤායති"** කියල යි. ඒකේ කෙළවර නම් පේන්නේ නැහැ. කෙළවරක් තියෙනවා. මට ඒ ගැන කිසි ම පැනවීමක් කරන්ට බැහැ. පැනවීමක් කියන්නේ කිසි ම විස්තරයක් කරන්ට බැහැ. බැලීමේ වේගය කොයි තරම් තිබුණත් අවුරුදු 45 කින් ඒක කරන්ට බැහැ. කවදා දකින්ට ලැබෙයි ද දන්නේ නැහැ ඒ පමණ දුර. ඇරත්, මම ආවේ ඕක බලන්ට නො වෙයි. බලලා ඇති වැඩකුත් නැහැ. එක මිනිහකුගේ සසර ගැන කියලා ඇති වැඩක් නැහැ. ඒ ගැන කියන්ට නො වෙයි මම ආවේ. ආරම්භයක් තියෙනවා. පැවැත්මක් තියෙනවා. අවසානයක් තිබෙනවා. අපට දැන් ඉගෙනීම ලැබිලා තියෙන විධියට මූලක් නැහැ. කවදත්

ඉඳලා තියෙනවා. අවසන් වෙන්නෙත් නැහැ. සැපක් විඳිනවා කියලා මොකක්දෝ පුට්ටුවක් හදාගෙන තීරණයක් දීගෙන එයාලා සන්තෝෂයෙන් ඉන්නවා. නමුත්, ලෝකයේ නැති යමක් හැදෙන්ට පුළුවනි. පවතින දේ නැති වෙනවම යි. යමක් හැදෙන්නේ ඒ හැදීම ම නැතිවීමේ ක්‍රියාවලියත් සංවිධානය කරමින්. යම් කිසි දවසක නැති වෙන එකකුයි එ තැන හැදෙන්නේ. ඒක යි **"සබ්බෙ සංඛාරා අනිච්චා"** කීවේ. සකස් වුණා නම් යමක් ඒක සදීරව ම පවතින්නේ නැහැ. ඒ ශක්තිය විසින් කරන්ට පුළුවන් හපන් කම් කරලා අවසන් වූ දාට ඒක නවතිනවා.

හැම නිෂ්පාදනයක ම හපන් කමක් තිබෙනවා. ඒ හපන් කම ඉවර කරන තුරු ඒකට බෑ කවදා වත් නවතින්ට. ඒක යි මේ මෙ පමණ සංසාරේ යන්නේ. අපේ ශක්තියට කරන්ට පුළුවන් හපන්කම් ටිකක් තියෙනවා. ඒ හපන්කම් තමයි එහාට මෙහාට දුව-දුව කොහොම ද කියලා අහන්නේ. තේ බොන්ට එන්ට කියනවා. ඒ සියල්ල ම නිෂ්පාදනය තුළ තිබෙන හපන්කම් කරල - කරලා අන්තිමට හපන්කම් ඉවර වූ දාට එයාට කියනවා රහතන් වහන්සේ කියලා. ඇයි රහතන් වහන්සේ කියන්නේ ? බැඳෙන්ට තිබෙන දේ සියල්ල ම අස්කරල යි නැවතිලා ඉන්නේ. ඒ හපන්කම් ඔක්කොම කරන්නේ බැඳීම් ශක්තිය යි. සංසාරේ දිගින් දිගට යන පුද්ගලයාට ඒ ශක්තියේ තිබෙන ශක්ති ස්වරූපය අවසන් වෙන සීමාවේදී හැඟීමක් එනවා ධර්මය හොයන්ට ඕන කියලා. මේවා ඇතුළේ කෙරෙන වැඩ. ඒකට කියන්නේ පාරමී ශක්තිය කියල යි. පාරමී ශක්ති කියන්නේ ඇතුළේ පිරිච්ච ශක්තිවල පුළුවන්කාර කම යි. පාරමී ශක්තියෙන් කළේ මොකක් ද? එදා ඉඳලා අරම්භ කළා වූ කෙලෙස් ශක්ති පාච්ච්චි කිරීමෙන් අතන හැප්පිලි මෙ තැන ගහගැනිලි යන මේවායින් වෙන්නේ කෙලෙස් එකතු වීම යි. පාරමී ශක්තියෙන් වෙන්නේ ඒවා එපා වීම යි.

සංසාරෙ එන විට කා තුළත් පාරමී ශක්ති පිරෙනවා. දැන් සමහර රටවල ළමයින්ට උදව් දෙන ව්‍යාපාර සංවිධාන තිබෙනවා. ලංකාවේ ළමයින්ටත් උදව් දෙනවා ඒ සමාගම්වල ඉන්න අය. බෞද්ධයන් වශයෙන් සම්මත අය නො වෙයි. ඒ අය බුදුන් වඳින්නෙත් නැහැ. සිල් සමාදන් වෙන්නෙත් නැහැ. ඒ කිසිවක් නැතත් ඒ මිනිස්සු අසරණ ළමයින්ට පිහිට විය යුතු යි කියා සිතන සිතුවිල්ලේ තියෙන්නේ බුදු හාමුදුරුවෝ පෙන්වා වදාළ

හොඳ හිත අවදි කරන, කෙලෙස් අස් කළ පැවැත්මක්. ඒ අයටත් පාරමී පිරෙනවා. ඉගැන්වීම්වලින් කෙරෙන්නේ පහසුවෙන් දැන ගන්ට පුළුවන් වීම යි. හැලෙන්ට ඕන ටික වැඩියෙන් හැලුණු විට යි මෙ වැනි උදව් උපකාර කරන සිත් පහළ වෙන්නේ. දැන් මෙහෙම නම්, ලොව්තුරා බුදුවරයෙක් ලොව පහළ වීමෙන් සිදුවෙන ප්‍රයෝජනය කො තරම් දැ යි හිතාගන්ට පුළුවන්. අපි හිතමු බුදු වරයෙක් ලොව පහළ වුණු විට උන් වහන්සේගෙන් ධර්මය අහන්ට ලැබෙන නිසා, මේ විද්‍යාව ඉතා ඉක්මණින් ක්‍රියාත්මක කරන්ට අවශ්‍ය හේතු සංවිධානය කළ හැකි වෙනවා. එ සේ නො ලැබුණා නම්, සෑහෙන කලක් ගත කරන්ට වෙනවා. මේ විද්‍යාව පාවිච්චි කිරීම නිසා වැඩය පහසු වෙනවා. බුදු හාමුදුරුවන් ළඟට ගිය අයට තිබුණේ සුළු පුළුවන් කමක් පමණ යි. බුදු හාමුදුරුවෝ ඒ පුද්ගලයන්ගේ ජීවිතය දෙස බලා "මොක ද මනුස්සයෝ ඔය තරම් ප්‍රමාද වුණේ මෙ තැනට ඇවිල්ලා මේ විදියට කරන්න ?" කියා කරුණු පහදා දුන්නා. ඒකට උදාහරණයක් චූලල පන්ථක සිද්ධිය. **චුල්ලපන්ථක** තෙරුන්ට එදා ඒ දේශනාව ඉගැන්වූයේ නැත්නම් චූල්ලපන්ථක අදත් සංසාරේ ගමන් කරනවා.

චූල්ලපන්ථකට කීවේ සුදු පිරිසිදු රෙදි කඩක් අතුල්ලන්ට යි. මේ තරම් සුදට තිබුණු රෙදි කඩ කිලුටු වුණේ කුමක් නිසා ද යන හේතුඵල මේ ඥාණවන්තයාට වැඩි වේලාවක් යන්ට පෙර වැටහුණා. සංසාර ගමන නැවතුණා. ඒක යි ලොව්තුරා බුදු වරුන් පහළ වීමේ භාග්‍යය. ඒ නිසා අපි සතුටු වෙන්ට ඕන. බුදු දහම අදත් තිබෙනවා. උන් වහන්සේගේ ශරීරය නො වෙයි උදව් කළේ. ධර්මය යි උදව්කළේ. ධර්මය තිබෙන නිසා බුදු හාමුදුරුවෝ ඉන්නවා කියා විශ්වාස කරන ලෙස දේශනා කළා.

ධර්මයෙන් කෙරෙන්නේ කුමක් ද කියන එක යි විග්‍රහ කළේ. සත්වයාගේ උපත ආදි දේ ගැන යි මේ කියන්නේ. අපේ සකස් වීම අනුව අප ළඟ තිබෙන කෙලෙස් ප්‍රමාණය වැඩි බව දැනගත්තේ කෙසේ ද? පරමාණුව ඇරල වත්, පරීක්ෂා කරල වත් බලන්න බැහැ. එ සේ නම් කොහොම ද බලන්නේ? පරමාණුවලින් නිකුත් වෙන ස්වරූපය යි අපි මේ හිත යි කියලා පාවිච්චි කරන්නේ. ඒ හිතේ තිබෙනවා නම් හැම දෙයකට ම ඇලෙන ගතිය, එහෙනම් ලෝභය සිතේ තිබෙනවා. දකින දෙය ඕන කරනවා. ලැබුණු දෙය යටිමඩි ගහගෙන කාට වත් නො දී හංගාගෙන ඉන්නවා. ඒ

මච්ඡරියේ (මසුරුකමේ) වේගයක් පෙන්වන්නේ. අභ්‍යන්තරයේ තිබෙන දේ, තිබෙන තත්ත්වය, සිත තුළින් නැතහොත් ජීවිතය තුළින් බලාගන්ට පුළුවනි. ඒක යි බුදු හාමුදුරුවෝ වදාළේ.

මේකෙන් ගැළවීමට තිබෙන මග ලෝභ සිත ආ විට පාවිච්චි නො කර ඉන්න එක යි. එ විට කාන්දම (කාමය) වැඩි වෙන්නේ (චාජ් වෙන්නේ) නැති එක යි වෙන්නේ. හෙමින් - හෙමින් කාන්දම (කාමය) අඩු වෙනවා.

# 03

යම් ශක්තියක් හැදෙන කොට ඒ ශක්තිය ප්‍රබල කරන්ට, දුබල කරන්ට හේතු තිබෙන බව බුදු රජාණන් වහන්සේ **"අස්සුතවා පුථුජ්ජනො"** කියන එකෙන් පෙන්වා වදාළා. පුථුජ්ජන කියන්නේ කෙලෙස් ශක්තිය යි. කෙලෙස් ශක්තිය කියන්නේ කාන්දම වැඩි කම යි. නා නා තරාතිරම්වල නරක සංවිධාන කාන්දමින් නොහොත් කාමයෙන් කෙරෙන නිසා පුථුජ්ජන කීවා.

මේ ලෝකයේ රෞද්‍ර කම සහ කර්කශ කම අඩු කළ හැකි තරංගය සත්පුරුෂ තරංගය යි. ලෞකික ධ්‍යාන, ලෞකික කුසල් යන නම්වලින් හැඳින්වෙන්නේ මෙය යි. ලෞකික කුසල්වල, ලෞකික ධ්‍යානවල තිබෙන්නේ ලෝභ, ද්වේෂ, මෝහ නැති කම යි. ලෝභ, ද්වේෂ, මෝහ නැති සිත් ලෝකයට බාර දෙන විට පරමාණුවක් (රූප කලාපයක්) සකස් වෙන අවස්ථාවට ඒක ක්‍රියා කළ හොත්, ඒකෙන් ලෝකයේ එක්තරා ප්‍රමාණයක සෞම්‍ය තත්ත්වයක් හැදෙනවා. හොඳ සිත් පහළ කිරීමේදී පුද්ගලයෙකුගෙන් සිදු වෙන සේවය සුළු-පටු නො වෙයි. එයා මුළු ලෝකයට ම සේවය කරන කෙනෙක්. **"චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය. බහුජන සුඛාය. ලොකානුකම්පාය"** කියලා කීවේ ඕක යි. දැන් වයසට ගිය හාමුදුරු කෙනෙකුට පුළුවන් ද ඇවිදලා කතා කරන්ට? නමුත්, වයසට ගිය ඒ උත්තමයෙකුගෙන් වෙන සේවය එ නම්, උන් වහන්සේගේ චිත්ත සන්තානයේ සකස් වී තිබෙන ස්වරූපය ලෝභ, ද්වේෂ, මෝහ අයින් වෙලා නම්, උන් වහන්සේ ලෝකය ගැන සිතන්නේ ඉතා ම සෞම්‍ය ස්වරූපයෙන්. ඒ සෞම්‍ය විධියෙන්, මෛත්‍රියෙන් සිතන හැම සිතුවිල්ලක් ම "චරථ" යි. චාරිකා කරනවා. උන් වහන්සේගේ හැසිරීම යි. උන් වහන්සේ හැසිරෙනවා. **"ලොකානුකම්පාය"** කීවේ උන් වහන්සේගේ එම හැසිරීමෙන් ලෝකයට යම් කිසි කම්පනයක් දෙන නිසයි. අර නරකට හැදුණු දේවල් වෙනස් කරන්ට ඒ සිතුවිල්ල ප්‍රබල යි. ලෝකය කම්පනය

කරනවා. අපි ලෝකානුකම්පාව කියන්නේ යමෙකුගේ දුක දැකලා "ඒ මනුස්සයා දුප්පත් මනුස්සයෙක්, අනේ අම්මේ, ඔහුට යහපතක් ම වේවා!" කියන එක යි. ලෝක කියන්නේ පෙරළියට යි. ඒ පෙරළිය සිදුවෙන වේලාවට ඒකත් කම්පනය වෙනවා. කම්පනය වෙලා ඊට වෙනස් විදියකට හැදෙනවා. වෙනස් කිරීම යි ලෝකානුකම්පාව කියන්නේ.

හැදෙමින් පවතින හැම දෙයක් ම බුදු හාමුදුරුවන්ගේ වචනයෙන් හඳුන්වන්නේ ලෝක නාමයෙනුයි. යම් තැනැත්තෙක් (භික්ෂුවක්) මුල්ලකට වෙලා ඉඳගෙන සෞම්‍ය තරංග සිතෙන් නිකුත් කරමින් පෙරළිය (ලෝකය) කම්පනය කරනවා. එ විට ඒ කම්පනය නිසා හැදෙන ශක්තිය ලෝකයේ හැම දෙයක් ම වෙනස් කරනවා. එයින් ගහක් හැදුණොත් ඒ ගහ බොහොම සශ්‍රීක යි. එයින් මොන වස්තුව හැදුවත් ඒකෙන් වැදගත් ශක්තියක් දෙන අයිතියක් සංවිධානය වෙනවා. බුදු රජාණන් වහන්සේ භික්ෂුවට කීවේ "හැසිරීමේ සියල්ල ම - යාම්, ඊම්, කතා කිරීම් වැනි සියලු ම දේ-ලෝකයේ වස්තු කම්පනය කරන්ට පුළුවන් විධියට හදපන්" කියන එක යි. එ විට පේනවා නේ බුදු හාමුදුරුවන් පුත්තු හදලා තිබෙන්නේ පොඩි වැඩකට නො වෙන බව? "අරිය" කියන්නේ ලෝභ, ද්වේෂ, මෝහ අයින් කළ සිත යි. සත්පුරුෂ කියන්නේ හොඳ යහපත් ක්‍රියා කරන මානසික තත්ත්වයට යි. ඊට වඩා ශ්‍රේෂ්ඨ යි අරිය මට්ටම. ඊට වඩා ගම්භීර යි. ඒකේ රාග, ව්‍යාපාද, ථීන මිද්ධ නැහැ. අරිය සිතෙන් නිකුත් කරන තරංගය අරකට වඩා (සත්පුරුෂ තරංගයට වඩා) ප්‍රබල විධියට අර ශක්තිවල ක්‍රියා කාරීත්වය වෙනස් කරනවා. මේ අරිය තරංගයත්, සත්පුරුෂ තරංගයත් සම්බන්ධ නො වූ විට, සෞම්‍යත්වයෙන් තොර ශක්තියක් නිෂ්පාදනය කරන පරමාණුවකුයි (රූප කලාපයකුයි) ගොඩ නැගෙන්නේ. ඒ බව හොඳට පැහැදිලි වෙනවා ඇති.

ඊට පසු පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන මහා භූත රූප පිළිබඳව යි කතා කරන්නේ. ලෝකය පාලනය කරන, ලෝකයේ සියලු දේවල ආධිපත්‍යය දරන ධාතු හතරට යි අපි පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන නම් කියන්නේ. රූප කලාපයක හැදුණු පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන ශක්ති යි අපේ ජීවිතයේ අපි පරිහරණය කරන්නේ. අපේ සිරුර රූප කලාප

පොදියක් නැත්නම් පරමාණු පොදියක්. රූප කලාප යනු **රූප්පණ ගොඩ** කියලා බුදු හාමුදුරුවෝ දේශනා කොට වදාළා. රූප්පණ (රූප) ගොඩ සකස් වීම අපි වර්තමානයේ බෙදා වෙන් කොට පෙන්නුවා ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන සහ නියුට්‍රෝන කියලා ප්‍රධාන වර්ග තුනකින්. ඉලෙක්ට්‍රෝනයක් ප්‍රෝටෝනය කරා එන විට, මේ ගමනේ තිබුණ ඉලෙක්ට්‍රෝනය ප්‍රෝටෝනයේ පීඩාවට අසු වූ හැටියේ වහා මේ ප්‍රෝටෝනය කරා ගමන් කරන්ට ඕන. ඒකත් ඒ ශක්තියේ ස්වභාවය යි. ඉලෙක්ට්‍රෝනයත්, ප්‍රෝටෝනයත් එක්තරා දුර ප්‍රමාණයකින් භ්‍රමණය විය හැකි තත්ත්වයක නො සිටිය හොත් එතන පරමාණුවක් නැහැ. භ්‍රමණය වෙන්ට බැහැ මේ දෙක එකට ඇලුණොත්. එක්තරා දුර ප්‍රමාණයක ඒ පරමාණුව රැඳුණේ කොහොම ද කියා බලමු.

මේ පොළොව සූර්යයාට මෙ පමණ දුර ප්‍රමාණයක් ඇතිව යි වටේ භ්‍රමණය වෙන්නේ. අපිට හිතෙන්ට පුළුවන් ඇයි පොළොව ගිහින් සූර්යයාගේ ඇලුණේ නැත්තේ කියලා. ඇලුණේ නැත්තේ යන්ට බැරි නිසයි. යන්ට බැරිකම හැදුණේ කුමක් නිසා ද යන්න බුදු හාමුදුරුවෝ පෙන්වනවා. **"පඨවිං පඨවිතො සංජානාති"** කියලා. ඒ සංජානනය කියන්නේ ඒ තද තත්ත්වය දැන ගත්තා කියන එක යි. තද තත්ත්වය දැන ගත්තා නම් එහෙම දැනගන්න මනුස්සයෙක් හෝ මොකෙක් හෝ ඉන්ට ඕනැ යි කියලා සිතෙන්ට පුළුවනි. එහෙත්, එතන එහෙම කිසි ම සත්ත්වයෙක් නැහැ. එතන තිබෙන්නේ එක වස්තුවක් තවත් වස්තුවක් සමඟ සම්බන්ධ වෙන්ට එන එක පමණ යි. අර කිසිවක් දන්නේ නැහැ. ඉලෙක්ට්‍රෝන්, ප්‍රෝටෝන්, දෙකක් තියෙන තැන අරයා එන විට මෙයාට සම්බන්ධ වීමට නො දී යම් තැනකදී ඒක නවත්වන්ට වෙනවා. නියුට්‍රෝනය විසින් දෙන බලපෑම උඩ ඒ සීමාවෙන් එන්ට දෙන්නේ නැහැ. ඒ එන්ට දෙන්නේ නැති තැන එය නවතිනවා. ඒ නැවතුණු තැන බුදු හාමුදුරුවෝ පෙන්වන්නේ පඨවිං **පඨවිතො සංජානාති** යනුවෙනි. දැන් ඒ සුළිය හිර වුණා කියලා ඒකට දැනුණු තැන යි නැවතුණේ. දැනෙන කල් නවතින්නේ නැහැ. ගලක් අහසට ගැහුවම ගල යනවා. ගිහිල්ලා වේගය අඩු වුණා ය කියලා ගලට තේරුණාට පසුව යි නවතින්නේ. තේරුණ යි කියන්නේ කුමක් ද? දුන්නු වේගය අඩුවෙන කොට ආපසු හැරිල්ල යි මෙ තැන දැන ගත්තා කියන්නේ. ඒ දැන ගැනීමට පුද්ගලයෙක් නැහැ. කෘත්‍ය ස්වරූපයක්

පමණ යි. ක්‍රියා ස්වරූපවලින් සිදු වෙන එක දැනීම කියලා කියනවා. අපට නම් සිතක් තිබෙන නිසා දැනෙනවා කියලා ගත්තා. අපේ දැනීමත් ගලේ දැනීමත් දෙක ම එක ස්වරූපය යි.

දැන් අපි කොහේ හරි යන්ට යනකොට කවුරු හරි මෝනවා හෝ ඇහිඳිනවා. එතකොට අපේ ගමන නවතිනවා. එයා දන්නේ නැහැ අරයා ඇහින්දේ මොකක් ද කියලා. නමුත්, මෙයාගේ ඇතුළෙන් "යකෙක් ද දන්නේ නැහැ" යන හැඟීම එන විට එයාට කකුල උස්සන්ටත් බැහැ. අර ධර්මයේ බලපෑම යි ඒ. යකා ය කියන පරණ හැඟීමක් බල පෑ නිසා යන්ට බැරි කම ඇති වුණා. හිරකළා. ඒ හිරකළ හැටියේ එයා කියන්නේ මම නැවතුණා කියලා. නමුත්, අර යකාගේ සංඥාව නොතිබුණු කෙනෙක් නම් මිනිහා යන්නෙත් යකා වගේ. නවත්වන්ට එකක් නැති නිසයි එහෙම වුණේ. ඒකෙත් අපෙත් න්‍යාය දෙක ම එක යි. අපි භාෂාවෙන් අයිතියක් කරගෙන ඉන්න එක යි අපට වැරදිලා තියෙන්නේ. අනුන්ගේ දෙයක්, අනුන්ගේ ක්‍රියා පිළිවෙලක් "මෙහෙ දියන්" කියලා බාර ගත්තා. දැන් තෝරා ගන්ට පිළිවෙලක් නැති ව වට පිට බලනවා. නොයෙක් ප්‍රශ්න! ඒක ඒකට ම බාර දෙන්ට පුළුවන් නම් එදාට යි රහත් වෙන්නේ. සියල්ල බාර දෙනවා. කවුරුත් නෑ. කරන්නෙක් නැහැ. එහෙම හිතන්ට බැරි ඒකට ඉඩ නො දෙන ශක්තියක් අප ළඟ තිබෙන නිසා. ඒ ශක්තිය කාන්දම යි. කාමය යි. හැම අවස්ථාවක ම මෙහාට ගන්න, මෙහාට අදින, ශක්තියක් අප ළඟ වැඩ කරන නිසා ඒ ශක්තියට අනුකූලව යි අපේ ප්‍රකාශ කෙරෙන්නේ. ඒ ශක්තිය විසින් ඒ ප්‍රකාශය කරනවා "මටත් ඕන" යනුවෙන්. මට නො වෙයි ඕන. ඒකට යි ඕන. නමුත්, මමෙකුත් ඒ තුළ හේත්තු කරලා මට යි ඕන කියලා කියන නැති දේකුත් එතනට ඇදලා තියෙනවා. **"පඨවිං පඨවිතො සංජානාති"** කීවේ අර විධියේ බලපෑම නිසා ඒක එ තැන නැවතුණා. නැවතුණා කීවාම බුදු හාමුදුරුවෝ එතැනින් නැවැත්තුවේ නෑ. ඒක යි බුදු හාමුදුරුවෝ **"ස්වාක්ඛාතො භගවතා ධම්මො"** යන පදයෙන් වදාළේ.

උන් වහන්සේ ඊළඟට වදාළා **"පඨවිං පඨවිතො සඤ්ඤත්වා පඨවිං මඤ්ඤති"** යනුවෙන්. මඤ්ඤති කියන්නේ හඟිනවා කියන එක. හඟිනවා කියන්නේ එහාට යන්ටත් බැරි ව, මෙහාට යන්ටත් බැරි ව සිතුවිලි පැවතුණු වෙලාවට එහෙම ම එයා ඉන්නවා. මේ

ක්‍රියාවේ හිමි කාරයෙක් නැහැ. ඒ ක්‍රියාව කිරීමට වූ හේතු විසින් ඒවා කරනවා. දැන් අපි යම් යම් දේවලට භය වෙනවා. භය වෙන්නේ ඒ භය කරන හේතූන් අපේ ළඟ සකස් වෙලා තිබෙන නිසයි. ඒ සකස් වූ හේතුවල ශක්ති සිතට සම්බන්ධ වෙන කොට භයෙයි කියන එකක් එයාට දැනෙනවා. යමෙකුට ඔහේ ඉන්න වෙලාවට කටින් කියන්නේ නැති ව යම් සංඥාවක් පෙන්නුවොත් භය වෙනවා. හරියට ස්ථිර ව නො දන්නා දෙයට යි භය යි කියන්නේ. ස්ථිර ව නො දන්නා කම ආ හැටියේ එයා හෙලවීමක් නැහැ. ඒ වගේ අර ශක්තියකුත් තමාට එහාට යන්ටත් බැරි ආපසු එන්ටත් බැරි තත්ත්වයක් ආ හැටියේ එ තැන ඉඳගෙන එ තැන නැවතිලා මේ තදවීම සිදු වෙලා. ඒ ආකාරයෙන් බාර ගෙන යි. බාර ගන්නවා කියන්නේ ඒකට අවනත වෙලා. බුදු හාමුදුරුවෝ ඔය තරම් ගම්භීර ව දේශනා කළා. බුදු හාමුදුරුවෝ දේශනා කළේ සාමාන්‍ය අයට පමණක් නො වෙයි. ලෝකයේ මහා විශාරදයෝ හිටියා. නොයෙකුත් පඬිවරු හිටියා. සමහරු හිටියා මිනී කට්ටට කිට්ටු කරලා එයා ඉපදුණෙ අහවල් දිහාවේ ය කියා කියන්ට පුළුවන් කම තියෙන අය. ඒ විධියේ අයට යි බුදු හාමුදුරුවන්ට දේශනා කර වදාරන්ට වුණේ. ඒ අයගෙනුත් කිසි කෙනෙකුට කතා නො කරන්ට යි බුදු හාමුදුරුවෝ අදහස් දුන්නේ. ඒ නිසා, මේ ආකාරයෙන් තිතෙන්-තිතට කියන්ට සිද්ධ වුණා.

**ධම්මො හවෙ රක්ඛති ධම්ම චාරී** කීවේ හැම එකක ම දැරීම් ස්වරූපයක බලපෑමක් තිබෙන නිසයි. ඉන් එහා කිසිවක් නැහැ. මොන ම අයිතියක් වත් නැති ව දැරීමක බලපෑම අනුව ඒවා සිද්ධ වෙනවා. ඊළඟට පෙන්වන්නේ "**පඨවියා මඤ්ඤති පඨවිතො මඤ්ඤති පඨවිං මෙති මඤ්ඤති පඨවිං අභිනන්දති**" යනුවෙනි. දැන් තිබෙන්නේ තදවීම යි. තදවීමට තිබෙන හේතු විසින් තද කළා. ඒ නිසා, තදවීමේ ප්‍රමාණය වැඩි වුණා. තද වීමට තිබෙන හේතු ඉවත් කළා නම් තදවීමේ ප්‍රමාණය වැඩි වෙන්නේ නැහැ. හේතු එකතු වෙලා තද වුණා මිස එයා තද වුණේ නැහැ. ඒ නිසා, මම තදවීමෙන් අයින් වූ කෙනෙක්. ඇදෙන ශක්තිය ඇදෙන්ට එන කොට වෙන ශක්තියක බලපෑමෙන් තදවීම නැවතුණා. එකක තියෙනවා අදින ශක්තිය. තව එකක තිබෙනවා ඇදෙන ශක්තිය. තව එකක අතරතුරට ඉදිරිපත් වීමේ ශක්තිය. තුන් දෙනාගේ

ශක්ති තුනෙන් සියල්ල ම කරන්නේ. නිදසුනක් ගතිතොත් තරුණයෙක් තරුණියක් සමඟ විවාහ වෙන්ට සිතනවා. තරුණිය ඇදෙන වස්තුවක්. තරුණයා ඇදගන්ට හදන වස්තුවක්. ඒ අතරතුරට තාත්තා ඉදිරිපත් වෙනවා. තාත්තා උපමා කළ හැක්කේ නියුට්‍රෝනයට යි. තාත්තා කියනවා "මාත් එක්ක නටන්ට එන්ට එපා." කියල. ඒ නිසා, දෙ දෙනා දෙ පැත්තේ ඉන්නවා මිස එකතු වෙන්ට ලැබුණේ නැහැ.

මා නො වෙයි හිර වුණේ. මාව හිර කළා. අපි මේ ගැන වටහා ගැනීමට හිතන්ට ඕන ඔය විදියට යි. ඔය අනුසාරයෙන් අපගේ ජීවිත අප වටහා ගත හොත් අප විඳින මේ එක දුකක් වත් අපි විඳින්ට ඕන ඒවා නො වෙයි. ගෙදර කරදර, තමාගේ කරදර, නොයෙක් කරදර, මේ එකකට වත් අප දුක් විඳිය යුතු නැහැ. අපි ඒවායින් බැහැර වූ අය. නමුත්, කුමක් නිසා ද මේ හිරවිල්ල? හිර කරන හේතු එක්ක යි බැඳිලා තියෙන්නේ. හිර කරන හේතු ඇතුළට ඉලෙක්ට්‍රෝනය ආවා වගේ අපිත් රිංගලා තිබෙනවා හිර කරන සිතුවිලි තුළට. ඒ නිසා, හිර නො වී බැහැ. දැන් යම් කිසි කෙනෙක් කෙඳිරි ගානවා. කරදර යි. හැම අපහසුවක් ම තිබෙනවා. ඒ නිසා හිරවෙලා. ඉලෙක්ට්‍රෝනය ගිහින් ප්‍රෝටෝනයට හිරවෙලා. දැන් එ තැන ලැගගෙන ඉන්ට ඕන. එතකොට ඒ මෙතන පෙන්වන්නේ මොකක් ද? අවිඤ්ඤාණක වස්තුවක් හෝ වේවා, සවිඤ්ඤාණක වස්තුවක් හෝ වේවා, ඒ වස්තුවේ ස්වභාවය යි. අවිඤ්ඤාණක වස්තුවට හිතන්ට බැහැ. සවිඤ්ඤාණක වස්තුවට ඒ වස්තුවේ ස්වභාවය හිතා ගැනීමට සම්පූර්ණ කරුණු මූල ධාතුවල තිබෙන ඉගැන්වීමෙ දෙනවා. මූල ධාතුවට වෙන්නේත් ඕක යි. ඒ ධාතුවලින් හැදෙන වස්තුවටත් වෙන්නේ ඒක යි. ඒ වස්තුව තවත් වස්තුවක් වෙත යන කොට ඒ වස්තුවට පුළුවන් කම තියෙනවා එයාගේ අයිතිය පාවිච්චි කරන්ට. නමුත්, බලපෑම්වලට යට වුණාම අයිතිය පවත්වන්ට බැහැ. ඒ බලපෑම්වලට යටවෙන තත්ත්වය තියෙන කල් පමණ යි ඒක වෙන්නේ.

ඊළඟට **"පඨවිං මෙති මඤ්ඤති"** දැන් මා ඉන්නේ පඨවියෙහි. දැන් මගේ අයිතිය තද වූ එකක්. කො පමණ මා වෙන් කළත් නැතත් හේතු එකතු වුණාට පසුව තද වෙනවා. මා කැමති නැහැ මේ කරදරවලට වැටෙන්ට. නමුත්, හේතු විසින් මාව මෙතෙන්ට

දාල තියෙනවා. එ සේ වූ නිසා මා දැන් කරදර විඳින කෙනෙක්. මේ අන්දමට සිතන විට මිනිසා තල්ලු වෙන්නේ කොතෙන්ට ද? මිනිසාව දානවා බුදු හාමුදුරුවෝ හේතු-ඵල න්‍යායයට. හේතු-ඵල න්‍යායය ගැන හිතලා ඒ න්‍යායය යටතේ තමාගේ නිදහස මතුකරනවා. ඒක මිනිසාට පුළුවන්. අප්‍රාණික වස්තුවකට බැහැ. අපට සවිඤ්ඤාණක ශක්තියක් තිබෙනවා. ඒක නිසා පුළුවන් මේවා ගැන සොයලා අපේ තියෙන ප්‍රශ්නය විසඳන්ට. මේවා තුළින් ගන්ට කරුණු බුදු හාමුදුරුවෝ දේශනාන කර වදාළා. **"පඨවිං මෙති"** කීවේ කොහොම මා නිදහස් කෙනෙක් වුණත් හේතු සහිත ව සිදු වුණු දේට මම මැදි වෙලා. ඒ නිසා, මා හිර වූ කෙනෙක්. ඒ නිසා, **පඨවිං අභිනන්දති.** ඒ කුමක් ගැන ද කථා කරන්නේ? පරමාණුවක් හැදීමේ ආරම්භයේදී ඒක සුළු අංශුවක් පමණ පොඩි කොටසක්. ඒ ශක්තිය ඵ තැන නැවතුණේ කොහොම ද කියලා කියන්ට යි මෙය වදාළේ. ඇලෙන හේතු වැඩ කරන තුරු අභිනන්දනය තිබෙන්ට නොහොත් නැවත නැවත ඇලෙමින් පවතින්ට ඕනැ යි කියන එකට යි.

ශක්තියක් කියන එක "සූ" ගාලා කරාමය ඇරිය වගේ දිගට ම හිටින්නේ නැහැ. ශක්තියක ස්වරූප ඇති වෙනවා. පවතිනවා, වැඩ කරනවා, නැති වෙනවා. උප්පාද, ඨිති, භංග කියන ඒවා හැම ක්‍රියාවකට ම අයිති යි. ශක්ති යි ක්‍රියා කරන්නේ. ශරීරය තුළ හැම තැන ම ඇති පරමාණු නිසා ඒවා ක්‍රියාකාරීත්වයෙන් රත්වෙනවා. ලිප උඩ ඉන්නවා වගෙ යි. කකුළ රත්වුණා. ඉස්සුවා. රත්වීම අනුව දහලනවා. රූකඩ නටනවා වගෙ යි. අභිනන්දනයෙන් පෙන්වනවා නිරතුරු ව ම නිදහස් වීමට ඉඩක් තියෙන බව. අරයා ශක්තිය යවනවා මෙයාව නවත්වන්ට. මෙයා ශක්තිය· එවනවා නැවතිලා ඉන්ට. අනිත් කෙනා යවනවා ශක්තිය තල්ලු කරන්ට. මේ තුන් දෙනාගේ ම ශක්තිය "සූ" ගාලා වැඩ කරනවා නො වෙයි. ඔය කියාපු විදියට වැඩ කරන එකක්. ඒ නිසා, ඒකට කියනවා කාම කියල. පඨවිය තියෙනවා. අභිනන්දනයක් තියෙනවා. නැවත නැවත ඇලීමක් තියෙනවා. මේ අනුසාරයෙන් අපගේ ජීවිතයෙන් යමක් මොන කරුණකට හෝ බැඳී පවතිනවා නම්, ශක්තිය අපහට තියෙනවා නම්, අපි කියන්නේ බැඳී පවතිනවා කියා.

මේ නීතිය යටතේ බැඳී පවතිනවා නො වෙයි. නිතර නිතර බැඳෙනවා. ඒක හිතනවා. බන්දවනවා. එක එක හිත, හිත අඳින කොට ඒකේ අංශකය වැඩි වෙනවා. ඒකේ හොඳ වර්ණය, හැඩය, ආස්වාදය මේවා සියල්ල ම සිතමින් අරකට අලවනවා. පුද්ගලයෙකු පිළිබඳ ව තිබුණු ඇලීම එයා පිළිබඳ ව හිත - හිතා ඉන්න වේලාවක හදිසියෙන් පිටිපස්සෙන් මොකක් හරි "සරාස්" ගාලා ශබ්දයක් ආවොත් ඊළඟට ඇලීම ඉවර යි. මොකක් ද කියලා පිටිපස්ස බලනවා. දැන් ඇලිලා තියෙන්නේ මොකට ද? දැන් ඇලිලා තියෙන්නේ අරකෙන් බේරීමේ හැඟීම එක්ක යි. එයින් පසු ව නැවතත් අර කරුණු දදා ඇලි-ඇලී ඉන්න එකට කියනවා අභිනන්දනය කියලා. අභිනන්දනය ඒකේ ඇති සුළු දෙයක්. ඒක පුංචි ධාතු ශක්තියක්. අපේ ළඟ තිබෙන ඇලීම් තත්ත්වය ඔකෙන් තේරුම් ගන්ට ඕන. "අනේ! මේවට ඇලිලා තියෙනවා. නිදහස් වෙන්ට බැහැ" කියලා කතාවක් තියෙනවා. නමුත්, අපට පෙනෙන්ට ඕන නිදහස් වෙන්ට පුළුවන් බව. ඇලෙන්ට තිබෙන හේතු නො සිතා ඉඳීම පිණිස නො ඇලීමට ඇති හේතු ඒකට දාපු හැටියේ නො ඇලීම ඇති වුණා. බාහිර ලෝකය අතහැර දාලා අපේ ජීවිතය ගැන බැලුවොත් හැම වෙලාවෙ ම අපේ පැවැත්ම ගැන අභිනන්දනයක් තියෙනවා. නැවත නැවත පවත්වන්ට ඕනැ යි කියන හැඟීම් රාශියක් වැඩ කරනවා. ඒ හැඟීම් රාශිය අපට එන්නේ වෙන බලපෑමකින්. ඒ බලපෑම කුමක් ද? මේ ලෝකයේ තිබෙන රූප, ශබ්ද ආදි දේවලින් යම්කිසි කෘත්‍යයක් - රසාස්වාදයක් ලබන්ට පුළුවන් කියන බලපෑම යි. ඒ බලපෑම උඩ ජීවිතයට ඇලි-ඇලී තියෙනවා.

පිළිගත හැකි හේතු නිසා යම්කිසි දවසක වැටහුණ හොත් "මේ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ තුළින් මොන ම විදියේ හෝ ආස්වාදයක් විඳින්ට බැහැ. ඕන නම් කරදර විඳින්ට පුළුවන්. හැම එකක් ම කරදරයට යි තුඩුදීලා තිබෙන්නේ" කියලා, මේ විදියට අර ශක්ති කැඩෙන තුරු හේතු හිතන්ට ඕන. එ විට අර බලපෑම නැති වෙනවා. අර ශක්තිය නැති වුණාට පස්සේ ජීවිතයට තිබෙන ආශාව සම්පූර්ණයෙන් ම අයින් වෙනවා. ලොවුතුරා සම්මා සම්බුදුවරු ඒ බුද්ධත්වයට පත්වීමට පෙරුම් පුරන බෝධිසත්ත්ව කාලයේ ජීවිතයට ආශා නැති ව හිටිය ද? බෝධිසත්ත්ව වරු ජීවිතයට ආශා කම නිසයි දුක් නැති තත්ත්වයක් සෙව්වේ, ජීවත්

වෙමින් සැප විඳින්ට. නමුත්, ජීවත් වීම ම දුකක් කියලා දැනගත්තාට පස්සේ ජීවිතයෙන් සැප හොයන බලපෑම එහෙන් මෙහෙන් ගැලවෙන්ට පටන් ගත්තා. ඊට පස්සේ කවදා වත් නො විඳපු සතුටක් භුක්ති වින්දා.

කෑම රස කරන්ට සමහරු හැම දෙයකට ම තක්කාලි දානවා. කෑම රස වුණාට තක්කාලි නිසා මුත්‍ර අමාරු යි නොයෙකුත් රෝග යි සියල්ල හැදෙනවා. ඒ වගේ, අපිත් හැම දෙයකින් ම රස විඳින්ට ඕනැ යි කියන හැඟීම සිතට දාලා තිබෙනවා. අර දර්ශනය, නර්තනය ආදි සියල්ල සැප විඳින ඒවාය යි සිතලා ඒවායින් සැප සොයනවා. මේවා විශ්ලේෂණය කරලා තේරුම් ගත් හැටියේ රස සෙවිල්ල එපා වෙනවා. අභිනන්දනය නැති වෙනවා. අප ළඟ තවම තිබෙන්නේ අභිනන්දනය යි.

බුදු හාමුදුරුවෝ ඊළඟට වදාරණවා **"පරිඤ්ඤෙය්‍යං පරිඤ්ඤාතං"** යන කරුණු දෙක. මේකෙන් අදහස් වෙන්නේ මොකක් ද? පිරිසිදු ව දැනීම යි. පිරිසිදු ව දැනීම යි කීවේ පරමාණුව (රූප කලාපය) හැදෙන කොට ඒවා බන්ධනය කරන ශක්තිවලට ඉඩ නො දුන්නොත් මේ තරම් කිට්ටු වෙලා හැදෙන්නේ නැහැ. සත්පුරුෂ තරංගයේ හෝ අරිය තරංගයේ සම්බන්ධතාවය ඇති වුව හොත් ඒවා කර්කශ විධියට හැදෙන්නේ නැහැ. බුදු හාමුදුරුවෝ අපට පෙන්වා දුන්නේ අපගේ ජීවිතයේ සකස් වෙන පරමාණුවල නැත්නම් රූප කලාපවල සම්බන්ධතාවයෙන් කර්කශ ගති ඇත් කිරීම සඳහා හොඳ අදහස් සකස් කරන්ට යි. හොඳ අදහසින් වෙන්නේ මොකක් ද? නරකට හැදුණු පරමාණු බිඳ හෙළනවා. ඊළඟට හැදෙන පරමාණු අරීට වඩා වැදගත් විදියට හොඳ පිළිවෙලට හැදෙනවා. පරමාණුවල පරතරය වැඩි වෙන්ට යි ක්‍රියා කළ යුත්තේ. එ විට අවකාශ ධාතුව ඇති වෙනවා. කිට්ටු වෙන්ට - කිට්ටු වෙන්ට රත්වීම වැඩි යි. ඈත් වෙන්ට - ඈත් වෙන්ට රත්වීම අඩු යි. කාන්දම් නො හැදෙන මට්ටමට ම රත්වීම අඩු කළා. එ විට කාන්දම හැදෙන්ට අවශ්‍ය රත්වීම නැති නිසා කාන්දම් නිෂ්පාදනය වෙන්නේ නැහැ. මුළු සිරුරේ ම තිබෙන්නේ ඒ පරමාණු යි. ඒ නිසා, රහතන් වහන්සේට, කලින් සිතපු සිතුවිලි දැන් සිතන්ට බැහැ. අර ධර්ම ස්වරූපයට අනුව යි සිතුවිලි පහළ වෙන්නේ.

මේ කාන්දම් නැති කරන තේජස නිපදවන්ට පුළුවන් වෙන්නේ දැනීම තිබෙන වස්තුවලට පමණ යි. ඒ නිසා, අපි දැන් දනිමින් ඒක කරනවා. පොල් ගහට බැහැ ඒක කරන්ට. ඒ නිසා, පොල් ගහ පොල් ගහම යි. පොල්ගහට රහත් වෙන්ට බැරි ඒක යි. නැති වෙනදා ට ඔය සියල්ල නැති වෙලා ලෝකෙ හැදෙන දාට පොල්වල රසායන ධාතුව යම් තැනකට එකතු වුණා නම් අන්න එදාට එතන පොල්.

# 04

**ආපං ආපතො සඤ්ජානාති** - ආපෝ යනුවෙන් අපට උගන්වා තිබෙන්නේ වතුර යි. වතුරේ ආපෝ ලක්ෂණ තිබෙනවා. නමුත්, වතුර ආපෝ නො වෙයි. "ආප" කියන්නේ ධර්ම ස්වරූපයක් මිස ද්‍රව්‍යයක් නො වෙයි. පඨවි කියා දෙයක් නැහැ. ඒ වෙලාවේ ඒ සිද්ධිය වෙලා තිබෙන හැටියට ඒකේ දැනෙන්නේ තද ගතිය. නමුත්, ඒක තදවෙලා ම තියෙනවා ය කියන්ට බැහැ. ආපෝ කියන්නෙත් නිතර පවතින දෙයක් නො වෙයි. ආපෝ කීවේ නිදහස. ක්‍රියාවක් කිරීමට තිබෙන නිදහසට කීවා ආපෝ කියලා. ඒ කියන්නේ බුරුල නැත්නම් නිදහස. මෙ තැනදී ආපෝ කතාව එන්ට තිබෙන හේතුව කුමක් ද? අර වස්තුව මේ වස්තුව සමග සම්බන්ධ වෙන වෙලාවේ ඒ වස්තුවට යන්ට බැරි කම නිසා එ තැන තද බව දැනුණා. එය පඨවි යි. ඒක ඒකට සම්බන්ධ වුණත් ඒක වටා ගමන් කිරීමට නිදහසක් තියෙනවා. ගමන් කිරීමට තිබුණ රීතිය බුදු හාමුදුරුවෝ පෙන්වා වදාළා. යම්කිසි ශක්තියක් නිෂ්පාදනය කිරීමට එයට ලැබුණු නිදහස යි මෙ තැන බලපාන්නේ. ඕනෑ ම තැනක ධර්මයක් හැදෙන්ට නිදහස තිබෙන්ට ඕන. නිදසුනක් ගෙන බලමු. රජ පවුලක ඉන්න කුමාරිකාවක් හිඟන්නෙකුට මුණ ගැසුණා. ඒ හිඟන්නාට කුමාරිකාව දැක්කට කවදා වත් හිතක් එන්නේ නැහැ ඒ කුමාරිකාව සමග විවාහ වෙන්ට. ඒකට නිදහසක්, ඉඩකඩක්, නැති බව දන්නවා. හිඟන්නියක් දැක්ක නම් එයාට ඒ වගේ අදහසක් එන්ට පුළුවනි. ඉඩ කියන්නේ - නිදහස කියන්නේ ඕකට යි.

හැම දෙයකට ම වරදෙ බැඳෙන්ට හෝ නිවරද වීමට හෝ යන මේ ධර්ම දෙකට ම නිදහස තියෙන්ට ඕන. අපි අපව සම්මත කරගෙන තිබෙනවා මිනිසුන් වශයෙන්. නමුත්, ඒ සියල්ල ම ද්‍රව්‍ය, ශක්ති කියන දෙකක්. මිනිසා කියන්නෙත් ද්‍රව්‍යයක් ශක්තියකින් පාලනය කිරීමට යි. ද්‍රව්‍ය-ශක්ති දෙක යි ලෝකයේ තිබෙන්නේ.

ඒ දෙක විසින් නිර්මාණය කරන ලද වස්තූන්ට අර සතා, මේ මිනිහා, මේ ගල, මේ ද්‍රව යනුවෙන් නම් කරගෙන තිබෙනවා. මේ සියල්ල මොනව ද? ශක්තියකුයි ද්‍රව්‍යයකුයි සම්බන්ධ වෙලා නිරූපණය කරන ඒවා වෙන වෙන නම් වලින් හඳුන්වා දී තිබෙනවා. ක්‍රියාවල හැටියට යි නම් දී තිබෙන්නේ. නමුත්, ඔක්කොම එකට බෙදුවොත් අර බුදු හාමුදුරුවන්ගේ නිගමනය හැර වෙන කිසිවක් ඉතිරි වෙන්නේ නැහැ.

යමක් කැරකෙන්ට තිබෙන නිදහසට කීවා "ආපො" කියලා. ඒ කියන නිදහස දැනෙන්නේ භ්‍රමණය වෙන වස්තුවට යි. දැනෙනව යි කීවාම කල්පනා කරලා බලා තීරණයක් ගන්ට ඒකට හිතක් නැහැ. ඒක දැනෙන නිසා යි කරකැවෙන්නේ. කරකැවෙන නිසයි දැනුණා කියන්නේ. හැම තැන ම නිදහසට යි "ආප" කියන්නේ. දැන් මෙතන පෙන්වන්නේ අර ශක්තිය හැදීමට එයාගෙන් සිදුවෙන ක්‍රියාව. බුදු හාමුදුරුවෝ වදාළා **"ආපං ආපතො සංජානාති"** කියලා. කැරකෙන්ට වස්තුවට නිදහස තියෙන නිසා එහාට ඇදෙන්ටත් බැහැ. ආපසු ඇදිලා යන්ටත් බැහැ. එ තැන විරුද්ධත්වයක් ඇති වෙනවා. එ තැන හිරවුණා. නමුත් හරහට තියෙනවා නිදහස. ඒ යම්කිසි අවහිරයක්. මේක සුළියක් නිසා ඒක කරකැවෙනවා. ඒ කරකැවීම භ්‍රමණයක් වෙනවා. රෝදයක් කැරකෙන නිසා නේ රෝදයට යන්ට පුළුවන් වෙන්නේ?. රෝදයක් ඇදන් යන්නේ නැහැ. රෝදය යන්ට පාර තිබෙන්නේ රවුමේ. ඒක නිසා ඒකේ ස්වභාවය තිබෙන්නේ බැමරීමට - රවුමේ ගමන් කිරීමට. භ්‍රමණය වෙන වස්තුවේ ඒ හැම බැමරීමක් පාසා ම කීවා **පඨවිං අභිනන්දති** කියලා. ඊළඟට ආපෝවලත් තියෙනවා අභිනන්දනයක්. මේ අභිනන්දනය කියන්නේ මොකක් ද? යම් ඇලීමක් තිබුණා ද ඒ ඇලීම එන්ඩ එන්ඩ ම තද වෙන එක යි අභිනන්දනය. අර බුරුල, නිදහස ඒ වටා ගමන් කරන්ට තිබෙන නිදහස. එන්ට එන්ට ම ගමන් කිරීමට නිදහස එයාට හම්බ වෙලා තිබෙනවා. ගමන් කිරීමේ නිදහස වැඩි වෙන බව යි ආපෝ කීවේ. ඒකෙන් අදහස් වෙන්නේ කුමක් ද? ඒ හැම බැමරීමක් පාසා ම වේගය වැඩි වෙනවා මිසක් අඩු වෙන්නේ නැහැ.

පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන භූත අපගේ ජීවිතයට සම්බන්ධ කරල යි විග්‍රහ කරන්නේ. ඒවා දැන ගැනීමෙන් අපට, අපගේ ජීවිතයට යම්කිසි අනර්ථයක් වෙන්ට එන විට ම එයින්

ප්‍රයෝජනයක් ලබා ගත හැකි වෙනවා මේ විග්‍රහය දැන ගැනීම නිසා. ජීවිතයට මෙයින් ප්‍රයෝජනයක් නැත්නම් ඒ විග්‍රහයෙන් පලක් නැහැ. යමක් දැක්ක හැටියේ ඒක ම බලමින් ඉන්න නිසයි අභිනන්දනය ඇති වෙන්නේ. බලමින් ඉන්න විට, යම් යම් විසිතුරු සහිත හැඟීම් පහළ වෙනවා. දැක්ක එකේ හොඳ හෝ නරක හෝ ගුණ හෝ අගුණ හෝ කිසිවක් සොයන්නේ නැති ව ඉන්න කොට, එයා එතන ඉන්ට ඕන නැහැ. බලාගෙන ඉන්ට වෙන්නේ නැහැ. ඒක නිසා ඇහැ අහකට ගන්නවා. අපිට මේ ළඟ සම්බන්ධය ඇති වෙල යි අභිනන්දනය උපදින්නේ. බලා ඉන්ට නිදහස තියෙන නිසා නිමිත්ත සමඟ සිත වැඩ කරන්ට නිදහස තිබෙනවා. යම්කිසි විධියකින් අනික් පක්ෂයේ කෙනෙක් දෙස බලාගෙන ඉන්න කොට "අනික් අය මා දෙස බලනව ද දන්නේ නැහැ" කියලා එහේ බල බලා මෙහේ බලන්ට සිදු වුව හොත් මිනිහා අහක බලනවා. ඕකට යි නිදහස, බුරුල, ආපෝ කීවේ. නිමිත්ත එක්ක සම්බන්ධ වෙන්ට තිබෙන බුරුල යි, ඉඩකඩ යි, නිදහස යි මේ ආපෝ වශයෙන් බුදු හාමුදුරුවෝ විග්‍රහ කර වදාළේ.

නිමිත්ත එක්ක සම්බන්ධ වෙලා තදවීම සිද්ධ වූ හැටියේ ඊළඟට උගන්වා වදාළේ **"තේජතො සංජානාති"** යනුවෙනි. අර වස්තුවට යි මේ දැනුණේ. වස්තුවට දැනුණා කියන්නේ එම වස්තුවේ අර භ්‍රමණය වෙන කාල සීමාව තුළදී හැම බැමරීමක් පාසා ම එයාගේ ශක්තියක් එනවා. එයාගේ යම් කිසි ශක්තියක් තියෙනවා නම් ඒ ශක්තියත් නිකම් නො වෙයි කැරකෙන්නේ. ඒ ශක්තියත් වෙනස් වෙනවා අනික් එත් වෙනස් වෙනවා. ඒ විදියේ ඉතා ම සියුම් වස්තුවේ ඉඳලා අනිත්‍ය ස්වභාවය මතුකරලා, පෙන්නුවේ අපගේ ජීවිතයේ අනිත්‍ය ස්වභාවය වටහා ගැනීමට පහසුවක් වශයෙනුයි. අපගේ ජීවිත ගැන අනිත්‍ය ස්වභාවය දළ වශයෙන් කීවාට වැටහෙන්නේ නැති නිසයි මේ සියුම් වස්තුවක් ගෙන හැර පාමින් විග්‍රහ කරන්ට සිදු වුණේ. අර පුද්ගලයා වස්තුව පිළිබඳ ව නිදහස ලැබිලා බලා ඉන්න කොට ඒ පුද්ගලයාගේ සියලු දේවල් වස්තුවත් එක්ක පැටලිලා තද වෙන නිසා, තද වෙමින් ක්‍රියා කරන නිසා, සිතුවිලි රත් වෙන්ට පටන් ගන්නවා. ඒ අපට සිදු වෙන දෙය බුදු හාමුදුරුවෝ පුංචි වස්තුවක් තුළින් පෙන්වනවා.

යම් කිසි පීඩනයක් අපේ හිත රත්වීම නිසා ඇති වෙනවා නම්, ඒක නැති කර ගැනීමේ උපක්‍රමය ඒ තුළින් ම පෙන්වනවා. අපව දුකෙන් නිදහස් කරන්ට බැහැ. නමුත්, හොඳට ලෙහෙසියෙන් ම දුකෙන් නිදහස් වෙන්ට මග කියා දුන්නා. මේ කාරණයෙන් පේනවා අර හිත රත් වුණේ කුමක් නිසා ද යන වග. අර වස්තුවත් එක්ක එන්ට එන්ට තද කරමින් ක්‍රියා කළ නිසා කුමක් ද වුණේ ? එක කරුණක් දෙස බලන විට ඒකේ තිබෙන තත්ත්වය හොඳ යි කියලා හිතන විට ඒ හොඳ යි කී කාරණය උඩ තවත් කරුණකට යොමු කරවන්ට වේගයක් නගිනවා. ඒ වේගය උඩ ඒකත් හොඳ යි කියලා හිතන කොට එතනින් පනින්නේ නැති ව තවත් යොමු වෙන්ට ශක්තියක් උපදවනවා. දැන් මෙ තැන අර සතෙක් නුනත් එ තැන සත්ව ශක්තිය යි තිබෙන්නේ. නමුත් ව්‍යවහාරයට සතෙක් නැහැ. මේ වස්තුව ඇතුළේ පළමු වැනි බැමරීමේදී දෙවැනි බැමරීම වේගවත් වෙනවා. පළමු බැමරීමේදී ඇති කරගත් ශක්තිය විසින් දෙ වැනි බැමරීම ඊට වඩා ප්‍රබල කරනවා. අපි යමකට යොමු වෙන විට ඒකේ එක කරුණක් හොඳ යි කියලා ගත් විට හොඳ යි කී එක සමග තද වෙනවා මිසක් තවත් එකකට සම්බන්ධ වෙන්ට ඉදිරිපත් වෙන්නේ නැහැ. හොය-හොයා මේ සිතුවිලි ගමන් කරවන්ට පටන් ගන්නවා. ඕක යි පරමාණුව තුළ සකස් වෙන ජවය.

ඔය තාපය - පළමු වැනි කොටස ගැන තමයි බුදු හාමුදුරුවෝ තේජස කියල කියන්නේ. ඒ තේජස ඒකේ වැඩ කරද්දී වායෝ කියල තවත් ශක්තියක් පෙන්නුවා. ව්‍යවහාරයට නම් වායෝ කියන්නේ හුළඟට. ආපෝ කීවේ වතුරට. තේජෝ ගින්න. පඨවි කීවා පොළොවට. ඕවා ඕවායේ ලක්ෂණ තිබුණට ඒ කියන ඒවා නො වෙයි. ඒ කාරණයට ගැලපෙන නියම විග්‍රහය නො වෙයි. පඨවි තත්ත්වය ඇති වෙන්නේ එ තැන තත්ත්වයක් උඩ. දෙකක් තද වෙන්ට නිදහසක් ඕන. උන්නු ගමන් හමු වෙලා නේ දෙන්නා ඇවිත් තද වුණේ? ගෘහ ජීවිතයට වෙන්නෙත් ඕක යි. ඒ සම්බන්ධතාවය ගන්ට නිදහස ඕන. මේ තේජෝ ශක්තිය අර ඉතා සියුම් - ඇහැට නො පෙනෙන - පුංචි වස්තුවට වගේම යි අපේ ජීවිතයටත්. අපේ ජීවිතය හැදිලා තිබෙන්නේ ඒ වස්තුවලින්. ඒ වස්තුවලට සිද්ධ වෙන දෙය තමයි මේ අපටත් වෙනවා කියන්නේ.

පඨවි, ආපෝ එකතු වෙලා නිෂ්පාදනය කළේ කුමක් ද? තේජෝ ධාතුව ළඟට බුදු හාමුදුරුවෝ පෙන්වනවා වායෝ කියලා නව ශක්තියක්. වායෝ කියන්නේ හුළඟ කියලා අරන් තිබෙනවා. හුළඟ නො වෙයි කියන්නේ කුමක් නිසා ද? නිකම් ම නො වෙයි. මූල පරියාය සූත්‍රයෙන් පෙන්වනවා අන්තිමට රහතන් වහන්සේගේ වායෝ ධාතුව නැහැ කියලා. උන් වහන්සේගේ ඇත්තේ නිබ්බාණය කියලා. වායෝ ධාතුව සුළඟ කියල ගත්ත නම් රහතන් වහන්සේගේ හුළං ගියා කියන්ට වෙනවා. රහතන් වහන්සේගේ හුළං හොඳට තියෙනවා. නැත්තේ කාමය විතර යි. කාමය යි කාන්දම කියන්නේ. තේජෝ ධාතුවෙන් නිෂ්පාදනය වෙන්නේ වායෝ ධාතුව. කාන්දම හැතැපුම් කෝටි ගණනක් දුර තිබුණත් ඒක සොලවන්ට සුදුසු මට්ටමේ කාන්දම් හැදුණු හැටියේ ඒක සොලවනවා. සෙලවීම මූලික කරල යි ඔය දූරකථන ආදි දේ නිපදවා තිබෙන්නේ. මේ තරංග ස්වරූප පාවිච්චි කරන්නේ ඒ නීතිය යටතේ යි. නැත්නම් මේ කාන්දම නිස යි. බුදු හාමුදුරුවෝ පෙන්වා වදාරනව කාන්දම හැදුණු හැටි. පඨවියත් ආපෝ ශක්තියත් ඒ දෙකේ ක්‍රියා කාරීත්වය නිසා හටගත් තේජෝ ධාතුවක් නිසා ඒක ක්‍රමානුකූල ව වර්ධනය වී ගෙන එන කොට ඒක ඇතුළේ නිපදෙනවා කියලා පෙන්වා වදාරනව අර සෙලවෙන ශක්තිය - වායෝ ධාතුව. වායෝ ධාතුව, වායෝ ශක්තිය කියල කීවේ උෂ්ණය - තේජස පදනම් කරගෙන ඒකේ යම්කිසි ප්‍රමාණයක නියමිත අංශයකට වැටෙන විට එ තැන හැදෙන අර කාන්දම කියන බලය යි. ඒක මේ ශබ්දයක් වත් කිසිවක් නො වෙයි. ඒක ශක්තියක්.

කාන්දම හැදුණේ තේජෝ ධාතුව පදනම් කර ගෙන යි. දැන් අපට තේරෙනවා අපට සමහර වේලාවට කේන්ති යනවා. නා නා දේවල් සිදු වෙනවා "මාව ගැස්සුණා, මාව තෝන්තු වුණා, අහවල් දේ හිතුණා, අරක මට හිතෙන් අතහරින්ට බැහැ, ඒකේ බැඳිලා තියෙනවා" ආදි දේවල් කියන්නේ තේජෝ ධාතුවෙන් නිපදවූ කාන්දමේ (වායෝ ධාතුවේ) ක්‍රියාකාරීත්වය නිසයි. අපිව නිකම් හදිසි දේවලට ගැස්සෙනවා. ඒ මොක ද ගැස්සුණා කියන්නේ? අර අපි ගෙන ගිය රිද්ම පෙරළීමට තරම්, ඊට සුදුසු, නැත්නම් ඊට වැඩි, කම්පනයක් වූ හැටියේ අරක නිකම් ම හෙල්ලුණා. අපි ද හෙල්ලුවේ ? එහෙම නැත්නම්, පරමාණු පොදිය හෙල්ලුණා ද? පරමාණු පොදිය යි හෙල්ලුණේ. ඒක මේ පොදියට අයිති වෙලා

තියෙන නිසා, මීට ම වෙන් වෙලා තියෙන නිසා, ඒකට තනියෙන් කියන්නේ "මාව හෙල්ලුණා, ගැස්සුණා" කියල යි. මේ මට "මම" කීවේ මාළඟ එකතු වී තිබෙන පරමාණු පොදිය හඳුන්වන්ට දීපු නමක්. එයා කියල හෝ මම කියල හෝ පරමාණු පොදිය වශයෙන් වෙන් කරනවා මිසක නැතුව කෙනෙක් වශයෙන් වෙනත් තත්ත්වයක් නැහැ. පරමාණු පොදියකට කියාපු, නැත්නම් රූප කලාප ගොඩකට කියපු, නමක් පමණ යි ඔය "මම" කියල කියන්නේ. කොටස් කරමින් යන කොට මම ය කී අය හොයන්ටත් බැරි වෙනවා. මිනිහා ඇත්තෙත් නැහැ. ඒ නිසා, "මම" කියන එක පනවා ගත් එකක් පමණ යි.

අපගේ ජීවිතය සම්පූර්ණයෙන් ම ඇස්, කන්, නාහය, කට ආදි සියලු ම දේ හැදුණු සම්පූර්ණ තනි වර්ගයක රූප කලාපයක්. ඒ රූප කලාපයේ තිබෙන ජවය - ශක්තිය හැදුණු හැටි උන් වහන්සේ විස්තර කළා. ඕක හැදුණු හැටියේ ඔය කියන පොදිය, කාන්දම සංවිධානය වෙන තුරු ඒකට කීවේ "භූත" කියල යි. තනි රූප කලාපයක්, පරමාණුවක් අපි හඳුන්වන්නේ භූත කියල යි. භූත කියන්නේ "සකස් වූ දෙය" කියන එක යි. අර කියපු ක්‍රමය යටතේ වස්තුවට සම්බන්ධ වීම, බැමරීම, පැවතීම, රත්වීම, රත්වීම තුළින් අර කාම ශක්තිය නැත්නම් කාන්දම නිෂ්පාදනය වීම යන මේවා සිදු වෙන ඔය කාල සීමාවේදි ඕකට මොකක් ද කීවේ? ඕක යි සංඛාර කීවේ. සකස් වෙනවා. සකස් වෙමින් තිබෙන අවස්ථාව. සංඛාර කියන්නේ සකස් වෙනව කියන එක. සංඛාර යි භූත හඳන්නේ. පවතිනවා, සිදුකරනවා නොයෙක් නොයෙක් අතට. ඒ ඒ අවස්ථානුකූල ව අර්ථයක් මතු කරන්නේ භූත. මොකක් වත් නො කරනවා නම් භූත කියල කියන්ට බැහැ. **"භූතතෝ සංජානාති"** - අර නීතියෙන් ම පෙන්නුවා, භූත කීවේ මොක ද කියා. දැන් ක්‍රියාවක් කිරීමට තරම් සුදුසු තත්ත්වයකට ඕක ඇවිත් තියෙනවා. මොකක් ද මේ ක්‍රියාවක් කරන්ට පුළුවන් තත්ත්වය?

තනි වස්තුවක් ඇතුළේ යම්කිසි ශක්තියක් තියෙනවා. දැන් ඒක වැඩක් කරනවා. ඒ වැඩේ කරන නිසා භූත යි. මේ කරන වැඩය කරන්ට මෙයාගේ ඇතුළේ තියෙන ශක්තිය තවත් ඒ හා සමාන ශක්ති තියෙන දේවල් එක්ක සම්බන්ධ කම් ඇති කර ගෙන ඒවා ගොනු කරනවා. දැන් ඕක ගොනු කරනවා කීවාම

අවුරුදු ගණනක් තියෙනවා නො වෙයි. චිත්තක්ෂණ දාහතක් ඇතුළතදී අරක ක්‍රියාත්මක වෙනවා. ක්‍රියාත්මක වෙනවා කියන්නේ ඒක පුපුරනවා. කොහොම ද ඒක පුපුරන්නේ? නිකම් නො වෙයි. පුපුරන වෙලාවෙදි ඒකේ තිබුණු ශක්තිය විසින් ඒ වර්ගයේ ඒවා සියල්ල ම ගොනු කරනවා. ඒ ගොනු කිරීම නිසයි මේ ලෝකයේ යම් යම් විවිධ දේවල් නිර්මාණය වෙන්නේ.

දැන් අපි කොස් ඇටයක් ගැන සලකා බලමු. කොස් ඇටයක තියෙන රසායන වෙන් කරලා, ඒ රසායන ඒ ගාණට දාලා, වීදුරු නලයක තිබ්බොත් අර කොස් ඇටය කරන එක ඒ නලය තුළ අර රසායනය කර යි. කොස් ඇටය කියන්නේ දිගටි රවුම් හැඩයට නො වෙයි. අර කොස් ගසක් පැලවෙන ඒ රසායනවලට යි. ඒ රසායන පොදිය ගොනු කරලා සුදුසු පොළොවක දාපු හැටියේ පසේ රසායන ඇදලා කොස් ගසක් ඇති වීමට වුවමනා කරන වැඩේ කෙරෙයි. ඒක කෙරෙන්නේ අර රසායනවලින්. ඒ ක්‍රියාව කෙරෙන්නේ කොස් ඇටය නමැති බීජය තුළ තියෙන රසායන ශක්තියෙන්. පරමාණු පුපුර-පුපුරා අර අවට තියෙන ඒවා අදිනවා. ඒකේ තියෙන බලය නිසයි. ලෝකයේ ඕනෑ ම තැනක නිර්මාණයක් හැදුණු හැටි බුදු හාමුදුරුවන්ගේ විශ්ලේෂණයෙන් විවෘත කොට වදාළා.

මේ භූත ස්වරූපය එක්කාසු වෙලා පරමාණුවක් හැදිලා එයට පසු ව සත්ව නිර්මාණයක් ඇති කරන ශක්ති ගැන බුදු හාමුදුරුවෝ අපව තල්ලු වෙලා එන්ට අඩි තාලෙම දැමුව විතර යි. මේ සත්ව කියන වචනෙ තියෙන සම්බන්ධතාවය බලමු. මේ සත්ව කියන ශක්තියෙන් පහෙන් පංගුවක් එක පරමාණුවක තිබෙනවා. රූප කාම, ශබ්දකාම, ගන්ධකාම, රසකාම, ඵොට්ඨබ්බකාම කියල වර්ග පහක් කාමයේ තිබෙනවා. ඉන් එහා හැදෙන්ට දෙයක් නැහැ. නමුත්, රූප කාමවල පමණක් වර්ග කෝටි ප්‍රකෝටි ගණන් තිබෙනවා. ඒ වගේ ම, කාම පහේ ම ඊට අයත් අනන්ත, අප්‍රමාණ වර්ග තිබෙනවා. මේ කීවේ සත්ව ස්වරූපයෙන් පහෙන් පංගුව යි. මේ කාන්දම් සියල්ලේ ම තිබෙන්නේ ඇලීමේ ශක්තිය යි. කාන්දම ඇලෙනවා කියන්නේ මේ අලවලා තියෙන එක නො වෙයි. අලවන ජාති තියෙනවා. එම කාන්දමේ අලවලා තිබෙන්නේ ඒක නො වෙයි. තවත් එකක් එක්ක සම්බන්ධ වෙන ශක්තිය නිසා ඒකට යි මේ ඇලීම කියන්නේ. ආලෝක

තරංග එක්ක යි රූප කාමය වැඩ කරන්නේ - ක්‍රියාත්මක වෙන්නේ. ශබ්ද තරංගය සමග වැඩ කරන ශබ්ද කාමය, ගඳ-සුවඳ වගී සමග, වායුව සමග, වැඩ කරන ගන්ධකාමය, ජලය සමග වැඩ කරන රස කාමය, වස්තු ස්පර්ශය සමග වැඩ කරන ඵොට්ඨබ්බ කාමය. ඔය වගී පහේ ම තිබෙන්නේ ඇලීමේ ශක්තිය යි. ඔය පහේ එකෙන් එකට තිබෙන්නේ ඇලීම් වගී එක යි. නැත්නම් පහෙන් පංගුව යි. ඒ පහ ම එකට එකතු වූ තැන යි සත්ව කියන නාමය අඩුවක්, පසුබෑමක් නැති ව ඉදිරිපත් වෙන්නේ. මේ පොදියට - ගොනුවට සත්ව නාමය තහවුරු වෙන්නේ කුමක් හෙයින් ද? ඇලෙන්ට තිබෙන්නේ යමක් එක්ක ද ඒකත් එක්ක ඇලෙනවා. ඇලෙන්ට තිබෙන්නේ ලෝකයේ කාම වගී පහ යි. ඒ වගී පහ සමඟ අලවන ශක්තිය මේ පොදියේ තිබෙන නිසා සත්ව යන්න තහවුරු වුණා. **සත්ත** කියන්නේ ඇලීම යි.

මේ වගී පහ එකතු වූ තැන සතෙක් නම් ඒ සතාට ඇසක්, කණක්, කටක්, තිබෙනවා ද ? නැහැ. බුදු හාමුදුරුවෝ වදාළා සත්තු අතරේ ථාවර සතෙක් ගැන. ථාවර කියන්නේ ඒ සතාට හෙල්ලෙන්ට බැහැ. හැදිච්ච තැන එහෙම ම ඉන්නවා. ඒ ථාවර සතාව හොයන්ට බැහැ. ඒ ථාවර සතා කීවේ වගී පහ එකතු වෙලා ඇහැට නො පෙනෙන ගොනුවට යි.

# 05

ධම් යනු කිසියම් ශක්තියක දැරීමක්. රූප කලාපයක නැත්නම් පරමාණුවක තියෙන්නේ එක්තරා ක්‍රියාවක් කරන ශක්තියක්. ඒ හැදුණු ශක්තිය කොයි එකකට වත් අයිති නැහැ. ශක්තියට ශක්තිය අයිති නැහැ. ශක්තිය විසින් හදන හේතුවටත් ශක්තිය අයිති නැහැ. මෙ තැනදී මේක විග්‍රහ කර නො ගත හොත් ඉදිරියට යන විට ගොනු කරන්ට අමාරු යි. ශක්තිය හැදුණේ යම්කිසි උදව්වක් නිසයි. උදව් නො ලැබුණ හොත් ශක්තිය හැදෙන්නේ නැහැ. ශක්තිය කීවේ ජවය (එනර්ජි) කියන කොටසට යි. ඒ ශක්තියට කිසි ම හවිහරණයක් නැහැ. ඒක පවතින්නේ අන්‍ය දේවල ක්‍රියාකාරීත්වයෙනුයි. ඒ නිසා, එක ශක්තියකට වත්, හේතුවකට වත් කියන්ට බැහැ මේක මගේ කියලා. ඒ ඇයි? ඒක තිබුණට අනික් එක නැත්නම් එයාට ඒක කරන්ට බැහැ. එයා නැත්නම් අනික් එකට ඒක කරන්ටත් බැහැ. ඔය යෝග වෙලා එන රටා අස්සෙන් - මුල්ලෙන් බලන කොට, ශක්තිය අහිමි තත්ත්වයකුයි තියෙන්නේ. ශක්තියක් තිබෙනවා. හිමිකාරයෙක් නැහැ. අයිතියක් නැති කම යි අනාත්මය කියන්නේ. මේකෙන් උගන්වන්නේ සියලු ධම්යන්ගේ මුල් පිළිවෙල යි. ඒ නිසා, **සබ්බ ධම්ම මූල පරියාය යි**. යම් කෘත්‍යයක් කිරීමේ පුළුවන් කාරකම යි ශක්තිය කියල කියන්නේ.

ශක්තිය ඇතුලේ පුළුවන් කාරකම් කිහිපයක් තියෙනවා. නවීන ක්‍රමයේ හැටියට රසායන බලය පවා ඒකේ තියෙනවා. කාන්දම්, විද්‍යුත් බල තියෙනවා. බුදු හාමුදුරුවන් පෙන්වා වදාළ විද්‍යාවේ හැටියට වණ්ණය, ගන්ධය, රසය, ඕජාව තියෙනවා. ඔය ඕජාව යි දැන් රසායන කියලා පාවිච්චි කරන්නේ. බුද්ධ දේශනාව ඉතා සියුම්. ඒ විද්‍යාවෙන් පෙන්වලා තිබෙන්නේ ඒකෙන් කෙරෙන කෘත්‍ය පමණ යි. ඒ ක්‍රියාව කිරීමට යම් දෙයක් ඉදිරිපත් වෙනවා නම්, ඒකට කියනවා ශක්තිය කියලා. ඒ ශක්තිය දරන්නා වූ කෘත්‍ය ස්වරූපයට කියනවා ධම් කියලා. එක පරමාණුවක් තුළ හැදෙන

ධර්ම එක යි කියන්ට බැහැ. ඒක යි අනිත්‍ය යි කීවේ. පරමාණුව තුළ ඇති ශක්තිය අපට කියන්ට බැහැ මෙන්න මේ ශක්තිය මෙකේ තියෙනවා කියලා. ඒ කියල තියෙන්නේ දළ වශයෙන්. ඒ කියන වට්ටෝරුවේ ස්වරූප ක්ෂණයක් පාසා ම වෙනස් වෙනවා. ඒ වෙනස් වෙන නිසයි ඒක කොයි අවස්ථාවේ හෝ විනාශ වෙන්නේ. ඒ නීතියම යි අපේ ජීවිතවලත් වැඩ කරන්නේ. පරමාණු ගොඩකත් එක පරමාණුවකත් කියන මේ දෙකේ ම වැඩ කරන්නේ එක ම නීතිය යි. ඒ නීතිය උල්ලංඝනය කරලා, ඒ ගැන තේරුම් නො ගෙන, පරමාණු ගොඩක් ගැන කතා කරන්ට ගිය හොත් අවුලකට වැටෙනවා. සංසාර කියන්නේ පවත්වන ශක්තිය යි. නිබ්බාණ කියන්නේ නැති කරන ශක්තිය යි. ඔය දෙකෙන් කොයි පැත්තට හරි ඒ පුද්ගලයා ක්‍රියා කරන හැටියට වැටෙනවා ඇති. දැන් අපි මේ කතා කරන්නේ පරමාණු ගොනුවක් එක් ව හදන ශක්තියක් ගැන යි. අපි මේ කතා කරන දැන් මේ තියෙන ශක්තිය අපේ හැම පරමාණුවකට ම **"පරිඤ්ඤාත"** වෙනවා. ඒ කියන්නේ දැන ගන්නවා. දැනගන්නවා කියන ශක්තිය ඒවා තුළ ගැබ් වෙලා. ඒ ශක්තිය ගැබ් වුණාම පරිඤ්ඤාත යි. තාම අපි **අපරිඤ්ඤාත** යි. මේ පරමාණුව යි එ නම් මේ රූපකලාපය යි බලපාන්නේ.

පරමාණුව නොහොත් රූප කලාපය සකස් වීමට හේතු වෙන ශක්ති ස්වරූපය හඳුන්වපු නම භූත යි. කුමක් හෝ සිද්ධියක් සිදු වෙන ස්වරූපයක් යමක් තුළ තියෙනවා නම් ඒක භූත යි. සියල්ල ම භූත නමින් හැඳින්වෙනවා. අර අර්ථය යටතේ මොකක් හෝ සිද්ධියක් කරනවා. සිද්ධියක් නො කරන දෙයක් හැදෙන්නේ නැහැ. මේ භූත ස්වරූපය කා තුළ ද තියෙන්නේ ? අන්ධ පෘථග්ජනයා තුළ යි. මිනිසාගේ සිට අන්තිම බිංකුන්ඩා - පුංචි සතා දක්වා ම අන්ධ පෘථග්ජන යි. අන්ධ කීවේ මේ ජීවිතයේ සිද්ධ වෙන සිද්ධීන් නැත්නම් මේ ශක්තිවලින් නිපදවෙන සිද්ධීන් පිළිබඳ ව කිසිවක් දන්නේ නැති කම යි. කිසිවක් පෙනෙන්නේ නැහැ. වැටහෙන්නේ නැහැ. සිද්ධීන් එක්ක පැවැත්ම රඳවනවා. පැවැත්මෙන් එහා මොකුත් දන්නේ නැහැ. ඒ ශක්තිය, ඒ ධර්මය අන්ධ පෘථග්ජන යි.

දැන් මේ භූත ස්වරූපයෙන් අන්ධ පෘථග්ජනයෙක් ගත හොත්, අපි මනුස්සයෙක් ගත හොත්, එයාගේත් තනි පරමාණුවකත් තියෙන දළ ස්වරූපය කිසි වෙනසක් නැහැ. නැතෙයි කියන්න වෙන්නේ මෙහෙම යි. කිසිවක් දන්නේ නැහැ. ඒකේ අර ජවය

මතුවෙන හැටියට ඒකේ ශක්තිය වර්ධනය වෙනවා. ශක්තියේ වර්ධනයේ හැටියට එක එක කෘත්‍යයට ඒ පරමාණුව තුළ සුදුසු කම් ඇති වෙනවා. එයින් පෙන්වන්නේ අර ජවය වැඩි වෙන තරමට ඒ ඒ ජවයේ ප්‍රමාණයේ හැටියට කළ හැකි කෘත්‍ය ස්වරූප එතන සිදු වෙනවා. ඒ අනුසාරයෙන් ගත හොත්, සාමාන්‍ය මිනිසෙක් අන්ධ පෘථග්ජන ස්වරූපයෙන් ඉන්නවා. එයාගෙන් සිදුවෙන්නේ අර කෘත්‍ය ස්වරූපයම යි. එයාගේ ප්‍රමාණයේ හැටියට කෘත්‍ය ලොකු වෙනවා. මොකක් ද කෙරෙන්නේ? එයාට හිතෙනවා. ඒක කෙරෙනවා කියන කතාව මෙතෙන්ට ගන්නේ නැහැ. කෙරෙනවා කෙරෙන හැටියට. ඒකට එක්කාසු වෙන හේතුවලින් ඒක උලුප්පලා දෙනවා. ඒක එයාගෙන් කෙරෙනවා. ඉතා ම පුංචි වස්තුවෙත් ඉතා ම ම ලොකු වස්තුවෙත් සිද්ධීන් දෙක අන්ධ යි. එහෙම වෙන්නේ මොක ද කියන එක දන්නේ නැහැ.

දැන් කෙනෙකුට කෝන්ති යනවා. තරහව ආපු හැටියේ තරහවට අනුකූල වෙනවා. කෝන්ති යනවා. ඊට අනුකූල වෙනවා මිස ඒක විග්‍රහ කරගෙන ඒකේ කිසිවක් සකස් කර ගැනීමට දැනීමක් නැහැ. අලියා, ඔටුවා ආදි මහ සතුන්ගේ ඉඳලා මිනිහා දක්වා ඒ ස්වරූපය ක්‍රියාත්මක වෙනවා. මිනිස් කමෙන් එහා කිසි ම සතෙකුට වත් පුළුවන් කමක් නැහැ අර කල්‍යාණ කියන ඒවා දනිමින් ක්‍රියා කරන ශක්තිය පාවිච්චි කරන්ට. ඒ ශක්තිය නැහැ.

**අන්ධ පෘථග්ජනයාගේ සහ කල්‍යාණ පෘථග්ජනයාගේ** වෙනස සළකා බලමු. මිනිසා අන්ධ පෘථග්ජනයා වශයෙන් තවම වැඩ කරන්නේ මොක ද? එයාට එක්තරා අඩුවක් ජීවිතයේ තියෙනවා. වශී දෙපැත්තක සම්බන්ධයකිනුයි සත්වයාගේ ක්‍රියා කාරීත්වය සිදු වෙන්නේ. දැනීම කියන එක, එක පැත්තකින් මතු කරනවා. හැඟීම කියන එක, එක පැත්තකින් මතු කරනවා. දෙන්නෙක් දෙ පැත්තකින් ඉඳගෙන යි මේ සත්වයාගේ පැවැත්ම මේ ආකාරයෙන් ගෙන යන්ට උදව් දෙන්නේ. දැනීම යි හැඟීම කියලා දෙකක් අප ළඟ වැඩ කරනවා. දැනීම ආවට පසුව යි හැඟීම ක්‍රියාවට වැටෙන්නේ. හැඟීම යි කියන්නේ මොකක් ද? යම්කිසි දෙයක් මේ අසවල් එක යි කියා හඳුනන්ට තියෙන දේවල ස්වරූප බේරාගන්ට පුළුවන් කම යි. දැනුම ලබා දීම මොළයට අයිති යි. හැඟීම ලබා ගැනීම හදවතට අයිති යි. මොළෙ යි හදවත යි දෙකක් තියෙන තැන යි සත්ව ස්වරූපය බලපාන්නේ.

මේ ලෝකයේ, කාන්දම් ශක්තිවල ප්‍රමාණ සීමාවක් නැති ව තියෙන්ට පුළුවන්. වර්ග වශයෙන් කාම කොටස් පහ යි. කාම පහේ කෘත්‍ය පහක් තියෙනවා. ආලෝක තරංග එක්ක වැඩ කරන ශක්ති තියෙනවා. ඒවාට කියනවා දර්ශන කියලා. ශබ්ද සමග වැඩ කරන කාන්දම වෙන එකක්. වායු තරංග එක්ක යි ගන්ධකාමය වැඩ කරන්නේ. ඒ ගන්ධකාමය වායුව මගින් තමාගේ නාසයේ තිබෙන ඒ වර්ග එක්ක සම්බන්ධ කළ හැටියේ ඒ කාම ධාතුව නැගිටලා ගඳ කියල එකක් හරි සුවඳ කියල එකක් හරි අපි පිළිගන්නවා. ගඳ වුණේ තමන් තුළ තිබූ කාම ධාතුව රෞද්‍ර තත්ත්වයේ තිබිලා වායුවේ උපකාරයෙන් මේක ක්‍රියාත්මක වුණු විට ඒකෙන් රිදවන තත්ත්වයක් ආවාම ඒකට කියන්නේ ගඳ කියල යි. සුවඳ කියන්නේ තමන් ළඟ තිබුණු ඒ කාන්දමේ ශක්තිය. දැන් සෞම්‍ය දේවල්, සෞම්‍ය කොටස් අර ස්පර්ශයෙන් චලනය කළ විට එයින් නිකුත් කරන තේජස වැඩිය සැරෙන් පුච්චන්නේ නැහැ. පුච්චන ප්‍රමාණය අඩු යි. එ නිසා ඒකට සුවඳ යි කියනවා.

ගඳ - සුවඳ, රස - විරස, සැප - දුක් මේ ආදි වශයෙන් අපි බෙදන මේ වර්ග පහ අර කාන්දම් පහෙන් කරන කෘත්‍ය පහක්. අපි සර්පයෙක් දැක්කොත් අපගේ පවතින කාන්දමේ වේගය වැඩි වෙනවා. ඇසින්, කණින්, නහයෙන්, දිවෙන් ගත්තා වූ දේ එක්ක අර කාන්දම් චලනය කරන්ට පුළුවනි. හොඳට ම චලනය වෙන්නේ වස්තු ස්පර්ශ වුණාට පසුව යි. එස්ස කොටස වැඩ කරන්නේ යමක් එක්ක ස්පර්ශ වුණාට පස්සේ. ඒක ගොරෝසු මට්ටමෙන් සකස් වූ එකක්. මේ කාන්දම් වර්ග පහ යි මේ ලෝකයේ නොයෙක් නිර්මාණ ඇති කරන්නේ. ගස්වල, මිනිසුන් තුළ, වෙනත් තැන්වල නොයෙකුත් දේ හදා තියෙන්නේ පරමාණු තුළ ක්‍රියා කරපු ශක්ති ස්වරූපය යි. ශක්ති ස්වරූපය විසින් ක්‍රියා කරපු ඒවායේ ප්‍රතිඵල හැටියට ඒ ඒ දේ එ තැන නිර්මාණය වෙලා තිබෙනවා. ඒ ඒ ආකාරය යි පස් දෙනා ඉටු කරන්නේ. අර පස්දෙනා හවුල් වෙල යි සත්ත්වයෙකු තුළ පවතින මොළය යි හදවත යි නිපදවලා තිබෙන්නේ. මොළය කී විට කෙනෙකුට හිතන්ට පුළුවනි ඉතා ම පුංචි සතෙකුට, අහැට පේන්නේ නැති වර්ගයේ සතෙකුට, මොළයක් තියෙනව ද කියලා. ඔය මොළය නැති සත්තු කියල වෙන් කිරීමක් කරලා තියෙනවා. මොළය කියලා එකක් පෙනෙන්නේ නැති නිසයි. මොළය යි කියන්නේ වස්තුවට ලැබුණා වූ ශක්තියක්.

ඒ ශක්තිය විකාශනය කිරීමට, පරාවර්තනය කිරීමට පුළුවන් තත්ත්වයෙන් වැඩ කරන නොටසට යි මොළය කීවේ. ඉතා ම පුංචි සතාගෙත් ඒ සතාගේ හැටියට පරමාණු ගුළියක් ඉතා ම පුංචියට තියෙනවා. ඒ සතාගේ අර කාම පහ තියෙන නිසා, කාම පහේ ශක්තිය රඳවා ගන්ට වුවමනා කරන ප්‍රමාණයේ පරමාණු පොදියක් එතන තියෙන නිසා, ශබ්දයක් කරන විට අර සතාගේ ශබ්ද තරංගය පිළිගන්නා කොටස් විසින් ඒක පිළිගන්නවා. ඒකට චලනය වෙනවා. චලනය වෙනවාත් සමඟ ම ඒ චලනය ඇවිත් අර දෝංකාරය වගේ නැවත පරාවර්තනය වෙනවා. නැවත පරාවර්තනය වෙනවා නම් ඒකට කියන්නේ මොළය කියල යි.

හැඟීම නැවත ධාරණය කිරීමට ඒ වස්තුව නැවත වරක් පරාවර්තනය විය යුතු යි. ඒකට කියනවා දන්නවා කියා. දන්නවා කියන්නේ සුළු වේලාවක් දරාගෙන සිටිනවා කියන එක යි. ඔය කියන කෘත්‍යය කරන්ට ඉතා ම පුංචි සතාගෙත් ඒ පරාවර්තනය තියෙනවා ඒ සතාගේ ප්‍රමාණයේ හැටියට. උණුසුම රකින්ට ඊට සුදුසු භාජනයකට දමනවා වගේ මේ උණුසුම රක්වල දෙන්නේ අර පරාවර්තනය මගින්. පැවැත්ම උදෙසා ඒ උණුසුම නිවී යන්ට නො දී නිරන්තරයෙන් පවත්වන්නේ අර පරාවර්තනයේ උදව්වෙන්. ඒ පරාවර්තනය නැති කළ හොත් වැඩිකල් ජීවත් වෙන්ට ලැබෙන්නේ නැහැ. තිබුණු උෂ්ණය ඉවර යි. රඳවන්නා වූ තත්ත්වය එන්නේ නෑ. ඒ නිසා, ඒ සතා මැරෙනවා. මොළය සම්බන්ධ කර ගන්නේ නැති ව භූත ස්වරූපයේ තිබෙන තත්ත්වය තේරුම් කරගන්ට අමාරු යි. ඒක පෙරළෙන හැටි කියන්ටත් ඕකම යි උදව් වෙන්නේ. මේ සත්ත්වයෙකුගේ ආරම්භයේදීත් සිදු වුණේ කුමක් ද? නිරායාස සිද්ධියක්. කවුරුත් එක්කාසු කළේ නැහැ. එක්කාසු වෙන්ට ඉඩ ලැබුණු නිසා එක්කාසු වුණා. එක්කාසු වීමේ ශක්තිය තිබුණු නිසාත් එක්කාසු වුණා. කාට වත් මේකේ හදන්ට ඉඩක් නැහැ. පුළුවන් කමක් නැහැ. නැත්තේ ඒවා තුළ තියෙනවා ඒවා කරන ශක්තිය. කවුරුත් නො කළාට ඒවා නිරායාස ව කෙරෙන ශක්තිය තියෙනවා. නිරායාස සිද්ධියකුත්, හිමිකාරයෙක් නැති කමත් නිසා බුදු හාමුදුරුවෝ පෙන්වා වදාළා අනාත්ම කියලා. අනාත්ම වාදය යි බුද්ධ දර්ශනයේ තිබෙන්නේ.

දෝංකාරය කියන්නේ ශබ්දය බිත්තිවල හැපිලා එම ශබ්දය ම ආපසු ඒමට යි. ඒ වගේ, මේ කාන්දම් කම්පනය වුණු විට

ඒක හැප්පෙන තැන්වලින් නැවත එවනවා. ඒක එක තැනක සිද්ධියක්. මේ කාම පහේ පරාවර්තීන ස්වරූපය වර්ධනය වීමත් කම්පන ස්වරූපය වර්ධනය වීමත් පරමාණු එකතු වෙන විධියට යි වෙන්නේ. එන්ට එන්ට සතා ලොකු වෙන කොට මේ වර්ග පහේ ගොනුව පළල් වෙනවා. පළල් වෙන්නේ ඒ ගොනුව තුළ තියෙනවා බාහිර දේ ඇදගන්නා ශක්තිය. ඒවට ගැලපෙන දේ අදින ශක්තිය ඒක තුළ තියෙනවා. රූප කාමයේ තිබෙන්නේ රූප දැකීමේ ශක්තිය හැදෙන යම් පරමාණු ගොනුවක්. ඒ ශක්තියේ ශබ්ද පිළිබඳ කිසි වගකීමක් නැහැ. ඒ ඒ අයගේ වර්ධනය ඒ ඒ අය විසින් කරනවා. ඒ ඒ අය කීවේ ඒවායේ ඒ වෙලාවට තියෙන ශක්තියට යි. ශක්තිය විසින් ඒකට කළ හැකි දේ කරනවා. ඒ විධියට වර්ධනය වෙච් ඇවිත් අපි කියමු ගෙම්බෙක් පමණට ඒ වස්තුව පළල් වුණා කියලා. ගෙම්බගේ ප්‍රමාණයේ හැටියට අර පරාවර්තනය කරන පැත්ත ක්‍රමානුකූල ව සකස් වෙනවා ප්‍රමාණයේ හැටියට, වැඩියෙන් ගොනු වෙන්ට පුළුවන් විධියට. ඇයි ගොනු වෙන්නේ? ඒකටත් හේතුවක් තිබෙනවා. එන්ට එන්ට දැනීම වැඩි නිසයි. දැනීම වැඩි වෙනවා කියන්නේ දැනීමේ පළල් බව වැඩි වෙනවා. වැඩි වෙන්ට - වැඩි වෙන්ට අර පරාවර්තීන ශක්තියත් ඒ සමඟ ම වැඩි වෙනවා.

දැන් සමාන්‍ය බිංකුණ්ඩෙක් ගත්තොත් ඒ බිංකුණ්ඩාගේ මොළය ඉතා ම පුංචි යි. නමුත්, ඒ සතාගේ මොළය වැඩ කරන හැටි බැලුවාම හිතන්ට බැහැ විද්‍යාඥයෙකුටත් එහා ගිහින්. එයාගේ ප්‍රමාණයේ හැටියට වේලුණු දූවිලි තිබෙන තැනක නැවතිලා කැරකෙනවා. කැරකෙන විට අර වේලුණු දූවිලි නිසා අතංගුව වගේ එකක් හැදෙනවා. ඒ අතංගුවේ උල් ව තියෙන තැනින් යටට යනවා. ගිහිල්ලා සද්ද නැති ව ඉන්නවා. හරි අහිංසක සතෙක් වගේ පේන්නේ. ඉතා පුංචි සත්තු අර ගැට්වේ වැහුවම වේලුණු දූවිලි නිසා ලිස්සලා යනවා අතංගුවට. සද්ද නැති ව ඌ සතාව ඇල්ලුවා. අර ගෙන ගියා. තව එකෙක් වැටෙන කල් ඌ මේ වැඩේ කරනවා. සෑහෙන මොළයකින් කරන වැඩක්. මේ බිංකුණ්ඩාගේ ජීවිතය දෙස බැලුවම මේ සතා ක්‍රියා කරලා තිබෙන්නේ ධාරණයකින්. ඒ ධාරණ ශක්තිය පරපුරට හිමි වෙලා. ඒ අව්වුවෙ ම වදින නිසා මුලින් ම අතංගුව වැනි දෙයක් හදපු බිංකුණ්ඩෙක් ඇති වුණා. මේ සතා පුංචි වළක දූවිලිවල අතංගුවේ සිටින විට පුංචි සතෙක් වැටීම

නිසා අල්ලාගන්ට පුළුවන් වුණා. ඒ නිසා, ඒ සතාව අල්ලන්ට පුළුවන්කාර කමක් ඇති වුණා. ඒක ශක්තියක්. ඒ ශක්තිය නිසා ධාරණයක් වුණා. සතා අල්ලපු වෙලාවේ කොහොම ද ක්‍රියාත්මක වුණේ, අන්න ඒ විදියට ඒ ක්‍රියාත්මක කරපු ස්වරූප ධාරණය වුණා. ඒක යි මතකය. ඒවා නැවත නැවත සිතින් කරන විට ඒ ස්වරූපය පවතිනවා. කාලයක් එම ස්වරූපය පවතිනවා.

යන පෙරහැර නවත්වලා කවුරු හරි ඒකේ සිටින නැට්ටුවෝ, බෙරකාරයෝ ගණන් කරන්නා වගේ ඒක පවතිනව කියන්නේ නැවතිලා නො වෙයි. ඒක ක්‍රියා කරමින් ඒකේ ස්වරූප ඉදිරිපත් කරනවා. ඒ ස්වරූප හඳුනන ධාරණයක් ඇති වෙනවා. ධාරණය ඇති වෙනවා කියන්නේ ඒ හැඟීම ඇතුළත් වූ පරමාණු හැදෙනවා. පරමාණුවක් නො හැදී ඒ වැඩය කරන්ට බැහැ. උදාහරණයක් ගනිතොත් ලීයක් යතුගාන්ට ඕන නම් යත්තක් හදන්ට ඕන. ලී කැල්ලකින් යතු ගාන්ට බැහැ. ඒ ක්‍රියාව කෙරෙන්ට ඒ වගීවල පරමාණු හැදෙන්ට ඕන. බුදු රජාණන් වහන්සේ මේ පරමාණු හැදෙන එක ගැන මුලින් ම දේශනා කොට වදාළා, **"අස්සුතවා පුථුජ්ජනො"** කියලා.

පරමාණුවක් හැදෙන වෙලාවේ ඒ පරමාණුවේ ශක්ති ස්වරූප හදන්ට කිසි ම ශබ්ද තරංගයක් හසු නො වුණු තත්ත්වයක් එන්ට ඕන. කලින් ම තනි ජවයකුයි හැදුණේ. දැන් නොයෙකුත් ජව ස්වරූප, පාද වැනි සියල්ල ම ඇතුල් වෙලා ඒ සියල්ල ම "අස්සුතවා පුථුජ්ජනො"යි "අස්සුතවා" කියන්නේ ඒ ඒ හැඟීම් එන විට ඒ හැඟීමට අනුව පරමාණුවේ තිබෙන ජවය පෙරළෙනවා. ඒ ජව ගැන යි අපි මේ කතා කරන්නේ. ඒ ජවවලින් කෙරෙන කෘත්‍ය ගැන යි. අපිට මතක තියෙනවා කියන්නේ අර පරමාණුවල තිබෙන ජවය පෙරළෙන නිසයි. ඒ විධියට පරමාණු (රූප කලාප) හැදෙන්නේ නැත්නම් ඒ කෘත්‍යය කරන්ට අප ළඟ කිසිවක් නැහැ. මේ බිම්කුණ්ඩා මුලින් නිකම් සතා. ඒ සතා ඔය විධියට ක්‍රමානුකූල ව කරලා කරලා සතුන් අල්ලන්ට පුළුවන් ශක්තිය සමුපූර්ණ වෙලා, දඩයම් කරන්ට සුදුසු ආයුධ හදාගෙන තිබෙනවා. බුදු රජාණන් වහන්සේගේ පරිණාම වාදය කුමක් ද? රූප කලාප (පරමාණු) පරපුර එකින් එකට යම් යම් සංයෝග බවට පත් වෙන්ට වෙන්ට රූප කාම, ශබ්ද කාම, ගන්ධ කාම, රස කාම, ඵොට්ඨබ්බ කාම යන මේ වගී පහේ පරිණාමය - පෙරළිය පටන්

ගත්තා. පෙරළෙන්ට - පෙරළෙන්ට, පරිණාමය වෙන්ට - වෙන්ට ම ශක්ති වර්ධනය වෙමින් දියුණු වෙමින්, යෝග එකතු වෙමින්, ඒවා වෙන වෙන තත්ත්වවලට වැටුණු බව පැහැදිලි කොට, විග්‍රහ කොට, දේශනා කළා.

හැම සතෙකුගේ ම කාම පහ තියෙනවා. පහකින් ම ගොදුරු සොයන අවස්ථාවක් සත්ව අවස්ථාව. කලින් අපි නිදසුනට ගත් බිංකුණ්ඩාගේ කාම පහ හදන පරමාණු තියෙනවා. ඒ සතාගේ වර්ග පහ මේ අතංගුවට වැටුණු සතා එක්ක ආකර්ෂණය වෙනවා. ආකර්ෂණය වුණු විට යි අල්ලන්නේ. බිංකුණ්ඩා විතරක් නො වෙයි ඇමීබාවක් අල්ලනවා. අන්තිම සියුම් සතෙක් හැටියට ඇමීබා ඉන්නේ. ඇමීබා අල්ලන්ට එන කොට - ස්පර්ශ වෙන කොට නටු දෙකක් එනවා. ඒක ලොකුවට දැක්කොත් බය වෙනවා. පෙනෙන්නේ නැති නිසා හොඳ යි. වස්තුවක් මේ සතා හමුවට ආ හැටියේ ඒක බදාගන්ට නටු දෙක ඉදිරියට යනවා. ඒ කාම ශක්තිය යි ඉදිරියට ඇදෙන්නේ. අණු පොදි යි ගිහිල්ල අර වස්තුව වට කරලා රොක් කර ගන්නේ. ඇමීබා දන්න මෙලොව දෙයක් නෑ. මේ සියල්ල ම අර පරමාණුවල ජවය කරන කෘත්‍යයන්.

දැන් ගස් වර්ග සතුන් අල්ලනවා. විඤ්ඤාණය නැති ව අල්ලන්නේ. අර කාන්දම් ශක්තිය විසින් ඇට පවා දිරවන ගස් තිබෙනවා. අර සතා අදින ශක්තිය පරමාණුවල කාන්දම් ජවය වැඩි නිසා කෙරෙන වැඩක්. ඒවා ඒ තැන්වල එකතු වෙලා හැදිලා තිබෙන්නේ. ඒක කාන්දමෙන් කෙරෙන්නේ. විඥාණ නැහැ. ශක්තියෙන් ශක්තිය දැනගැනීම විඥාණ යි. ගසේ තිබෙන්නේ කාම හතර යි. කොටස් හතර යි. මේ පහක් තිබෙන තැන යි විඥාණ ශක්තිය ගැන කතා කරන්නේ. පරමාණු වර්ග පහ එකතු වූ විට ඒකෙ තිබෙන පරමාණුත් අපගේ ඉන්ද්‍රියයේ ඒ වර්ගයේ යමක් සම්බන්ධ වෙන විට මැද තියෙන පරමාණුත් කම්පනය වෙන එක යි විඤ්ඤාණය කියන්නේ. ඇස්, කන්, නාසාදිය ඒකේ වාටිය වශයෙන් ගත් විට වාටියට ලැබෙන සම්බන්ධය, මැද තිබෙන පරමාණුවක් විසින් දැන ගන්නවා. එයට කාන්දම් වර්ග පහ ම ගොනු වෙලා සුදුසු ආකාරයෙන් සකස් වෙලා තියෙන්ට ඕන. ඉතා ම සුළුවට වාටිය කම්පනය වෙනවා. ඒ වාටියේ අර වර්ග පහ තියෙන්ට ඕන සත්ව තත්ත්වයෙන්. නැත්නම් දැනීම අඩු යි. දැන් ඇහැ අන්ධ නම් පෙනෙන්නේ නැහැ. කන් අහෙන්නේ

නැත්නම් ශබ්දය දැනෙන්නෙත් නැහැ. ඒ හුළං මෙහාට දෙන්ට ඕන. පිටින් ඇද්ද විට දෙන එක යි විඥානය.

අපට සතුටු වෙන්ට පුළුවන් අපි අන්ධ පෘථග්ජන භාවයත් පහු කරලා ඇවිත් ඉන්න නිසා. කල්‍යාණ පෘථග්ජන මට්ටමෙ යි අපි ඉන්නේ. මේ ලාභය නම් අත්හරින්ට පුළුවන් කමක් නැහැ කියල හිතන්ට පුළුවන් තත්ත්වයක යි කවුරුත් ඉන්නේ. කල්‍යාණ පෘථග්ජන කමේ වුණත් වැරදි අඩුපාඩු කම් තියෙන්ට පුළුවනි. කල්‍යාණ පෘථග්ජනයා කීවේ කාරණයක් ගැන හිතලා එය ධාරණය කරගෙන, ඒක හොඳ පැත්තට හරවන ධාරණය අරගෙන, හොඳ පැත්තට හැරවීමේ ක්‍රියා මාර්ගයට බැස ගත් එක්කෙනාට යි.

පරමාණු කම්පනය වෙලා ගොනු වෙන්නෙත් එක නීතියක් යටතෙ යි. ඒ වර්ගී තියෙන තැනට ඒවා ළං වෙනවා. ඒක ඒ ශක්තිවල ස්වභාවය යි. ඇහේ පරමාණුවල තිබෙන්නේ රූප කාමය තිබෙන ශක්ති. අපි ආහාර අරගෙන ඒ වර්ගය සකස් වෙන විට ඒවා සියල්ල ම ලේ ධාතුවත් සමඟ ඇදි - ඇදී රැඳෙන්නේ ඇහේ විතර යි. ඇහේ ගොනු වෙන එක කෘත්‍යය කරන එක. කෘත්‍යයට ලැස්ති වූ එක, කෘත්‍යයට සුදුස්සන් වෙමින් ඉන්න එක ඇහැ වටේට තියෙනවා. කණේ මැද්දේ එක්තරා සෙව්වකට යි දැනීම ලැබෙන්නේ. මේ මයික් එකේ ශබ්දය මේ හැම තැන ම තියෙනවා. කන් පෙත්තේ පටන් ඔය මයික් එකේ වෙව්ව එකම යි කණේ හැදෙන්නේ. ඒකට සහයෝගය දීමට අවට ප්‍රදේශයත් ඒවායින්ම යි හැදිලා, තියෙන්නේ. අන්න ඒ නීතිය යටතෙ යි මොළය වෙන් වෙන්නේ. ඒ ඒ වර්ගී වැඩියෙන් තියෙන තැනට ඒවා වැඩියෙන් සම්බන්ධ වෙනවා. කණ අල්ලෙහි හෝ පිටි අල්ලෙහි හැදෙන්නේ නැත්තේ මොක ද? එහෙම හැදුණ නම් අත දික් කරලා ඕන වෙලාවට ඕන දෙයක් අහන්ට පුළුවනි. මේ සියල්ල ම අර ස්නායු ශක්තිය එක්ක ළඟ ළඟ ක්‍රියා කරපු එකේ ප්‍රතිඵලයකුයි ඇස, කණ, නාසය, දිව බෙල්ලෙන් උඩ හැදුණේ. නැත්නම් ඕවා වෙන තැන්වල හයි වෙන්ට තිබුණා නේ?

මෙ සේ කාම පහ එකතු වෙලා සතෙකු වෙලා. ශක්ති පරිණාමයෙන් - ජවයේ වර්ධනයෙන් මිනිසෙකු වුණා. මොහු මිනිසුන් අඳුනනවා. පන්සල් පල්ලි දැකලා තියෙනවා. ඒවා අඳුනනවා. මිනිහා මෙයින් මරණයට පත් වෙලා තිරිසනෙක් වුණොත්, ඒ

තිරිසනා අනික් තිරිසනුන්ට වඩා වෙනස්. අනිත් තිරිසනුන්ට නැහැ මෙයා ළඟ තිබෙන දැනීම. ඒකත් සංයෝග වෙල යි උපදින්නේ. මේ සතා මිනිහෙක් ව සිටිය කාලේ කළ වැඩවල හැඩය තිබෙනවා. අනික් අයට උදව් කළ ඒවා තියෙනවා. "ආයුබෝවන්" කියපුවා තියෙනවා. ඔය හැම "ආයුබෝවන්" එකක් පාසා ම ශක්තියකුත් එකතු වෙනවා. දැන් මේ සතා වෙන සතුන් අතර ඉන්න කොට හඩින්, හැඩෙන් අනිත් අයට සමාන යි. නමුත්, යම් කිසි අවස්ථාවක් ආවොත් කරුණාවක් පාන්ට, මේ සතා ටිකක් කරුණාව පාවිච්චි කරනවා. අර බෝසත් මුවාගේ (නිග්‍රෝධ මිග ජාතකය) තිබුණේ ඒක යි. බෝසත් මුවා මිනිස් භවයේ සිට මුව ආත්ම භාවයට සුදුසු ශක්ති ගොනුවීම නිසා මුවෙක් ව උපන්නා. ඒ පරමාණුවල සංයෝගය පෙන්වන්ට යි ඕවා බුදු හාමුදුරුවෝ දේශනා කළේ. දඩයක්කාරයෝ මුවන් එළවන විට බෝසත් මුවාට මතක යි මෙ තැන බඩ ගැබ්බර මුව දෙනක් ඉන්න බව. "අනේ ! අර මුව දෙන අහු වුණා ද දන්නේ නැහැ" කියලා ඒ මුව දෙන එනව ද කියලා බලන්ට හැරිච්ච ගමන තමයි අර මිනිස්සු මේ මුවා අල්ලා ගත්තේ. ලස්සන නිසා මැරුවේ නැහැ. වෙන එක මුවෙක් වත් නැහැ මුව දෙන ගැන විමසුවේ. මේ මුවාට විතරක් හිතුණා මුව දෙන ගැන බලන්ට. ඒ එනව ද කියලා බැලුවේ මිනිසෙකු වෙලා සිටි අවස්ථාවේදි එකිනෙකාගේ දුකට පිහිට වූ සිත ඒ අවස්ථාවේදී වැඩ කළ නිසයි. එයින් ඒ පොඩි අකරතැබ්බයටක එයාව අහු වුණා. වෙන මුවෙක් අහු වුණා නම් එවලේ ම කරගහ ගන්නවා. මේකගේ තිබුණු හැඩරුව, ඇස්වල පුංචි කම, පැහැදිලි කම නිසා හරි දැකුම්කලු යි. මරන්ට හිත නැහැ. එ නිසා, රජගෙදරට ගෙන ගියා. රජ්ජුරුවන්ටත් මේකා දැක්ක විට හරි ආසා හිතුණ. එ නිසා, අභය දානය කළා. මනුෂ්‍ය ආත්මයේදී ගත් පරමාණු ශක්තියෙන් හදපු ක්‍රියාකාරී ස්වරූප තිරිසන් ආත්මෙදීත් ආවා. ඒක නිසයි ශරීරය ප්‍රසන්න වුණේ, පැහැදිලි වුණේ. අනුන්ගේ සිත් ගන්නා ස්වරූපයක් ආවේ.

පරිණාමය කියන්නේ ඒ ශක්තියේ ස්වරූප එන්ට එන්ට ම වෙනස් වෙවී වර්ධනය වෙවී නිර්මාණ නිර්මිත වීමට යි. ඒ පිළිබඳ විග්‍රහ කර දීම, පැහැදිකලි කර දීම, කියා දීම පරිණාම වාදය යි.

# 08

රූප කලාපය තුළ මේ කාම වර්ග පහ එක එක විධියට යි හැදෙන්නේ. කාම (කාන්දම) සැර වෙන විධියටත්, මධ්‍යස්ථවත්, හීනවෙන විධියටත් හැදෙනවා. ඒ අවස්ථා තුනෙන් කොයි ආකාරයට හැදෙනව ද කියලා අපි දන්නේ නැහැ. නො දැනුවත්ව ම යි අපි මෙ තෙක් දුර මනුස්ස ජීවිතයට එන තුරු සකස් වෙලා තිබෙන්නේ. ඒ සංවිධානය තුළින් සකස් වෙවී ඉදිරියට ඇවිත් තිබෙනවා අපි මනුස්ස කියන සම්මතය යටතේ. නමුත්, බුදු හාමුදුරුවෝ මූලපරියාය සූත්‍රයේදී මනුස්ස කියන නාමය ගත්තේ නැහැ. **භූතෙ භූතතො සංජානාති** ඊළඟට **දෙවෙ දෙවතො සංජානාති.** මනුස්සයන් අයින් කරලා මතක් කරන්නෙ වත් නැති ව දේව තත්ත්වය ගැන යි උන් වහන්සේ දේශනා කළේ. අපි ඉන්න මට්ටම ගණන් ගත්තේ නැති තත්ත්වයක්, නැත්නම් ලකුණු නො වැටුණු මට්ටමක්. ඒ විධියට යි පෙනෙන්නේ. එහෙම වෙන්ට හේතුවක් තියෙනවා. භූත කියලා කතා කළාට පසු ව මනුස්ස මට්ටමත් වැටෙන්නේ භූත සංඛ්‍යාවට යි. නිරායාසයෙන්, ඉබේට, මොන ම සංවිධානයක් වත් මොන ම පාලනයක් වත් නැති ව හැදෙන එකට යි භූත කියන්නේ. මිනිස් ආත්මේ තියෙන තරමක් අපගේ ඉන්ද්‍රිය පහට අයිති වී තිබෙන ඒ සකස් වූ දේවල් කිසිවක් පාලනයකින් සකස් වූ දේවල් නො වෙයි. ඒ පාලනයකින් සකස් නො වූ ඒවා උපරිම මට්ටමට සෑම ජාතියෙන් ම මේ මිනිස් ජීවිතයේ තිබෙන නිසා, මනුස්ස මට්ටම භූතවල අන්තිම කොටසට යි ගත්තේ.

මිනිසාගේ ජීවිතයේ බලන බැලීම්, අසන ඇසීම්, ආඝ්‍රාණ, රසවිඳීම්, ස්පර්ශ කිරීම් යනාදිය යි ප්‍රධාන. ඒවායේ සංකීර්ණ තත්ත්වයකුයි මොළය කල්පනා කරනවා කියන්නේ. අපි කල්පනා කරනව යි කියන්නේ පරණ එකක් ඉස්සරහට දාගෙන කතා කරනවා, හිතනවා. ඒ හැර, අපට බැහැ අලුත් දෙයක් ගැන

සිතන්ට. භූත එක සමාන නැහැ. හැඳෙන හැඳෙන හැම විට ම වෙනස් ස්වරූප යි හැඳෙන්නේ. වෙනස මිසක් පවතින මොනවා වත් නැති නිසයි බුදු හාමුදුරුවෝ එක එල්ලේ ම අනිත්‍ය වචනයක් ඉස්සරහට දැම්මේ. මේ ස්වරූපය, මේ විධියට කළොත් ලබන සුමානේ ගන්ට පුළුවන් කියලා කවදා වත් කතාවක් නැහැ. ඒ ස්වරූපය නො වෙයි ඊට වඩා හොඳ ස්වරූපයක් ගන්ටත් පුළුවනි. ඊට වඩා නරක ස්වරූපයක් ගන්ටත් පුළුවනි. ඒ ස්වරූපය ඉවර යි. අපට හිතක් පහළ වෙනවා අරය දිහැ බලන්ට ඕනෙ යි කියලා. බලන්ට ඕන කියන හිත එනවත් සමග ම ඒ බලන පැත්ත, ආකර්ෂණය වූ පැත්ත, හිතෙන් සංවිධානය වෙලා ඉවර යි. ඒක යි **සංජානාති** කියන්නේ. හිතෙන හිතෙන වාරයක් පාසා මනෝධාතුව වැඩ කර කර ඒ ගනුදෙනුවෙන් එවන එක යි දැන ගන්නේ. මෙතන තියෙන ශක්තියෙන් අර පැත්තට යොමු වෙන්ට හැඟීම් එන අවස්ථාව යි **සංජානාති** කියන්නේ. සකස් වූ ශක්තිය විසින් යොමු කරවන පැත්ත සංජානාති යි.

**භූතේ මඤ්ඤති** කියන්නේ ඒ පැත්තට යන්ට වෙලා. හැඟීම් ඇවිල්ලා. මඤ්ඤනය කියන්නේ හැඟීමක්. වෙන පැත්තකට හැරෙන්ට බැහැ. ක්ෂණික සිද්ධියක්. ඒකට බැඳිලා බලපෑමක් තියෙනවා ඒකට. නො කර ම බැහැ. ඒ ඇදීමට තමන්ගේ ඉන්ද්‍රියයන් ක්‍රියා කරනවා යටවෙලා. **භූතෙ මඤ්ඤති** කියන්නේ ඒකට යටවෙලා තියෙනවා කියන හැඟීම එනවා.

**භූතතො මඤ්ඤති** - මම ඉන්නේ දැන් ඒ හැඟීමෙන්. ඒ හැඟීම උඩ යි මගේ හිත තියෙන්නේ. මේ යොමු වීම පිටස්තර දෙයක්. හරියට බෙරකාරයාව කුලියට ගෙන්වා ගන්නවා වගෙ යි. බෙරකාරයා හැම තැන ම බෙර ගහන මිනිහෙක්. නමුත්, දැන් යෙදිලා තියෙන්නේ මෙ තැන බෙර ගහන්ට. දැන් බෙරකාරයා කට්ටඩි රාළගේ. බෙරකාරයා ඒ වෙලාවට විතර යි බෙරකාරයා. සින්නක්කර බෙරකාරයෙක් කට්ටඩි රාළට නැහැ. අනිත්‍යය බුදු හාමුදුරුවෝ පෙන්වන හැටි යි මේ. ඒ තරම් තිතෙන් තිතට පෙන්වනවා. බුදු හාමුදුරුවෝ ප්‍රකාශ කළ ගම්භීර අදහසක් ලෝකයාට තිතෙන් තිතට පෙන්වනවා. ඒවා පෙන්ව පෙන්වා යි කීවේ **''දෙවෙන වා, මාරෙන වා, බ්‍රහ්මුණා වා කෙනචි වා''** කියලා. කියන්ට පුළුවන් කෙනෙක් ඉන්නවා නම් ඇවිල්ලා කියන්ට යි කියලා. මේ උන් වහන්සේගේ උදානයක්. අභියෝගයක් නො

වෙයි. "වරෙල්ල බලන්ට" කියනවා නො වෙයි. යම් කිසි කෙනෙකුට මේවා බොරු යි කියන්ට ඕන නම් ඉදිරිපත් වෙන්ට ඕන. බැරි නම් පිළිගන්ට ඕන. මේවා බාර නො ගෙන ඉන්ට පුළුවන්. ඒක එයාගේ කැමැත්ත. ඒක ඔහොම නො වෙයි කියන්ට බැහැ.

උන් වහන්සේගේ අදහස් ස්ථිර යි. ථාවර යි. ස්ථිර කියමනක්. ඒක නේ ථෙරවාදය කියන්නේ ? ස්ථිර වචනයක් කතා කරන්ට පුළුවන් කෙනෙක් ලෝ පහළ වුණේ බුදු වරයෙක් පමණ යි. දැන් අර්ථ දීලා තිබෙන්නේ තෙරුන් වහන්සේලා කළ එක ථෙරවාද යි කියල යි. තෙරුන් වහන්සේලා ඕන එකක් කරපුවාම ඒක ථෙරවාදය. එහෙම කතාවක් නැහැ. ස්ථිර වදනක්. ස්ථිර කියමනක්. බුද්ධ වචනයට ගත්ත තීරණයක් තිතෙන් තිතට බෙදපු හැටි. **භූතෙ මඤ්ඤති** - මම දැන් ඉන්නේ මේ ක්‍රියාවට අඩංගු වෙලා. ඒකෙ යි මම දැන් ඉන්නේ. **භූතෙ අභිනන්දති** - ඒක නිතර නිතර යොදවන්ට කෙරෙන බලපෑම නිසා නිකම් ම බෙල්ල හැරවෙනවා. ඔය අභිනන්දනය යි බෙල්ල හැරවිල්ල. එක වරට "සුස්" ගාලා හරවන්ට බැහැ. අර හැරවිල්ල එක පාරට හැරෙව්වට ඒකෙ හැරවිලි ගොඩක් තියෙනවා.

දැන් චිත්‍ර පටයක මිනිහෙක් අත උස්සනවා එක පාරට ම පේනවා. නමුත්, ඒ අත ඉස්සීමට චිත්‍ර කොයි තරම් පහුවෙන්ට ඕන ද? ඉස්සිලි ගොඩක් එකතු වෙලා එක ඉස්සිල්ලක් පේනවා. බුදු හාමුදුරුවෝ මේක පෙන්වනවා. බාහිර චිත්‍රපට බලන්ට ඕන නෑ. අපි ළඟත් තියෙනවා ඔය චිත්‍ර පටය. හැරවිලි ගොඩක් එක්ක එක හැරවිල්ලක් එනවා. හැරවිලි ගොඩකිනුයි එක හැරවිල්ලක් හැරෙන්නේ. මේ අභිනන්දනය භූත ගැන යි කතා කරන්නේ. ඒ රසායන සමඟ ආකර්ෂණය වෙන කාන්දම ඇති පුද්ගලයාට ඒක අහු වුණාම ඒකෙන් අරක යටපත් වෙනවා. දැන් සමහර අය ඉන්නවා මොන ම මත් පැනක් වත් බොන්නේ නැහැ. නමුත්, මිනිහට සතුන් මරන්නට කීවොත් පුදුම සතුටක් දැනෙනවා. සමහරුන්ට බොරු කියනවා කී විට නිවාඩු අරන් බොරු කියනවා. තවත් සමහරු ඉන්නවා දෙන්නෙක් කොටවලා අයින් වෙලා නාට්‍යයක් බලා ඉන්නවා වගේ මිනිහා ඒ දිහා බලා ඉන්නවා. ඒවා බොහෝ විට විනෝද පැත්තට හැරිලා තිබුණත් කෙරෙන්නේ භූත සකස් වීමක්. ඒක යි බුදු හාමුදුරුවෝ කිසි ම පුද්ගලයෙක් අයින් නො කළේ. ඒ පුද්ගලයා වශයෙන් එයාට අයිති වෙලා

තියෙන නරක ඒකේ නරක මිස, ඔය තැන්වල හොඳ ගොනු වුණොත් ඔය වස්තුවට ම අපි කියනවා හොඳ මිනිහා කියලා. ඒක නිසා, අපි ලැස්ති වෙන්ට ඕන ඒ මිනිහගේ අර වස්තුවට ගහන්ට නො වෙයි. ඒ මිනිහ ළඟ තිබෙන නරක ටික අරන් දාන්ට යි. අරන් දාන්ට පුළුවන් ඒවාත් තිබෙනවා, බැරි ඒවාත් තිබෙනවා.

ළිං තිබෙනවා ඉහින්ට බැරි. දෝනාව වගේ උල්පත් තියෙන ඒවා. ඉහින්ට ඉහින්ට ගලා එනවා. ඒ වගේ, මිනිස් ජීවිතවලත් දෝනාවෙන් ගලා එන්න වගේ ඉක්මනට නරක හැදෙනවා. ඒ අයව නවත්වන්ට බැහැ. ඒ දෝනාව හෙමින් හෙමින් ඇහිරිලා යාන්තම් කාන්දු වෙන මට්ටමට ආපුවම යාන්තම් සුද්ධ කරලා සුද්ධ වතුර ගන්ට පුළුවනි. ඒ වගේ, පුද්ගලයෝ එක එක ආකාරයෙන් සකස් වෙනවා. අර මුලින් කියාපු කෙනාගේ ඒ වගී සකස් වෙනවා ඉක්මන් වැඩි යි. සමහරු ඉන්නවා නොයෙක් අවස්ථාවල විලාසිතාවලට යොමු වෙන අය. ඒවාට ආකර්ෂණය වෙන ඒවා එයා තුළ හැදිලා. විවිධ ආකාර දේවල් හැදිලා ඒවත් එක්ක ආකර්ෂණය වෙමින් ඉදල ම මිනිහා එක්තරා ප්‍රමාණයකට තෙහෙට්ටු වෙනවා. එහෙම වුණාට පසු ව එයාගේ සිතේ නව භූතයක් සකස් වෙනවා. "අනේ මන්ද මේවා කෙහොම විඳින්ඩ ද කියල? නො විඳින්ට ඇත්නම් හොඳ යි" ආදි වශයෙන්. ඒක යි මේ අනාත්ම වාදය. අපි කරන දෙයක් නො වෙයි. හරියනවා, හොඳ වෙනවා, නරක් වෙනවා. අපි කරන දේවල් නො වෙයි. "අපි" කියන්නේ අර භූත ගොඩට. ඒ භූත ගොඩේ තියෙන සංයෝග ශක්තීන් ක්‍රියා කරන හැටියට ඒ වස්තුවට අයිතිවාසිකම් ලැබෙනවා.

පාලනය කරනවා, පාලනය වෙනවා කිව්වට අපි කරන පාලනයක් නැහැ. කොටින් කියනවා නම් එයාට ඒ පාලනය වීම සඳහා එක්කාසු විය යුතු විධියට කරුණු එකතු විය යුතු යි. නිදසුනක් ගනිතොත් ගෙට ඇතුල් වෙලා හොරෙන් කාපු බල්ලෙකුට තද පාරක් දුන්නොත් ඒ බල්ලා ඒ ගේ කිට්ටුවෙන් වත් යන්නේ නැහැ. ගෙට රිංගලා සිටින විට වැදුණු පාර යි ගෙට රිංගිල්ල යි දෙක එකතු වෙලා මනෝධාතුවේ ශක්තියක් සකස් වෙනවා. එම සකස් වීමට යි භූත කියන්නේ. ගෙට රිංගන කොට, නැඹුරු වෙන කොට අර සංයෝග අහුවෙනවා. බල්ලා පාලනය වුණේ

ඌ විසින් නො වෙයි. වැරැද්ද කරන විට වැදුණු පාරෙනුත් නො වෙයි. ඒ අනුසාරයෙන් හැදුණු ශක්තියෙන් ඌට ඉඩ දෙන්නේ නැහැ නැවතත් ඒක කරන්ට. ඒ කරන ශක්තිය ඒ පැත්තේ තිබුණට මේ පැත්තේ තිබෙන ශක්තිය අනුව පසුබානවා. ඒ නිසා, කරන්ට බැහැ. ඕන කෙනෙක් හොඳ වුණා ය කියන්නේ ඒක යි. සංසාරේ එන කොට අපි සැහෙන ප්‍රමාණයක් හැදිලා තියෙනවා. මනුස්සයො වෙලා ඉඳලා ඒවා වැරදිලා, තිරිසන්නු වෙලා නොයෙක් නොයෙක් තැන්වලදී පිට දිගේ පොලු පහර කාපුවා, වෙඩි පහරවල් කාපුවා, වලවල්වල වැටිලා සුමාන ගණන් බඩගින්නේ හිටපුවා මේවා නිකම් යනව ද? ඒවා සියල්ල ම ජීවිතය තුළ භූත කියන නිතිය යටතේ හැදෙනවා. දැන් සමහරු ඉන්නවා හොඳ වැඩක් කිව්ව හැටියේ ඒකට නැඹුරු වෙනවා. සමහරු ඉන්නවා "හොඳ වැඩ කරලා කාට ද හරියන්නේ ?" කියලා ඒ පැත්තට විරුද්ධ වෙනවා. තව ම එයාට හොඳ පැත්තට හැරෙන්ට පාර වැදිලා නැහැ. ඒ නිසා, එතකල් මිනිහා නට - නටා ඉන්නවා. ඒක කරන ශක්තිය එයා ළඟ තවම නැහැ.

අපි කාටත් සන්තෝෂ වෙන්ඩ පුළුවන් අපි සංසාරේ එන ගමන් භූත පාලනයක් යටතේ හැදුණු නිසා. යම් තරමක් ද අර "පඨවි" කී නීතිය යටතේ රූප කලාප, නැත්නම් පරමාණුවකට අයිති ඒ කොටස් කිට්ටු වුණේ, ඒ පමණට පාලනය, ශක්තිය නැති කරන තේජසක් නංවනවා. පාලනය වෙනවා කියන්නේ ටික ටික කාන්දම ඇත් කර ගන්නවා. අවකාශය, ඉඩකඩ වැඩිය රත් නො වෙන්ට ඇත් කර ගන්නවා. ඒ ඇත් වූ තරමට දෙන රශ්මිය ඉවසන්ට පුළුවන්. කිට්ටු වෙලා නිපදවන රශ්මිය වැඩ කරන විට ඉවසන්ට බැහැ. ඒ අදහස ම ක්‍රියාත්මක කරන්ට ඕන. උහුලන්ට බැරි වේග ආ විට සමහරු ගහනවා පුටුවට ඇඳි කැඩිලා ඔක්කොම බිම වැටෙන්ට. ඒ වේග ඒ තරම් අමාරු යි. සමහරු ඉන්නවා කේන්ති ගියාම පුටුවට ගහන්නේ නැහැ. පුටුව උස්සලා වෙන තැනකින් තියනවා. ඒ එයාගේ ප්‍රමාණය. සමහරු ඉන්නවා කේන්ති ගියහම පුටුව උඩ ඉඳගන්නවා. එයා නිකම් නිදහසක් බලාපොරොත්තු වෙනවා. ඒ අර වේගවල තරාතිරමේ හැටි යි. ඇතුළෙන් දෙන රශ්මි ධාරාවේ හැටියට යි ක්‍රියා කරන්නේ. මේ දේශනාවට කන් දීගෙන ඉන්න කොට නොයෙක් ප්‍රශ්න මතුවෙලා එනවා. "අපි වැටහෙන විධියට තේරුම් කරගන්නවා. නැත්නම්

පසුව තේරුම් ගන්ට ක්‍රමයක් යොදාගන්නවා" කියලා ඉවසලා ඉන්ට පුළුවන් නම්, ඒ අයගේ තේජස අඩු බව පැහැදිලි වෙනවා. සකස් වෙන භූතවල සෞම්‍යත්වය එතන පේනවා. භූත කීවේ සකස් වූ රූප කලාපවලට (පරමාණුවලට). පරමාණුවල තිබෙන නා නා තරාතිරම්වල සකස් වීමට භූත කීවේ. වෙන භූතයක් නැහැ.

භූත දෝෂ කියලා තවත් ජාතියක් තියෙනවා. ඒවාත් ඔය නීතිය යටතෙ යි හැදෙන්නේ. මානසිකව බලන විට ඒක වෙනස් කරන්ට කටින් කීවට බැහැ. වෙන ඒ වගේ භූතයකින් ම ඕන ඒක කරන්ට. දැන් යමෙක් කියනවා "මට හිතටත් කරදර යි. ගෙදරත් හරියන්නේ නැහැ. මොක ද දන්නේ නැහැ. කිසි ම වගතුවක් නැහැ" කියලා. එහෙම අවස්ථාවට පැරණි ඥාණවන්තයෝ නුවණින් යුක්ත ව වැඩ යොදලා තියෙනවා. මිනිහගේ මනස දානවා ඊට වඩා ගොහොරු පැත්තකට. දාලා ඒවායින් ගොඩ ඇද්ද විට අර සියල්ල ම ඉවර යි. ඒ මිනිහට කියනවා "ඒක ඇත්ත. එදිරිකාරයෝ නැති කෙනෙක් නැහැ. අවුරුදු දෙක තුනකට කලින් හූනියම් පාළුවක් වළලා තියෙනවා" දැන් මිනිහගේ හිත පාළුවට වැටිලා. හූනියම් පාළුව ගැන යි දැන් සිත වැඩ කරන්නේ. "ඔය හූනියම් පාළුව කපන්ට පුළුවන්, බිමට නො කඩපු අළු පුහුල් ගෙඩියකුයි එක නැට්ටේ දෙහි ගෙඩි තුනකුයි හොයාගෙන ආවොත්" කියලා තියනවා. එක නැට්ටේ දෙහි ගෙඩි තුනක් සොයන්ට සෑහෙන මහන්සියක් දරන්ට වෙනවා. එහෙම මහන්සි වෙන කොට මිහිහගෙ හිතේ තිබුණු භූතය වෙන භූතයකට පෙරළුවා. ඊළඟට දෙහි ගෙඩි තුන යි පුහුල යි කට්ටඩියාගේ පපුව උඩ තියාගෙන මතුරලා මිනිහට ම දෙනවා පුහුල කපන්ට. ඒ කැපුවේ මිනිහගේ මානසික දෝසේ. ඊට දින කිහිපයකට පසු ව මිනිහගෙන් අහනවා "කොහොම ද?" කියලා. "දැන් නම් කරන වැඩත් හරියනවා, ගේත් සිරියාවන්ත යි, ඔක්කොම හොඳ යි". කියනවා. ඒ පැරණියෝ මනෝවිද්‍යාව දැනගෙන හිටියා. මනසට සාත්තු කරන්ට හදපු දේවල් ඒවා. නා නා තරාතිරම්වල භූත ස්වරූප ඔහොම නිර්මාණය වෙමින්, ක්‍රියාත්මක වෙමින් විවිධ ක්‍රියාවල් කරනවා.

යම් කෙනෙක් තදින් අනාචාරයේ හැසිරෙනවා. සමහරු ඉතා භයානක වැඩ කරනවා. නමුත් ඒ පුද්ගලයෙකු වශයෙන් කරන වරද නො වෙයි. ඇතුළේ තිබෙන දෝෂයක වරදින් කෙරෙන වැඩ.

ඒ නිසා පුද්ගලයාට වරදක් කියන්න බැහැ. බුදු හාමුදුරුවෝ ඒකේ මුල දන්නා නිසා මහා කරුණාව කාටත් සාධාරණ ව පැතුරුවා. අපිත් ඒ විධියට යි වැරදි කරුවන් දෙස බැලිය යුත්තේ. අපෙත් ඇතුළේ තිබෙන දෝෂ නිසා වැරදි කරුවන් දෙස කරුණාවෙන් බලන්ට, සලකන්ට බැරි වෙලා තියෙනවා. නිදසුනක් ගතිතොත් බඩේ අමාරුවක් තිබෙන ලෙඩෙකුට "අපවිත්‍ර කරන නිසා මෙහෙ එන්ට එපා" කියලා බෙහෙත් නො කර හිටියොත් ලෙඩා එයින් ම දුර්වල වෙලා මැරෙයි. බෙහෙත් දීලා සුව වුණාට පසුව මිනිහා හොඳ යි. බුදු හාමුදුරුවෝ ධම්මචක්ක සූත්‍රයෙන් උගන්වා වදාළේ කාම සුඛල්ලිකානුයෝගය යි, අත්ත කිලමථානුයෝගය යි අතහරින්ට කියලා. ඒ අත්හැරීම පුරුදු වුණු විට එය මනෝධාතුවේ තැන්පත් වෙනවා. මේකට ඇලුම් කරන්ට දෙයකුත් නැහැ, අමනාප වෙන්ට දෙයකුත් නැහැ කියන එක යි ඔය අන්ත දෙකෙන් පෙන්වා වදාළේ. ඒ ඒ අවස්ථාවල ඒ ඒ වස්තූන් තුළ වූ ස්වකීය ස්වරූපයක් මතුවෙනවා. ඒ වෙලාවට අපි ටිකක් අයින් වෙන එක යි තිබෙන්නේ. ඊට වඩා මොන විදියකින් වත්,යතුගාලා වත් හදන්ට බැහැ. අර කී අන්ත දෙකට අසු නො වී ඉන්ට පුළුවන් උදව්වක් මේ දේශනාවෙන් ලැබෙනවා. බුදු හාමුදුරුවන්ගේ මේ දේශනාවලින් උදව් දෙන්නේ අනර්ථවලට නො වැටෙන්ට යි.

බුද්ධ ධර්මයෙන් උගන්වන්නේ මතු භවයකදී කවදා හෝ සසර දුක් නිවල නිවන් දකින එකක් කියල යි වැඩි දෙනා හිතන් ඉන්නේ. ඒක වැරදි යි. අපේ දියුණුව මේ අවස්ථාවේදී ම, ජීවත් වෙන කාලය තුළදී ම, ලබන්ට ඕන. බොහොම සතුටින්, සිනාමුසු මුහුණින් කිසි හැලහැපිල්ලක් නැති ව ජීවත් වෙන්ට ඕන. මැරුණාම සිද්ධ වෙන දෙය ජීවත් වෙන අපි දන්නේ නැහැ. හොඳ කෙනෙක් මැරුණොත් නරක තැනකට යන්ට බැහැ. ඒක ඒ හොඳ කමේ අයිතිය. ඒ නිසා, එහේ ගැන නො වෙයි හිතන්ට ඕන මෙහේ ගැන යි සිතන්ට ඕන. අපි විඳපු තරමක් දුක් විඳලා තියෙන්නේ ඕන නැති තද බැඳීම් නිසයි. තද ගැටීම් නිසා දුක් විඳිනවා. මේකට ඇලෙනවා. ඒකට ගැටෙනවා. ලැබෙන දෙක ම පුළුවන් විධියට පරිහරණය කරන්ට ඕන. පොත්තත් එක්ක දුන්නොත් පොත්ත ගලවලා කනවා. නො තම්බා දුන්නොත් තම්බලා කනවා. එන හැටියට ගන්ට පුරුදු වෙනවා. එන හැටියට ගන්ට බැරි මොක

ද? එකකට ඇලෙනවා. එකකට ගැටෙනවා. ඔය විධියට නටන තුරු අපිත් ඉතින් ඇතුළෙන් නැටෙනවා. ඒ නැටිල්ල නවතිනවා මේකේ ඇත්ත යුක්තිය තේරෙන කොට. ඒකට රත්නත්‍රයේත් සියලු දිව්‍යරාජයන්ගේත් පිහිට අඩු නැති ව ලැබෙන බව අපට පැහැදිලි යි.

**දෙවෙ දෙවතො සංජානාති** - දේව කියන්නේ පාලනයට යි. සිත පාලනය කර ගත් විට පාලනය කර ගත් තැනැත්තාට ඒ සුදුසු කම්වලට ලැබෙන ආත්ම අයිතිය දේව යි. ඒ අයිතියේ හාස්කම් තියෙන්ට පුළුවනි. පුණ්‍ය බලයේ හැටියට යි ඒ අයිතිවාසිකම. අපි කතා කරන්නේ මෙහේ "දේව" ගැන යි. මැරුණට පස්සේ එක ගැන කතා කරන්ට දෙයක් නැහැ. තමාට පාලනය වෙන්ට තියෙන දෙය තමා තුළින් පාලනය වෙනව නම් ඒකට යි දේව කීවේ. පාලනය වෙන්නේ කොහොම ද? කිසි ම කෙනෙක් හේතුවක් නැති ව පාලනය වෙලා නැහැ. ලෝකයේ කිසිවෙකු එහෙම පාලනය වෙන්නෙත් නැහැ. එක්කෝ බය වීමට හේතුවක් යෙදීමෙන්. එසේ නැත්නම් ඒක එපා වීමෙන්. නැත්නම් එපා වීමට කරුණු යෙදීම නිසා. අපි දැන් පින් කරනවා. අපිට පින් කරන්ට හේතුව මොකක් ද? හිතුණේ මොක ද? යමක් - කමක් ඇති අය "අපට පින් කරන්ට නම් ඕන. නමුත් තව ම වෙලාවක් නෑ" කියනවා. තව ම ඒ අයට පින් කරන හේතු සිතින් ඉදිරිපත් වෙලා නැහැ. සසර පැවැත්මට බය වෙලා නැහැ. බය යි කියන්නේ නියාලු කම නො වෙයි. මෙහෙම වෙන්ට හොඳ නැහැ. ඒකෙන් අනර්ථයක් සිදු වෙනවා. එහෙම කළොත් අනර්ථයක් නො වී බේරෙන්ට බැහැ. අනර්ථයෙන් බේරෙන්ට යි උත්සාහය. ඒකට යි බය කියන්නේ. පාලනයක් යටතට මගේ මේ සිත ඇවිල්ලා තියෙනවා කියලා ඔහුට දැනෙනවා.

යම් කිසි කෙනෙකුට මොනවා හරි එයා නො කරන දෙයත් එයා ඉදිරියෙන් තියලා ඒක කරන්ට කියනවා. "මට බැහැ ඒක කරන්ට. බැරි බව මට දැනෙනවා." ඒ දැනෙනවා කියන එක යි **දෙවෙ දෙවතො සංජානාති** කීවේ. ඒක යි පාලනය. සමහරුන්ට අර බලපෑම නිසා මේක කරන්ට වෙලා තියෙනවා. තවම ඒ බලපෑමට කෙළින් ඉන්ට ශක්තිය නැහැ. එතකොට ඒ අය පාලනය වෙන්නේ කොහොම ද? ඒ බලපෑමට අනුව ඒක කළා. ඊට පසු ව එයාට ඒකේ ආදීනවය තේරුණා. ඒ නිසා, ඒක නො කළ යුත්තක් ම

බව සිතට වැටහුණා. කොයි බලපෑම ආවත් මේවා කරන්ට හොඳ නැහැ. එහෙම වුණාට පසු ව ඒ වගේ බලපෑමක් එන විට ඔය මොන බලපෑම ආවත් මේක කරන්ට හොඳ නැහැ කියල හිතෙනවා. මැරුවත් එයා ඒක කරන්නේ නැහැ. සුලුගල උපාසක තුමා ළඟ තිබුණේ ඒක යි. එ තුමාට කුකුළෙකු මරන්ට දුන්නා. ඒකා මැරුවේ නැත්නම් තමුසෙගේ බෙල්ල කපනවා කීවා. ඒකට නො බියව කුකුළා විසිකරලා දැම්මා. දමලා "ඉතින් කපනවකො මගේ බෙල්ල ! තමුසෙට ඕන කුකුළගේ බෙල්ල මට කියල කප්පවන්න නේ ? මම කුකුළගේ බෙල්ල කපන්නේ නැහැ. මගේ බෙල්ල තමුසෙ කපනවා. මගේ රාජකාරිය ඉවර යි. දැන් තමුසෙගෙ රාජකාරිය යි තියෙන්නේ" රජතුමා මේක අහලා බොහොම ප්‍රසාදයට පත් වෙලා තියෙනවා. අන්න ඒ "දේව" තත්ත්වය යි අපට ඕන. මේක බාගෙට "දේව" නො වෙයි සම්පූර්ණ දේව යි. සම්පූර්ණ "දේව" වැටෙන්නේ ලෝකෝත්තර තත්ත්වයට යි. ස්ථිර වශයෙන් ම වැරැද්ද කෙරෙන්නෙ නැති තත්ත්වයකට පත් වූ හැටියේ ලොකෝත්තර යි. සංසාරෙදි වත්, කවදා වත් ඒ වරද කෙරෙන්නේ නැහැ.

තේමිය කුමාරයාගෙන් ඒකට සාක්ෂියක් පෙන්වන්ට පුළුවන්. අන්තිම පොඩි දරුවා ඔඩොක්කුවේ තියාගෙන පිය රජු යම් යම් නීති පැනෙව්වා, අරයගේ හිස ගසා දමන්ට, මෙයාට වද දෙන්ට, යනාදි වශයෙන්. මේ පොඩි ළමයට බහ තේරෙන්නෙත් නැහැ. පුංචි ළමය "ඒවා කරන්ට එපා" කියන්ඩ දන්නේ නැහැ. ඒත් එදා ඉඳලා මේ ළමයා කැගැහැව්වෙත් නැහැ. බඩගින්නට වත් ඇඩුවේ නැහැ. සද්ද නැති ව ඉන්නවා. මේ ළමයට තේරුණා ද අර දේව කියන ස්වරූපය ? පරම්පරානුගත ව යන හැටි යි මේ තෝරන්නේ. ඒ ළමයා දන්නව ද රජතුමා කළේ හරි නැති වැඩක් කියලා? ඒවා කිසිවක් දන්නේ නැහැ. සංසාරෙදි අනන්ත කාලවලදී මේ ළමයා රජකම් කරලා, ඒවායින් යම් යම් කරදර විඳලා, වැරදි දැකලා, වැරදි බව අවබෝධ කරගෙන තියෙනවා. ඒවායින් නොයෙක් පීඩන විඳපු කෙනෙක්. සංසාර ගමනේදී බෝසතාණෝ යි මේ. රාජ කියන ඇස් දෙකට පේනවා යම් යම් සළකුණු. සිංහාසන පේනවා. රජ ගෙදරට අයිති ආම්පන්න පේනවා. මේ වැඩේට නො වෙයි අර බය වුණේ. රජ ගෙදරක ස්වරූපය සන්තානයට වැටුණු පසු නිමිත්තට බය වුණා.

තාත්තා කළේ මොකක් ද කියලා මේ පොඩි එකා දන්නේ නැහැ. ඒ බය, වැඩ කරන්ට පටන් ගත්තා. අනිත්වා මතක නැහැ. ඒක ම හිතේ වැඩ කරනවා. රජකමට බය වෙලා අවුරුදු දහසයක් ම නොයෙක් වදවලට මූණ පෑවා. ගින්දරවලට වත් බය වුණේ නැහැ. රජකමට ඊට වඩා බය යි. කැලේට ගියාට පසුව යි ඔහුට මහා ප්‍රබෝධයක් ආවේ. සැනසීමෙන් කල් ගෙවනවා. තාත්තා ගියා පුතා ඉන්නව ද කියල බලන්ට. රජ ගෙදරදී හිටියේ කක්කුට්ටෙක් වගේ. කැලේදී දැක්කේ බෙල්ල මහත අත් මහත හොඳ ලස්සන තරුණයෙක්. පියා අහනවා රජගෙදර මේ තරම් රස මුසු තත්ත්වයක් තිබියදී කක්කුට්ටෙක් වගේ ඉදලා කැලෑ කොළ කාලා කොහාම ද මේ තරම් ලස්සන වුණේ කියලා. ඔහු කියනවා තමාගේ බය නැති වුණු බව. අතීත බය, වර්තමාන බය, අනාගත බය සියල්ල නැති වූ බව කීවා. ඒ නිසා, කැලෑ කොළ කෑවත් ඒවායේ රසායන ඕජාව සියල්ල ශරීරයට අදිනවා. ඒ කාලයේ රජ ගෙදරදී බයෙන් සිටි නිසා මොන රස ආහාරයක වත් රසායන ශරීරයට යන විට පිච්චිල යි යන්නේ. ඒ නිස යි මෙහි වෙනස ඇති වුණේ කියලා පහදලා දුන්නා.

අතීතයේ ගෙන ආ ශක්ති පාලනය විසිනුයි මේ ළමයාට අර මානසික තත්ත්වය ඇති වුණේ. මේක මේ දරුවා කාගෙන් වත් අහල කරපු එකක් නො වෙයි. නමුත්, පොතේ තියෙන්නේ මෙයාගේ පෙර ජාතියක මෑණි කෙනෙක් වූ දෙවියෙක් ඇවිල්ලා කිව්ව ලු එහෙම කරන්ට කියලා. ගොළුවෙකු, බිහිරෙකු වගේ ඉන්ට කියලා. කවුද ඒ දෙවියෝ ? දෙවියෙක් තමයි' කීවේ. "දේව" කියන පාලනය විසින් සිතට පෙන්නුවා මෙහෙම යි කළ යුත්තේ කියලා. තේමිය කුමාරයාගේ පාලනය විසින් දුන්නු එක දෙවියෙක් විසින් දුන්න යි කියන එකේ කිසි ම වරදක්, අඩුවක් නැහැ. ජීවිතය ඇතුළෙන් ආ පාලන ශක්තියත් ඒ පාලනය විසින් තමන් ව පාලනය කරනවා හොඳ පැතිවලට.

දේව කියන ශබ්දය තුළ තරාතිරම්, භේද ගොඩක් තියෙනවා උච්ච, මධ්‍යම, හීන කියලා. මොන ම ලෙසකින් වත් ඒ වැරදි දෙය කරන්ට බැරි නම් එය උච්ච අවස්ථාව යි. මධ්‍යම අවස්ථාවට ආ විට සෑහෙන ප්‍රමාණයකින් පාලනය වෙනවා. ඒක බිඳෙන තදබල එකක් ආවොත් එයා ඒකට ටිකක් නැමෙනවා. හීන තත්වෙයෙන් යුක්ත කෙනා පාලනය කරනවා. පොඩි වෙනසක්

වුණු හැටියේ එයා ඒක නවත්වනවා. හීන තත්ත්වයේ සිට මධ්‍යම තත්ත්වයට සහ මධ්‍යම තත්ත්වයේ සිට උච්ච තත්ත්වයට යි එන්නේ. ඒ නිසා, හීන තත්ත්වයෙන් කාටත් පටන් ගැනීමට සිදු වෙනවා. ඒක කාටත් සාධාරණ යි.

දැන් කිසියම් කෙනෙකු තව කෙනෙකුට ප්‍රිය වෙන්නේ ඇයි? මෙයාගේ භූතවලට ගොදුරු වෙන, ආකර්ෂණය වෙන, ශක්ති එයාගේ භූතවල තියෙනවා. ඒක යි එ සේ ප්‍රිය වෙන්නේ. නැත්නම් සියලු දෙනාට ම ප්‍රිය වෙන්ට ඕන. මේවා වෙන්නේ භූත නිසයි. හැම තැන ම තියෙන්නේ භූත යි. පාලනයෙන් යුතු භූත, පාලනයෙන් තොර භූත කියලා වර්ග - දෙකක් තියෙනවා. දේවවලින් එහාට දියුණු වුණාට පසු ව ඒවායේ ලකුණු වෙනම තියෙනවා. පාලනය වෙන්නේ සකස් වෙන විට යි. පාලනය වෙන්නේ මොන ක්‍රමය යටතේ ද කීවොත් සකස් වෙන විට යි පාලනය විය යුත්තේ. සකස් වූවාට පසු පාලනය කරන්න බැහැ. හේතුවලින් පාලනය වෙනවා. අපට ඒ ගැන අයිතිවාසිකමක් නැහැ.

# 07

මූල පරියාය සූත්‍රයේ "**සබ්බ ධම්ම මූලපරියාය**" යි කී නිසා සියලු ධර්මයන්ගේ මුල් පිළිවෙල කියන අදහස ගන්ට ඕන. සංසාර කියන වචනය එක්ක අපගේ මේ කතාව සම්බන්ධ කරන විට ඒ භූත කියන සකස් වෙන තත්ත්වයේ තිබෙන්නේ හැම විට ම අලුත් දෙයක්. මේ ධර්මය අහවල් දවසේ ඉඳලා සකස් වුණා කියා දැන් තියෙන්නේත් ඒ ධර්මය ම යි කියලා කියන්ට බැහැ. යම් දවසක යම් ධර්මයක් සකස් වුණොත් ඒ සකස් වූ ධර්මයට මිශ්‍ර වෙන තවත් දේ තියෙන නිසා ඒ ධර්මය එ තැනදී අවසාන යි. ඒ අනුසාරයෙන් ඒක සම්බන්ධ කරගෙන තවත් ධර්මයක් හැදෙනවා. ඒ ධර්මයත් පෙරළෙන විට තවත් ඒවා ඒකට එක්කාසු වෙනවා. ඒ එක්කාසු වීමේ ක්‍රමය යි සංසාර කියන්නේ. සංසාරෙට වැටීම යි සංසාරයෙන් බේරීම යි කියලා වගී දෙකක් බුදු දහමේ උගන්වනවා. එයින් සංසාරයේ නැවතී සිටීම කියලා එක ධර්ම පැත්තක්. ඒ ධර්ම එකින් එකට හැදෙනවා. අලුත් වෙනවා. ඒ විධියට දිගින් දිගට යනවා. එක ම සීමාවක් ඇතුළෙ යි ඔය සියල්ල ම වෙන්නේ. සියලු ධර්ම පෘථග්ජන පුද්ගලයාගේ හැදෙන්නේ අල්ලල යි. පෘථග්ජන මිනිස් ආත්මයට ආව වෙලාවේ ඉඳලා ක්‍රමානුකූල ව අලුත් එකමුතුවක් යටතෙ යි සකස් වෙන්නේ. සිතුවිලි හොඳ පැත්තට හැරෙන්ට යි මේ එකමුතුව.

සිතුවිලි සාරවත් පැත්තට හැරෙන අවස්ථාව යි මිනිස් අවස්ථාව. සත්ත්ව අවස්ථාවට සුළු සුළු හැඟීම් ඇති වෙනවා "මෙතනින් යන්ට හොඳ නැහැ. උගුලේ අසුවෙනවා" යනාදි වශයෙන්. ඒ හැරෙන්ට, සිතුවිලි හොඳ පැත්තට හරවන්ට සතාට ලැබෙන සහාය සම්පත්තිය මදි. මිනිසා ලෝකීය ධර්ම තුළින් වුවත් ඒවායේ කටුකත්වයෙන් මිදෙන්ට දන්නවා. ආහාර ගැනීමේදී, වෙන යමක් ගැනීමේදී, තර්ක කිරීමේදී, හොඳ පැත්තට හැරෙන එක්තරා සංවිධානාත්මක ස්වරූපයක් තිබෙනවා. අන්‍ය ආගමිකයන්, අන්‍ය

ලබ්ධිකයන් තුළත් මේ ස්වරූප තිබෙනවා. බෞද්ධයන්ට තියෙන ලාබය ඉක්මනින්, නිසියාකාර ව, සාර්ථක අන්දමින් එය කරගෙන යාමට නියම මාර්ගයක් ලැබී තිබීම යි. අනෙක් අයට නො ලැබුණු විදියට, කෙටියෙන්, එහෙත් මෙහෙත් පැන ගැනීමට ක්‍රම බුදු පියාණන්ගෙන් ලැබිල තිබෙනවා අපට. සාමාන්‍ය මිනිසෙකුට මේ තත්ත්වය ලබන්ට, භූත තත්ත්වය දේව තත්ත්වයට එන ක්‍රම අනුගමනය කරන්ට වෙන්නේ මහත් දුෂ්කරතාවලට මුහුණ දීල යි. බොරුවක් කියන එක, නරක වචන කියන එක අනර්ථයක් වෙන වැඩක් බව එයාට වැටහෙන්නේ බැණුම් අහල, ගුටි කාලා, ඒවායේ අත්දැකීම් ලැබුවාට පසුව යි. බොරු කීමට අවස්ථාවක් එනවා. එ විට එයා ඒක නවත්වනවා. බොරු කීමේ එක්තරා ශක්තියකුයි මෙයා නැවැත්වූයේ. නැවැත්වූයේ තිබුණු දෙයින් කොටසක්. ඕක වෙන සිතක් ය කියල කියන්ටත් බැහැ. ඒ සිතේ ම කොටසකුයි. නමුත්, ඒ සිත ම නො වෙයි. කොටසක් නැති නිසා ඒකම යි කියන්ට බැහැ. **න ච සො න ච අඤ්ඤො** කීවේ ඒක යි. මේකෙන් අපිට පේනවා අපි හැම වෙලාවෙ ම චුත වෙනවා. ප්‍රතිසන්ධියකුත් ලබනවා. අපේ ළඟම යි, මේ ශරීර කූඩුව තුළම යි, චුත වෙන්නෙත්, ප්‍රතිසන්ධිය ලබන්නෙත්. නිරුද්ධ වෙන සිතට තව මොකක් හෝ එකක් එකතු වෙනවා. සම්බන්ධ වෙනවා. ඒක යි ප්‍රතිසන්ධි කථාව ආවේ.

අපි හැම දෙනා ම සංසාරේ ගමන් කරමිනුයි සියලු ක්‍රියා කරන්නේ. ඒ ගමනේ හැම වෙලාවෙ ම ඉදිරියට යාමකුයි කෙරෙන්නේ. ඉදිරියට යාමේ අවසානයක් තිබෙනවා. පැත්තට යාමේ අවසානයක් නැහැ. වර්ණ, ගන්ධ, රස කියන තුනේ පැවැත්ම රඳවන ශක්තිය පඨවි, ආපො, තේජෝ, වායෝවලින් දෙනවා ඒ දුන් බලපෑමේ ප්‍රමාණය අනුව වර්ණ, ගන්ධ, රසවල පැවැත්ම රඳවන එක යි ඕජා කියන්නේ, ජවය කියන්නේ. පැවැත්ම රඳවන ශක්තිය, ඇතුළේ රඳවන ශක්තිය ඕජා යි. ඕජා ශක්තිය, අභිධර්මයේ විග්‍රහ වෙන්නේ **ජීවිතේන්ද්‍රිය රූප** නමිනුයි. ජීවිතේන්ද්‍රිය රූප තිබී ජීවිතය පැවැත්වීමට රූප්පණය වීම යි,වෙනස් වීම යි කෙරෙන්නේ. එ සේ නැති ව රූප කියලා වර්ගයක් නැහැ. පවත්වන විධියට ක්‍රියාත්මක වෙනවා නම් ඒක ජීවිතේන්ද්‍රිය රූප යි. ජීවිතේන්ද්‍රිය රූප මැරීගෙන යනවා කියන්නේ පවත්වන ශක්තිය දැන් ක්‍රියා කරන්නේ නැහැ කියන එක යි. පවත්වන්ට රූප්පණය වෙන්නේ නැහැ.

බෞද්ධ දර්ශනයෙන් උගන්වනවා නා නා තරාතිරම්වල වටිනා පැවතුම්. බෞද්ධයන්ට මෙ පමණ හොඳ දර්ශනයක් ලැබිලත් ප්‍රතිපත්ති රකින්නේ නැහැ කියලා සමහරු දෝෂාරෝපණය කරනවා. නමුත්, ඒ මිනිහට වටිනා පැවතුම්වලට වැටෙන්ට ඒවා ප්‍රත්‍යක්ෂ වෙන්ට ඕන. දන් දෙනවා, සිල් රකිනවා, භාවනා කරනවා කියලා සම්මත දේ කරනවා. නමුත්, එයා ළඟ ධර්ම දියුණු වෙලා නැහැ. ධර්ම දියුණු වෙන්නේ කවදා හෝ ඒවා තමාගේ සිත තුළින් තීරණය වුණාට පසුව යි. ඒක යි ප්‍රත්‍යක්ෂය. දැන් බොහෝ දෙනා කියනවා ඒක දැන් මම නවත්වලා කියලා. ඒක නැවැත්වීමේ හොඳකම, සැනසීම, එයාට තේරිලා තිබෙනවා. ඒක කළාම ලැබෙන පලයත් නො කළ විට ලැබෙන පලයත් කියන දෙක දිහා බැලීමෙනුයි නරක දෙය එයා නවත්වලා තිබෙන්නේ. සැනසීම ලැබීම සඳහා නො සැනසීම ලැබෙන එක අත්හැරියා. ඒ විධියට යි මේ පාලනය එන්නේ. එහෙම පාලනය වෙන එක්කෙනාට මේ බෞද්ධ දර්ශනය ලැබුණු විට හිතනවා අපට තිබෙන්නේ දීර්ඝ කාලීන ගමනක් කියන එක. මේක ඉක්මනින් සකස් කර ගන්නා ක්‍රම, කෙටි ක්‍රම, බෞද්ධ ධර්මයෙන් උගන්වා තිබෙනවා.

මාසෙකට එකක් දෙකක් හරිගස්සමින් සිටින කෙනාට මිනිත්තුවට පණහක් - හැටක් හදාගන්ට උදව්ව ලැබෙනවා නම් ජීවිත කාලයක් දුක් විඳින්ට තිබෙන එක කෙටි කරගන්ට පුළුවන් බව දැනෙනවා. පුද්ගලයා ඒකට උත්සුක වෙනවා. නිදසුනක් ගත හොත් එක රැකියාවක් කරල ලබන වැටුපෙන් ඉඩමක්, ගෙයක් ගන්ට බැරි බව දැන ගත් පුද්ගලයා අතිකාලත් කරනවා. තව වෙනත් රැකියාවකුත් කරලා මුදල් උපයන්නා වගේ වැඩක් බව වටහා ගන්නවා. බුද්ධ සාසනය ඒ වගේ එකක්. බුද්ධ සාසනය අපට හමු වූ නිසයි පාලනය ඉක්මන් වෙන්නේ. පාලනය නිරවුල් ව ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසයි බුද්ධාගම් කාරයෙක් වීමේ අගය අපි සළකන්නේ. ඒ වටිනාකම යි අපට හිතෙන්ට ඕන. එ සේ නැති ව, අපගේ බුදු හාමුදුරුවෝ යමක මහා ප්‍රාතිහාර්ය දක්වලා තිබෙනවා. බුදු හාමුදුරුවෝ සම්මා සම්බුද්ධ යි කිය කියා හිටියට විතරක් වැඩක් නැහැ. උන් වහන්සේ අවබෝධ කළ ජීවිත සුබ සිද්ධිය, ධර්ම ස්වරූප ප්‍රයෝජනයට අරගෙන ඕන වැඩේ කරගන්ට. අපටත් පෙන්වා දුන්නා මේ වැඩේ කර ගන්නේ මෙහෙම යි කියන එක. අවුරුදු කෝටි කල්ප

ගණන් ඉදිරියට යන මිනිසාට හැකියාව යි, උත්සාහය යි තිබෙනවා නම් මේ ආත්මයේදී ම වැඩේ කරගන්ට පුළුවන්. රහත් වුණා කියලා සඳහන් කරලා තිබෙන අයට බුදු හාමුදුරුවෝ මුණ නො ගැසුණා නම්, ඒ ඇත්තන්ගේ අර හැකියාව තිබුණත් අර සහාය නො ලැබුණු නිසා ඒ අය කොහේ යයි ද, කොහෝ ඉඳී ද, කවදා අවසන් වෙයි ද කියන්ට බැහැ.

බුදු හාමුදුරුවන්ගේ ධර්ම ක්‍රම ජීවිතයට සම්බන්ධ වූ නිසා ඔය නිකම් තියපොත්තෙන් කඩ - කඩා ඉන්ට ඕන නෑ. එක පාර ම පදාසයක් ගලවල යන්ට ඩයිනමයිට් එකක් දානවා වගේ ක්‍රමයක්. කෙලෙස්වල මහා පදාස ගලවලා යන ක්‍රම යි බුදු හාමුදුරුවෝ දේශනා කොට වදාළේ. අනුමාන ඥානය, අවබෝධ ඥානය කියලා බුදු දහමේ ක්‍රම දෙකක් තිබෙනවා. යම්කිසි පැහැදිලි කිරීමක්, විස්තරයක් විවරණයක් කරන කොට කන් දීගෙන ඉඳලා එහෙම කළොත් එහෙම වෙන්ට පුළුවනි. එහෙම වෙන්ට ඕන. ඒක හොඳ ක්‍රමයක් කියලා තමාගේ හිතෙන් විග්‍රහ කරලා ඒක පිළිගන්නවා. එහෙම ම යි කරන්ට ඕන. වෙන කරන ක්‍රමයක් නැහැ. ඒකට කියනවා **අනුමාන ඥානය** කියලා. ඒ කී පිළිවෙලට කළ නිසා, පැවතුම් සකස් කළ නිසා ඒ එන ප්‍රතිඵලය දෙස බලා තීරණය කිරීම **අවබෝධ ඥානය** යි. ඉස්සර ගෙදරට යන කොට හරි ම කරදර යි. දැන් එහෙම නැහැ. කරදර නො එන පිළිවෙලට යි එයා ගෙදර යන්නේ. එයා කරදරයක් නැති ව ගෙදරට යන ක්‍රමය දැන ගත්තා. ඒකට කියනවා **ප්‍රත්‍යක්ෂ ඥානය** කියලා. අනුමානය නො ලබා අවබෝධය ලබන්ට බැහැ. ප්‍රශ්න අහමිනුත් කරන්නේ අනුමානය පැහැදිලි කර ගැනීම යි. අවබෝධ නො ලබා ප්‍රත්‍යක්ෂය ලබන්ට බැහැ.

මේ දේව කියන ස්වරූපය පෙරළි - පෙරළී ඇවිල්ලා මේ එන්නේ **ප්‍රජාපති** වෙන්ට යි. ප්‍රජාවගේ අධිපති ප්‍රජාපති යි. ඇහෙන් බලන විට නරකක් නො වෙන්ට ඇහේ අණු හැදෙනවා. ඇහීම ආදි ක්‍රියා පහේදී ම තමාගේ සිත පාලනය කරනවා. යමෙක් තමා ඉදිරියේදී ම දොස් කියනවා. ඒ අවස්ථාවේදී තමාට දැනෙනවා නම් මේ අහන එක හිත නරක් කරගෙන ඇහුවොත් නිතර ම මට හිත නරක් කරගෙන අහන්ට හේතු සකස් වෙනවා. ඒ මිනිසා ඕන එකක් කියපුවාවේ! මා හිත විතරක් නරක් කරගෙන ඕව අහන්නේ නැහැ. මා හිත නරක් කරගත හොත් මට යි පාඩුව.

හිත නරක් කර ගැනීම යි පාඩුව. එච්චර යි පාඩුව. එයා මොනවා කීවත් මට පාඩුවක් නැහැ. ඔය ඉන්ද්‍රිය පහ පාලනය කරගෙන යන කොට ඒ පහේ ක්‍රියාවලදී කාම පහේ උග්‍ර ම ක්‍රියාවේග යි අපි පාලනය කළේ. කාම පහේ ඒ උග්‍ර වේග නිසයි අපිට ඉහිලුම් නො දෙන ප්‍රතිඵල ලැබිලා තියෙන්නේ. ඒ උග්‍ර ප්‍රතිඵලය දැනගෙන අහන්ට ඕන. අපට අමනාපයක් හෝ බැඳීමක් හෝ නො එන විධියට යි අහන්ට ඕන. මේ පහේ ක්‍රියාකාරීත්වයේදී ඔය විධියට යි සිතන්ට ඕන.

යම්කිසි පුද්ගලයෙක් තමන්ව වර්ණනා කරන කොට ඒ අවස්ථාවේදීත් අපි නරක් වෙනවා. බැඳීමකින් යුක්ත ව හිනා වෙවී මෝඩයා වගේ අහගෙන ඉන්නවා. එහෙම අහන් හිටීම නිසා එයාට ලෙඩක් බෝ වෙනවා. මිනිසුන්ගෙන් හොඳ අහන්ට ඕනැ යි කියන ලෙඩේ බෝ වෙනවා. දැන් එයා දුක් විඳින ජාතියේ පුද්ගලයෙක් වෙලා. යමෙක් තමා ගැන හොඳ කියන විට අප සිතිය යුත්තේ කෙසේ ද? "මේ මිනිහා කියන තරමක් බොරු කියන්නේ. එයා කොහොම ද දන්නේ මා ගැන ? එයා දවසේ පැය විසිහතර ම මා ළඟින් ඉන්නවා ද? මා විතර යි මා ගැන දන්නේ. මෙයාලා මාව අග්‍ර විධියට පිළිඅරන්. කමක් නෑ! ඒ අය සතුටු වෙනව නේ? ඒ නිසා මට කමක් නෑ" කියා සිතිය යුතු යි. තමා ගැන නරක කියන කොටත්, "ඒ මිනිහට නරක් වුණාට මට මොක ද? ඒවා මෙලොව යකෙක් දන්නේ නෑ. මම විතර යි මා ගැන දන්නේ. ඒ නිසා ඒ කියන්නෙත් බොරු" කියා සිතුවොත් ඒ මට්ටමට තමාගේ හිත පරිහරණය කරන විට කාම වර්ග පහ පාලනයට වැටෙනවා.

භූත තත්ත්වයෙන් සත්වයෙකුගේ පැවැත්ම රඳවනවා දුක ද සැප ද කිසිවක් දන්නේ නැති මට්ටමට. දේව තත්ත්වයෙන් පැවැත්ම රඳවන්නේ දුකක් නැති මට්ටමට. කලින් සැප ද දුක ද මුකුත් නැහැ. ජීවත් වෙනවා. ජීවත් වෙන ශක්තිය යි භූතවලින් කීවේ. දේව කියන තත්ත්වයට ආ විට ජීවත් වෙනවා. පාලනය වූ තරමට සැපයකුත් තියෙනවා. සැපය කීවේ දුක් නැති කමක් තියෙනවා කියන එක යි. ඒක විශේෂ අලුත් ධර්මයක්. විශේෂ අලුත් ධර්මයක් කියන්ට හේතුව කලින් කුමක් හෝ දුකක් විඳින්ට යි සකස් වී තිබුණේ. ඒවා අලුත් අලුත් විධියෙන් විඳිනවා. නමුත් දැන් මේ මට්ටම යි සකස් වී තිබෙන්නේ. ජීවත් වෙනවා. ඇතැම්

දේවලින් දුක් විඳින්නේ නැහැ. තවත් තිබෙනවා දුක් විඳින දේවල් හරිගස්සා ගන්ට. ලෞකික වශයෙන් පීඩා නො විඳින තැනට එයාට ශබ්දය ඇහුණාට, දර්ශන පෙනුණාට ඒ තරම් කලබල වෙන්නේ නැහැ. එක්තරා පාලනයක් යටතෙ යි එයාගේ සිතුවිලි සංවිධානය කරල තියෙන්නේ. සිතුවිලි නො වෙයි එයා සංවිධානය කළේ. එයා සංවිධානය කළේ සිතුවිලිවල උපකාරයෙන් ශරීරයේ පැවැත්ම රඳවන රූප කලාප යි. පරමාණු සංවිධානය කළා හොඳ සිත් පහළ වෙන විධියට. අපේ සිතුවිලි පහළ වීමෙන් ශාරීරික පරිවර්තනය වීමේදී පරමාණු පෙරළීම යි අපි කරන්නේ. ඔක ජීවිතයකින් පිටස්තර ව කරන්ට පුළුවන් ක්‍රියාවක් නො වෙයි. බුදු හාමුදුරුවෝ ඒ බව පෙන්වා වදාළේ **"සමණෝ නත්ථි බාහිරේ"** යනුවෙනි. මේ සමනය වීම පිටස්තර තැනක කර ජීවිතය ඇතුළට සම්බන්ධ කරන්ට බැරි බව යි.

ඊළඟට සිදු වෙන තත්ත්වය ප්‍රජාපති යි. මේ තත්වෙය පැහැදිලි කිරීමට උපතක් පහළ වෙන ක්‍රමය ගත යුතු යි. ඇහෙන් නම් ආලෝක තරංග හැදිච්ච හැටි. ඇහේ අණු පුපුරනවා. පුපුරලා නිකුත් කරන තාපය, විද්‍යුත් කාන්දම්. ඔය ගොනුව ඇහේ කෙරෙන සිද්ධියක්. ඇහේ ලේ ධාතුවේ තිබුණා නම් අර පාලනය වූ රූප කාමය - දුක් නො විඳින තත්ත්වයේ, පාලනය වූ ලේ නම් අර රූප කාමවල තිබුණේ - ඒ රූප කලාප නම් ඒ ක්‍රියාවේදී රූප්පණය වුණේ - අඩු තාපයකුයි ඒ අවස්ථාවේ හැදෙන්නේ. ඒ වගීයේ ම රූප කලාපවලට අයත් හදවතේ ඇති රූප කලාපවල ශක්ති යි නිකුත් කරන්නේ. අඩ පතක් පමණ ලේ හදවතේ තිබෙන බව බුදු හාමුදුරුවෝ වදාළා. එක දොස්තර මහත්තයෙක් හදවතක් කපලා බලා හදවතේ අඩපතක් හෝ කෝප්ප භාගයක ලේ නැතැ යි කියලා තීරණය කරනවා. හදවත ආශ්‍රිත ව ගමන් කරන ලේවල ඔක්කොම මිරිකලා බැලුව හොත් අඩ පතක් තියෙනවා. අඩ පතක් කීවේ "පමණ" යන වචනය සමඟ. එක් එක් අයගේ හදවතේ සුළු වශයෙන් අඩ පතට අඩු වැඩි වෙනවා. හරියට ම අඩ පත යි කීවා නම් හරියන්නේ නැහැ.

දේව තත්ත්වය ප්‍රජාපති වුණේ කොහොම ද? ලේ ධාතුවේ තිබෙන හැම අණුවක් ම, රූපකාම, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ කාම ඔක්කොම හොඳ අතට හැරිලා, බලන කොටත් හොඳ හිතක්. අහන කොටත්, ඉන්ද්‍රිය පහේ ම ක්‍රියාවන් කරන කොටත්

හොඳ හිතක් පහළ වෙනවා. හොඳ හිත් පහළ වුණේ නරක ඒවා හැදෙන්ට වුවමනා කරන ආකාරයේ උෂ්ණත්වය ඒවාට නො දී නරක ඒවා බිඳෙන්ටත් හොඳ ඒවා හැදෙන්ටත් හිතේ උෂ්ණත්වය පාලනය කරගෙන සිටි නිසයි. ඒකට සාක්ෂියක් ගනිතොත් දැන් යම්කිසි කෙනෙක් තමාගේ හොඳ කියන කොට එයා ඒක අහගෙන ඉන්නවා. නමුත්, සිතින් පිළිගන්නේ නැහැ. එතකොට වුණේ මොකක් ද? අල්ලන මට්ටමට සිත ගියේ නැහැ. ඉන් මෙහා ඒක නැවතිලා තිබුණා. අරයා කියවනවා, කියවනවා. කියවලත් ඉවර යි. ඒ අල්ලන කාලය තුළදී අහගෙන හිටියා. ඒ කාලය තුළදී බිඳිලා තියෙන්නේ නරක රූපකලාප. මෙයාගේ හිතේ තියෙන්නේ හොඳ රූපකලාප නිසා, ඒ බිඳෙන අතරේ හැදෙන අණු ඔක්කොම හොඳ අණු යි. එක වරක් ඔහොම හදලා ජීවිතේට ම පරිහරණය කරන්ට බැහැ. අර විධියට කෙරෙන්ට ඕන. අරයත් ඒ විධියට පරිහරණය කරන්ට ඕන. එ විට ප්‍රජාපති වෙනවා. හැම වෙලාවෙ ම ප්‍රජාවට අධිපතියෙක් ඉන්නවා. කලින් හැම අවස්ථාවෙ ම හිතක් පහළ කරන විට ඒ හිත පහළ වෙන්ට උදව් වුණු පරමාණු හොඳ හිතක් හැදීමට අධිපති වූ නිසාත් ඒ වගේ හොඳ හිත් පහළ කරන්ට තවත් අණු තියෙන නිසාත්, මේ සිත පහළ කරපු අණු "පති" වුණා. අනිත් අණු සියල්ල ම "ප්‍රජා" වුණා. මේ සිත පහළ කරන්ට උපකාර වූ යම් අණු ජාතියක් වේ නම් ඒවා ඒ අවස්ථාවට අධිපති වුණා. මේ අධිපති බව මුළු සිරුරේ ම තියෙනවා. ඒ කොයි අණු ඇවිත් සිත පහළ වුණත් පහළ වෙන්නේ මෙ බඳු සිතක් - හොඳ සිතක්.

අණු අතරෙන් දැන් සිත පහළ වීමට ඉදිරිපත් වුණේ මේ අණු ටික නිසා ඕක "**ප්‍රජාපති**" වුණා. **පතිරූප දෙස වාසො ච** කීවේ ඕක යි. තමන්ට ඒ සිතට නිරන්තරයෙන් සැනසිල්ලේ පහළ වෙන්න පුළුවන් කරන වටා පිටාවක් එක්ක ඒ සිත ජීවත් කරනවා නම් ඒක විතර යි **පතිරූප දෙස වාසො ච** යනුවෙන් අදහස් කරන්නේ. අපට ඕක තෝරලා තිබෙන්නේ "හොඳ ප්‍රදේශවල වාසය කිරීම" යනුවෙනුයි. ලෝක ධාතුවේ එක තැනක වත් හොයාගන්ට නැහැ හොඳට තිබෙන ප්‍රදේශ. ළමයෙක් කවුරුත් නැති තැනක හිටගෙන ඉඳලා දූවල ඇවිත් කහනවා. කුඹි කාලා. ළමයා කවුරුත් නැති තැනක හිටියේ කිසි කරදරයක් නැති ව ඉන්ට. එ තැනත් කුඹි හිටියා. මේ ලෝක ධාතුවේ කොතනක වත් නැහැ ඔය කියන

**පතිරූප දෙස වාස.** හොඳ යි, අපි කියමු බෞද්ධ රටක් ලංකාව කියලා. මොකක් ද වෙලා තියෙන හොඳේ ? කවුරුත් පාහේ ඉතින් "අනේ! අපොයි!! කරදරයි" ගගා කෙඳිරියෙන් ජීවත් වෙන්නේ. මෙතන ඉන්න මේ අය කියනවා රටේ - තොටේ කරදර තියෙනවා කියල. අපට ඒවා කරදර නො වෙයි. රටේ තියෙන ඒවා නේ? ඒවත් එක්ක අපි ඉන්නවා. මේ අයගේ අණු එක්තරා දුරකට පාලනය වෙලා නිසා දිගින් දිගට හොඳ සිත් පවත්වන්ට එය පහසුවක් වෙලා නිසයි කරදර ය යි සම්මත නිමිති ඉදිරියේ සැනසිල්ලේ ඉන්නේ.

හැදුණු සමාධි සිතකින් පැයක කාලයක් ඉන්ට බලන්ට. ඒ කාලය තුළ මුළු ශරීරයේ ම හැදෙනවා ලෙය ප්‍රජාපති ලෙස. ඒ වෙලාව ඇතුළත වෙන අවුලක් හදාගත්තොත් ප්‍රජාපති වෙන්නේ නැහැ. දේව යන පාලනය යටතේ හැදුණු විට ඊළඟට ප්‍රජාපති වෙනවා. ඒක දිගට ම අනුගමනය කළ විට එයාගේ ලක්‍ෂණය කුමක් ද? ප්‍රජාපති වුණාම එයාට මොනවා ඇහුණත් එ තරම් දෙයක් නැහැ. ඔන්න එයාගේ අහවලා විපතට පත්වුණා යි කීවා ම එයාට කලබලයක් - දැඟලිල්ලක් නැහැ. ඒ තත්ත්වය එයාට දුක් දෙන තත්ත්වයක් නො වෙයි. එයා සත්පුන් ව කාරණයට ඉදිරිපත් වෙනවා. කුණු ගොඩක් පෑගුණා. ඒකත් එයාට දෙයක් නො වෙයි. හෝදගෙන යනවා. හැම තැන ම ඒ පාලනය වෙන කොට කුණු ගොඩ පෑගුණත්, අහවලා මළත් එක ම සැප සිත යි. සැප යි කීවේ ඒවායින් දුක් විඳින්නේ නැති නිස යි. එයාට කෙනෙක් යම් තරම් කෝටි ගණනක මුදලක් දෙනව යි කීවත් පීඩාවක් නැහැ. ඒ නිසා, ඒ අවස්ථාවේදීත් සැප යි. මොන ම කරුණකින් වත් දුක් විඳින්නේ නැහැ ප්‍රජාපති සිත සැකසුණොත්. දැන් සමහරුන්ට ලොතරැයි ආදිය වැටුණු හැටියේ කවුරු හරි ඇහුවොත් මේ මුදල්වලින් මොකක් ද කරන්ට බලාපොරොත්තුව කියලා, මිනිහා ඉස්සෙල්ල ම කියනවා "සියක් නමකට සාංඝික දානයක් දෙනවා" කියලා. එතෙන්දී ම මිනිහගේ හිත නරක් වෙනවා. ඒ දානය දෙන්ට බැහැ සුලු මුදලකට. අහවල් මිනිසුන්ට උදව් කරනවා ය කියනවා. ඒ කෙලෙස්වලින් ගහපු පාර. කෙලෙස්වලින් මිනිසුන් ඉදිරියේදී කරන්ට අපහසු දේ කියනවා. ලැබුණු මුදල මදි අරව කරන්ට. ඊට වඩා නරක ද ඇහුව ම මොක ද කරන්ට බලාපොරොත්තුව කියලා, ඉතින් පසුව කල්පනා

කරලා දෙන එකක් දෙන්නෙ නැතැ යි කියල හිටියාම ඉවර නේ? ප්‍රජාපති නැති නිසයි එහෙම කියන්ට බැරි. අරක ඇදුණු වෙලාවේ ඉඳලා මිනිහට කුලප්පුව හැදිලා. ඒ නිසයි දුක් විඳින්නේ.

දැන් මේ කාටත් තේරුම් යන්ට ඇති අපි යම් දුකක් විඳිනවා නම් අපේ නො දැනුවත් කම නිසයි ඒ විඳින්නේ කියලා. මේක මෙහෙම හදන්ට පුළුවන් බව අපි දැනගෙන හිටියේ නැහැ. අපට සුලු වැඩ යි කරන්ට තියෙන්නේ. ලාභ - අලාභ, යස - අයස, ප්‍රශංසා - නින්දා, සැප - දුක් කියන ධර්‍ම අවේදී ම සිත කම්පනය කරගන්නේ නැති ව - පීඩාවට පෙරළ ගන්නේ නැති ව අකම්පනීය ලෙස සිටින්නට පුරුදු වෙන එක යි, උත්සාහ කරන එක යි. එ සේ කරලා දුක් නො විඳ සිටින එක යි.

මේ ධර්‍ම අට පිළිබඳ තෝරලා තිබෙන්නෙත් ලෝකයේ ඔය අට තිබෙනව යි කියල යි. බුදු හාමුදුරුවෝ ලෝක නාමයෙන් වදාළේ තමන්ගේ සිත තිබුණ තත්ත්වයෙන් අන්‍ය තත්ත්වයකට පෙරළී යාම යි. මේ අටට තමයි සිත කොයි පැත්තෙන් හෝ පෙරළෙන්ට පුළුවන් වෙන්නේ කියල යි බුදු හාමුදුරුවෝ දේශනා කොට වදාළේ. මේක ලෝකයේ තියෙන එකක් නො වෙයි. අපේ සිතේ තියෙන එකක්. ඒ අවේදී සිත නරක් නො වී පෙරළෙන්ට ඉඩ දෙනවා. ඒක ලාබ යි. වැඩිය ලැබුණු එකත් පිළිගත්තා. හිතේ වෙනසක් නැහැ. තිබුණ දේ නැති වුණා. ඒත් වෙනසක් නැහැ. අනිකුත් සියල්ලේදී ම සිත වෙනසකට පත් කර ගන්නේ නැත්නම් අටලෝ දහමින් කම්පිත වෙලා නැහැ. **"ඵුට්ඨස්ස ලොක ධම්මෙහි - චිත්තංයස්ස න කම්පති."** යන සැපය උදා වෙනවා. එය සැප උදානය යි. **අහො සුඛං** කියන්නේ ඒකට යි.

# 08

පුද්ගලයෙකුගේ ජීවිතයක සැපය වර්ධනයට උපකාර වෙන ධර්ම සකස් වෙන අලුත් අලුත් ආකාරය යි මේ මූලපරියාය සූත්‍රයෙන් විග්‍රහ වෙන්නේ. ඒකට දීලා තිබෙන වචනය ප්‍රජාපති යන්න යි. නමුත්, ඔය ප්‍රජාපති කියන ශක්තිය තුළ කෝටි ප්‍රකෝටි ගණන්, සීමාවක් කියන්ට බැරි තරම්, නා නා ආකාරවල පිරිසුදු ස්වරූපවල සිතුවිලි පහළ කරන්ට පුළුවන් තත්ත්වයේ තාප, විද්‍යුත්, කාන්දම් අල්ලගෙන නම් ක්‍රියා කරන්නේ, ඒ වෙලාවට හටගත් සිතුවිලි ඉදිරියට යන විට නා නා තරාතිරම්වල සිතුවිලි ස්වරූප පිරිසිදු පැත්තෙන් වර්ධනය වෙනවා. කුසලය බර-සාර කමෙන් අඩු යි. අකුසලේ බර-සාර කම වැඩි යි. කුසල අණු නැගිට්ටවන්ට පුළුවන් ලෙහෙසියෙන් ම. අකුසල අණු නැගිට්ටවන්ට ඒ ජාතියේ ම වේගයක් දමන්ට ඕන. ඒක යි කුසලයේ හිත තියන්ට ලේසිත් අකුසලයේ හිත තියන්ට අමාරුත් වෙන්නේ. අපි අමාරු වැඩෙ යි කරන්නේ. අපගේ ශක්තිවල කුසල මෙන් ම අකුසල ද තිබෙන නිසා කුසලයක් කරන්ට යන වෙලාවට අර අකුසල ශක්තිය විසින් දෙන බලපෑම් උඩ හිත ටිකක් නරක් වෙනවා. "මොකක් ද බං අර කරන්නේ" කියන වචන කියවෙන්නේ අර අකුසලයේ බලපෑම නිසයි.

ලේ ධාතුවේ හැම අණුවක් ම කුසල ස්වරූපයට පෙරළුණු විට යි ප්‍රජාපති තත්ත්වයට පත් වෙන්නේ. අකුසල ශක්තියක් වැඩ කරලා සිත අකුසලයට හැරුණත් නැවත වරක් කුසලයක බලපෑමක් ආවොත් කුසලයට යළිත් සිත හැරෙනවා. (අකුසලයටත් ඒ විධියට යි.) ඒ අයිතිවාසි කමට මිනිසා කො පමණ අපායේ හිටියත් මිනිසා නිවන් දකින මිනිහෙක්. බය වෙන්ඩ ඕන නැහැ. අපායෙන් එළියට එන දාට එන්නේ අර කුසල මිශ්‍රණයේ ශක්තියත් එක්ක යි. අපායෙන් දොට්ට ඇවිත් යම්කිසි දවසක සිත දියුණු කරන්ට ලැස්ති වුණොත් ඒ මිනිසාට අනිත් අයට වඩා ඉක්මනින් දියුණු

කරන්ට පුළුවන් වෙනවා. ඒක යි වැදගත් කම. කරන එකක් කිසිවක් අපතේ යන්නේ නැහැ. ජීවිතයේ කවදා හෝ යන්තම් හරි හොඳ හිතක් පහළ කරලා තිබුණොත් නැවත දවසක, අවස්ථාවක, හොඳ හිතක් පහළ කරන විට මේ ශක්තියත් ඒකට උදව් වෙනවා. අන්න ඒකෙනුයි අපට බොහොම ඉඩ කඩ තිබෙන්නේ. ඒ නරක කරන ශක්තිය තුළිනුයි හොඳ කරන ශක්තිය උදා වෙන්නේ.

කෙනෙක් නරකක් කළාම සමාජයට කරදර නිසා දොස් කීවත්, "ඒක ඒ මිනිසාගේ ස්වභාවයක්. ඒක නො කර බැරි එකක්." කියා සිතලා, ඒ විධියට සිත සකස්ක කරලා, ඔය කියන ප්‍රජාපති තත්ත්වය දිගට ම, වැඩි කලක් පවත්වනවා නම්, ඊ ළඟට හැදෙන්නේ බ්‍රහ්ම තත්ත්වය යි. බ්‍රහ්මත්වයත් ලෞකික, ලෝකෝත්තර කියලා කොටස් දෙකකට බෙදෙනවා. ලෞකික බ්‍රහ්ම තත්ත්වය කොයි වෙලාවේදී හෝ කිලිටි වෙන්ට පුළුවනි. කිලිටි වෙන තත්ත්වය අස් කරලා නැති නිසයි. නරක තෙරපගෙන, දැනට පාවිච්චි කරන හරිය පමණක් හොඳට තියාගෙන ඉන්නවා. දැන් මිනිස්සු කැලෑවල ගොවිතැන් කරනවා. වටේට කැලේ තියෙනවා. මිනිසා පොඩ්ඩක් සුද්ධ කරගෙන ගොවිතැන් කරනවා. ගොවිතැන් කරලා ඉවර වෙන කොට එයා නැවත වාරයක් ගොවිතැන් නො කළ හොත් ආයෙත් පාරක් කැලේ වැවෙන්ට පුළුවනි. ඒ වගේ තත්ත්වයකුයි ලෞකික බ්‍රහ්මත්වයේ තිබෙන්නෙ.

බ්‍රහ්ම කියන්නේ ධ්‍යාන සිත්වලට යි. මේ ලෞකික තත්ත්වය හදන්නේ නැති ව ලෝකෝත්තර තත්ත්වය හදන්ට යන්ට හොඳ නැහැ. ඒ කියන්නේ වැටෙන් පනින්නේ නැති ව ගෙට ගොඩ වෙන්ට හදන එක වැරදි යි. කොහොම හරි වැටෙන් පැනල ඕන ගෙට රිංගන්ට. මුලින් ම ලෞකික තත්ත්වය පිළිබඳව යි බ්‍රහ්ම අයිතිවාසිකමේදී කතා කළේ. ලෞකික තත්ත්වයෙන් ගිහිල්ලා නිවුණට පසුව යි ලෝකෝත්තර බ්‍රහ්මත්වයේ හිමි කම ලැබෙන්නේ. රහත් වෙන තුරු ලෝකෝත්තර බ්‍රහ්ම නාමය හිමි නැහැ. අනාගාමී පුද්ගලයා අතිනුත් ඒ තත්ත්වයට අදාල වැරදි කෙරෙනවා. ඒවා කරන නිසා සම්පූර්ණ පිරසිදු නැහැ.

මේ ලෞකික බ්‍රහ්මත්වය කියන ධ්‍යාන සිත හැදෙන්ට ඕන අර කියන ප්‍රජාපති තත්ත්වය පහු කරල යි. ශරීරයේ හැම තැන ම තියෙන ලේවල තියෙන අණුවල තියෙන්නේ උෂ්ණත්වය අඩු

අංශකය යි. ධ්‍යානයට සමවැදුණාම එයාට ඇස, කණ, නාසය, දිව, ශරීරය කියන මේ ඉන්ද්‍රිය පහ ම අමතක වෙනවා. අමතක වෙනවා කීවේ ඒ පිළිබඳ අවධානය යොමු වෙන්නේ නැහැ. යොමු කරන ශක්තිය යි මෙ තැන නැති කරලා තිබෙන්නේ. නැති වෙලා තිබෙන්නේ. යමක් ලබන අදහස, අස්කරන අදහස යන දෙක ම නැහැ මෙයාගේ සිතේ. ලෝභ, ද්වේෂ දෙක පහළ වීමට හේතුවක් නැති නිසා, එයාගේ හිත නිරායාසයෙන් ම ඒ තත්ත්වයේ පවතින නිසා, එයාට රූප, ශබ්ද, ගන්ධ, රස ස්පර්ශවලට යොමු වීම් සිදුවෙන්නේ නැහැ. ඒ ඉන්ද්‍රිය පහෙන් ම සිත් පහළ කරන ශක්ති නැති ව යනවා. එක පැත්තකට බාර දීලා නිසයි. මනෝන්ද්‍රියට බාර දීලා. ඕනෑ ම සිතක් වැඩ කරන්නේ මනෝන්ද්‍රියත් එක්ක යි, නැත්නම් මොළෙත් එක්ක යි. ධම්මාරම්මණ එක්ක යි. තමා විසින් හිත ඒ තත්ත්වයට ගැනීමට අරමුණු කළා වූ යම්කිසි නිමිත්තක් වෙයි නම් ඒ නිමිත්තේ ආශ්‍රය යි එයාට මනෝධාතුවෙන් ලැබෙන්නේ. ඒක ගැන මතක විතර යි එයාට තියෙන්නේ. මොළෙ යි හදවතෙ යි සම්බන්ධතාවය වැඩ කරන විට එයින් ලැබෙන සුඛ ආශ්වාදය නිසා, එයින් ලැබෙන සැප වින්දනය නිසා, එයාට වුවමනා කරන්නේ නැහැ ඉන්ද්‍රියයන් පාවිච්චි කරන්ට. ඉන්ද්‍රිය වැඩ කරන්නේ නැති ව ගිහින්.

මනෝන්ද්‍රිය විතරක් වැඩ කරන වේලාවට එයාගේ සිත කුසලාරම්මණයේ පවතිනවා. මුලින් උනන්දුවෙන් ඒ මට්ටමට සිත පවත්වනවා. ඒක අයිති දේව කොටසට යි. එහෙම උනන්දුවෙන් සිත පවත්වන විට මුළු සිරුරේ ම රූප කලාප හොඳ අතට පෙරළුණාට පසුව දැන් උනන්දු වෙන්ට ඕන නෑ. සියලු ම අණු පෙරළිලා. තව පෙරළෙන්ට අණුවක් නෑ. කොහොම ද කීවොත් වයස අවුරුදු පණස් පහ වෙන තුරු සේවය කරලා විශ්‍රාම ගත්තට පසු එයාට දැන් වැඩ කරලා වෙහෙසෙන්ට ඕන නෑ. ගෙදර ඉඳලා මාසයට වරක් ගිහිල්ලා විශ්‍රාම වැටුප් අරගෙන සැනසිල්ලේ ඉන්නවා වගෙ යි. ඒ වගේ තත්ත්වයකුයි ධ්‍යානයේ තියෙන්නේ. ඒ තත්ත්වයට දියුණු වුණාට පසු ව නිසංසල යි. ඒකට යි බ්‍රහ්ම කීවේ. බ්‍රහ්ම කියන්ට හේතුවක් තිබෙනවා. පිරිසිදු කියන එක යි බ්‍රහ්ම යන්නෙහි අර්ථය. පිරිසුදු නම් එයාට කිසි කරදරයක් නැති ව ඉන්ට පුළුවන්. ඒ බ්‍රහ්ම තත්ත්වයේ ප්‍රථම, ද්විතීය, තෘතීය, චතුර්ථ කියලා හතරක් තියෙනවා.

ශරීරයේ අණුවල මුල් අවස්ථාවේ හැදුණු අණු පරපුර දියුණු වෙලා ඒ අනුසාරයෙන් නව උපදිනවා. ශක්ති සම්පන්න වෙනවා. මුල් පරම්පරාවේදී ආරම්භ කරන කොට තිබුණු ස්වරූපය නො වෙයි. කලක් යන විට අලුත් කර කර අණු උපදිනවා. අලුත් ඒවා පිරිසිදු සිත ආරෝප කරනවා. ඒකෙන් ලැබෙන ආස්වාදය වැඩි යි. ප්‍රථම, ද්විතීය, තෘතීය, චතුර්ථ (පළමු වැනි, දෙ වැනි, තුන් වැනි, සතර වැනි) ආදි වශයෙන් ධ්‍යාන බෙදුණේ ඕක යි. සිතේ සෞම්‍යත්වය කොයි තරම් ද කියනවා නම් ආශ්වාස, ප්‍රශ්වාසවල ක්‍රියාකාරිත්වය දැනෙන්නේ නැහැ. චතුර්ථ ධ්‍යානයට සමවැදුණු විට ආශ්වාස, ප්‍රශ්වාස නවතිනවා කියලා කතාවක් තියෙනවා. ආශ්වාස ප්‍රශ්වාස නැවතිලා මිනිසෙකුට ජීවත් වෙන්ට බැහැ. ඒ තරම් සියුම්, නො දැනෙන තරමේ ආශ්වාසයකුයි ඒ වෙලාවේ වැඩ කරන්නේ.

විදර්ශනා වඩන පුද්ගලයාට ඉතා ම සුදුසු චිත්ත අවස්ථාව චතුර්ථ ධ්‍යාන අවස්ථාව යි. චතුර්ථ ධ්‍යානයෙන් ඉදිරියට ගිය හොත් විදර්ශනා වඩන්ට බැහැ. මේ රූපාවචර ධ්‍යාන යි. රූපාවචර කියන්නේ පෙරළෙන බව, වෙනස් වෙන බව දැනෙන නිසයි. හිතේ ඇති වෙන සුඛයේ නා නා තරාතිරම් පෙනෙන්ට පටන් ගත් අවස්ථාවෙදි යි එයාට විදර්ශනා කරන්ට පුළුවන් බොහොම හොඳට. සුඛයේ තිබෙන සියුම් දේවල් සොය සොයා ඒවායේ තිබෙන අනිත්‍යය බල බලා සිත නො ඇලෙන පැත්තට හරවන්ට පුළුවනි. මේ බ්‍රහ්ම තත්ත්වයෙන් පෙන්වූයේ තවත් එක ධර්ම උපතක්. හැම වේලාවේ ම එයාගේ ජීවිතයේ ඒ ධර්ම උප්පත්ති වෙලා තියෙනවා. මේ පුද්ගලයාට අකරතැබ්බයක් වෙලා ධ්‍යානය කැඩිලා පාපී පැත්තට හැරෙන්ට පුළුවනි. එයා ළඟ ධ්‍යාන ශක්තිය තිබෙනවා. ඒ ධ්‍යානය පිරිහුණාට ධ්‍යාන ශක්තියට අබලමක් නැහැ. නිදසුනක් ගනිතොත් කාන්දම් කැල්ලක් අතේ තබා ගෙන නොයෙකුත් විසිතුරු වැඩ කරමින් සිටි පුද්ගලයාගේ ඒ කාන්දම් කැල්ල නැහැ. කාන්දම් කැල්ල නැහැ කීවාට ඒ කාන්දම් කැල්ල ආකර්ෂණය වෙන නව කාන්දම් කැල්ලක් ලැබුණු දාට අර කාන්දම වැඩ කරනවා. සංසාරේ ඔය විධියේ ධ්‍යාන පුරුදු කරපු පුද්ගලයා පාපී ක්‍රියාවක් නිසා දුගතියට සම්බන්ධ වුණත් ඒ පාපී තත්ත්වය අවසන් වූ දාට නැවත අර ධ්‍යාන ශක්තිය වැඩ කරනවා. යම්කිසි කෙනෙක් චතුර්ථ ධ්‍යානය ගැන කතා කළොත් මෙයාට අධික උනන්දුවක්

ඇති වෙනවා. අර ශක්තිය අතීතයේ සිට තිබුණු නිසයි උනන්දුව ඇති වුණේ.

ඒ ශක්තිය වර්ධනය කර ගන්ට, බාහිරෙන් තමාගේ හිතට එන දෙය නවත්තපු තරමට එයාට ඒක මතුකර ගන්ට උපකාර ලැබෙනවා. පරිසරය, ආර්ථිකය වැනි දේ තමාට හොඳ නැත්නම් තමාගේ හොඳ පාච්චිච්චි කිරීමට ලැබෙන නිදහස මදි. ඒක නිසයි බුදු හාමුදුරුවෝ වදාළේ දාන, නෙක්ඛම්ම කියන දෙකක්. නිදහස් සිතක නිදහස ගැන හිතට නිදහස ගැනීම යි දාන, නෙක්ඛම්ම දෙකෙන් කරන්නේ. තමා සතු ව යමක් තියෙනවා නම් ඒකට මෙහෙම කරන්ට ඕන කියලා ලොකු ලැයිස්තුවක් හදාගෙන. තදින් ඒකට බැඳිලා. යමෙකුට කෝටි ගණන් සල්ලි තියෙනවා. එයා ඒ ගැන හිතන්නේ නැහැ. ඒවා වැඩක් ආව වෙලාවට වියදම් කරනවා. කවදා හරි මැරෙනවා නේ කියලා හිතුව නම් ඒ අංශයෙන් බරක් නැහැ. ඒ සිතේ නෙක්ඛම්ම නිසයි එසේ සිතන්ට පුළුවන් වෙන්නේ. ඒවායින් ආශ්වාද විඳින්ට උත්සාහ කිරීම ආසාව. මේවා නිසා තියෙන්නේ ලොකු දැහලිල්ලක්. බලා ඉවරයක් නැහැ. ඕවා නැති වුණාට කමක් නැහැ. ලැබුණු දෙයක් කරනවා. පේන දෙයක් බලනවා. නැත්නම් ඔහේ නිකම් ඉන්නවා. ඒක යි නෙක්ඛම්මයේ ලකුණු. ඒ නෙක්ඛම්මය හැදෙන හැටි යි. නෙක්ඛම්ම - දාන දෙක තිබෙනවා නම් වචන, ක්‍රියා දෙක හොඳට වැඩ කරනවා. ඒක යි සීලය ඇතුළත් කරලා තිබෙන්නේ. දානය, නෙක්ඛම්මය සාර්ථක ද කියලා හොයන්නේ සීලයෙන්.

කෙනෙක් කියනවා අහවල් දවසේ සිට සල්ලි ඔක්කොම අවලංගු කරන්ට යනවා කියලා. ඒ අහපු එක්කෙනාගේ සල්ලි කෝටි ගණනක් තිබෙනවා. එයා හිතනවා සල්ලි විතරක් නො වෙයි මාත් කවදා හෝ අවලංගු වෙලා යනවා. ඒ නිසා, මුදල් අවලංගු කළාට මම මොකට ද හිත පීඩාවට පත් කර ගන්නේ? අනිත් අය ජීවත් වෙන විධියට මාත් කාලය ගෙවනවා. එහෙම හිතෙනවා නම් එයාගේ ප්‍රකාශය හරි. කෙනෙකුගෙන් ලැබෙනව යි කියපු දෙය දැන් ලැබෙන්නේ නැති බව වැටහෙනවා. එ විට මේ දියුණු සිත තියෙන එක්කෙනා සිතන්නේ කොහොම ද? මං ඒක ලබන්ට බලාපොරොත්තු වුණා නො වෙයි. ලැබුණොත් ගන්ට යි අවශ්‍ය කටයුතු කළේ. නො ලැබුණොත් නො ගෙන ඉන්ටත් පුළුවනි. ඒ ප්‍රමාණයට එයාගේ නෙක්ඛම්මය හරි. ඒ

පුද්ගලයා තුළ ශුද්ධ ස්වරූපය තිබෙනවා. ඒ ස්වරූපය බ්‍රහ්මත්වය යි.

ඊළඟට මේ ධර්ම ස්වරූපයේ තිබෙනවා බ්‍රහ්ම මට්ටමට අයත් ආභස්සර මට්ටම. ආභස්සර කියන්නේ සිත සන්සුන් වුණාට පසු ව පුද්ගලයාට දැනෙන වින්දන ස්වරූපය යි. තමාගේ හිතේ උපන්නා වූ පැහැපත් කම තමාට රසවත් වූ වේලාව යි ආභස්සර සිත. මේවා දැන ගන්නේ වින්දනයෙන්ම යි. පභස්සර යි කියන්නේ ආලෝකයට යි. ඉස්සර අඳුරක තිබුණ සිතක් අඳුර ඉවත් වෙලා සිතේ සැප මට්ටම පෙනෙනවා. සැපය තිබෙනවා. පේන්නේ නැහැ. ඒක යි අඳුර. අඳුර යන්ට යන්ට සැපය පෙනෙනවා. පස්වණක් ප්‍රීති මට්ටමට සැපය පෙනෙන සිතක්. මේ ආභස්සර තත්ත්වයට සිත පත් වූ විට ඉදිරියට සිත දියුණුවට යන්ට ලෙහෙසි යි. වැඩියෙන් පිරිසිදු වී ඇති බව දැනෙනවා. මේක අලුත් ධර්මයක්. අලුත් ධර්ම උපදින හැටි යි බුදු හාමුදුරුවෝ එක එක පුද්ගලයා පිළිබඳ ව ජාතක පොතින් පෙන්නුවේ. සංසාරේ කවදා වත් ඔය ක්‍රෝධය තිබුණේ නැහැ. අහවල් දවසෙ යි උඹේ ක්‍රෝධ ධර්මය උපයන්නේ. උපන්න බව යි ජාතක යන වචනයේ අරුත. ඒ වගේ අපේ ජීවිතවලත් ඔය පහළ නො වූ ධර්ම තිබෙනවා. අපි දන්නේ නැහැ අපේ කොයි තරම් දුරට හොඳ ධර්ම දියුණු වෙලා ද කියලා.

දැන් සමහරු ඉන්නවා කොයි තරම් වෙන වැඩ තිබුණත් මේ ධර්ම ශ්‍රවණය එක්ක ආකර්ෂණය වෙන අය. ඒ කලින් ඔහොම එකක් අහලා උසස් අලුත් ධර්මයක් තිබෙන නිසයි. සංසාරේ යම්කිසි දවසක දියුණු කළ ධර්මයක මතුවීම යි එයාට වැඩියෙන් ආකර්ෂණය වෙන්නේ. අද ඇයි මේ ධර්ම දියුණු කරන්ට බැරි? උදව්වක් නැහැ. කරන හැටි කොහොම ද දන්නේ නැහැ. නැත්නම් මෙතන ඉන්න අයට මීට කලින් මේවා දැන ගත්තා නම් මීට වඩා ඉදිරියට යන්ට තිබුණා. නමුත්, ග්‍රහණයට හසුවුණාට පසුව යි මේ ධර්මය දැන ගන්ට ලැබුණේ. දැන් ඉතින් කරන්ට දෙයක් නැහැ. හිරවෙලා ඉන්නවා. ඔය විධියට යි සංසාරේ පැවැත්ම එන්නේ. ලෝකයේ ස්වභාවයට අනුව අපි ග්‍රහණයට යටවෙලා තිබෙනවා. නිදසුනක් ගත්තොත් දැන් කඩේකට යනවා යමක් අරගෙන එන්ට. ඒක ලාබෙට ගත්තා යි කියලා හිතාගෙන එන කොට අතර මගදී මුණ ගැහුණු කෙනෙක් කියනවා ඔය භාණ්ඩය කීය ද? ඔයිට වඩා බොහොම ලාබෙට අර කඩේ ඔය වගේ

භාණ්ඩ තියෙනවා ය කියනවා. දැන් ඉතින් ඒක කලින් අරගෙන නිසා කිසිවක් කරන්ට බැහැ. ඒ වගේ තත්ත්වයක් දැන් වෙලා තිබෙන්නේ.

ධර්මය හරි හැටි තේරුම් ගන්නා තුරු එයා සංසාරයේ ගමන් කරනවා. ධර්මය හරි හැටි දැන ගන්නා තුරු එයා මුළාවක යි ජීවත් වෙන්නේ. බලා ගෙන ඉන්නවා. සාධු කියනවා. මෛත්‍රී බුදු හාමුදුරුවෝ දැකලා නිවන් දකින්ට හිතනවා. මහා කරදරයක වැටිල යි ඉන්නේ. එහෙම නැති ව ධර්මය වටහා ගත්ත හැටියේ ඒ අයට ලොකු ලාබයක් ඇති වෙනවා. ලොකු අයිතිවාසිකමක් ලැබෙනවා. දැන ගත්ත දවසේ ඉඳලා වැඩේ නිම වෙන තුරු කරනවා. එ සේ නො වී සිදු වූ මේ වැරදිල්ල නිසයි, ප්‍රමාදය නිසයි, අපට සංසාරේ බොහෝ කලක් යන්ට වෙලා තියෙන්නේ.

# ০৭

නිරායාසයෙන් කෙරෙන කොටස් ටිකක් සම්පූර්ණ වෙලා මිනිස් ආත්මය දක්වා අපව ගෙනැවිත් තියෙනවා. මිනිස් ආත්මයේදී අපි යම් යම් ප්‍රමාණවලින් දේව තත්ත්වය හඳුනා නිසා එක්තරා ප්‍රමාණයකින් ශිෂ්ටත්වය ඇසුරු කරමින් ජීවත් වෙනවා. තවත් පිරිසක් ඉන්නවා ඒ ශිෂ්ටත්වය කියන එක ගණන් ගන්නේ නැහැ. ඒ අය බොහොම සරු සාරෙට යමක් කමක් ඇති ව ජීවත් වෙනවා. නියම අවබෝධය තිබෙන අන්තිම දුගී මනුස්සයාගේ ජීවිතයේ තිබෙන සන්සුන් කම ඒ තත්ත්වය නො දත් මහා ධනවත්, උගත් අය තුළ මොන ම ක්‍රමයකින් වත් පිහිටන්නේ නැහැ. ඒ අය තුළ භූත කියන සකස් වීම ඇති නිසා නා නා තරාතිරම්වලට යට වෙච් ජීවත් වෙනවා. පීඩාකර දේවල් ම යි එහෙම කෙනාට එන්නේ. පීඩාකර දේවලින් තොර ව එයාට හිතන්ට පුළුවන් කමක් නැහැ. කවදා ද එයාගේ පීඩාකාරී තත්ත්වය නැති වෙන්නේ, පීඩාකාරී තත්ත්වයෙන් මිදෙන්ට කළ යුත්තේ කුමක් ද කියලා එක දවසක් හෝ ඒ දෙය කළා නම්, අන්න දේව තත්ත්වය උපන් දවස.

දේව කියන්නේ පාලන ශක්තිය. ඒ පාලන ශක්තිය උපන් දවස යි. අපගේ ජීවිතයේ හැම වෙලාවෙ ම අලුත් එකක් උපදිනවා. ඒක ක්‍රමානුකූල සංවිධානයකින් කෙරෙතොත් පමණ යි ප්‍රයෝජනයක් තිබෙන්නේ. ඒ ඒ ධර්ම උත්පත්ති වෙච් දේව කියන මට්ටමට ආවට පසුව යි ප්‍රයෝජනවත් ධර්ම උපදවා ගන්ට පුළුවන් වෙන්නේ. ඒකට නිදසුනක් කියතොත් බෝධිසත්ත්වයෝ බෝධි මූලයේදී "බුදු වෙලා මිස නැගිටලා වෙන කරන්ට දෙයක් නැහැ. ඒ නිසා, බුදු වෙන තුරු මේ වැඩය යි කරන්ට තිබෙන්නේ" යනුවෙන් කළ අධිෂ්ඨානය ඒ භවයේ පටන් ගැන්මක් ද? ඒක මුලින් ම හටගත්තේ බෝධිසත්ත්වයන් තේමිය කුමරු ව සිටින අවස්ථාවේදි යි. මේ කරදරකාරී ජීවිතයෙන් බේරෙන්ට මම ඕන ම දුකක් විඳිනවා. මේ

රජකමට නම් අත තියන්නෙ වත් නැහැ. පංච කාමය අත්හරින්ට එදා ඒ ගත්ත තීරණය යි - ඒ මානසික ධර්මය යි බෝධි මූලයේදී ඉදිරියට ඇවිත් සිටියේ. ඒ නිසා, පසුබාන්ට කරුණක් නැහැ.

ජීවිතය පරිහරණය කරනව යි කියන එක ඕන කෙනෙකුට කරන්ට පුළුවන් දෙයක්. ප්‍රධාන ම කාරණය ප්‍රයෝජනවත් අන්දමට පරිහරණය කිරීම යි. ජීවිතය දුකක් නැති ව පරිහරණය කරන්ට පුරුද්ද මදි නිසා අද බැරි වෙන්ට පුළුවනි. ජීවිතය මෙතනින් අවසන් වෙන ජීවිතයක් නො වෙයි. ජීවිතය මෙ තැනින් අවසන් නො වෙන ලකුණු තිබෙනවා. ඇලීමේ ශක්තිය, කාම ශක්තිය, කාන්දම් ශක්තිය අප තුළ තියෙන නිසයි මෙතනින් ජීවිතය අවසන් නො වෙන ලකුණු අපට පෙනෙන්නේ. ඒ නිසා, ජීවිතය දිගින් දිගට ගමන් කරවන්ට, ගමනක යෙදෙන්ට අපට වෙලා තිබෙනවා. ඒ යන ගමනේදී මේවා සංවිධානය කරලා එකතු කරලා නො තිබුණොත් එහිදී සංවිධානය කරන්ට ලැබෙයි ද කියන්ට බැහැ. විශ්වාස නැහැ. හිතන්ට බැහැ. ඒ නිසයි බුදු හාමුදුරුවෝ ප්‍රමාද වෙන්ට එපා කියලා දේශනා කොට වදාළේ. ඔය වෙනත් දේවලට නො වෙයි පාලනය වූ ධර්ම සිතේ පහළ වෙන විධියට හික්මීමට යි ප්‍රමාද වෙන්ට එපා කීවේ. අවස්ථාව පැමිණි විට ම කරගත්තේ නැත්නම් කවදා අවස්ථාව ලැබෙයි ද දන්නේ නැහැ. මනුස්ස ආත්මය යි,බුද්ධෝත්පාද කාලය යි, ක්ෂණ සම්පත්තිය යි දුර්ලභ යි කියලා වදාළේ නිකම් ම නො වෙයි. ඒ අයිතිවාසිකම් නො ලබා පුද්ගලයෙකුට මේවා කරගන්ට බැහැ. ඉගෙනීම ලැබෙන්නේ නැහැ, ක්‍රමය ලැබෙන්නේ නැහැ.

බ්‍රහ්ම කියන්නේ පිරිසිදු කමට යි. තාවකාලික වුණත් පිරිසිදු කම තියෙනවා. පිරිසිදු කම කියන්නේ කුමක් ද? කිලුටු එක්කාසු නො වෙන එක යි. කිලුටු එක්කාසු නො වෙනවා නම් එතන පිරිසිදු යි. ඒකට යි පිරිසිදු කම කියන්නේ. යම් වෙලාවක කිලුටු එකතු නො වෙන මට්ටමට ශුද්ධ කළොත් ඒක දිගට මපිරිසිදු යි. ඔය අවස්ථා දෙක යි ලෞකික, ලෝකෝත්තර වශයෙන් දෙකට බෙදුවේ. එක වරට ම අපට ලෝකෝත්තර තත්ත්වය හදන්ට බැහැ. ලෞකික තත්ත්වය හදල යි ලෝකෝත්තර තත්ත්වයට සිත ගන්නේ. බ්‍රහ්ම කීවේ අපේ හිත තුළ පවත්නා නා නා තරාතිරම්වල නරක මිශ්‍රණ එක්ක සිතට ක්‍රියා කරන්ට ඉඩ නො දී හොඳ මිශ්‍රණයකින් යුක්ත ව සිත ක්‍රියා කිරීමට ඇබ්බැහි කිරීම නැත්නම්

යෙදීම යි. බ්‍රහ්ම කියන තත්ත්වය එන්ඩ බාහිර සම්බන්ධ කම් එක්ක තමාගේ සිතේ තිබෙන ඇලීම තාවකාලික වශයෙන් වත් නවතින්ඩ ඕන. බ්‍රහ්ම කියන ස්වරූපයට එන තුරු බලන්ට, අහන්ට, ආඝ්‍රාණය කරන්ට, රස විඳින්ට, ස්පර්ශ කරන්ට යන මේ ඉන්ද්‍රියයන්ගේ බලපෑම නිසා ඇති වෙන සිත් පහළ කිරීම නවත්වන්ට බැහැ. මේ ඉන්ද්‍රියයන් පහෙන් මට ලබන්ට දෙයක් නැහැ. ඊට වඩා ප්‍රයෝජනවත් වෙන්නේ ඉන්ද්‍රිය ගෝචරයන්ගෙන් අයින් වූ හැටියේ ලැබෙන සැපය යි. එහෙම සිහි කරමින් ඒ තත්ත්වය මතුවෙන තුරු උත්සාහය යොදන කොට ඒවායේ බැඳීම අඩු වෙන තරමට ඒවායේ ක්‍රියා කාරීත්වයට අවශ්‍ය වේගය නැති වෙනවා. එහෙම වෙල යි බ්‍රශ්ම කියන පරිශුද්ධත්වයට සිත පත් වෙන්නේ. තමාගේ සිතට දැනෙන දෙය එක්ක බැඳීමකින් තොර ව ඇසුරු කරන්ට හැකියාවක් ඇති වෙනවා. ඒක යි බ්‍රහ්මත්වයේ තිබෙන ලක්‍ෂණ ය.

මේ තත්ත්වයට පත් වූ පුද්ගලයාගේ ඇසුරට ලැබෙන්නේ කුමක් ද? ඇසින්, කණින් වූ සම්බන්ධතාවය නැති නිසා ඉතිරි වෙන්නේ මනෝධාතුව විතර යි. මොළයේ ක්‍රියාකරීත්වය පමණ යි. ඒ මොළයේ ක්‍රියාකාරීත්වය නිසා අර කෙලෙස්වලට සම්බන්ධ සටහන් සියල්ල ම නවතිනවා. ඒවා ක්‍රියාත්මක කරන්ට පුළුවන් වේග හිතෙන් නො දෙන තත්ත්වයක් උදා වෙනවා. ඇලීමක්, බැඳීමක්, උදව්වක් බලාපොරොත්තුවක්, අපේක්‍ෂාවක් බලපාන්නේ නැති තත්ත්වයක් සිතේ ඇති වෙනවා. ඒ වේග අඩු වෙනවා. සැර ගති අඩු වෙනවා. හිත වැඩ කරන විට ඒ සිතේ වේගය මනෝධාතුවේ සෞම්‍ය සටහන් වැඩ කිරීමට වුවමනා වේගයට යි ක්‍රියාක්මක වෙන්නේ. මේවා එක පාරට ම සෞම්‍ය කළා නො වෙයි. හෙමින් හෙමිනුයි මේ බාහිර ලෝකෙත් එක්ක ඉන්ද්‍රිය සමඟ ඇති සම්බන්ධය අඩු කළේ. හෙමින් හෙමින් අඩු වෙන විට ඒ ප්‍රමාණයට සටහන් හැදි-හැදී වැඩ කර-කර ඇවිත් සම්පූර්ණයෙන් ම පිරිසිදු යි කියන තත්ත්වයට එන විට ඒ සටහන්ම යි වැඩ කරන්නේ. ඒ නිසා, කවදා හෝ ඒ සෞම්‍ය සිත් පහළ කරන තුරු ඒ පිරිසිදු සිත පරිහරණය කරන්ට ලැබෙන්නේ නැහැ. කොහේදී හෝ ආත්මයකදී ඒ සිත පහළ කරලා තියෙන්ට ඕන. එ විට යි එයා ඒ ධර්මය උප්පාද කරලා තියෙන්නේ. එයා මනුස්සයෙක් වෙලා චිත්ත දියුණුවක්

ලබලා වැඩට බහින කොට ඒ හොඳ ධර්ම ස්වරූපය ඉදිරියට එනවා. ඇවිත් වැඩ කරන්ට පටන් ගන්නවා. එහෙම අයට මේක ඉක්මනින් කර ගන්ට පුළුවන් වෙනවා.

ප්‍රමාද වෙනවා කියන්නේ අර ධර්ම උත්පාද කරලා නැති එකේ අඩු පාඩුව යි. එක ගාථාවක් කට පාඩම් කර ගන්ට බැරි ව ගෙදර යන්ට සිටි චූලපන්ථක භික්ෂුවට බුදු හාමුදුරුවෝ ක්‍රියාව කරන ක්‍රමය කියලා දුන්නා. ඒ ක්‍රමය අනුගමනය කළ ඒ භික්ෂූන් වහන්සේ පැය ගණනක් ඇතුළතදී සියලු කෙලෙසුන් අවසන් කරලා මනෝමය ඍද්ධිවිධ ඥානය පහළ කළ හැකි මහා හපනෙක් වුණා. හිතේ තිබෙන කෙලෙස් අයින් වෙන කොට අතීතයේදී දියුණු කළ අභිඥා ධ්‍යාන බලය මතු වෙනවා. හිතේ තිබෙන තත්ත්වය ඔය විධිය යි. අපට ජීවත් වෙන්ටත් ඕන, යුතුකම් ඉටුකරන්ටත් ඕන. ඒ සියල්ල ම අතරතුරේදී මේ හොඳ ධර්ම උපදවා නො ගත හොත් කවදා මේක කර ගන්ට ලැබෙයි ද දන්නේ නැහැ. ඒ බව සිතට අවබෝධ කර ගෙන මේ ධර්ම උපදවා ගත හොත් සෑහෙන ලාබයක් වෙනවා. ඉක්මනට සැනසීම ලබන්ට හැකි වෙනවා.

බ්‍රහ්ම කියන තත්ත්වයේ තිබෙන්නේ තාවකාලික වශයෙන් හිතට අපේක්ෂාවක් මතු වීමට ඉඩ නො තිබීම යි. අපේක්ෂාවක් මතු නො වෙන නිසා විරුද්ධත්වයක් මතුවෙන්නෙත් නැහැ. සෑම දෙයක් ම ඒ ඒ ලැබෙන ආකාරයෙන් අමුතු චලනයක්, කම්පනයක් නොමැති ව පිළිගන්නට පුළුවන් තත්ත්වයකුයි ධ්‍යාන සිත්වල තිබෙන්නේ. ඊළට පෙන්නුවේ සිතේ **ආභස්සර බ්‍රහ්ම තත්ත්වය** ගැන යි. සාමාන්‍යයෙන් අපි ඉගෙන ගෙන තිබෙන්නේ, හිතෙන් එළියක් එනවා, ඇවිත් බාහිර ලෝකයත් සමඟ පැතිරී යනවා කියන විධියට යි. ඒක නො වෙයි ආභස්සර තත්ත්වය. සිතේ දීප්තිය කියන්නේ කලින් සිතේ තමාට නො පෙනුණු යම් යම් දේවල් ආභස්සර අවස්ථාවට එන විට පෙනෙන්ට පටන් ගන්නවා, පැහැදිලි ව පෙනෙන්ට පටන් ගන්නවා.

ආභස්සර චිත්ත මට්ටමේ ලෞකික පැත්තට යොමු වෙලා [illegible]න අවස්ථාවේ හිතේ පැහැපත් කම හිත ඇතුළේ ක්‍රියාකාරීත්වය හොඳට පැදිලි ව පෙනෙනවා. නමුත් එයා දනිමින් නිකා සිටිනවා. සිත පිරිසිදු තත්ත්වයට පෙරළා ගන්නවා. එතන සිට මතුවෙන

හැම චිත්ත ස්වරූපයක් ම යන්ට දෙනවා විනා වැඩක් ගන්න හැටි දන්නේ නැහැ. බුදු කෙනෙක් ලොව පහළ වීමේ අගය, ප්‍රයෝජනය, වැදගත්කම මොකක් ද? ඒ පහළ වූ සිතුවිලිවල අහක දමන්ට දෙයක් නැහැ. එම සිතුවිලිවල අපට ලබාගත යුතු තේරුම් ගත යුතු ඒවා තිබෙන බව බුදු හාමුදුරුවෝ පෙන්වා දීලා තිබෙනවා. ඔය සිතේදී යි ඕවා බලන්ට ඕන. විදර්ශනාව කෙරෙන්නේ ඔතනදී යි. විදර්ශනාවේදී එන සිතුවිලි අපතේ යන්ට ඉඩ දෙන්නේ නැහැ. ඒ ලැබෙන - ලැබෙන අවස්ථාවෙන් නියම ප්‍රයෝජනය ලබන්ට ඔතනදි අහවල් එක කරගන්ට ඕන. ඕක යි ඔතනදී කර ගන්ට තියෙන කාරණය කියලා බුදු හාමුදුරුවෝ, බැලිය යුතු දේවල් සළකුණු කරලා අපට කියා දුන්නා. ධම්ම චක්ක සූත්‍ර දේශනාවේදි බුදු හාමුදුරුවෝ පස්වග මහණුන්ට කියා දුන්නේ ඔය අවස්ථාවේදී කරන්ට ඕන පිළිවෙල යි. ඒ කරන්ට ඕන පිළිවෙල උන් වහන්සේලා අන්වීක්ෂයක කාච මාරු කර කර බලන්නා වගේ ඉතා සියුම් අවස්ථා බැලිය යුතු යි.

ආභස්සර චිත්ත ශක්තිය ලෝකයේ පහළ වූ වෙලාවෙදි ඒ චිත්ත ශක්තිය ඇතුළෙ යි තිබෙන්නේ ලෝකයත් එක්ක සම්බන්ධ වෙන ඉතා ම සියුම් මට්ටම. ඒ ඉතා ම සියුම් මට්ටම පෙනෙන්නේ නැති නිසා මේ සත්වයා ඉදිරියට එන්නේ නො දැනුවත් කමින්. ඒ හිතේ දිගින් දිගට ම බැඳීමේ ශක්තිය ගෙන යන තත්ත්වයක් තිබෙනවා. ඒ බව එයාට පෙනෙන්නේ නැහැ අලුතෙන් සසරට වැටුණු කෙනෙක් නිසා. එයා මේ අධ්‍යාපනය ලබලා නැති නිසයි. අග්ගඤ්ඤ සූත්‍රයේ කියනවා මේ ලෝකයට ආපු හැටියේ ඒ ආභස්සර බ්‍රහ්ම ලෝකයෙන් ආ මේ බ්‍රහ්ම දිව්‍ය රාජයා පොළව අතගාලා අත ලොවිනවා කියලා. එ විට රහ වැටෙනව ලු, පෘථිවි රසය උඩ තියෙන නිසා. එ සේ රස වැටීම නිසා එදා ඉඳලා පොළොව ලෙවකකා ඉන්නව ලු. ඒක මහ අවනම්බු කතාවක්. ඒ පෙන්නුවේ මොකක් ද? ඒ අවස්ථාවේ සිතේ තිබෙන මට්ටම යි. මේ සිත ඔය ආකාරයෙන් කාම පහ එකතු වෙලා ගොනු වූ හැටියේ ඒකේ උපදිනවා රසවත් ස්වරූපයක්. ඒ ක්‍රියා කාරීත්වයේ රසය පීඩාකාරී තත්ත්වයක් නැති කම. ඒ පීඩාකාරී තත්වෙයක් නැති කමේ ම එල්ලි - එල්ලී යි ඒ සිත පළල් වෙන්නේ. ඒක යි ඔය ලොවිනව යි කීවේ. කවදා හරි ආරම්භ කරන වෙලාවට සිතේ පීඩාකාරී තත්ත්වය නැති කම රස යි. රස බලන හැටි දන්නේ නැති නිසා

ඇහිල්ල ගහලා ලොව්නවා කීවා. ලොවින්ට ඇහිල්ලක් තිබෙන්ට ඕන. චිත්ත ශක්තියක් විතර යි තිබෙන්නේ. ඇහිල්ලක් නැහැ. ඒක ගැන නො කියා අර විධියට කීවා, කොහොම හරි ඕක තෝරා ගන්ට.

මේ රස වුණා කීවේ අර ඒ සිතේ උපන් වේග ප්‍රමාණය රසවත් විධියට, ඇදුම් දෙන විධියට, සෞම්‍ය තත්ත්වයෙන් මතු වුණා කියන එක යි. ඒ එල්ලුණු සත්වයා ඉතා ම සියුම්. ඇමීබාවාටත් වඩා පුංචි සතෙක්. දැන් මේ ලොකුවට ඇවිත් අන්තිමට මිනිහෙක් වුණා. මිනිහා වුණාට පස්සේ කෙලෙස් අඩු කරමින් ආපස්සට යනවා. ඒ ගමනේදී යි ආභස්සර කියන චිත්ත මට්ටම අහුවෙන්නේ. අර කාම පහ එක්කාසු වුණා. කාම පහ කිව්වම අණු ගොඩක් එකතු වෙන්නේ. ඒ රූප කලාප ගොඩේ තියෙන අණු සමඟ රූප, ශබ්ද ආදි බාහිර නිමිති සම්බන්ධ වෙන වෙලාවට ඒ සම්බන්ධ වෙන එක පිළිගන්න ශක්තියක් ඒකේ තියෙන්නේ. ඒ ශක්තිය පිළිගන්න අවස්ථාවෙදි ඒකේ මැදි වෙලා තියෙන අනෙක් රූප කලාපවල යම් වෙලාවක ද ඒ කාන්දම් චලනය වුණේ, ඒ චලනයට යි විඤ්ඤාණ කීවේ. එක රූප කලාපයකින් (අණුවකින්) ඕක කරන්ට බැහැ. අණු පොදියකිනුයි මේක කෙරෙන්නේ. අපට ඇහැක් තියෙනවා. නමුත්, එදා ඒ සතාට තිබුණේ ආලෝකය පිළිගන්න කාන්දම් ඇති අණු පමණ යි. අපේ දැන් ඇහැ කියලා වෙනම තැනක එක්කාසු වෙලා තියෙනවා. ඇතුළේ තියෙන කාන්දම් චලනය වූ හැටියේ අන්න ඒකට කියනවා විඤ්ඤාණය කියලා. දැනුත් එහෙම යි. එදත් එහෙම යි. **ඒ විඤ්ඤාණය වීමෙන් පසු ඇති වෙන සිතේ ස්වභාවය යි ආභස්සර කීවේ**. ඒක යි සසරට වැටෙන අවස්ථාව. පළමු වැනි හිතේ හැටි යි ඒ කියන්නේ.

ආභස්සර බ්‍රහ්ම ලෝකයෙන් බ්‍රහ්ම රාජයෙක් මෙහාට ආවා කියල යි පිළිඅරන් තියෙන්නේ. එහෙම කෙනෙක් එන්ට ඕන නැහැ හද්ද වදේ විඳින්ට. ඒ බ්‍රහ්ම ලෝකවල ජීවත් වෙන දෙවිවරු යි. මේ කියන්නේ ලෝකය ඇතුළේ සත්ව ප්‍රාණයක් හැදෙන හැටි. ඒ අලුතෙන් හැදුණු එකක්. අර දිව්‍ය ලෝකයේ ඉන්න බ්‍රහ්මයෙක්. මේ ගොරෝඩි කෙනෙක් හදන මුල් අවස්ථාව යි **ආභස්සර** කියන්නේ. එතන ඉඳලා ස්මරණයට එන්ට පුළුවන්. ඊර්ෂ්‍යා, මාන, ක්‍රෝධ එන්ට පුළුවන්. මේ ආභස්සර තත්ත්වයේ සකස් වූ සිත පැවැත්වූවාට

ඒ සිතේ තිබෙන්නේ සසරට අයෝග්‍ය නො දැනුවත් කමින් සසරට ඇවිත් තිබෙන ශක්ති යි. දැන් මේ කරන්නේ කරදරකාරී ශක්තීන් එහෙන් මෙහෙන් හල - හලා එන විට තිබෙන අවස්ථාව යි මේ ආභස්සර අවස්ථාව.

ඒ සිතේ උපදින සැපයට ආශා කරනවා. සැපයට බැඳෙන ගතිය, සැපය අපේක්ෂා කරන ගතිය ඒ ආභස්සර සිතේ තියෙනවා. අපේක්ෂාව කියන්නේ වර්තමානයේ එකක් නො වෙයි. මතු බලාපොරොත්තුවකට කියන නමක් අපේක්ෂාව. මේ විධියේ ම රසයක් මතුවටත් ලබාගන්ට ඕනැ යි කියන එක යි අපේක්ෂාව. ඒ අපේක්ෂාව සිතේ තිබෙන බව අර දාර්ශනිකයාට පෙනෙනවා. අපි බැඳුණු හැටි මේකෙන් පෙන්වන්නේ. ඒ ධර්ම ස්වරූපවලින් නා නා පැතිවලට අපව පත් කරනවා. ඔය එක තත්ත්වයක් වත් අපි අපේක්ෂා කරපු තත්ත්ව නො වෙයි. ලැබුණු දෙය පිළිගත්ත එක යි මෙතන වෙලා තියෙන්නේ. අපි කීවේ නැහැ කළු වෙන්ට ඕනෙ යි, කෙස් සුදු වෙන්ට ඕනෙ යි, මූණේ ඇස් දෙක ඕනෙ යි මේ ආදි එකක් වත් අපි කිව්වේ නැහැ. ලැබුණාට පස්සේ ඒකට බැඳෙනවා. අපේ තිබෙන අමුතු කරදරය ඕක යි. මේක නිරායාසයෙන් ලැබුණා. තිබිලා යන දවසකට යන්ට යයි. ලැබුණු නිසා පරිහරණය කරනවා. අපට ඇහැක් තිබෙනවා. ඒක තියෙන්නේ මූණෙ. ඇහෙන් කෙරෙන වැඩ ගොඩක් පටලවා ගෙන තිබෙනවා. නමුත් එක ම වැඩ යි ඇහෙන් කෙරෙන්නේ. ඒ වැඩේ කරන්ට කො පමණ ගොඩක් වැඩ තියෙනව ද? අද මේක බලන්ට ඕන. හෙට ඊළඟ එක බලන්ට ඕන. නමුත්, මිනිහා කරන්නේ බලන එක විතර යි. හිතේ තිබුණ මට්ටම අල්ලගෙන මේ පුද්ගලයා එයාගේ මේ සිතුවිලි වැඩ කිරීමේදී තමාට යම් වෙලාවක ද වැටහුණේ මගේ හිතේ තිබෙන මේ සසරට ඇතුල් කරන ශක්තියක් මෙ තැන වැඩ කරනවා, මොකක්දෝ අපේක්ෂාවක් තිබෙනවා කියල, ඒක දැන ගත්තට පස්සෙ මෙයාගේ සිතේ අලුත් ධර්මයක් උපන්නා. අපේක්ෂාවක් තියෙන බව දැනීමේ ධර්මය යි අලුත් ධර්මය. එකක් නම් හිතේ තියෙන්නේ මොනව ද කියල බලන්ට ඕන. දෙ වැනි ධර්මය නම් මේ සිතේ තිබෙනවා දුර්වල කමක්. දුර්වල කම නම් උපදින සැපයට ආශා කරනවා කියන එක යි.

මේ ආශා කරන සැපය මට ඕන විධියට හිටින්නේ නැහැ. ඒක නිසා අනිත්‍ය යි. එයා එතනදී දෙන නිගමනයට කලින්

බැඳිල යි මෙයා සසරට වැටුණේ. මේ අලුත් ධර්මයෙන් නො බැඳෙන තත්ත්වයට හැරෙන හැටි යි මේ කියන්නේ. රසයක් එතන පවතිනවා. ඒ රසය ම මට ලබන්ට බැහැ. අලුත් අලුත් රස එනවා. ඒ තිබුණ රසය ඒ වෙලාවට ඉවර වෙනවා. ඒවා වෙනස් වෙලා යනවා. ඒක නිසා මේ සිතට සම්පූර්ණයෙන් ස්ථිරව ම අයිතියක් මේ එක සැප ස්වරූපයක වත් නැහැ. නමුත්, මෙයා දන්නේ නැහැ ඒක අනාත්ම යි කියන්ට. අනාත්ම කියන එක නො වෙයි මෙයා ඉස්සර වෙලා ගත්තේ. සිතේ පවතින ධර්මයන්ගේ ක්‍රියාකාරී ස්වරූපය හඳුනන එක විතර යි මෙයා මුලින් කරන්නේ. "මෙහෙම එකක් තියෙනවා. ඒක නිරායාසයෙන් සිදු වෙනවා. මේ සිතේ සැප ස්වරූප එකක් වත් පවත්වන්ට බැහැ" යන නිගමනයක් දෙමින් යන එක යි මෙයා කරන්නේ. ඒක යි ආභස්සරය ලෝකෝත්තර තත්වයට හැරෙන අවස්ථාව.

ඊළඟට එන අවස්ථාව **සුභකිණ්හක.** ඒකෙන් කෙරෙන්නේ ඒ පුද්ගලයාගේ හිත පිළිබඳ මුලින් තිබූ ක්‍රියාකාරී ස්වරූප දකින්නට තිබුණු තත්ත්වය එයාගේ සිතේ සමථ්ල වීම යි. නිශ්ශබ්ද තත්ත්වයට සිත පත් වෙනවා. නිහඬ වුණා නො වෙයි. බලන පුද්ගලයාට හිතේ තිබෙන දැනීම් ස්වරූප, හිතට දැනෙන ශක්තිය මේ සිතේ අඩු යි. ශක්තිය හීන යි. සිතේ තිබෙන සියුම් තත්ත්වය බලන්ට තරම් මෙයාගේ සිහිය සියුම් මදි. ඒක නිසා නිහඬ තත්ත්වයට පත් වෙනවා. ඒක නරක අවස්ථාවක් නො වෙයි. සුභකිණ්හක අවස්ථාවේ තව ඉදිරියට යන විට ඒකෙදිත් දකගන්ට පුළුවන් නොයෙකුත් දේවල්. සිත බැඳී ගන්නා නා නා තරාතිරම්වල ස්වරූප පෙන්වන්ට - දැක ගන්ට - ඒ අවස්ථාව එයිට වඩා හොඳට උපකාර වෙනවා.

මේ තත්ත්වයට පත් නො වී ජීවිතය සදාකාලික සැපයට පත් කර ගන්ට බැහැ. මේ සියල්ල ම පහු කරන්ට ඕන. එ විට බයක් ඇති වෙන්ට පුළුවන් අපි කවද ද ඕවා කර ගන්නේ කියලා. කවද ද ඕව කරගන්නේ කියන එක අපට හිතන්ට තිබුණේ බොහොම කලින්. නමුත්, අද මෙහෙම එකක් කීවා කියලා දැන ගත්ත එකමත් එක්තරා අලුත් ධර්මයක්. මෙහෙම එකක් තියෙනවා, මෙන්න මෙහෙම යි ඒක කරන්ට ඕන කියලා දැන ගත්ත එකත් එක්තරා අලුත් ධර්මයක්. මෙහෙම තියෙනවා කී එක මුලදී දැනගෙන තිබුණේ නැහැ. දැනීම නැහැ. දැන් තියෙනවා. ඒක නිසා පිළිවෙලින්

තමාගේ සිත්වල ඒක නිෂ්පාදනය කර නො ගත්තොත් අඩුපාඩුවක් වෙනවා. දැන් මේක, අසා වටහා ගත් අයගේ සන්තානයට ගියා. ඕක අස්කරන්ට මොන ම සමතෙකුට වත් බැහැ. දැන් තියෙන්නේ ඒක ජීවිතයට පුරුදු කරන එක යි. පුළුවන් තරමට ටික ටික හෙම්හිට පුරුදු කරන එක යි අවශ්‍ය. පොඩි කපල්ල යි තියෙන්නේ. ඕකත් මම හිම්හිට අඩු කර ගන්නවා කියලා හිතට ගත්තා නම් ඒ එක දියුණුවක්.

මේ දැනීම ආවට පසු ව ඒ දැනීම තුළින් තමාව පාලනය කරන්ට පටන් ගන්නවා. ඒක යි මේ දැනීම අවශ්‍ය යි කියන්නේ. මූලික වශයෙන් දැනීම මුල් වෙන්නේ ඕකට යි. මෙහෙම දෙයක් තියෙනවා. මේක යි මේ ක්‍රමය. මේක කරන්ට පුළුවන් මෙන්න මෙහෙම යි කියලා තමාගේ දැනීමට වැටුණට පස්සේ එතන ඉඳලා එයා පාලනය වෙන බව එයා ම දන්නේ නැහැ. සමහර අවස්ථාවලදී ඉතා ම තදින් කේන්ති ගන්න තැන්වලදී සමහර විට කේන්ති ගන්ට බැරි වෙන්ට පුළුවනි. කාරණය කේන්ති ගන්න එකක් වුණාට මේ කරුණේදී යම්කිසි විධියකින් එයා පාලනය වෙනවා. "කී දවසක් ජීවත් වෙන්ට ද? කේන්තියෙන් මැරෙනවාට වඩා නරක ද නිකම් මැරෙන එක" කියල ඔන්න ඔහොම බාහිර දෙයක් වත් අරගෙන පාලනය වෙනවා. ඕව යි බුදු හාමුදුරුවෝ වදාරන අලුත් ධර්ම. ඒ ධර්ම උප්පාද කරගන්නා අතරේ තමයි ඔය නිසොල්මන් තත්ත්වයට හිත පත් වෙනවා කීවේ. තවත් ඉදිරියට තිබෙනවා වේහප්ඵල ආදි අවස්ථා. ඒවා චිත්ත තත්ත්ව වශයෙන් කතා කරනවා විනා වචනවලින් කියන්ට බැරි හේතුවක් තියෙනවා. නිහඬ කම, සන්සුන් කම, නිසොල්මන් කම යන හඳුනා දීම්වලින් පමණ යි ඒවා කියන්ට පුළුවන් වෙන්නේ. මේවා හිත දෙස බලා හුරු කර ගත යුතු දේවල් මිස වචනයෙන් කියන්ට පුළුවන් දේවල් නො වෙයි. මේ විධියේ පරිශුද්ධතාවයට වැටිලා කොයි තරම් තේජස් මට්ටම සියුම් වුණා ද කීවොත් මගේ හිතේ කිසිවක් නැහැ යි කියල යි එයාට හිතෙන්නේ. අංශක 50 ට නැගපු ගින්නක් අංශක 10 ට බස්සපුවම ගින්න දැන් උණු ද නැද්ද කියලා කියන්ටත් බැහැ. ඒ වගේ වේග ධාරාව අඩු වෙවී ඇවිල්ලා හිතේ සෞම්‍ය ගණනට නිවෙන විට ඒ තිබුණු තත්ත්වයෙන් ක්‍රියාත්මක කරන වේගයට මනෝධාතුවේ තිබෙන සටහන් සොලවන්ට බොහොම අඩු චලනයකුයි අවශ්‍ය.

අපි මේ දැන ගන්නවා කියන්නේ සිතුවිල්ලකිනුයි. සිතුවිල්ල විසින් දුන්න වේගය පරාවර්තනය වීමේදි යි දැනගන්නවා කියන එක ලැබෙන්නේ. මොළය වැඩ කරන්නේ නැත්නම් දැනීම කියන එක වැඩ කරන්නේ නැහැ. අසංඛාරික සිතුයි අපට දැනෙන්නේ. සසංඛාරික සිත් අපට දැනෙන්නේ නැහැ. ඒකත් එක සිත් වර්ගයක්. අසංඛාරික සිත් ප්‍රබල යි. සසංඛාරික සිත් දුබල යි. ප්‍රබල වේග යි අපට දැනෙන්නේ. හැම වෙලාවෙ ම පරාවර්තිත සිත් වලිනුයි අපට දැනීම ලබා දෙන්නේ. සිතෙන් වේගයක් එවලා එය පරාවර්තනය කරල යි දැනීම ලබා ගන්නේ. අපට බලන්ට පුළුවන් වෙන්නේ ගොරෝසු වේගවලින් පහළ වෙන සිතුයි. ගොරෝසුව බල බලා පුරුදු වෙලා සෞම්‍ය වේග හඳුනා ගන්ට බැරි තත්ත්වයක් එනවා. ඒවා වැඩ නො කරනවා වත් එසේ නැත්නම් හිත අන්තිම ශක්තියෙන් හීන වෙලා වත් නො වෙයි. ඒ වෙලාවෙත් හිතේ ශක්තිය එහෙමම යි. රශ්මිය විතර යි නිවිලා තියෙන්නේ. ඒ නිවුණු රශ්මියේ හැටියට එන පරාවර්තනය ප්‍රබල මදි මෙයාට යමක් හඳුනාගන්ට. ඒක නිසා ඔය මොනවා හෝ තියෙනවා. මොනව ද කියන්ට බැහැ. ඒකට යි **ආකාසානඤ්චායතන** කීවේ.

මේ ආකාස කියන මට්ටමට අපි දවසකට වරක් වත් පත් වෙනවා. ඒ කවර අවස්ථාවක ද? නින්ද යන්ට කලින් අවස්ථාව යි. අපේ නින්දේදී හිත එහෙම ම අඩු වෙවී ගිහිල්ලා ලෝකය එක්ක මොකක් ද කියලා තෝරන්ට බැරි තත්ත්වයට ආවට පස්සෙ යි නින්ද යන්නේ. එතකල් හිත බහිනවා. මිම්ම හොයන එක ලෝකයේ තියෙන දේ දැනගැනීම යි. ලෝකයේ තියෙන දේ දැනෙන තාක් කල් නින්ද යන්නේ නැහැ. නො දැනී යන්ට ආ හැටියේ නින්දට පත් වෙනවා. වෙන දෙයක් කරන්ට බැහැ. නිරෝධ සමාපත්තියට සමවදින අවස්ථාවෙදිත් ඔය **ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නේවසඤ්ඤානාසඤ්ඤායතන** යන අවස්ථාවලට බැහැල යි **සඤ්ඤා වේදයිත නිරෝධයට** පත්වෙන්නේ. ඒ අවස්ථාවේදී කිසිවක් දැනෙන්නේ නැහැ. නිරෝධ සමාපත්තියට සමවදින උතුමා කොයි ක්ෂණයේ සමවැදුණා ද කියන්ට දන්නේ නැහැ. බුදු හාමුදුරුවන්ටත් එහෙම යි. හැම දෙනා ම පසුකරන ධර්ම යි අපි මේ කතා කරන්නේ.

මොකක් ද මේ නිපදවන ධර්මය? එහි අමුත්ත කුමක් ද? අපට නො දැනී තියෙන දැනීම දැනගෙන සිදු වීමට සිහිය පුරුදු කරන එක යි මේ අපි සිත දියුණු කරමින් කරන්නේ. මේ අපි කරන්ට පුරුදු වෙන්නේ තිවෙන අවස්ථා හඳුනා ගෙන ඒවා තිවෙන්ට සකස් කරන එක යි. දැන් හඳුන-හඳුනා ඉන්ට දන්නේ නැහැ. "හෝස්" ගාලා යනවා. සිහියෙන් හඳුනා ගෙන ගත කරන්ට පුරුදු වෙන කොට හඳුනා ගන්ට පුළුවන් වෙනවා. දැනට අපට පුරුදු නැති නිසා ඒවායින් වැඩක් ගන්ට බැහැ. අපි මේවා හඳුනලා නැහැ නේ? අද නේ ආරංචිය ආවේ? මේවා මතුවෙන්නේ හිත බැහැගෙන - බැහැගෙන ගිහිල්ලා. නො දැනුවත් මට්ටමට ආ විට. දැනුවත් මට්ටමට පත් වෙන විධියට වැඩ කරන එක යි කියලා සිතට දැනුණේ දැනුයි. ආකාසානඤ්චායතනයට සිත ඇවිත් ඒ විධියට සිත වැඩ කරන විට එයාට සිහියෙන් තමා විසින් කරන කාර්යය තෝරා ගන්ට පුළුවන් වෙනවා. ඒක යි මෙතන තිබෙන දියුණුව. ඉස්සර කිසිවක් දන්නේ නැති ව පසු කළේ. දැන් දනිමිනුයි පසු කරන්නේ. දැනගෙන පසු කරන නිසා සිත ඕන තැනකට ගන්ට පුළුවන්. ඔය විස්තරෙ යි අපි හොඳට දැනගන්ට ඕන.

# 10

මූල පරියාය වශයෙන් පෙන්වන්නේ ජීවිතයක සකස් වෙන ධර්ම යි. ඔය ධර්ම ගොඩට යි ජීවිතය කියන්නේ. මේ ජීවිතය පිළිබඳ ව මූලික අවස්ථාව ධර්ම හතරකින් ගොනු කළා. පඨවි, ආපෝ, තේජෝ, වායෝ යනුවෙන්. පඨවි කියන්නේ තදවීම. අපෝ කියන්නේ තදවීමට ඇති ඉඩකඩ. ඒ ඉඩකඩත් එක්ක අර තදවීමේ ප්‍රමාණයේ හැටියට රත්වීම. රත්වීමේ හැටියට කාන්දම් නිෂ්පාදනය වීම. ඒ ධර්ම හතර අපේ ජීවිතයේ හැම වේලාවෙ ම බොහෝ වේගයෙන් ක්‍රියා කරමිනුයි පවතින්නේ. මේ ධර්ම හතර මූලික කරගෙන නා නා තරාතිරම්වල ස්වරූප ජීවිතයක සකස් වෙනවා. අතක් හැදෙන, ඇඟිලි හැදෙන, දත් හැදෙන, හම හැදෙන, මස්, කටු හැදෙන මේ හැම දෙයක් ම ඔය පඨවි, අපෝ, තේජෝ, වායෝ ක්‍රියා කාරීත්වයේ විවිධත්වය යි. ඒ ඒ ස්වරූපවලින් වැඩ කරල යි දෙ තිස් කුණපය කියන මේ ශරීරය සකස් වෙලා තියෙන්නේ. අපි මේවා හැදුණට පස්සේ අයිතිවාසිකම් කියලා තියෙනවා.

අයිතිවාසිකම් කියන එක යි **පඨවිං පඨවිතො සංජානාති. සඤ්ඤත්වා මඤ්ඤති, අභිනන්දති** කියන වට්ටෝරුවෙන් පෙනෙන්නේ. ඔය වට්ටෝරුව ක්‍රියාත්මක වෙල යි නා නා තරාතිරම්වල දේවල් හැදිලා තියෙන්නේ. එක විදියක පඨවියක් නො වෙයි. නා නා තරාතිරම්වල පඨවි. ඒ වගේ ම ආපෝ. ඉඩකඩ, බුරුල, නිදහස යන මේවාට යි ආපෝ කියන්නේ. මේ නා නා තරාතිරම්වල සීමාවක් කරන්ට බැහැ. ඒ සියල්ල ම ඒ අවස්ථාවේදී ඒ ක්‍රියාකාරීත්වයේ දරන ස්වභාවය යි. ඒකට යි ධර්ම කියන්නේ. ඒ දැරීම් ස්වභාවය විවිධ ආකාරවලින් ක්‍රියාත්මක වෙලා දැරීම් මහා රාශියක් එක්කාසු වෙල යි අර භූත කියන අයිතිවාසිකම නිෂ්පාදනය වෙන්නේ. භූතවලට යි සියල්ල ම අයිති. ඒ භූත ස්වරූපය කාලාන්තරයක් පරිහරණය කරලා ඒ

පරිහරණය කරපු කාලයේ ඇවෑමෙන් ඒ ජීවිතයේ තව එකක් හැදෙනවා, ඒ දේවල් වැඩි කාලයක් පවත්වන්ට පුළුවන් ගතිය යි ඒ.

යම්කිසි ක්‍රියාකාරීත්වයක් පඨවි, ආපෝ වශයෙන් ක්‍රියා කරනවා නම් ඒවායේ ක්‍රියාකාරීත්වය ධාරණය කරලා අපට නැවත දැන ගන්ට පුළුවන් ධර්ම ස්වරූපයක් ඔය කාල සීමාව තුළදී හෙමින් හෙමින් වැඩිලා තියෙනවා. එක එක තරාතිරම්වලට අයත් සත්ව ජාති ඉන්නවා. මතක තියෙන, මතක නැති සත්තු ජාති ඉන්නවා. ඔහොම දියුණු වෙච්ච ඇවිත් මනුස්ස මට්ටමට ආ විට ඒ හැදුණු ශක්ති ධාරණය වෙනවා. වැඩියෙන් ධාරණය වෙනවා. පඨවි, ආපෝ, තේජෝ, වායෝවලින් සකස් වූ කාෂ්ටක ශක්ති ධාරණය වෙනවා. ඒ ශක්තිය කාලයක් පවත්වන්ට පුළුවන් එකට යි ධාරණය කීවේ. ධාරණය තුළිනුයි "දේව" හැදුණේ. තමාට ඕන දේ කරගන්ට පාපි ස්වරූපයට වඩා වෙනස් පාලන ක්‍රමයක් යටතට ගන්ට අර හැදුණු ධර්මයෙනුයි අපි උදව් ගත්තේ. අපි හැදුවා නො වෙයි. මේ මූල පරියාය සූත්‍රයෙන් සම්පූර්ණයෙන් ඉදිරිපත් කරන්නේ අනාත්ම ස්වරූපය යි. කිසි ම අයිතිවාසි කමක් නැති බව යි. දේව කියන අවස්ථාවේදී යම්කිසි පාලනයක් එයාට හිතෙනවා. මට මේක මෙහෙම නො වෙයි වෙන විධියකට යි කරන්ට ඕන කියල හිතනවා. නමුත් ඒකේ සුලමුල සොයනවා නම් එ විට දැනෙනවා. එයා හිතුවා නො වෙයි හිතුණා. හිතුණා කීවේ මහා ක්‍රියාකාරී ගොඩක තනි වචනයකුයි. මෙහෙම යි කරන්ට ඕන කියලා හිතුණේ එයා ළඟ හැදුණු දේවල් අර ධාරණ ශක්තියේ එක එක කොටස් එතන වැඩ කරලා හැඟීමක් ලබා දුන්නා. ඒකේ සුලමුල පෙන්නලා දුන්නා.

නිදසුනක් ගතිතොත් පතොක් කටුවක් කවුරු හරි දැක්කොත් එයා ඒකෙන් පරිස්සම් වෙනවා. එයාට පරිස්සම ආවේ අර කටුව ඇනිලා නො වෙයි. ඇනිලා නැහැ. නමුත්, එයාට ධාරණයට වැටිලා තියෙනවා, ඔය කටු ඇනුණොත් ගෙඩි හැදෙනවා, කරදර වෙනවා, දුර දිග යනවා කියලා. අර ධාරණයට ශබ්දානුසාරයෙන් ඒක ලැබෙනවා. පතොක් ගැන ධාරණය වූ කොටස වැඩ කරලා පතොක්වල නරක මෙයාට හැහෙනවා. පතොක් දැක්ක ගමන් ම අපි වේදනා විඳින්ට බය වෙනවා. ඒ වේදනා ධාරණයට ඇවිල්ලා අපව පස්සට දානවා. අර ධර්මවලිනුයි ඒක කළේ. එයා පස්සට

යනවා නො වෙයි. පුංචි ළමයෙකුට පතොක් දුන්නොත් එයා කිසි ම ගණනක් නැති ව අල්ලයි. ළමයාට පතොක් ගැන ධාරණයක් නැහැ. මේ ලෝකයේ තියෙන දේවල් අපි දන්නේ නැහැ. සුලමුල දන්නේ නැහැ. වළේ වැටෙනවා, කටු ඇනෙනවා. ඒ සිදුවීම්වල ධාරණය ක්‍රියාත්මක වීමෙනුයි දැනෙන්නේ. මේ ධාරණය ක්‍රියාත්මක වෙන්නේ නිමිත්ත මුණ ගැසුණු විට යි.

දැන් කවුරු හරි කතා කළොත් ඉන්දියාව ගැන, එයත් එනවා ඉන්දියාව ගැන කියන්ට. ඒ එයා ඉන්දියාව ගැන කතාවට මැදිහත් වෙන්නේ ඇයි? එයාගේ ධාරණයේ තිබෙනවා ඒ ගැන. ධාරණයේ තියෙන ටික දොට්ට දමන්ට යි එයා හදන්නේ. ඉන්දියාව කියන ශබ්දය එන විට ම ඉන්දියාව පිළිබඳ ධාරණයේ තිබූ සටහන් වැඩ කරනවා. සටහන් වැඩ කරන විට එනවා රත්වීමක්. ඒකෙන් දෙනවා ඉන්දියාව ගැන සුලමුල සියල්ල ම. ඒ ධාරණය නිසා පහළ වෙන සිතුවිලි මෙයාට උහුලන්ට බැහැ. උහුලන්ට බැරි නිසා කොහොම හරි අර අමාරුව සංසිඳවා ගන්ට ඉන්දියාවේ තියෙන නොයෙකුත් දේ ගැන කියන්ට වෙනවා. එයාගේ ගෑස් පිටවෙනවා. රත් වෙනවා වැඩි නිසයි ගෑස් පිට වෙන්නේ. රහතන් වහන්සේ නමක් ළඟ සිට ඉන්දියාව ගැන නො වෙයි රහත් වීම ගැන වුණත් යමෙක් මොන පව ගොඩක් කීවත් රහතන් වහන්සේ කිසිවක් කියන්නේ නැහැ. අහගෙන ඉඳියි. එහෙම අහගෙන ඉන්ඩ පුළුවන්. රත්වෙන අණු රහතන් වහන්සේ ළඟ නැති නිස යි. දැන් අපට තේරෙන්ට ඕන අපගේ මේ නො සන්සුන් කම කුමක් නිසා ද කියලා. කෙනෙක් කතා කරන විට අහගෙන ඉන්ඩ බැහැ. මොකක් හෝ පැහිච්ච කමක් කියලා බැණුම් අහන්ඩ වෙනවා.

මේ ධර්ම දැන ගැනීමෙන් වෙන්නේ කුමක් ද? ඒක අලුත් ධර්මයක් වෙනවා. ජීවිතයට අලුත් ධර්මයක් එකතු වෙනවා. තමාට නිමිත්ත ඉදිරියේ රත්වීම උහුලන්ට බැරි මට්ටමට වැඩි වෙන කොට සිතේ ස්වභාවය ගැන මෙනෙහි කරමින් ඉන්නවා. එ විට පාලනය වෙනවා. ඒ පාලන ශක්තිය යි. එ සේ නැති ව කිසි කෙනෙක් පාලනය කරනවා නො වෙයි. ඒක යි බුදු හාමුදුරුවෝ දේශනා කළේ පුළුවන් තරම් දේ අහගන්ට කියලා. අහගන්නා දෙයට **සුතමය ඤාණය** කීවා. තමාට යහපතක් වෙන ඕන දෙයක් අහන්ට කීවා. හරි වැරදි කියලා දෙකක් තිබෙනවා. ඒකෙන් හරි වැරදි බලා තමාට යහපත වෙන දෙය ධාරණයට ගන්ට ඕන.

තමාට වෙන දෙය තමා දැන ගන්න කොට, මේ වෙන්නේ මේක යි, ඒකේ මිම්ම මේක යි, ඒකේ ප්‍රමාණය මෙ පමණ යි, යනාදි වශයෙන් සිතන කොට, තමා කරලා තිබෙන්නේ මනසිකාරය යි. ඒකට යි මනසිකාර කියන්නේ. නැති ව හුළං ඇද-ඇද ඉඳලා හෝ කසනවා කසනවා කියලා හෝ හරියන්නේ නැහැ. තමාට වෙන්නේ, මේ නිමිත්ත ඉදිරියේ මේක යි කියලා හිතන කොට ඒකත් ප්‍රත්‍ය වෙනවා. ඒ උදව්වෙන් තවත් ධර්මයක් ඇති වෙනවා. සිත රත් නො වෙන ලෙස දරා සිටීමේ ධර්මය යි මේකෙන් ප්‍රත්‍ය වෙන්නේ. අභිධර්ම පිටකයේ විභංගයෙ යි මේ ධර්ම උගන්වලා තිබෙන්නේ. හැම වෙලාවෙ ම පුද්ගලයා තුළ ධර්මයක් හැදෙනවා. ඒක නවත්වන්ට බැහැ. බුදු හාමුදුරුවෝ නිවන යි කීවේ රත්වෙන එක නිවා ගැනීමට යි. නැත්නම් වෙන කොතනක හරි නිවන තියෙන තැනක් නැහැ. නිවන්ටත් ක්‍රමයක් තිබෙනවා. ඒ ක්‍රමය යි බුදු හාමුදුරුවෝ ඉදිරියට දැම්මේ.

මේ වෙන්නේ මේක යි. මේකෙන් වෙන්නේ මේ තත්ත්වය යි කියා හිතන කොට තමා තුළ තිබෙන රත්වීම ඒ ගාණට නිවෙනවා. නිවෙන්නේ කොහාම ද? අර රත්වෙන කරුණට විරුද්ධ පැත්ත දැම්ම නිස යි. ගිනි ජාලාවට ඇල් වතුර ගහන්නා වගෙ යි. අර කාරණයට රත්වෙන විට නිවන පැත්තට කරුණු එයා දානවා. ඒකේ ආදීනව මෙව යි. මේ වෙන්ට යන්නේ මේක යි. මේකෙන් වෙන අනර්ථය මේක යි. ඒ ප්‍රතිවිරුද්ධ පැත්ත දාපු හැටියේ නිවුණා. බුදු දහමේ නිවන කියලා උගන්වන්නේ රත්වෙන එක නිවා ගැනීමට යි. ගිනි තියාගෙන, "නිවන් ලැබේවා" කියන කොට සාදු කීවාට, නිවෙන්නේ නැහැ. ඒ කියන වෙලාවෙත් මිනිහා ගිනි තියාගෙන. රත්වෙන - රත්වෙන වෙලාවට නිවා ගන්ට ඕන. කෙනෙක් නො රුස්සන දෙයක් කියන විට හිතේ උපදින රත්වීමේ වේගය වාව ගන්ට බැරි වෙනවා. කතා කරන්ට පතින්නේ ඕක යි. කතා කිරීම නො වෙයි මෙතන කරන්ට තිබෙන්නේ. මෙතන නිවන්ට යි තිබෙන්නේ. කෙලෙස්වල ගතියක් තියෙනවා හරියට හොරු වගෙ යි. හොරා ගෙට රිංගන කොට "ඔන්න හොරා!" කියන කොට ම පැනලා දුවනවා. අන්න ඒ වගේ වැඩක් මේ. කෙලෙස් වැඩ කරන විට ඒක දැක්කම ඒක අහකට යනවා. යන්නේ මොක ද? පළමු සිතේ ඒක ආවා. දෙවැනි හිතෙන් මේක හිතන්නේ නැති ව වෙන එකක් හිතන

කොට සිත සෞම්‍ය වෙනවා. මේ අන්දමට සිතේ පාලනය ඇති වෙනවා. කලින් මේ දේව, ප්‍රජාපති, බ්‍රහ්ම පිළිබඳ විස්තර කරලා තිබුණත් මේ විස්තරයේ වැදගත් කම නිසා නැවත මතක් කරන්ට සිද්ද වුණා.

දැන් මේ ඉදිරියට යන කොටසේ තියෙන්නේ අර අලුත් ධර්ම මතුවෙච්ච පුද්ගලයාගේ නරක පැත්ත බිඳී-බිඳී හොඳ පැත්ත අවදි වෙන පාලන ශක්තියක් යටතේ යන ක්‍රමයක්. ඒ පාලන තත්ත්වය අපි දැනගන්ට ඕන. අපෙන් කෙරෙන්නේ කුමක් ද? කාරණය පිළිබඳ ව වටහා ගැනීමට කරුණු කණට දාන එක විතර යි. දැන් මේ කාට හෝ යම් හදිසි අවස්ථාවකදී අර විධියේ කතාවක් හෝ ක්‍රියාවක් කරන්ට ආපු වෙලාවට තමන් ඒක කරන්නේ නැහැ කියල හිතුවට හරි යන්නේ නැහැ. ඒකේ ප්‍රතිවිරුද්ධ පැත්ත හිතන කොට හරි යනවා. නිකම් ම බහිනවා. බුදු හාමුදුරුවෝ සතිපට්ඨාන සූත්‍රයේදී **ඒකායන මාර්ගයක්** ගැන පෙන්වා වදාළා. මොකක් ද මේ ඒකායන මාර්ගය? මෙ තැන අපිට කරන්ට දෙයක් නැහැ. ප්‍රතිපත්ති රකිනවා කියලා බොහොම හොඳට ලෑස්ති වෙලා වෙහෙසෙන්ට දෙයක් නැහැ. අර කාරණය යොමු වෙන තැනට දාලා මනසිකාරය කළ හැටියේ කාර්යය සිද්ධ වෙනවා. ඒකායනය මනසිකාරය යි. ඒ හැර, වෙන කිසිවක් නැහැ.

තමාගේ හිතේ නරක වේග අඩු වෙච්ච ඒවා සෞම්‍යත්වයට පත්වෙන්ට - පත්වෙන්ට හිත යන එන ස්වරූප තමයි ආභස්සර, සුභකිණ්ණ, වේහප්ඵල ආදිය. ඔය ආකාරයෙන් සිතේ ක්‍රියාකාරීත්වයන් දියුණු වෙගෙන යන විට ලැබෙන්නේ, දැනෙන්නේ මොකක් ද? මානසික සැපය අවදි වෙන්ට පටන් ගන්නවා. මානසික සැපය අවදි වෙනවා කියන්නේ සිත රත් නො වෙන තත්ත්වයට පත් වෙනවා. සිත යම් තරමකට ද රත් නො වෙන්නේ ඒ තරමට සැප යි. ඒක යි නිවන සැප යි කියල දේශනා කළේ. සැප යි කීවම අපි හිතන්නේ මොකක් හරි තැනකට ගිහිල්ල විඳින සැපයක් ගැන යි. බුදු හාමුදුරුවෝ වදාළේ නිවාගත් තරමට සැප යි කියල යි. නිවන සැප යි කියන එක යි එයින් පෙන්වන්නේ. ඒකට තිබෙන සාක්ෂිය කුමක් ද? සෝවාන් වූ ආර්යයන් වහන්සේගේ තියෙන සැපයට වඩා සකදාගාමී අවස්ථාව සැප යි. අනාගාමී තත්ත්වය ඊටත් වඩා සැප යි. රහත් වූ විට සම්පූර්ණයෙන් ම සැප යි. සැප යි කියල කතා කරන්නේ අර කී

නිවීමට යි. සෝවාන්, සකදාගාමී අනාගාමී වෙලත් රහත් නො වෙන්නේ මොක ද? ඒ චිත්ත මට්ටම්වල සැපයට ඇලෙන නිසයි. රාග නිසයි. ඇතැම් අය සෝවාන්, සකදාගාමී, අනාගාමී, අරහත් කියන මට්ටම්වලට එක තත්පරයෙන් පත් වෙලා නිවන ප්‍රත්‍යක්ෂ කරනවා. ඒ උත්තමයන්ට පෙනෙනවා මේ ඇල්ලීම නරක යි කියලා. ඔය සැපයට ආසා නො කරන තත්ත්වය යම් වෙලාවක ද එන්නේ, ඒ වෙන තුරු සැපය සම්පූර්ණ ස්ථාවර භාවයකට පත් වෙන්නේ නැහැ. පූර්වන් කම් අනුව සහ දැනීමට අනුව යි රහත් වීමේ චිත්ත මට්ටම සම්පූර්ණ වෙන්නේ. සමහරු ඉන්නවා බණ පද තුන හතරක් කියන විට සියලු කෙලෙසුන් අවසන් කරලා නිවෙනවා. **දාරුචීරියට** බණ පද හතරකින් වැඩේ සඵල වුණා. ඒ ඇල්ලිල්ල තිබුණේ නැති නිස යි.

දැන් බ්‍රහ්ම තත්ත්වය ගැන කතා කරනවා නම් ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නේවසඤ්ඤානාසඤ්ඤායතනය යනුවෙන් මානසික මට්ටම්වල ඉතා ම සියුම් තත්ත්වයක් උදාකරලා පෙන්වනවා. ඒවා ඕන තරම් අහල තියෙනවා. ඒ හිත බස්ස-බස්සා, නිවි නිවී ඇවිල්ලා ඒකේ නො දැනෙන තත්ත්වයට එන තුරුත් එක එක ධර්ම හැදෙනවා හිතේ. කලින් බොහොම සැරෙන් තිබුණු රත්වීම දැන් අඩු කර ගෙන යි ඇවිල්ලා තිබෙන්නේ. පහන් දැල්ලේ එළිය අඩු කර-කර ආ විට වටේට පේන්ට තිබුණ ඒවා දැන් නො පෙනෙනවා වගෙ යි. කලාමැදිරි එළියක් තරමට එළිය අඩු කළ විට එළිය තියෙනව ද නැද්ද කියා වත් දන්නේ නැහැ. එළිය විහිදෙන්නේ නැහැ. ඒ තත්ත්වයට හිතේ ක්‍රියාකාරීත්වය එනවා. ඒකට කියන්නේ නේවසඤ්ඤානාසඤ්ඤායතන කියල යි. ලෞකික සිතක තිබෙන තත්ත්වයක් මේක.

තවත් ධර්ම ස්වරූපයක් පෙන්වනවා දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත කියල. දිට්ඨ කියන්නේ දැකීම, සුත කියන්නේ ඇසීම, මුත කියන්නේ ස්පර්ශ වීම. විඤ්ඤාත කියන්නේ හැඟීම් හඳුනා ගැනීම, දැනීම යන මේවා යි. මේ සියලු දේවල් අර පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන අවස්ථාවල ඉඳලා නේවසඤ්ඤා නාසඤ්ඤාවලට එන තුරු තිබුණ මානසික මට්ටම්වල තියෙන්නේ දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත විතර යි. සම්පිණ්ඩනය ඕක යි. ඒ සියලු ම ශක්ති ඇතුළේ තියෙන්නේ මොනව ද? දැකීමේ ශක්තිය, ඇසීමේ ශක්තිය, ස්පර්ශ කිරීමේ ශක්තිය, හඳුනා ගැනීමේ ශක්තිය තිබිලා තියෙනවා.

හැම ශක්තියක් තුළ ම දැකීමේ ඇසීමේ, ස්පර්ශ කිරීමේ පුළුවන් කාර කම සහ කල්පනා කිරීමේ පුළුවන්කාර කම තියෙනවා. පඨවි, ආපෝ, තේජෝ, වායෝ සිට මෙතෙන්ට එන තුරු හැදුණු නා නා ධම්වල තිබුණු ක්‍රියාකාරී තත්ත්වය කුමක් ද? දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත විතර යි. අපගේ මුළු ජීවිතයෙ ම කරලා තියෙන්නේ දැකීම, ඇසීම, ස්පර්ශ කිරිම, කල්පනා කිරීම යන ගොනුව හැර ජීවිතයේ කළ වෙනත් කිසි ම දෙයක් නැහැ.

කිසි ම කෙනෙකුට ජීවත් වෙන්ට ඕන නැහැ. කිසි ම අදහසක් නැහැ. අපි ජීවත් වෙනවා කියන්නේ කුමක් ද? හිතෙන් දෙන බලපෑම නිවා ගන්ට හදනවා. දැන් සමහරු කියනවා මට මැරෙන්ටත් නිදහස නැහැ කියලා. ඒ මොකක් ද ඒ කියන්නේ ? දරුවො ගැන හිතලා, තියෙන සිතුවිලිවලින් එන වේග නිවා ගන්ට මිනිසුන්ට වැඩ කරන්ට වෙලා තිබෙනවා. ඒ නිසා, මිනිහා ජීවත් වෙන්ට ඕන කියනවා. ජීවත් වෙන්ට නො වෙයි මිනිහට ඕන ප්‍රශ්න වලට පිළිතුරු දෙන්ට. දැන් යමෙක් ප්‍රශ්න අහන්නේ ඇයි ? නිකම් ඉන්ට බැරි ඇයි ? හිතෙන් කියනවා "අහනවකො" කියලා. එතකොට නිකම් ඉන්ට බැහැ. ඉතින් පට පට ගාලා පටන් ගන්නවා. ප්‍රශ්න වැඩි වෙන කොට එයාට දරා ගන්ට බැහැ. ජීවත් වෙන්ට නො වෙයි ආසාව. මේ මතු වූ ප්‍රශ්න විසඳන්ට යි එයාට ඕන.

ප්‍රශ්නයක් නැත්නම් ජීවත් වෙන්ට ඕන නැහැ. රහතන් වහන්සේට වුණේ ඒක යි. එකක් වත් නැහැ ප්‍රශ්න. එතකොට මම ඉන්නේ කුමකට ද? ඉඳලා වැඩක් නැහැ. අර උත්පත්තියේදී ගත්ත වේගයේ තියෙනවා ශක්තිය. ඒ වේගය ඉවර වෙන තුරු ඒකේ බලය තියෙන නිසා මට ඉන්ට වෙලා තියෙනවා. එතකල් ඔය අනුන්ට මොන මොනවා හරි කර කර ඉන්නවා. යන දාට මම යනවා. රහත් සිත ක්‍රියාත්මක වෙන්නේ ඒ විධියට යි.

මේ අනවශ්‍ය දුක් විඳින්නේ නො දන්නා කම නිසයි. ජීවිතය දැන ගත්ත හැටියේ දුක් කියලා ජාතියකුත් නැහැ. කළ යුතු යි කියලා දෙයකුත් නැහැ. පුළුවන් නම් කරනවා. නැත්නම් නිකම් ඉන්නවා. ඒකට පිළිතුරු දෙන්ට බුදු හාමුදුරුවෝ ඉදිරිපත් කළා උපෙක්ඛාව. ඔක්කොම ධම් ජීවිතයේ තැන්පත් වෙනවා. **කවදා වත් කිසිවෙක් සිතිය යුතු නැහැ නිවන් දකින්ට බැරි වෙයි කියලා. අපි සියලු දෙනා ම නිවන් දකිනවා.** මේ පිරිස මෙ තැනට ගෙනාවේ

ඒ ඒ ධර්ම විසින්. මේ දෙය අසාගත්තොත් අද ඒකෙන් අලුත් ප්‍රයෝජනයක් ලබන්ට පුළුවන් වෙයි කියලා හිතපු ධර්ම විසිනුයි මෙ තැනට මේ පිරිස ගෙනාවේ. කලින් ඇසූ ධර්ම තුළින් තව රුකුලක් දුන්නා අලුත් ධර්ම ටිකක් අසාගන්ට. එහෙම මොන ම ධර්මයක් හෝ නො දන්නා මිනිහව ලනුවක් දාලා ඇදගෙන ආවත් ලනුව බුරුල් කළ හැටියේ දුවන්ට පටන් ගනීවි. ඉන්ට බැහැ. ඉන්න බලපෑම ඇතුළේ නැහැ. මේ අයට ඒ බලපෑම තියෙන නිසා මොන ම ලෙසකින් වත් නවත්වන්ඩ බැහැ.

ඔය **දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත** කියන හතරෙන් අපි කළේ කුමක් ද? තව ධර්මයක් තිබෙනවා. **ඒකත්ත, නානත්ත, සබ්බත්ථ** කියලා ඒක බෙදෙනවා. ඒකත්ත කියන්නේ එ තැන එක යි. නානත්ත කියන්නේ විවිධ යි. සබ්බත්ථ කියන්නේ ඔක්කොම. අපි ලෝකෙට හැරුණු වෙලාවේ ඔය තුනෙනුයි ලෝකය විග්‍රහ කරලා තියෙන්නේ. ඒකත්ත කීවේ මොකක් ද ? බොහොම ගොඩක් තියෙනවා. මෙන්න මේක හොඳ යි කියලා ගත්තා. සියල්ලෙන් තෝරපු එක ඒකත්ත යි.

නානත්ත කීවේ විවිධ වශයෙන් බව පැහැදිලි කිරීමට යි. මෙකේ අහවල් එක හොඳ යි, මේකේ අහවල් එක හොඳ යි කියලා තෝරනවා. ඒකේ වැඩි වෙලාවක් තෝරන්න ගියොත් ඊට වඩා හොඳ එකක් නැද්ද කියලා වට පිට බැලෙනවා. සෑහෙන කාල සීමාවක් එයා සොයනවා. සබ්බත්ථ කීවේ ඔක්කොම. සම්පූර්ණයෙන්. එකක් තෝරගන්ට ඔක්කොම ඇසුරු කරන්න ඕන.

**ඊළඟට නිබ්බාණ** - මේ ලෝක ධාතුවේ හැම කෙනෙක් ම නිබ්බාණය බලාපොරොත්තු වෙනවා. මොකක් ද ඒ බලාපොරොත්තු වෙන නිබ්බාණය ? හැම වෙලාවෙ ම තමාගේ මානසික පීඩනය නැති ව ඉන්ට යි. මානසික පීඩනය නැති ව ඉන්ට නම් හිත නිවෙන්ට ඕන. හිතේ නිවීමෙන් ලැබෙන අයිතිවාසිකම කුමක් ද? කරදරවලින් නිදහස් වී ඉන්ට ඕන කම. මේ කරදර කියන්නේ කුමක් ද? තමාගේ හිතේ ඒ ඒ දේවල් අරමුණු කරගෙන, සම්බන්ධ කරගෙන ඇති වුණා වූ වේග උහුලන්ට බැරි කම යි. එයාට ගෙදර කන්ට නැහැ. ළමයි අසනීපයෙන්. ගෙදර ඇත්තෝ කරදරයෙන්. ණයත් තියෙනවා. අනන් මනන් ගොඩක් තියෙනවා. මේ එකින් එකට, එකින් එකට, හිතන කොට පත්තු වෙන ගිනි

තිබෙනවා. මේ ඔක්කොම එක් රොක් වුණු විට උහුලන්ට බැහැ. ඒ සිතේ තේජස පත්තු වෙන කොට මිනිහා කියන්නේ මේ ඔක්කොම කරදර අරවයින් කියල යි. ඒවයින් නො වෙයි කරදර. මේවායින් උපදින ගින්න උහුලා ගන්ට බැහැ. ඒක යි කරදර. ක්‍රියාව දරාගෙන සිටීම යි කරදර. ක්‍රියාවල් දරාගෙන සිටින නිසයි පත්තු වෙන්නේ. ඉන්ද්‍රිය පහේ වැඩ කරන මෝල් පහේ ගින්දර එක කටකින් පිට වෙන්නේ. අසනීප නම් ළමයට බේත් අරන් දෙනවා. බේත් ගන්ට සල්ලි නැත්නම් කොත්තමල්ලි දෙනවා. ඒකටත් සල්ලි නැත්නම් තේ වතුර දෙනවා. ඒකත් නැත්නම් නිකම් ඉන්නවා. ඔක්කොම එයාට කරන්ට පුළුවන් නම් කරදරයක් නැහැ. එයා එතන ක්‍රියාව දරාගෙන නැහැ.

දරුවෙක් ඉන්න පියෙකුට ඕක හිතන්ට පුළුවන් ද? බැහැ. එයාගේ හිතේ දරුවා ගැන වගකීමත් අරන් තිබෙනවා. ඒ නිසා, එයා ඒ දුක විඳින්ට ඕන. දැන් නවාතැනකට නේවාසිකයෝ ගත්තොත් කෑම දෙන්ට, ඒ අය ඉල්ලන කෑම සපයන්ට ඕන. ගත්තට පසු ව කරන්ට දෙයක් නැහැ. ඕක මැදදි හදන්ට බැහැ. මේවා දැනගැනීමෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද? මම මේවා පුළුවන් හැටියට කරනවා. එක එක පුද්ගලයා ඉන්න මට්ටම්වල හැටියට යි නිවන්න කීවේ. කොසොල් රජතුමාට දෙසූ බණ බුදු හාමුදුරුවෝ සුනීතට දේශනා කළේ නැහැ. පටාචාරාගේ හැටියට පටාචාරාට, සුනීතගේ හැටියට සුනීතට. මේ ආදි වශයෙන් සුදුසු පරිදි යි බුදු හාමුදුරුවෝ දේශනා කොට වදාළේ.

අර විදියේ ගෘහ ජීවිතයකට බැඳිලා වගකීම් ගොඩක් එක්ක ඉන්න කෙනෙකුට භාවනා කරන්ට කතා කළොත් මොන භාවනා ද? ඒ මනුස්සයට ඕන අර කරදරවලින් නිවෙන්ට යි. එයාට උගන්වන්ට ඕන ඒ විධියට යි. එතකොට එයා ගෙදර ඉඳන් නිවිලා. එ විට එයා කවදා හරි එතෙන්ට එනවා. එහෙම ක්‍රමයක් බුදු හැමුදුරුවෝ පෙන්නලා තිබෙනවා. මේ නිබ්බාණය කියන එක අපි නිරතුරු ව බලාපොරොත්තු වෙන එකක්. එතන වරද කුමක් ද? **"නිබ්බාණං අභිනන්දති"** කරනවා. ඒකටත් ඇලෙනවා. මෙ පමණ දුර පෙන්නුවේ මේ ලෞකික පැත්ත යි. ඊට පසුව යි අනෙක් පැත්තට හැරන්නේ.

# 11

බෞද්ධ දර්ශනය කියන්නේ තමාගේ ජීවිතය දුකින් මුදවා ගැනීම සඳහා උපකාර වෙන දැනීම යි. ඒ දැනීම යම් ප්‍රමාණයකට ද තිබෙන්නේ ඒකට කියනවා බුද්ධිය සකස් කරන දැනීම කියලා. දර්ශනය කියන්නේ ඇයි? තමන්ගේ ජීවිතයෙන් ම පෙනෙනවා මෙහෙම කරපුවම අරහෙම වෙනවා ය කියලා. මේ විදියට කළොත් අර විධියට යි වෙන්නේ කියලා දැනගෙන පීඩා සහිත සංවිධානය නවත්වන්ට ඕන කියල හිතනවා. එ විට පීඩා නො දෙන සංවිධානය සකස් වෙනවා. අන්න ඒ පුද්ගලයා ළඟ තිබෙනවා බෞද්ධ දර්ශනය. ඒකට යි බෞද්ධ දර්ශනය යි කියල කියන්නේ. පොතේ තිබුණු දේ ඇස් දෙකෙන් දැකලා ඒ දැක්ක දෙය ඉගෙනගන්න අයට කියනවා මෙහෙම යි කියලා. ඕක මතකයේ තිබීමක්. සංඥා ගොඩක් ධාරණයේ තිබීමක්. බෞද්ධ දර්ශනය කියන එකත් එක්ක මේවා මිශ්‍ර කළොත් ඒකෙන් ගන්ට තිබෙන දෙය පුස් කනවා.

බෞද්ධ දර්ශනය තමා තුළිනුයි ප්‍රත්‍යක්ෂ වෙන්නේ. ඒ තැනට එයා සූතමය ඤාණය පරිහරණය කරන්ට ඕන. පීඩා සහිත සංවිධානය ඇති වෙන්නේ මෙන්න මේ හේතුව නිසා, පීඩා නො වෙන විධියට හිත සංවිධානය වෙන්නේ මේ හේතුව නිසා කියලා එයා අසා දැන ගෙන තිබුණොත් ඒ අසාගත් දෙයෙහි ධාරණය එයාට උපකාර වෙනවා. අහගෙන ඉඳලා ඊට අනුව පිළිපැදීම කියල යි අපි හිතන්නේ. එහෙම නම් වෙන්නේ, අනාත්ම පදනමක් මත යි මේක ගොඩනැගෙන්නේ කියලා අපට ඔප්පු කරන්ට බැහැ. අපි කරනවා නම් අනාත්මයක් නැහැ. අපට කරන්ට කිසි දෙයක් මේක ඇතුළේ නැහැ. කවදා හරි නොයෙක් නොයෙක් ක්‍රම ඔළුවට වැටිලා කලින් අහලා ඒවා ඔක්කොම පොදි ගැහිලා අපේ මනෝධාතුවේ ධාරණයේ තිබෙනවා. ඔය අතරතුරේ නියම ක්‍රමයකුත් ඔය අස්සෙන් ආවා. එයාට ලැබුණා අහන්ට. ඒ අවස්ථාව

එනවත් එක්ක ම එයාට චූවමනා කරන්නේ මේකෙන් ගැලවීමක් ලැබීමට යි. නිසි මගට සිත දමා ගැනීමට යි. ඒ නිසා, අලුත් බලවත් දෙය හිතෙන් පිළි අරගෙන ඒක එයා අනුමත කරනවා. ඒ අනුමත කරගෙන - කරගෙන යන විට එයාට සිදු වෙන විශේෂයක් තියෙනවා. අහපු හරි කියමන නැවත නැවත සාරවත් කරනවා. ඒ සාරවත් වූ එක අසාරවත් වූ ඒවා අබිබවනවා. ඒක යි විශේෂය. දැන් මෙතැනදී කතාවට කන් දීලා යම්කිසි දෙයක් මෙයාගේ හිතට එකඟ වෙන විධියට කියවුණා නම්, ඒක ගැන තමන්ට බැහැ මතක් නො කර ඉන්ට. ඒක ගැන නැවත සිහියට නො ගෙන ඉන්ට බැහැ. ඒක තමාට වැටහුණා. ඒ විධියට කළොත් හරියයි ද ? හරි නො යන්ට හේතු නැහැ. ඒ ඔක්කොම හේතු ඉදිරිපත් කරල යි කීවේ. එතකොට එයා දන්නෙ ම නැති ව එයාගේ අර සටහන ප්‍රබල වෙනවා. ඒකට කියන්නේ චින්තාමය ඥාණය කියල යි. **චින්තාමය ඥාණය** කීවේ හොඳ නරක දෙක පිළිබඳ ව වටහාගෙන සිතීමට යි.

මේ ක්‍රමය හරි බව නොයෙක් අවස්ථාවලදී මතක් වෙනවා. මතක් වෙන ශක්තිය ප්‍රබල වුණාට පස්සේ එයාට සිදු වෙන්නේ කුමක් ද? තමන්ගේ සිත කලම්බන යමක් හමු වූ විට, දර්ශනයක් හමු වූ විට ඊට ගැලපෙන කියමන් කියලා තියෙන සටහන නිමිත්තට අනුව ක්‍රියා කරන්ට පටන් ගන්නවා. ඒක නිරායාස සිද්ධියක්. ඒ නිමිත්තේ විසිතුරකුයි මේ කියන්නේ. ඒක ඉබේට වැඩ කරනවා. ඒකට නිදසුනක් ගනිතොත්, පිරිසක් මැද්දේ ඉන්න කෙනෙක් සොයන්ට අයෙකුට කියනවා. මෙන්න මෙයාගේ හැඩය මෙහෙම යි. එහෙම කෙනෙක් දැක්කොත් කියන්ට. ඒ හැඩය හිතේ දරාගෙන යන කොට කොහේදි හරි ඒ හැඩය ඇති කෙනෙක් හමු වුණොත් "ආ! මෙන්න අර හොයපු මිනිහා" කියලා හඳුනා ගන්නවා. අන්න ඒ වගෙ යි මෙ තැන මේක සිද්ධ වෙන්නේ.

මේ විධියට යි පිළිපදින්ට ඕන. මේ විධියට යි කතා කරන්ට ඕන ආදි වශයෙන් එනව නම් අදහසක්, ඒ එන්නේ අර සටහන් ටික නිසයි. දැනගත්ත ටික විතර යි එන්නේ. ඉන් එහා මොකුත් එන්නේ නැහැ. ඉන් එහා තවත් දේ තිබෙන්ට පුළුවන් කරන්ට. නමුත්, සටහන් කරලා තිබෙන්නේ දැනට එ පමණ යි. ඒ සටහන් මතක් වෙනවා. මේ නිමිත්තට සිත යොමු වෙලා එයට බහිනවා. බැස්සහම වෙන්නේ මේක යි. මේවා ඉතින් දිගින් දිගට යනවා.

මේවා ඔක්කොම කතා කරන්නේ කවු ද? තමා ළඟ ඇති සටහන්වලින් අරකත් එක්ක හැසිරෙන පිළිවෙල යි. එහෙනම් දැන් පුළුවන් ද ඕකෙන් මග හැරෙන්ට? කවදාවත් ම බැහැ. එයාට ඒකෙන් මඟ අරින්ට බැහැ. අන්න ඒ විධියට යම්කිසි පුද්ගලයෙකු හැසිරෙන තත්ත්වයට වැටෙනවා නම් එයාව හඳුන්වනවා "භික්ඛු" කියලා. එයා සිවුරු පොරවලා නැහැ. භික්ෂු හැඩය අරගෙන නැහැ. "භික්ඛු" කීවේ ගවේෂණයක යෙදෙන එක්කෙනා නිසයි. ගවේෂණය මොකක් ද? හැම දෙනා ම ගවේෂණයක යෙදෙනවා, ජීවිතය සැපයට පත් කරන්නේ කොහොම ද කියලා. ඒ හොයන එකේ හරි දේ හොයන එක්කෙනයි භික්ෂු ශබ්දයට ගැණෙන්නේ. බොහොම අසාර යි අපි පරිහරණය කළ විධිය. තියෙන්ට ඕන හොඳ ක්‍රමයක්. තවම මට ඒක ලැබුණේ නැහැ. තියෙන්ට ඕන නො වරදින ක්‍රමයක්. මේ එකක් වත් හරියන්නේ නැහැ කියලා මේ ලෝකයේ තිබෙන දේවල් සමඟ සිත සම්බන්ධ නො කර ඒවායේ අසාරත්වය දැකලා යම්කිසි කෙනෙක් අර පැත්තට රිංගන්ට හදනවා නම් එයාට ම එයා "භික්ඛු" වෙනවා. භික්ඛු කියන එක මේ ඇඳුම් කට්ටලයට අයිති එකත් නො වෙයි. මේ සැපය ගවේෂණය කරන එක්කෙනා මුණ ගැසුණු විට බුදු හාමුදුරුවෝ ඇමතුවේ **''ඒහි භික්ඛු!''** කියල යි. (එන්ට භික්ෂුව කියල යි.) ඒක යි ඒහි භික්ඛු භාවය. ඊට පසු ව සිවුරු පොරවන්ට සිවුරු හොයාගෙන එන්ට ඕන. ගවේෂණය හරි කියන එක යි බුදු හාමුදුරුවෝ ඒහි භික්ඛු යන්නෙන් පෙන්වා වදාළේ. භික්ෂු කමේ ඇඳුම් කට්ටලයෙන් පෙන්වන්නේ මොකක් ද? මේක යි මේ කරන්නේ කියලා අනික් අයටත් ප්‍රයෝජනයක් ගන්ට හෙම ඕන නම් එතෙන්ට යන්ට ඕන. ඒකට යි ඇඳුම් කට්ටලය ප්‍රයෝජනවත් වෙන්නේ. ඒ ඇඳුම් කට්ටලය ඇඳගෙන සිටින උත්තමයන් ළඟට යි යමක් දැනගන්ට යන්නේ.

භික්ෂුවක් වීමට - ගවේෂකයෙකු වීමට - තිබිය යුතු ධර්ම මොනවාදැ යි අප වටහාගත යුතු යි. මූලිකව ම අත්හැරීම තියෙන්ට ඕන. අයිතිකර ගන්ට දෙයක් නැති නිසයි අත්හරින්ට ඕන. ඉඩම්, ගෙවල් අත්හැරියා. අඹු-දරුවන් අත්හැරියා. මේවා අත්හැරිය පුද්ගලයා මොන ඇඳුමකින් පෙනී සිටියත් එයා භික්ෂුවක් - ගවේෂකයෙක්. නිකම් හිතුණට කල්පනා කරලා භික්ෂුවක් බවට හෝ භික්ෂුත්වයට හෝ පත් වෙන්ට බැහැ. ඒක

ක්‍රියාවෙන් කෙරෙන්ට ඕන. ක්‍රියාවෙන් කෙරෙන බව තමන්ට පෙනෙන්ට ඕන. තමන් ඔක්කොම අත්හැරලා බව පේන්ට ඕන. සිත ඇතුළේ තිබෙන අයිතිවාසිකම් අත්හැරල නම් ඉන්නේ, බුදු හාමුදුරුවන්ට පෙනෙනවා එයා භික්ෂුවක් බව. එවිට යි "භික්ෂුව, එන්ට!" කියලා අමතන්නේ.

**උපතිස්ස පරිබ්‍රාජකයා** මහා ධනස්කන්ධයක් තිබුණ කෙනෙක්. ඔක්කොම අත්හැරලා සුදු රෙද්දක් ඇඳගෙන පාරක් ගානේ හරි දේ සොයා ඇවිදිනවා. ඒවා වැඩක් නැහැ. හරි දේ හොයන්ට ඕනෙ යි කියල යි එයා පාරට බැස්සේ. බුදු හාමුදුරුවෝ එයාව දැක්කා. එයා භික්ෂුවක්. නැත්නම් සියල්ලන්ට ම දෙන්ට පුළුවන් නේ ඒහි භික්ෂු භාවය ? භික්ෂු කියලා කතා කළේ කාට ද? නියම ගවේෂකයෙකුට යි. ඒ තැනැත්තාට මේ ක්‍රියාව හරි යන බව පෙනෙනවා. ඒ නිසා "භික්ෂු" කියලා කතා කළා. ඊට පසු ව සිවුරු කොහෙන් හරි ලැබෙන්ට ඇති. නැති ව උඩින් සිවුරු පාත්‍රා එන්නේ නැහැ. ඇඳුම් ගැලවිලා සිවුරු ඇන්දෙන්නේ නැහැ. ඒවා හරියන වැඩ නො වෙයි. ඕවා ඔහොම කියන නිසයි බුද්ධාගමේ තිබෙන වටිනා ධර්මය වටිනා කමක් නැති තත්ත්වයට වැටුණේ. ඒහි භික්ෂු භාවය කියන්නේ බුදු හාමුදුරුවෝ මනස දැකලා - ඒකේ සර්ව සම්පූර්ණත්වය දැකලා - උන් වහන්සේ තේරුම් ගත්තා එයා නියම භික්ෂුවක් බව. නියම ගවේෂණයට වැටිලා තේරිලා තිබෙනවා පරිහරණය කරපු ඒවා හොඳ නැති බව. හුදකලා ජීවිතයට වැටිලා සොයමින් ඉන්න කෙනෙක්. ඒ නිසා, "ඔබ නියම ගවේෂකයෙක්. මෙන්න ඔබ සොයන දෙය" කියලා, උන් වහන්සේ පෙන්නුවා. **යස කුල පුත්‍රයාට** වුණෙත් ඒකම යි. බුදු හාමුදුරුවන්ගේ නැදෑ වෙන අනුරුද්ධ කුමාරයෝ මහණ වුණා. දේවදත්ත මහණ වුණා. කෝ ඒ අයට ඒ වාසි? "එව, මහණ!" (ඒහි භික්ඛු) කියල කතා කළේ නැහැ. මානසික දර්ශන එක්ක යි උන්වහන්සේ කතා කළේ.

හරි දෙය වැටුණු දාට වැරදි දේ අයින් වෙනවා. **යෝපි සෝ භික්ඛවේ භික්ඛු සෙඛෝ,** යම් කෙනෙක් ද ශික්ෂණයට පටන් ගත්තේ ශික්ෂණයකින් අර අසාරවත් දෙය ජීවිතයෙන් අතහැර හැර යම්කිසි කෙනෙක් හරි දේ ලැබෙන තුරු එයාගේ පැවතුම් සංවිධානය කෙරුවා නම් අන්න ඒ ජීවිතයට යි සේඛ කියන්නේ. භික්මෙන ජීවිතයට අත්තිවාරම් දාපු දවස. ඒ අයට යම්කිසි දවසක ඒ

නියම ක්‍රමය වැටුණු විට එදා සිට එයාගේ ජීවිතයෙන් ඒ දෙය පරිහරණය කරනවා නම්, පරිහරණය වෙනවා නම්, ඒ පරිහරණය වෙන කාල සීමාවේදී එයාව හඳුන්වන්නේ "සේඛ" කියල යි. හික්මීමෙන්, ශික්ෂාවෙන් ඉන්න කෙනාට යි සේඛ කියන්නේ. එක් එක් කෙනා කියන විදියට හික්මෙන පුද්ගලයා නො වෙයි. තමන්ගේ ජීවිතය දුකින් මුදවා ගැනීමට තමා විසින් පිළිපැදිය යුත්තේ කොයි ආකාරයෙන් ද, ඒ ආකාරයට පිළිපදින කෙනා "සේඛ" වෙනවා. මේ ලෝකේ මොන දේ ඉදිරිපත් කළත් ගවේෂකයා "හා! හොඳයි" ගාලා බදා ගන්නේ නැහැ. ඒවා එපා වෙලා. හිතෙන් අල්ලන්නේ නැහැ. හිතෙන් නාල්ලන තත්ත්වය නිසයි හික්ඛු කීවේ. කොයි තරම් ලෝක සම්මත ප්‍රියංකර දෙයක් දැක්කත් එයා ඒක දිහා බලා අහක බලා ගනීවි. ඒ මොක ද? ඒකෙන් මට වැඩක් නැහැ. මගේ මේ වැඩේ කරගන්ඩ ඒකෙන් උදව් දෙන්නේ නැහැ. පංචකාම සම්පත්තිය සම්පූර්ණයෙන් එපා වෙනවා. ඒකේ අසාරය පේන්ට ගන්නවා. මේකෙන් මිදෙන ක්‍රමයක් තියෙන්ට ඕන කියලා යම්කිසි කෙනෙකුගේ සිතට වැටුණොත් අන්න ඒ අවස්ථාව සේඛ යි. දුකෙන් බේරිලා නිවීමට පත් වීම සඳහා හික්මෙනවා. ඒ නිසා සේඛ යි. සියලු ධර්මයන්ගේ මුල් පිළිවෙල යි මෙ තැන දේශනා කරන්නේ. මේ ධර්මය සිතක හටගත්ත වෙලාව කොයි වෙලාව ද, සියලු දේ කෙරෙහි ආදීනව දැකලා, එයින් මිදිලා දුක් සහිත තත්ත්වයට පෙරළන්නා වූ ක්‍රමය හොයා ගෙන ඉගෙන ගෙන, පරිහරණය කරන්ට වැටෙන අවස්ථාව යි ඒ. **"අනුත්තරං යොගක්ඛේමං පත්ථයමානෝ විහරති"** කීවේ දැන් එල්ල කරගෙන ඉන්නේ අනුත්තර වූ අවසාන තත්ත්වයේ දුක් යෝග වීම ක්ෂය කිරීම යි. සිදු වෙන ආකාරය පවතින තත්ත්වයට පත් වුණු පුද්ගලයෙක් වෙනවා.

ඒ පුද්ගලයාගේ ජීවිතයට අර මුලින් කී තද ගතිය දැනෙනවා. යම්කිසි දෙයක් හේත්තු වෙන කොට ඒ හේත්තු වෙන ප්‍රමාණයේ හැටියට එයාට දැනෙනවා. යම්කිසි දෙයක් ඉන්ද්‍රියට හමු වෙලා හිත ඒකත් එක්ක සම්බන්ධ වෙන හැටි එයාට පේනවා. ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ සියල්ල ම එහෙම යි. ඒ තද වීමට ඉස්සර වෙලා කීවේ **"පඨවිං පඨවිතො සංජානාති"** කියල යි. සංජානාති කීවේ තද වෙන බව එයාට දැනෙනවා. නමුත්, දැන් මෙ තැන තිබෙන්නේ **"පඨවිං පඨවිතො අභිජානාති"** යි. සංජානාතිවල යි

අභිජානාතිවල යි ලොකු වෙනසක් තිබෙනවා. සංජානාතිවල තිබුණේ තදවීම නිසා උපදින වේදනාවට අනුව දැන් වැඩි යි, දැන් අඩු යි කියලා සංඥාව දැන ගැනීමක්. අභිජානාති කීවේ විශේෂයෙන් දැන ගන්නවා කියන එක යි. විශේෂයෙන් දැනගත්තා කියන්නේ ඉන්ද්‍රියයන් එක්ක හමු වෙන ඒ නිමිත්ත තමාගේ හිතට දැනෙනවා කියන, හිත පහළ වීම දක්වා සිදු වෙන සිද්ධිය බව මෙයා දන්නවා. අභිජානාති කියන්නේ සුල මුල ඔක්කොම දන්නා කමට යි. මේ අනුව, මේ දැනීම පහළ වුණේ කොහොම ද? මම දන්නවා ද නැතුව ශක්තිය විසින් දන්නවා ද ? මම කීවේ කාට ද? ශක්ති ගොඩකට නේ ද? ඒවා උපදින - උපදින ශක්ති නො කඩවා පවතින නිසා ඒකට නමක් දැම්මා "මම" කියලා. වෙන කියන්ට දන්නේ නැහැ. පෘථග්ජන යි. සුතවා කියන තත්ත්වයට ආ විට අර කී විස්තර, පංචස්කන්ධ විස්තර, කර්ම විභාගය මේ කියන සියල්ල ම ඔළුවේ දාගෙන. සම්පූර්ණයෙන් එන්ජිමක් සවි කරන හැටි ඔක්කොම ඉගෙන ගත්ත පුද්ගලයා වගෙ යි. අභවල් ඇණය අභවල් අංකය ඇති මුරිච්චියට. ඒ ඇණේට අභවල් අංකය ඇති මුරිච්චිය යි දාන්නේ. ඒ ඉගෙනීම වගේ මෙයා සම්පූර්ණ දැනීමක් ලබනවා. විකෘතියට යෝග වෙලා තිබුණු ජීවිතයක් ප්‍රකෘති ස්වරූපයට, සකස් විය යුතු ක්‍රමයට, සකස් කරන්ට මෙයා ඉගෙනීම ලබා තිබෙනවා. අල්ලන්නේ ඔය විදියට. අල්ලන්නේ මොකක් ද? පඨවිය. මොකෙන් ද සසරට ඇතුල් වුණේ? පඨවිය මුල් වෙලා. දැන් ගලවන්ට හදන්නේ මොකක් මුල් කරගෙන ද? පඨවිය මුල් කරගෙන. පටන් ගත්ත තැනින් ගලවන්ට ඕන.

අභිධර්ම කියන්නේ තමා කලින් නො දැන ගත්ත නො දැන හිටපු ධර්ම විශේෂයෙන් එයාට දැනෙනවා නම් එය යි අභිධර්මය. මේවා අපි දන්නේ නැහැ. මේවා විශේෂ ධර්ම කොටස්. ඒක අස්සෙලු සියලු රහස් තියෙන්නේ. ඒ රහස් ටික දැනගන්නා තුරු මේක බලන්ට බැහැ. ඒ නිසා සියලු රහස්, ගුප්ත ධර්ම ටික, දැනගන්ට ඕන. ඒ ගුප්ත ධර්ම යි මේ සේඛ පුද්ගලයා දැන ගත්තේ. මේ දකිනව යි කියන්නේ කුමක් ද? මම දකිනවා නො වෙයි. අහැට වැටුණු මේ නිමිත්ත උපකාරයෙන් ඇහැ රූප්පණය වුණා. රූප්පණය වෙලා එතෙක් නිපදවපු තේජස් යම්කිසි ප්‍රමාණයක් එහි තියෙනවා. ඒ ප්‍රමාණයට අනුව සකස් වූ කාන්දම් බලය හදවතේ තිබෙන කාන්දම සමඟ සම්බන්ධ වුණා. සම්බන්ධ

වීම නිසා ඒ හදවතේ තියෙන අණුවල ඒවා රූප්පණය කරලා ඒවායේ ඇති තේජස් නිකුත් කරනවා. ඒ තේජසට යි හිත යි කියන්නේ.

අර නිමිත්ත පිළිබඳ ඒ ශාස්ත්‍රීය විග්‍රහය නො කර එයා බැලුවා නම් කවුද දන්නෑ, කොහෙ ද දන්නෑ, කාගේ ද දන්නේ නැහැ යනාදි වශයෙන් විපරමක යෙදෙනවා. දැන් මෙයා නියම ශාස්ත්‍රය දන්න නිසා නිමිත්ත මුණ ගැසුණු හැටියේ බලන්නේ ඒක ගැන නො වෙයි. මෙහෙම චිත්ත ස්වරූපයක් හැදුණේ කොහොම ද කියල යි. මෙයා අභ්‍යන්තරය යි බලන්නේ. අභ්‍යන්තරය බැලීමට බාහිරය උපකාර වුණා. මම ද බැලුවේ?එයා පෙන්නුව ද? නිමිත්ත විසින් මේ ඡායාව එවීම නිසා ඒක රූප්පණය වුණා. ඒකට බැහැ රූප්පණය නො වී ඉන්ට. ඒක යි අනාත්ම යි කියන්නේ. මෙය බලන අදහසින් නො වෙයි සිටියේ. ඡායාව වැටුණා. රූප්පණය වෙන අණු (රූප කලාප) තිබුණු නිසා රූප්පණය වුණා. ඒක කවුද බැලුවේ? කවුරුත් බැලුවේ නැහැ. ඒක සිදු වුණු විට, තේජස හදවතට ගිය විට, මුළු සිරුරට ම පතුරුවලා ඒක මේ වස්තුවට ඔරොත්තු නො දෙන මට්ටමට ආවාම අපි කියනවා දකිනවා නැත්නම් දන්නවා කියලා. නො දන්න කමට, විශේෂයෙන් දැනීමක් නො තිබුණ නිසා, "මම" යන පිළිගැනීම සිතේ ධාරණය වෙලා. ජීවිතය දුකෙන් බේරා ගැනීමට, කරදරයෙන් බේරා ගැනීමට, කාටත් අවශ්‍ය යි. ඒක සතාටත් අවශ්‍ය යි. සතාත් ජීවිතය දුකෙන් බේරා ගැනීම සඳහා යි දුවන්නේ. හැම තැන ම දුවනවා ක්‍රමය දන්නේ නැති නිසා. අපිත් සත්තු වගේ කරන්නේ දඟලන එක විතර යි.

# 12

ඉතා ම පුංචි මට්ටමේ ඉඳලා මිනිස් මට්ටම දක්වා ධර්ම එකතු වෙල යි මේ මිනිස් මට්ටම හැදිලා තියෙන්නේ. ඒ ඒ සත්‍වයාගේ ස්වරූපයට අවශ්‍ය ධර්ම එයා ගාව තියෙනවා. ඊට වඩා යමක් එක්කාසු වුණු හැටියේ ඒ සත්‍වයා නො වෙන සතෙක් හැදෙනවා. ඔය විධියට ධර්ම අලුතෙන් එක්කාසු වෙවී, එක්කාසු කරන්ට පුළුවන් අවසාන ධර්ම ගොනුවේදී යි මිනිස් කම හැදුණේ. ඒකට කීවා "මනුස්ස" කියලා. හැම ධර්ම ගොනුවක ම ස්වරූපය මේ ජීවිතය තුළ තියෙන නිසා, ඔහු සියලු ම්ම්වල අයිතිකාරයා ය කීවා. ඒක යි මනුස්ස කීවේ.

පඨවි, ආපෝ, තේජෝ වායෝ යන මේ හතර ගත්තොත් ඒ හතර පිළිබඳ ව අභිජානනය කරන්නේ කොහොම ද? යමක් එක්ක තමාගේ සිත සම්බන්ධ වෙන විට, ඒ සම්බන්ධ වෙන වෙලාවේ යම්කිසි ප්‍රමාණයක සම්බන්ධයක් එයාට දැනෙනවා. ප්‍රයෝජන වැඩි එකට බැඳෙනවා වැඩි යි. ප්‍රයෝජනය අඩු වෙන්ට වෙන්ට බැඳීම අඩු යි. හිතවත් අහිතවත් පැත්තෙනුත් එහෙම යි. එ විට මේ පුද්ගලයාට දැනෙනවා මෙකට වැඩියෙන් සම්බන්ධ වුණේ කුමක් නිසා ද කියලා. ඒකට තිබෙන නිදහස සම්බන්ධකමට හේතු වුණා. ආණ්ඩුවේ මුරකාවල් තිබෙන වත්තක අඹ ගහේ අඹ තිබුණාට ඒක දකින පුද්ගලයාට අඹ කෙරෙහි සමබන්ධතාවය, බැඳීම වැඩි වෙන්නේ නැහැ. මුරකාවල් තිබෙන නිසා අඹ කඩාගන්ට තිබෙන නිදහස අඩු බව දන්නවා. ඒ නිසා, බැඳෙන්නේ නැහැ. ආපෝ ගතිය නැහැ යි කීවේ ඒක ලබන්ට තිබෙන නිදහස නැහැ කියන එක යි. බැඳීම අඩු වෙන්ට - වෙන්ට ඒ පිළිබඳ සිතෙන් උපදවන රත්වීම අඩු වෙනවා. එයින් උපදවන වින්දනය අඩු යි. වින්දනය අඩු වූ තරමට "වායෝ" අඩු වෙනවා.

බැඳෙන ගතිය වැඩි වෙන්ට වැඩිවෙන්ට කාරණය ඉටු කරගන්ට වුවමනා කරන සකස් වීම සිදු වෙනවා. කාමය වැඩි වෙනවා.

ආණ්ඩුවේ වත්තේ මුරකාවල් යටතේ තිබෙන නිසා එයාගේ ආපෝ ගතිය වැඩ කළේ නැහැ. ඒකට කම්පනය වුණේ නැහැ. එතකොට සෙලවෙනවා අඩු යි. වැට කඩොලු නැති නිරවුල් වත්තක නිදහසක් ඇති ව තිබෙනවා නම්, කලින් වත්තට නො තිබුණු පඨවියක් හට ගන්නවා. ඒ නිසා, නො කා ම බැරි වෙනවා. ඇතුළත සියල්ල කම්පනය කරන නිසයි සියල්ල ම වුණේ. දුකෙන් තොර වූ තත්ත්වයට පත් වීමේ සුදුසු කම් ලබන තැනැත්තා අභිජානනයට පත් වෙනවා. විශේෂ දැනීම පරිහරණය කරන විට එයාට සිදු වෙනවා එයාගේ සිතෙන් නිෂ්පාදනය වෙන්නාවූ හැඟීම, රත්වීම කම්පනය කරන මට්ටමට ආවේ මොන හේතුව නිසා ද කියල බලන්ට. ඒ හේතුව උඩ මේක ස්පර්ශ කරන්ට මට මේ තරම් නිදහස තිබුණා. ඒ නිසා, ඒක තදින් ස්පර්ශ කරමින් රත්කර ගැනීම වැඩි කර ගත්තා. ඒ නිසයි කම්පනය වෙලා, කාමය අධික වෙලා, මේ සියලු ම පීඩා ඇති වුණේ කියලා දැනගත්ත පුද්ගලයා බැඳීමට තිබෙන ආපෝ ගතිය නැත්නම් නිදහස අඩු කරනවා. ඒක ක්‍රියාත්මක වීම **අභිජානනය** යි. හේතුව නැති කළ හැටියේ ඒ අවස්ථාවෙ ම එයාගේ පීඩන ස්වරූපය නැති වෙනවා. තාවකාලික සැනසිල්ලෙන් සදා කාලික සැපයට පත් කිරීමට අධ්‍යාපනයක් දෙන, හුරුවක් දෙන අවස්ථාව යි මේ කතා කරන්නේ. අපට ඕන වෙලා තිබෙන්නේ ඕක යි.

ලෝක ධාතුවේ පුද්ගලයෙක් විඳින දුක - ඒ මානසික පීඩනය අස් කරන්ට මේ ලෝක ධාතුවේ කිසි කෙනෙකුට බැහැ. එයා විසින් ම අස් කළ යුතු යි. ඇයි එයාට ඒක ලැබෙන්නේ ? එයාගේ වරදිනුයි. එයා නම් ඒක ඇති කරගත්තේ එයා ම ඒක ඉවත් කර ගත යුතු යි. ඒකේ ශාස්ත්‍රය ඉගෙන ගත යුතු යි. පරිහරණය කළ යුතු යි. ප්‍රතිඵල දෙස බලා හරි වැරදි තීරණය කළ යුතු යි. ඒ තත්ත්වයට හැඩගැසුණු පුද්ගලයාගෙන් ඉටු විය යුතු කොටස් ටික ඒක යි. දැන් අපට ජීවිතයේ හමු වෙන නා නා අවස්ථාවලදී ඔය ක්‍රමය යටතේ දුක් විඳින්නේ කුමක් නිසා ද? මේ දුක් විඳීමේ අයිතිකාරයෙක්, හිමි කාරයෙක් හොයන්ට බැහැ. පෙරළෙන - පෙරළෙන හැටියට දුක හීන, මධ්‍යම, රෞද්‍ර වශයෙන් ඒක ඇතුළේ තිබෙන ක්‍රියා ස්වරූපයේ වූ ඵලයක් මිස අයිතිකාරයෙක් නැති බව නිගමනය කරන්ට වෙනවා. සිත ඇතුළෙන් එකී නිගමනය එනවා. ඒක ක්‍රියාවක වරදක් මිස, සිදු වීමක වරදක් මිස,

අයිතිකාරයෙක් වත් වගකිව යුත්තෙක් වත් නැහැ. ඒ සිදු වෙන තැනම යි මේ පීඩනය තිබෙන්නේ. සුවය තිබෙන්නෙත් හිතේම යි. හිත හොඳ පැත්තට පෙරළෙන විට සුව යි. නරක පැත්තට පෙරළෙන විට පීඩා යි. පීඩාව හෝ සුවය ලැබෙන්නේ හිතට යි. හිත කියල ගත්තහම යම්කිසි කෙනෙක් කියයි ඒක මගේ සිත කියලා. නමුත්, කිසි ම කෙනෙකුට මගේ හිත යි කියන්ට හිතක් නැහැ. හිත පහළ වුණාට පසුව යි අපි හිතෙ යි කියන්නේ. හිත පහළ කරලා දුන්නේ තමන් නො වෙයි. ඒක නිසා අපට අයිතිවාසිකමක් කියන්ට බැහැ. කොයි එකේ අයිතිවාසිකමත් ඔහොම යි.

අපි දැන් මේ ලෝකයේ ධර්ම ශක්තියකින්, කර්ම බලයකින් මනුෂ්‍යයෙක් වෙලා උපන්නා. මව් කුසක උපදින කොටත් අපි දන්නේ නැහැ මේ මොක ද වුණේ කියල. බිහි වෙලා ඇහැ ඇරලා බලන විට වැඩියෙන් ළඟ හිටිය කෙනෙක් හිටියා. ඒ ළඟ හිටිය එක්කෙනා කියා දුන්නා "අම්මා" කියලා. එයාට අම්මා කිව්වා. එයා දන්නේ නැහැ. ඊළඟට ආවා අම්ම යි කියන කතාව. අපේ අම්මා වුණේ කවදා ද? ඉපදිලා, දැකලා, කවුදෝ කීවට පස්සේ අම්මා වුණා. එතකල් අපේ අම්මා කෙනෙක් නැහැ. එහෙම වෙලාවක නො කියා හිටියා නම්, අම්මා කියන ශබ්දය නො දුන්නා නම්, ලොකු වෙන කොට අම්මාව පෙන්නලා මේ කවුද කියල ඇහුවොත් කියයි ගෑණියෙක් කියලා. අපේ අම්මා මට ලැබුණේ කොහෙන් ද? ඇඳුනුවට පස්සේ ලැබුණා. එතකල් දන්නේ නෑ. අම්මට සම්පූර්ණයෙන් හිමිකාර කම ඒ නීතිය යටතේ නැහැ. නමුත් උපන්නට පස්සේ අර කී සුහද සම්බන්ධතාවය යටතේ ශක්තිමත් අම්මෙක් ගොඩනැගුණා.

අන්න ඒ වගේ, තමන්ගේ සිත යම් ස්වරූපයක් ද ඉදිරිපත් කරන්නේ ඒ ස්වරූපය දෙස බලා මගේ සිත යි කියනවා. නමුත්, ඒ ස්වරූපය එන්ට ඉස්සර වෙලා මතුවෙන්නේ අර සිත පහළ වීමට කරන කෘත්‍යයන්ගේ උපකාරය යි. ඒ කෘත්‍යයන් කෙරෙන කොට අපි දන්නේ නැහැ කොහොම ද ඒක වුණේ කියලා. උපන්නට පස්සේ අල්ලගත්තා ඒක මගේ කියලා. අන්න ඒ නීතිය, ස්වභාවය, ඒ න්‍යායය මුලින් ම දැන ගත් එක යි අභිජානනය. විශේෂයෙන් දැනගත්තා යනු යි. එ තැනදී එයාට වෙන්නේ කුමක් ද? එයාට වෙනවා එයාගේ අදහස් අයින් කරගන්ට. අර "මම යි,

මගෙ යි" කියා වෙන් කරගත් අයිතිය හිතෙන් අයින් වෙනවා. එයාට ම දැනෙනවා මම මේක ට අයිතිකම් කියන්ට මම ඒකට කළ දෙයක් නැති බව. එ විට එයා "මම" කියන්නේ හැඳින්වීමට පමණ යි. ඒකෙන් මට කියල අයිතියක් මොන ම නීතියක් යටතේ වත් නැහැ. ඒක උපද්දවල තියෙන්නේ වෙන ක්‍රමයකින් නිසයි. ඒක සිදු වූ දෙයක්. අන්න ඒකට කියනවා ධර්ම ස්වභාවය කියලා. ඒ ධර්මයන්ගේ ක්‍රියාකාරීත්වය විසින් මේ ධර්ම ස්වරූපය මතු කරනවා. ධර්ම ස්වභාවය නම් ඇයි මට පීඩා යි කියලා කතා කරන්නේ ? පීඩා යි නො කියා ඉන්ඩ බැරි ඇයි? වස්තුව ඇතුළේ වේගය රත්වෙන්ට-රත්වෙන්ට මේ වස්තුවට හුමාලය වදිනවා. ඒ අයිතිවාසිකම ඒ වස්තුවට ලැබෙනවා. කේතලයට වතුර දාලා රත් කළ විට කේතලේ රත්වෙලා හෙල්ලෙනවා. වරද රත්වීම යි. කේතලේට වතුර දාන්ට ඉඩ නො දුන්නා නම් ඒකට ලිප උඩ ඉඳ ගෙන හෙල්ලෙන්ට වෙන්නේ නැහැ. ඒක රත් කරන්නේ නැහැ.

නාගසේන හාමුදුරුවන් මිලිඳු රජුට දුන් පිළිතුර මෙ තැනදී දෙන්ට වෙනවා. රජ තුමා හාමුදුරුවන්ට කීවා මම ආවේ කරත්තෙන් කියලා. එ විට හාමුදුරුවෝ කරත්තේ හැම තැන ම අල්ල - අල්ලා මේක කරත්තෙ ද කියල අහනවා. නෑ! නෑ! ඒකට කියන්නේ බොස් ගෙඩිය. මේකට අඹරාව. ඔය රජ තුමා ආපු මොකට ද කරත්තේ කීවේ? රජ්ජුරුවෝ උත්තර දෙනවා ඔය ඔක්කොම එක්කාසු වුණු විට තල්ලු කරන් යන්ට පුළුවන් තත්ත්වය ආවම අපි ඒකට කියනවා කරත්තය කියලා. කරත්තය කියන්නේ ගොඩක් එක්කාසු වෙලා හැදුණු එකක්. ඒ නීතිය මෙතෙන්ට ගැනෙනවා. "මම" කිව්වේ කවු ද? අයිනක ඉඳන් නැති ඔප්පු ලියලා. හොර ඔප්පුවක් ලියාගෙන.

**"මාමඤ්ඤති"** කියලා තව වචනයක් යොදලා තියෙනවා. මාමඤ්ඤි කියන්නේ මොකක් ද? එයා පරීක්ෂණයක් පවත්වනවා. මොකක් ද පවත්වන පරීක්ෂණය? එයා වීර්ය කරනවා. ඒක සිතට අයිති වැඩක්. මේක ගතට අයිති වැඩක්. ගත යි සිත යි දෙකේ තියෙන්නේ එකමුතු කමේ සම්බන්ධතාවයක්, ක්‍රියාකාරීත්වයක්. එතන අයිතිකරුවෙක්, එහෙම නැත්නම් තුන් වැන්නෙක්, ඔ තැනට අයිති නැහැ. තුන් වැන්නා සම්බන්ධ වී කළේ කුමක් ද? නැගිටින්නට හදන මිනිහා අතින් උස්සලා කෙනෙක් නැඟිට්ටවන්ට හැදුවා

වගේ. අරයට තනියෙම නැගිටින්නට ඉඩ දුන්නා නම් එයා වාරුව අල්ලලා පුළුවන් හැටියට නැගිටීවි. මෙයා අතින් අල්ලා උස්සන්ට ගිහිල්ලා ලෙස්සලා වැටෙනවා. අන්න ඒ වගේ වැඩක් තුන් වැන්නා ගෙන් වුණේ. තුන් වැන්නා නිසා දුක වැඩි වුණා. සිත, ගත දෙක කරන වැඩ එක්ක අර අයිතිකාරයෙක් රිංගපු හැටියේ, නො දන්නා, කරන්ට බැරි, පැහිච්ච කමක් කරන්ට ගිහිල්ලා තිබෙනවා. මොකක් ද පැහිච්ච කම? අරක නවත්වන්ට යනවා. කෝක ද නවත්වන්ට යන්නේ? ලැබුණු පීඩා අයිතිය. එ සේ නවත්වන්ට යාම නැගිටින්නට හදන මිනිහගේ අත උස්සලා වාරු නැති ව වැටෙන්නා වගේ වැඩක්. දුක වැඩි වෙන මට්ටමට එයාගේ ක්‍රියාකාරිත්වය වර්ධනය වෙලා. එයා දන්නේ නැහැ.

තමාගේ සිතට ආවා වූ පීඩා ස්වරූපය හෝ සැප ස්වරූපය හෝ සිදු වී ඇත්තේ කොහොම ද? අර වස්තුව සමඟ හෝ නිමිත්ත සමඟ සිත තදින් වැඩ කිරීම සිද්ධ වෙලා තියෙනවා. මෙ තැන කාම ධාතුව තියෙන නිසයි ඒ විධියට වැඩ කරන්නේ. කාම ධාතුව වැඩි වෙන විධියට මේවා ක්‍රියාත්මක කරලා තියෙනවා. ඒවාට කෙරෙන විධියට කෙරන්ට දීලා නැහැ. තවත් අලුත් සංයෝගයක් දාලා තියෙනවා. ඒ බව මෙයාට තේරුණු විට පෙනෙනවා ඒක ක්‍රියාවේ දෝසයක්. කාමයට අයිති එකක්. මේක කාමයට යටත් වූ ඉන්ද්‍රිය විසින් කරන වැඩක්. ඒ ඉන්ද්‍රියයේ තිබෙන ශක්තිය විසින් මේ විධියේ තේජස සහිත හිතක් පශළ කරනවා. ඒක ධර්ම කොටස් කීපයකට අයිති යි කියල. එතකොට මෙයා දන්නවා "දැන් මට ඔතන කරන්ට දෙයක් නෑ" කියලා. වෙච්ච දේ පිළිගන්ට විතර යි තිබෙන්නේ. ඕක යි අභිජානනයේ ප්‍රතිඵල. සිද්ධ වෙන්නේ මෙහෙම යි. ඒවා නැති වෙන තුරු මේවා නවත්වන්ට බැහැ. ඒ නිසා, ඒ සිදු වෙන එක මොකක් ද, ඒක පිළිගත යුතු යි. ඒක නවත්වන්ට ගිහින් වෙච්ච මෝඩකම කාමය වැඩි වීම පමණ යි. පිළිගන්නවා කියන්නේ මොකක් ද? දැන් ඔන්න කෙනෙකුගේ අකටයුත්තක් මම දැක්කා. ඒ අකටයුත්තට මට කේන්ති ගියා. මට ඕකට කේන්ති යි. "මට" කියන්නේ කෙටි විවරණයක්. ඔක සිද්ධ වුණේ විශේෂ කැලි එකතු වෙල යි. ඒ ගාණට සිත ආවා. ඒ සිත යි අර උහුලන්ට බැරි. කොහොම ද ඒක හැදෙන්නේ?

කලින් ඒ වගේ වැඩවලට විරෝධය පළ කරන කාමධාතුව ඒකත් එක්ක හප්පලා - හප්පලා තද සටහනක් තියෙනවා. ඒ වගේ සිද්ධියක් නැවත එන කොට උහුලන්ට බැරි සිතක් පහළ වෙනවා. ඒ වැඩේ නො වෙයි මිනිහට උහුලන්ට බැරි, ඒ වැඩය නිසා පහළ වූ සිත යි උහුලන්නට බැරි. ඒ සිත පහළ නො වුණා නම්, "අනේ අර මනුස්සයා මොනව ද මං දන්නේ නැහැ කරන්නේ? මොනව කරන්න ද?" කියලා කියයි. උහුලන්න බැරි සිත ආවම "මොනව ද ඕයි මේ කරන්නේ තමුසෙලා? බූරුවෝ වගේ වැඩ කරනවා" කියල කියන්ට පුළුවනි. බූරුවො යි බල්ලො යි දාගෙන මිනිහා කෑගහන්නේ මොක ද? මෙයාගේ හිතේ උපන් වේදනාව උහුලගන්ට බැරි ව. එයා වැරදි මතයක් අරගෙන තිබෙනවා. ඒක නිසයි උහුලන්ට බැරි. වුණු දේ බැලුවොත්, අභිජානනය කළොත්, ඒක වෙලා තියෙන්නේ එහෙම නො වෙයි. ඕවගේ ඒවා ඕන තරම් වෙනවා.

ඒ වගේ ඒවා වෙන කොට මගේ කෑලි ටිකක් තිබෙනවා. ඒවා හැප්පිලා ගින්නක් පත්තු වෙනවා. ඒ ගින්න උහුලන්ට බැරිව යි මම කෑ ගහන්නේ. නැති ව ඒ මිනිහා මොනවා කළත් මට කමක් නැහැ. බණින කොට, අකටයුතු කම් කරන කොට, වැරදි කරන කොට, ඔය කොයි කාටත් රත්වෙන්නේ රත්වෙන මට්ටමේ ඒවා හැදිලා තියෙන නිසයි. ඒ රත්වීම ඒවාට හිමි කරලා මම අයින් වූ හැටියේ ඒක වැඩ කළාට ඒකට උදව්වක් මම නො දෙන නිසා නිකම් ම බහිනවා. ඒක හමු වුණා. ගින්න මතු වුණා. නැවත හප්පන්නේ නැති නිසා රත්වීම බහිනවා. අකටයුත්ත ප්‍රශ්නයක් වෙලා නැහැ.

අපි කලක් තිස්සේ භූත කියන ක්‍රමය යටතේ හදලා තියෙනවා මීයෝ, කොටි, වලස්සු, පිඹුරෝ, අලි, පෙරේතයෝ, කුම්භාණ්ඩයෝ, ඔක්කොම හදලා තියෙනවා භූත ක්‍රමය යටතේ. කලක් තිස්සේ හදපුව යි අපි මේ විඳින්නේ. පඨවි, ආපෝ, තේජෝ, වායෝ විතරක් නො වෙයි. **"භූතෙ භූතතො අභිජානාති"** විය යුතු යි. ඒ සකස් වූ වැරදි දේවල් එනවා දකින කොට ම විශේෂයෙන් එයා දැනගන්ට ඕන. "මේ වුණේ මේක යි. ඒ තත්ත්වය හැදෙන දේවල් නො දැනුවත්ව ම මේක ඇතුළේ සංවිධානය වෙලා තියෙනවා. සංවිධානය වෙලා තියෙන ක්‍රියාකාරීත්වය විනා අර ක්‍රියා මේකට මොකුත් සම්බන්ධ නැහැ. ඒක නිසා මම අයින් වෙන්ට ඕන"

කියලා. අනික් ඒවායින්, නිමිතිවලින් අයින්කරන ක්‍රමය යි සිද්ධිය බැලීම. සිදු වුණේ මෙහෙම යි කියලා බලන කොට එ තැන "මම" පේන්නේ නැහැ. නැති "මම" නිකම් ම අයින් වෙලා. වෙන දේ බලන කොට මට එතන කිසි රාජකාරියක් නැහැ. ඒක "මම" ඇතත් නැතත් කෙරෙයි.

එහෙම දැනගන්න විට ඒක කෙරෙහි යොදන තද කිරීම නැති වෙනවා. අඩු වෙනවා. ඒ අඩු වෙන එකට "මාමකඞ්ක" කියලා කීවා. මගේ සම්බන්ධතාවයක් ඒකට නැති ව හඳුනා ගන්නවා. පුද්ගල සම්බන්ධතාවය අයින් වෙන්නේ ක්‍රියාකාරී ස්වරූපය ඒකේ වැඩ කරන හැටි බලන කොට. මම ගැන හිතන්ට වෙලාවක් නැහැ. දැන් මෙතනින් උලුප්පලා දෙන්නේ කුමක් ද? මේ වස්තුව ලෝකයේ වස්තුවක්. ලෝකයේ නිර්මාණය වූ වස්තුවක්. ඒ වස්තුව තුළ මේ කෘත්‍ය ස්වරූප හටගෙන තියෙනවා. ඒ බව නො දැන මම කියන අතිරේක පදයක් යටතේ මේක පාලනය කරන්ට ගිහිල්ලා මේවා ඔක්කොම ජොහොර වෙලා ගිහින්. අන්න ඒ ලෝකයේ වස්තු ලෝකයට බාරදෙන අවස්ථාව. ලෝකයට බාර දෙනවා කියන්නේ "ඔන්න ඕක අරං පලයං" කියන එක නො වෙයි. ලෝකයේ සිද්ධි කියන්නේ එක එක වෙනස් වීම්. ලෝක කියන්නේ තිබුණු තත්ත්වය අන්‍ය තත්ත්වයකට පෙරළීම යි. ඔය විධියට යි මේක සිද්ධ වෙන්නේ. ලාබෙකට තියෙන්නේ ඒක හදන්ට නො යාම යි. එන එන දේ පිළිගැනීම යි. ඒ ක්‍රමය යටතේ ඒවා වර්ධනය අඩු වෙනවා. ඒවා අනුගමනය කරන කොට වෙන්නේ කුමක් ද? යුක්ති ධර්මයක් ඉටු වෙලා තියෙනවා. මොකක් ද යුක්ති ධර්මය ? ලෝකයේ වස්තු ලෝකයේ දෙයක් හැටියට අපි පිළිගන්නවා. මමත්වය ඉවත් කරලා හිතන අවස්ථාව යි මාමකඞ්කය.

"මම" කියන විශේෂ අයිතිවාසිකම - සබඳකම කියන්ට ඉඩක් - නිදහසක් - කිසිවක් එන්නේ නැහැ. ඒක නිසා, එයාට කියා ගන්ට බැහැ කවුද කළේ කියලා. ඒ කරපු හේතු තියෙනවා. වෙන විධියකින් එය කෙරිලා තියෙන්නේ. මම කියන කෙනා කරපු වැඩේ කෝ? මොකුත් කරලා නැහැ. ඒක නිසා පොර අල්ලන්න එපා. ඒක ඒ වෙලාවට අයිති වැඩේ. ඒක නිසා ඒක පිළිගැනීම පමණ යි තියෙන්නේ. ඒක තමන්ට අයිති දෙයක් නො වෙයි. දැන් යම්කිසි කෙනකුගේ කකුලේ ගෙඩියක් ආවොත් ඒකට රටට යි සුළඟට යි දොස් කියලා බැහැ. කකුළ ඇතුළෙන් ඇවිත්

තියෙන්නේ. හොඳ වෙන කල් බෙහෙත් දමන එක යි තිබෙන්නේ. අන්න ඒ වගේ වැඩක් මේක. මේ හැම එකක් ම පිටින් එන ඒවා නො වේ. ඇතුළෙනුයි එන්නේ. පිටින් උදව් වෙනවා. උදව් කරගන්නවා. වරද වුණේ මෙ තැන යි. එ තැන ඉඳලා එයා ඒ ක්‍රියාව අස් කරනවා. ඒ ක්‍රියාව අස්කරන කොට ලෝකයේ දෙය ලෝකයට බාර දෙනවා. ලෝකයේ දෙය ලෝකයට බාරදෙන ක්‍රියාව යටතේ මේවා විග්‍රහ වෙන විට අප්‍රමාණ සිතුම් ස්වරූප ඔය විදියට විග්‍රහ කරන්ට සිදු වෙනවා. ඒ මොක ද? එකක් වත් විග්‍රහ නො වුණොත් ඒ විග්‍රහ නො වූ එක කවදා හරි පහළ වුණොත් ඒකෙන් කරච්චල් ඇති වෙනවා. ඒක නිසා හැම එකක් ම විග්‍රහ කර කර යවනවා. ඒක වුණේ මෙහෙම යි. මේක වුණේ මෙහෙම යි. ඔක්කොම වෙන්නේ මේ ක්‍රියා නිසා යි කියල දැන ගත්ත විට තමන්ගේ අමුතු බලපෑම අයින් වෙනවා. එ විට ඒක කරන තීරණ, තමාගේ ආරක්ෂාව, බැඳීම ආදි නොයෙක් වෙළු දාලා තියෙන ඒවායේ වෙළු බුරුල් වෙනවා. ඒ වෙළු බුරුල් වූ උත්තමයින්ගේ අවස්ථා ඉතිහාසගත ප්‍රවෘත්තිවල සඳහන් වෙලා තිබෙනවා.

එ වැනි ප්‍රවෘත්තියක් ක්‍ෂාන්තිවාදී ජාතකයේ තියෙනවා. රජු ඇවිත් වධකයා ලවා අත කපන්ට ලෑස්ති වුණා. ක්‍ෂාන්තිවාදී තාපස තුමා "මොකක් ද රජතුමනි කරන්ට හදන්නේ?" කියලා පැනලා දිව්වේ නැහැ. තාපසයා හිටියා අත කපන තුරු. අපට පුදුම හිතෙනවා. නමුත්, මොකක් ද මේ ශාස්ත්‍රය? මේ ක්‍රමය එයාගේ හිතෙන් පුහුණු කරපු කෙනාට ඒකේ විග්‍රහය පෙනෙනවා. මේ අවස්ථාවේ හැටියට මෙතන මගේ තිබුණු ක්‍රියාවෙන් එයාගේ හිත කුපිත වුණා. මේ ක්‍රියාව කරන්නේ කාට වත් නො වෙයි. මට නො වෙයි. වස්තුවට යි. ඒ වස්තුවට කරනවා කියන නිගමනය ඉතා තදින් තීරණගත ව සටහන් වෙලා තියෙනවා. ඒ නිසා, අත කපන කොට හිත වෙනස් කර නො ගෙන ඉන්ට පුළුවන් වුණා. අත සමග මෙයාගේ කිසි ම සම්බන්ධයක් නැහැ. අත පරිස්සම් කර ගන්න හෝ තියා ගන්න අදහසක් නැහැ. ඒවා අයින් කරලා දැම්මා. ලෝකයේ වස්තුවක්. ලෝකයේ වස්තුවලින් ඕක හැදිලා තියෙන්නේ. අත කැපිලා වෙන් වුණා. එහෙම වුණාට කමක් නැහැ. ඒක පිළිගත්තා. අපට නම් බැහැ.

නමුත්, අපත් කවදා හරි ඔය තැනට එනවා. මමායතනයෙන් බැඳුණු වෙළුම බුරුල් වුණු දාට යි අපටත් එහෙම හිතන්ට පුළුවන් වෙන්නේ. ඒක රකින්ට එයා පොර ඇල්ලුවේ නැහැ. ඒකට හේතුව කුමක් ද? ඒකත් ප්‍රශ්නයක්. "මේක රකින්ට පොර අල්ලන්ට ගියොත් මම නරක් වෙනවා විනා මම රැකෙන්නේ නැහැ. මෙන්න මේ ක්‍රමයට යි මාව රැකෙන්නේ. දුකින් බේරීමෙන් මම සමර්ථයා වෙනවා. නැත්නම් මම දුකට හසු වෙනවා. මේ අවස්ථාව ලෝකයේ කොතෙන්දී හරි කරන්ට වෙනවා" කියන තීරණය ගත්තේ බැඳී තිබුණු වෙළුම කඩල යි. අන්න එතන රාජකාරියක් තියෙනවා. හැම එකක් ම එයා විග්‍රහ කරනවා. මේ මොකක් ද? මේක යි. මෙහෙම වුණේ මොක ද? මේ හේතුව නිසයි. කේන්ති ගියේ නරහට. ද්වේෂය හිතේ තිබුණ නිසයි. ක්ෂාන්තිය ආවේ සැප සිත උහුලන්ට පුළුවන් ශක්තිය සිතේ තිබුණු නිසයි. ඔන්න ඕකට කියනවා විදර්ශනාව කියලා. විදර්ශනාව කීවේ විශේෂයෙන් පැහැදිලි ව පෙනෙන එකට. නිසි තැනට තමාගේ සිත පරිහරණය කරන්ට පුළුවන් තරම් විශේෂයෙන් පැහැදිලි ව පෙනෙන එක යි විදර්ශනාව. සිද්ධියේ සුල-මුල සියල්ල ම විශේෂයෙන් පැහැදිලි ව පෙනෙනවා. දැකීම්, ඇසීම්, ආඝ්‍රාණය කිරීම් හැම එකක ම සුල-මුල පෙනෙනවා. එයාට එයට වඩා ලොකු දෙයක් නැහැ. හැම ක්‍රියාවකදී ම සිත විග්‍රහ කරමින් අර නිගමනය දෙනවා. කෙනෙකුට හිතෙන්ට පුළුවන් හැම එකක් ම විග්‍රහ කරන්ට ඕන නම් එයාට නිවාඩු ලබා ගෙන ඔය වැඩේ කරන්ට වෙනවා නේ ද කියලා. නිවාඩු අරන් කරන්ට හිටියොත් වැඩේ හරියන්නේ නැහැ. අර වැඩ කරන වෙලාවෙම යි මේවා හදන්ට වෙන්නේ. නිවාඩු අරගෙන හදන්ට ගියත් වැඩට ගිය විට නරක් වෙනවා. හැම එකක ම මේක පටලවන්ට ඕන. ඒකට කියනවා "මාමසඥ" කියලා. ඒ විධියට කරගෙන එන කොට **අකාලිකෝ, ඒහිපස්සිකෝ, ඕපනයිකෝ, පච්චත්තං වේදිතබ්බ** ඕවා ඔක්කොම ඉස්සරහට එනවා.

මම මෙහෙම බලපු නිසයි මට මෙහෙම රිදුම ආවේ. හරි විධියට බලපු නිසයි රිදුම නැති වුණේ. ඒකේ රිදුම හෝ රිදුම නැති ප්‍රතිඵලය පෙනනවා. අකාලික යි. ඒක සිදු වෙන්ට අමුතු කාලයක් ගියේ නැහැ. එහෙම කරන කොට ම ඒ තීරණය ආවා. ඒකෙන් ලබන ප්‍රතිඵලය වූ තද දුක් විඳීම දැන් නැහැ. හේතු නැති

නිසයි. ඒක මම දැනෙන විධියට යි කළේ. "පච්චත්ත වෙදිතබ්බ විඤ්ඤූහි" යි.

තවත් දැනුණොත් තවත් කරනවා. ඒ ධර්මයේ ගුණ ඒ පුද්ගලයා ළඟ නිතර ම වැඩ කරනවා. "ධම්මං සරණං ගච්ඡාමි" කීවේ ප්‍රතිඵල භුක්ති විඳීමට යි. මොකක් ද? ඒකෙන් එයා සැනසිල්ලක් ලබනවා. සරණ යාම වුවමනා වුණේ සැනසෙන්ට යි. අන්න දැන් ඒ සරණය තියෙනවා. දැන් මේ විග්‍රහ කළේ දැන් දැන් ප්‍රයෝජන ගන්ට පුළුවන් දේශනාවකුයි.

# 13

අපගේ ජීවිතය තුළ ධර්ම සකස් වීම් ගැන යි මේ කතා කරන්නේ. ඒ සකස් වුණා වූ ධර්ම යි අපි පාවිච්චි කරන්නේ. ඒ ධර්ම පාවිච්චි කරනවා කියන කොට ඒ දැරීම් ස්වරූපවල මොනව ද තියෙන්නේ කියලා දැන ගන්නේ ඒ දැරීම් ස්වරූප වැඩ කරන තැනදී ඒ සියල්ල ම එක තැනකට එනවා. හරියට අර එන්ජිමක සෑම කෑල්ලක් ම වැඩ කරලා එක තැනකින් වේගය මතු කරනවා වගෙ යි. ඒකෙන් තමයි මුළු ඇන්ජිමට ම බලපෑම එන්නේ. ඒ වගේ අපේ ජීවිතය තුළත් සෑම තැනක ම තියෙන ධර්ම එක තැනකින් ඉස්සරහට දානවා. ඒ ඉස්සරහට දමන දැමිල්ලේදී උපදවන ඒ දැරීම්වලට අපි කියනවා හිතනවා කියල. ඒ හිතනවා කියන්නේ ජීවිතය තුළ ඇති දැරීම්වල ශක්තිය ඉස්සරහට දාන වෙලාව. වෙලාව කිව්වට ඒක නිතර ම කෙරනවා. ඒවායේදී අපේ හිතේ නා නා තරාතිරම්වල යම් යම් ස්වරූපවලට අයත් වින්දන ඇතිවෙලා නා නා හැඩ අපේ හිතේ ඇති වෙනවා - කේන්ති යනවා. කණගාටු වෙනවා. ආශා හිතෙනවා. මාන්නය එනවා. මේ එක තැනක තියෙන ධර්ම නො වෙයි. ඒ මුළු ජීවිතය ම පිරිවරාගෙන තිබෙන ධර්ම ගොනුවක එක්තරා සංයෝගයක්. ඒ හිතෙන් දෙන්නා වූ ඒ වේගය සංකීර්ණ ස්වරූපයක පවතින නිසා ඒ හිතේ ඒ වෙලාවට වැඩියෙන් තියෙන්නේ මොන ධර්ම ශක්තියක් ද ඒක යි ඉස්සරහට එන්නේ.

කෙනෙකුට කේන්ති ගියා කියමු. ඒ කේන්ති ගිය මිනිහාගේ ජීවිතය ඇතුළේ තිබුණා නම් අනුන්ට මෛත්‍රී කරන ශක්තිය, බිඳක් වත් තිබුණා නම්, අර කේන්තියට මෛත්‍රියත් මිශ්‍ර වෙනවා. කේන්ති ගියාට කේන්තියට තනියම වැඩ කරන්ට දෙන්නේ නැහැ. අර මෛත්‍රියේ සිසිල ඕනෑ ම අවස්ථාවකදී එනවා. කේන්ති වේගය මෛත්‍රියේ ගණනට අඩු වෙනවා. එවිට කේන්තියේ අඩු වුණු ප්‍රමාණය යි පරිහරණයට දෙන්නේ. කේන්තිය ආපු තරමට වැඩ කළා නම් ඒක කෙනෙකුගේ ජීවිතය නැති කරන මට්ටමේ

ශක්තියක්. මෛත්‍රියෙන් කිසියම් පසු බැමක් දෙන නිසා ගහලා විතරක් නිකම් ඉඳීවි. ඕකෙන් තෝර ගන්ට පුළුවනි රාග චේතනාව හෝ ද්වේෂ චේතනාව මුල් වුණාම ඒවායේ සංකීර්ණ ස්වභාවය නිසා නා නා පැතිවලට හරවන බව. එයා ළඟ තිබුණේ නැත්නම් අර විධියේ යහපතට හරවන යම්කිසි ධර්ම ශක්තියක්, හිතන හැම එකේදි ම එයා දැඩි ස්වරූපයක් පරිහරණය කරනවා. කෙනෙක් දිහා බැලුවත් බැලෙන්නේ දැඩි ස්වරූපයෙන්. ඒක මිනිසුන් අතර සම්පූර්ණ වෙලා නැහැ. තනි නරක ශක්තියක් වැඩ කරන්නේ නැහැ. සමහර වෙලාවට යම් ද්‍රව්‍ය වර්ගයකින්, බෙහෙත් වර්ගයකින්, අර යහපත් ශක්ති යට කරන්ට උපක්‍රම ශක්ති යොදා ගෙන තිබෙනවා. ඒ උපක්‍රම ශක්ති අයින් කර ගත්තොත් යහපත් පැත්තක් මිශ්‍ර වෙල යි සිත වැඩ කරන්නේ.

අල්ල ගන්නා ශක්තිය සමඟ කිසි සම්බන්ධතාවයක් නැති ව එයා, ඒ කියන්නේ රහත් වීමට කටයුතු කරන සේඛ පුද්ගලයා, ඒවා නාල්ලා පරිහරණය කරනවා. ඒ තැනැත්තා හික්මෙන පුද්ගලයෙක්. ඒක යි සේඛ යන වචනය පාවිච්චි කළේ. හික්මීමේ ස්වරූපයට බැස්ස පුද්ගලයාට පේනවා මා විසින් කළ යුතු හික්මීම මේක යි කියා. හිතට එන අදහස්වල, නැත්නම් ධර්මවල, තියෙනවා නා නා තරාතිරම්. ඒ හැම එකක ම ඉස්මතු වෙලා තියෙන්නේ ලෝභය හෝ ද්වේෂය යි. කොයි එකෙනුත් හදන්නේ ඔය ධර්ම දෙක යි. ඒ ධර්ම දෙක ආවා වගේ යන්ට හරිනවා. ඒවා සමඟ සම්බන්ධතාවයක්, විශේෂ යොමු වීමක් කරන්ට නරක යි. එහෙම සම්බන්ධතාවයක් පවත්වන්නේ නැති විට සිත දේව, ප්‍රජාපති යන මට්ටම්වලට දියුණු වෙමින් පවතිනවා. ඒ මට්ටමට දියුණු වේගෙන යන වෙලාවෙදී සිතට පොපියවන ගතියක් ආවත්, බොහොම සතුටුදායක ගතියක් ආවත්, එයා ඒක හොඳ යි කියා සිතින් පිළිගන්නේ නැහැ. මෙන්න මෙ තැන මෙහෙම ගතියක් තියෙනවා. එච්චර යි. නිවි - නිවී දාහය අඩු වෙවී යන කොටත් මේ සිත පිළිබඳ සේඛ පුද්ගලයා කල්පනාකාරී වෙනවා. ඒ අවස්ථාවෙදිත් එයා ඒක හොඳ යි නො කියන්ට වග බලා ගන්නවා. ඒක හොඳ යි නො කියන්නේ හොඳ නැති නිස යි. නැති ව ඔහොම නො කියා බේරෙන්ට බැහැ යි කියන එක නො වෙයි.

යම්කිසි නිතියක් යටතේ යි හොඳ යි නො කියන්නේ. ඒ හිතේ නිවීමක් තිබෙනවා කියලා දැන ගත්තේ හිත තියෙන නිසා යි. හිත තිබුණු නිසා යි නිවුණේ. හිතේ නිවීම හොඳ යි කීවොත් හිත හොඳ යි කියන එක යි එ තැන පැහැදිලි වෙන්නේ. හිත හොඳ යි කියන නරක විදියට හිතල තියෙන්නේ හිත යි. හිත නැත්නම් බැලීමත් ඇසීමත් මොකුත් නැහැ. වැඩ ගොඩවල් කිසිවක් නැහැ. හිත හොඳ යි කීවොත් හිතට ඇලිලා. ඒ නිසා, ඔය කියන එකක් වත් හොඳ නැහැ. හොඳ නැහැ යි කියන්නේ ඔය නිසයි. නැති ව හිත සමහ තරහ වෙලා නො වෙයි. ඔය හිත ඔය විධියට දියුණු වෙනවා. ඕවා බල-බලා ඉන්නවා විනා මට ඕකේ පොඩ්ඩක් වත් ඉන් එහා ඇහිලි ගහන්ට දෙයක් නැහැ යන තීරණය යටතේ ජීවත් වෙනවා.

**යො පි සො භික්ඛවෙ භික්ඛු අරහං ඛීණාසවො** - ඛීණාසව කිවේ දුක් විඳීම සඳහා යම් පැහිල්ලක් වේ නම්, එය ජීවිතය තුළ ක්‍රියාත්මක වේ නම්, ඒ පැහිල්ල නැති කරනවා. පීඩා දෙන්නේ මේ පැහිල්ල යි. ඒක ම වැඩ කර-කර ඒකේ ශක්තිය වර්ධනය කරන එකට කීවා පැහිල්ල කියලා. අපේ පැහෙන අවස්ථාව කුමක් ද? ඒකම යි ඔය කර්මය කියලා වෙන් කරලා ගත්තේ. කර්මය විපාක දෙන අවස්ථාවේ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ කළේ කුමක් ද? කර්ම විපාක දීමට ඒ පැහෙන එක නැවැත්තුවා. පිහලා දැම්මා. ඒ පැහීම වටහා ගැනීමට නිදසුනක් ගනිතොත් කෙනෙකුගේ අක්මාව නරක් වෙලා. අක්මාවක් නරක් වීමට සාමාන්‍යයෙන් බොහෝ දුරට බලපානවා මත්පැන් බීම. නමුත් එයා මත් පැන් කට හරියේ වත් තියලා නැති කෙනෙක්. එහෙනම් මේ ලෙඩේ හැදුණේ කොහොම ද? එයා හරියට කන්ට ආස යි කොච්චි මිරිස්. ඒකෙන් පෙනෙන්නේ කර්මය පැහෙන හැටි යි. තමන්ගේ හිතෙන් පෙන්වනවා. ඒ විධියේ දේවල් එක්ක තමාගේ සිත ඇදුම් දෙනවා. ඒ ඇදුම් දෙන්නේ මොක ද? ජීවිතය පීඩා දෙන ශක්තියට හරවන බලයක් මෙන්න මේකේ තියෙනවා - ඒ බලයට අනුකූල වෙලා ඒ බලය විසින් අදින්නා වූ දෙය ගත්තොත් කරන්නේ අර අක්මාව නරක් කළා වැනි දෙයක්. ඒක හිතට හොඳ වුණාට ඇඟට හොඳ නැහැ. ඇඟේ තියෙන කොටස් දුර්වල කරලා විකෘති කරනවා. විකෘති කළ හැටියේ එයා මරණයට බයෙන් පීඩා විඳිමින්, වේදනා විඳිමින්, ඉන්නවා.

එයා ළඟ තිබුණා ශක්තියක්. ඒ ශක්තියට යි කර්ම ඵලය කියන්නේ. ඒ ශක්තීන්ට නිමිති හමු වූ හැටියේ ඒ ශක්ති නිමිත්ත සමඟ ආකර්ෂණය වෙනවා. ආකර්ෂණය වුණු හැටියේ උහුලන්ට බැරි ව යනවා. ශක්තියේ තේජස බොහොම සැර යි. ඒ තේජස නවත්වා ගන්ට බැරි ව මිරිස් කාලා තේජස නවත්වනවා. ඒ තේජස නවත්වන්ට මිරිස් ගත්තට පස්සේ ඒක ඇඟ ඇතුළට ගිහිල්ලා අර අක්මාව නරක් කරන වැඩේ කරනවා. එතන ඉඳලා එයා විඳිනවා. කර්ම විපාක විඳිනවා කියන්නේ ඕකට යි. ඕන ම සිතුවිල්ලක් තුළ පැහිල්ලක් මතුවෙනවා. ඇතුළේ තිබෙන ශක්තිය රත්වෙන කොට ක්‍රියාත්මක වෙනවා. ක්‍රියාත්මක වෙන විට යි හුමාලය පිටට එන්නේ. හුමාලය කොයි පැත්තෙන් ආවත් හඳුවන යි ඒක දැන ගන්නා සුදුසු ස්ථානය. එ නිසා ඒ රිදුමෙන් බේරෙන්ට අරක කරන්ට වෙනවා. ක්ෂීණාශ්‍රව කීවේ කවු ද? ඒ ආසාව, ශක්තිය නැති කළ උත්තමයා. ඒ උත්තමයා සේබ වෙවී ආවා. පැහෙන්ට සිතුවිල්ලක් ආවා නම් ඒක පැහෙන්ට තිබෙන ඉඩ නැවැත්තුවා - හැදුණු එක පරිහරණයට නො ගැනීමෙන්. තවත් පැහෙන්ට හැදෙන ඒවා පැහෙන්නේ නැහැ.

කුඹුරේ සී සාලා වපුරන්නේ නැති ව හිටියොත් ඊට පස්සේ වී නැහැ. අපි දන්නේ ම නැති ව වපුරනවා. ඇට ටිකක් දමනවා. වපුරන්නේ නැති ව ඉන්ට යි ඕන. ක්ෂීණාශ්‍රවයන් වහන්සේ කළේ කුමක් ද? සිතට එන ඒවා මෙන්න එනවා, ඔන්න ආවා, අහවල් එක යි ඔය ආවේ කිය-කියා බලා ඉන්නවා. ඒවාට කිසි ම හෙල්ලිමක් නැති ව ඉන්නවා. කෙලෙස්වල නා නා තරාතිරම්වලට අයත් ඒවා තියෙනවා. ඒ නා නා තරාතිරම්වල කෙලෙස් එන්නේ අනතුරු හඟවන නළාවක් (සංඥාවක්) පිඹිනවා වගේ. ඔන්න දැන් එන්නේ ගොයියෝ අහවල් ජාතියේ කියලා එයාට එයාගේ හිතෙන් කියනවා. ඒක අනතුරු හඟවල යි එන්නේ. නිකම් එන්නේ නැහැ. කොයි තරම් අනතුරු නළා පිම්බත් බීරට මොකුත් ඇහෙන්නේ නැහැ නේ ? අනතුරු නළාව පිඹින තැනටත් ගිහින් මිනිහා කැගහනවා. ඒවගේ අපට මේ කෙලෙස් අනතුර පෙනෙන්නේ නැහැ. අපි අන්ධ යි. අපි අන්ධ වෙලා තිබෙන්නේ දැනීම නැති කමින්. ඕන දේ පෙනෙන්නේ නැහැ.

ජීවිතය ඇතුළේ නා නා පැහීම් එළියට එනවා. ඒ පැහීම්වල එක එක වගී තිබෙනවා. ඒ ඒ වගීවලින් ජීවත් වෙන්ටත් ඕන

නිසා ජීවිත නඩත්තු කරන්ට වෙනවා. ඒ වගේ යුතුකම් ඉටු කරන්ටත් වෙනවා. ඒ ඒ දේවල් එක්ක සම්බන්ධතාවයක් තිබෙන පුද්ගලයා ඔය පැහීම පාලනය කරන්නේ කෙසේ ද? ඒ පැහීමෙන් දෙන ඒවා කිසිවක් කරන්නේ නැහැ. පැහීමට අයිති නැති නිසි ක්‍රමයක් තියෙනවා නම් ඒ පැහෙන අස්සේ මෙයා මේක කරනවා. ඒ කොහොම ද කීවොත් මං දැක්කා දරුවෙක් තාත්තට කරදර කරනවා. තාත්තාගේ මුහුණෙන් තද තරහ ගතියක් පෙනෙනවා. එක පාරක් කම්මුලට ගැහැව්වා. කණෙන් ඇද්දා. තාත්තගෙන් තව මොනවදෝ ඉල්ලනවා. තාත්තා ඇතුළත් පිච්චි-පිච්චි "ඉන්ට පුතා, මම අරන් දෙන්නම්" කියලා එයාගේ ගාණට අරගෙන, ශබ්දය ඒ ගාණට සීමා කරලා, ඒක එයා අරන් දුන්නා. හරි අමාරුවෙන් දුන්න බව පෙනුණා. නැත්නම් හැරුණු ගමන් කෝච්චියෙන් විසිවෙන්ට යි ගහන්ට හිතෙන්නේ. අර සිද්ධිය අවසන් වුණාට පස්සේ මා ළඟ හිටිය මහත්තයෙක් කිව්වා "මගේ නම්, උඹව දොට්ට විසිකරනවා කෝච්චියෙන්" කියලා. එයා පැහිල්ල වැඩි කරගෙන. සිද්ධියට මුහුණ දෙන එක්කෙනා පැහිල්ලෙන් බේරන්ට ඕන පිළිවෙත පුරන කොට, බලා සිටි එක්කෙනාගේ තේජස වැඩි වෙලා. එයා දොට්ට විසිකරන්ට හදනවා. කෙලෙස්වල තත්ත්වය එයින් වටහා ගන්ට පුළුවනි. ඔය වේගය අර මහත්තයට නො තිබුණා නො වෙයි. එයා හරි ඉවසිලිවන්ත මහත්තයෙක්. දෙවිෂය තියෙද්දී අමාරුවෙන් අර ගාණට කළා. ඒක යි මේ ප්‍රතිපත්තිය - පිළිවෙත කියන්නේ. තේජස හෝ ගාලා එනවා. එයාගේ ගාණ අල්ලා ගන්නවා. මේ ගාණට යි මේක කරන්ට ඕන. ඒ පැහිච්ච ඒවා පාවිච්චියට නො ගැනීමේ හේතුවෙන් ලොකු ප්‍රයෝජනයක් ලැබුණා. කුෂ්ට, දද ආදි දේ හදන ශක්ති නැති ව ගියා. ඒ පැහිල්ල පැහෙන හැටි, ඒ පැහිල්ල අඩු වෙන හැටි බලාගන්න යි අපට මේ සාක්ෂි ලැබිලා තිබෙන්නේ. ඔය පැහිල්ල ඉවර කරගෙන අර විධියට පරිහරණය කරන කොට **"හිසබු අරහං බිණාසවො"** කියනවා. පැහෙන්නෙ නැති වැඩේ දිගට ම ක්‍රියාව සම්පූර්ණ වෙන තුරු කරන්ට වෙලා තියෙනවා. එක වෙලාවක කරලා තව වෙලාවක නො කර හිටියොත් වෙන්නේ මොක ද? නො කළ තරමට තව ටිකක් ශක්තිය එකතු වෙනවා. ඒ නිසා, නිරතුරුව ම මෙය කළ යුතු යි.

ඊ ළඟට තිබෙනවා **කත කරණීය** කියලා විග්‍රහයක්. බහා තබපු ගතියක් කීවා. බහා තැබුවේ මොනවා ද? මුළු ජීවිතයේ ම බහා තැබිය යුතු කොටස් බහා තබලා තියෙනවා. බහා තබලා ඉවර යි. බහා තබන්ට වෙන දෙයක් නැහැ. අපි මේ රහතන් වහන්සේ ගැන කතා කරන විට අපි ඒ ජීවිතය යි ආශ්‍රයට ගන්නේ. ඒ ජීවිතය දෙස බලා කත තරණීය වෙන්නේ මෙහෙම යි. උන් වහන්සේ අවසන් කරපු එක යි මම මේ කරගෙන යන්නේ. මමත් එතනට එනවා. මේක කරලා මමත් කවදා හරි කත කරණීය වෙනවා. කත කරණීය වෙන්ට කරන්ට ඕන කුමක් ද? සැනසිල්ල පවත්වන ක්‍රමය පමණ යි කරන්ට තියෙන්නේ ඒක ම විතර යි පරිහරණය කරන්ට ඕන. ඒ ටික විතරක් පරිහරණය කරනවා. අරවා උහුලනවා. උහුලන එකට යි ක්ෂාන්තිය තියෙන්නේ. තමන්ගේ යහපත පිණිස පවතින දේ පාවිච්චි කරන අතර ඊට අතිරේක ව යම් තරමක් තිබෙනවා නම් ඒවා සියල්ල ම උසුලා ගෙන, දරා ගෙන සිටින්නට පුළුවන් වෙන්ට ඕන.

ක්ෂාන්තියත් පාරමිතාවක්. ඒකට පාරමිතා කීවේ ඇයි? ඒක පුරුදු වෙන තුරු කරන්ට බැහැ. දැන් කෙනෙක් බණිනවා. බණින කොට කේන්ති යනවා. ඒක හරි. අපි ඒකට දොස් කියන්නේ නැහැ. කේන්ති ගියාම දැන ගන්ට ඕන මේ මනුස්සයා එක්ක කතා කරන්ට ඕන කොහොම ද? එයා බොහොම නරක විධියට බණිනවා. මෙයා තේරුම් ගන්ට ඕන එයා එක්ක කතා කරන්ට ඕන විධිය. "හා! හොඳ යි මහත්මයා, අපි මේක හිමිහිට කතා කරලා නිරවුල් කර ගනිමු." එහෙම කතා කරන්ට ඕන හරි අමාරුවකින්, බරකින්. එහෙන් මෙහෙන් චූරු පනින්ට එන නිසයි අමාරුවෙන් කතා කරන්ට වෙලා තියෙන්නේ. ඒක යි බුදු හාමුදුරුවෝ වදාළේ තමන්ගේ ජීවිතය පිළිබඳ වගකීම තමන් ම බාර ගන්ට ඕන යි කියලා. ඒක නො කළොත් දුක් විඳින්ට වෙනවා. දුක් විඳින්ට කැමති නැත්නම් වගකීම බාර අරගෙන කරන්ට ඕන. දෙකෙන් එක යි. බුදු හාමුදුරුවෝ කීවේ නැහැ දුක් විඳින්ට එපා කියලා. සැප විඳපල්ලා කිලයත් කීවේ නැහැ. මෙන්න තියෙනවා දුක්විඳින්ට, සැප විඳින්ට පැති දෙකක්. දුක් එන විධියට කළොත් එයාට දුක් විඳින්ට වෙනවා. ඒ ගැන ගණගාටු වෙන්ට බැහැ.

බුදු හාමුදුරුවෝ නොයෙක් අවස්ථාවල දුක් විඳින අයට පිහිට වුණු තැන් සඳහන් වෙලා තිබෙනවා. ඒ අවස්ථාවලදී උන් වහන්සේට කිසි කම්පනයක් නෑ. අනුකම්පාවක් තැහැ. මහා භයානක පුද්ගලයෝ උන් වහන්සේ ළඟට ආපු වෙලාවේ කිසි කම්පනයක් වුණේ නැහැ. එහෙම තමයි ඒ අය කතා කරන්ට ඕන, හැසිරෙන්ට ඕන. ඒ අය ළඟ තිබෙන ධර්ම නිසයි එහෙම කතා කරන්නේ. චිංචි මානවිකාව උන් වහන්සේ ළඟට ආව වෙලාවේ, "මේකි කියන කතාවල හැටි?" කියලා කියන්ට ගියේ නැහැ. ඇය මේ වෙලාවේ කිව යුත්තේ ඔය විධියට යි. එයාගේ පැහිල්ල තිබෙන්නේ ඒ විධියට යි. එයා යම්කිසි කෙනෙකුගේ බලපෑමට යට වෙලා. ඒ අනුව යි ඇගේ හිත වැඩ කරන්නේ. කිසි ම දෝෂයක් නැහැ. දෝෂය තිබෙන්නේ එයා ළඟ ඔය හදපු ධර්මවල යි. ඒ නිසා, අමුත්තක් වුණේ නැහැ. ඒවා වෙන්නේ ඔහොම යි කියා දන්නවා. අර විධියේ තමාගේ ජීවිතයෙන් තමාට වෙන දේ දැක්කම යම් මනුස්සයෙකුට කේන්ති ගිහින් තමාට බණින කොට එයාට පුදුම වෙන්ට දෙයක් නැහැ. මටත් ඔය කේන්ති ගිහිල්ලා තියෙනවා. මම ඉහිලුවේ පුදුම අමාරුවකින්. නමුත්, මේ අසරණයාට බැරි ව ඇති. දන්නේ නැති ව ඇති. උහුලන ක්‍රමය දන්නෙ නැති ව ඇති. ඉතින් ඒ මිනිහා මොනවා කරන්ට ද? බුදු හාමුදුරුවෝ උගන්වන්නේ හතුරා ඉදිරියේ මෛත්‍රිය වඩන්ට කිල යි. අර මිනිහා බණින කොට "සියලු සත්වයෝ නිදුක් වෙත්වා! නිරෝගී වෙත්වා! සුවපත් වෙත්වා!" කියන්ට ගියොත් ගුටි කන්ට යි වෙන්නේ. එහෙම කියන එකට නො වෙයි මෛත්‍රිය කියන්නේ. මෛත්‍රි කරන්නේ කොහොම ද? එයාගේ හිත රත් වෙලා.මගේ හිත නිවිලා. මෛත්‍රි හිතෙන් "හොඳයි මහත්තයෝ, මා අතින් වරදක් වුණා නම් මට සමා වෙන්න! මම යම් කිසි ගෙවීමක් කරන්ට තියෙනව නම් මම ගෙවන්නම්." ඒ පිට කරන්නේ මෛත්‍රි ශබ්දය යි. ඒ මෛත්‍රිය පිට කරන විට එයාට අල්ලාගෙන ඉන්ට නිමිත්තක් නැහැ. ඉක්මනින් ම වේගය බහිනවා. ඒක යි මෛත්‍රියෙන් අනුන්ගේ හිත් නිවෙනව යි කීවේ. මෛත්‍රීයට පත් වෙනවා කීවේ ඕකට යි. නිදුක් වේවා! නිරෝගී වේවා! සුවපත් වේවා! කිව්වට, මන්ත්‍රයක් වගේ කිව්වට, හරියන්නේ නැහැ එහෙම කීවාම සියලු දෙනාගේ ම සිත් තුළ මෛත්‍රිය ඇති වෙනවා නම්, අපට පුළුවනි යාපනය පැත්තට හැරිලා "නිදුක්, නිරෝගී, සුවපත් වෙත්වා!" කියන්ට. ඒවා කෙරෙන වැඩ නො වෙයි.

අදත් මේ මෛත්‍රිය ඔය කී ක්‍රමයට ඔවුන් ඉදිරියේ පරිහරණය කරන්ට පුළුවනි. කියන්ට බැහැ මොන තත්ත්වයේ ද අපි ඉන්නේ කියලා. අප තුළ මෛත්‍රියේ ඝන සාර තත්ත්වයක් තිබෙනවා නම් ඒ තත්ත්වයට ප්‍රතිඵල ලැබෙන්නට පුළුවනි. අපිත් ඒ මට්ටමට ඉන්ට ඕන. මන්ත්‍රය දන්නේ නැත්නම් අලි අල්ලන්ට බැහැ. එහෙම වුණොත් අලියා පාගයි. මන්ත්‍රය හොඳට ම දන්නවා නම් කණෙන් අල්ලන එක යි ඇත්තේ. බැරි පුළුවන් කම එයා දැනගන්ට ඕන. දැන් මෙතන බුදු හාමුදුරුවෝ කීවේ ක්ෂිණාශ්‍රවයන් වහන්සේ, රහතන් වහන්සේ කියල යි. කවුද මේ සියලු දේ බහා තබපු උත්තමයා? සියලු දේ බහා තැබුව කීවාම අපි ඇත් වූ කතාවක් නො වෙයි එයින් අදහස් වෙන්නේ. දැන් අපි සියල්ල අල්ලගෙන ඉන්න නිසයි අර පැහිල්ලට යටවෙන්නේ. "මට තත්ත්වයක් තියෙනවා. අහවල් තනතුර යි දරන්නේ. අපි අහවල් පරම්පරාවේ එවුන්. ඔය එක එක ජාතියේ එවුන්ට යට වෙන ජාතියේ අය නො වෙයි අපි" මේ ඔක්කොම බදාගෙන නිසා මේ මිනිහට වෙලා තියෙනවා පණ නැති වුණත් අර මිනිහට ගහන්ට. ඒ මොක ද? හොඳ කුලවන්තයෙක්. පරම්පරාවේ කවුරු වත් ගුටි කාලා නැහැ. එකෙකුට වත් යටත් වෙලා නැහැ. අපේ තාත්තා තමයි රට කළේ කියනවා. උන් ඒ කාලෙ ම මැරිලා. මේ මනුස්සයා ඒවා අල්ලගෙන ගුටි කනවා. බහා තබපු බව කී විට ඒවා මොකුත් නැහැ.

බාප්ප කෙනෙක් රජකම් කල බවත් ඇත්ත. මම පුතා. බාප්පා නො වෙයි. ඒක එයාට යි අයිති. මේක මට අයිති යි. බැණුම් අහන්ට, අවනම්බු විඳින්ට, මේ ඔක්කොන්ට ම යට වෙලා ඉන්නවා. මම ඕවැ එල්ලිලා නැහැ. මම එල්ලුණොත් මට මොක ද වෙන්නේ? අර එන වේගවලට එල්ලිලා, ඒවාට යටවෙලා, තවත් ගුටි කන මිනිහෙක් වෙනවා. ඒ ගුටිය අදින් ම මම ඉවර කරනවා. අපටත් ඔය බහා තබන එක කරන්ට පුළුවනි. රහතන් වහන්සේ කියනවා මම ඔතන ඉඳලා ඕවා ඉවර කරල යි මේක ඉවර කළේ කියලා. මම සියලු දේ බහා තැබුවා. ඉතින් ඔය ඇත්තොත් බහා තබ - තබා ඉස්සරහට එන්ට කියලා. රහතන් වහන්සේ කියනවා මම අහවලා, තාත්තා අහවලා කියන ඔක්කොම ඒවායේ එල්ලිලා තියෙන එක අත්හරින්ට. ජීවිතයේ හැම තැනදී ම මේ ශාස්ත්‍රය දැනගෙන එයා ඒ ශාස්ත්‍රය අනුගමනය කරන පුද්ගලයෙක් වෙන්ට ඕන. එ විට එයාට භාවනා කරන්ට නියම කරගත් වේලාවක්

නැහැ. එයා මුළු ජීවිතයේදී ම භාවනා කරනවා. නින්දෙන් අවදි වූ වේලාවේ සිට නින්දට යන තුරු ම එයා කරන්නේ බහා තබන එක යි. ඒක යි භාවනාව. පැහිල්ල නවත්වනවා.

රාජකාරි ගොඩක් තිබෙනවා. උයන්ට තියෙනවා. නඩු අහන්ට තියෙනවා. කතා කරන්ට තියෙනවා. ගණන් බලන්ට තියෙනවා. මේවා සියල්ලමත් ක්‍රියාත්මක වෙනවා. බහා තබන එකත් පැහිල්ල නවත්වන එකත් ඒ ගාණට ම කෙරෙනවා. කටුව යන ගමන් බට්ටත් යනවා වගේ කටුවට එක වෙලාවකුයි බට්ටට එක වෙලාවකුයි නැහැ. බට්ට යි කටුව යි දෙක ම එකට යන්නේ. කටුව වටේ කැරකෙනවා. බට්ටා එහාට මෙහාට යනවා. අන්න ඒ වගේ දෙක ම එකට කරන්ට පුළුවන්. කරන්ට පුළුවන් කාට ද? ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් ලබපු පුද්ගලයට යි. අලෝභ, අදෝස, අමෝහවලින් යුක්ත පුද්ගලයාට යි. මේ කියන ඒවා යමෙකුට තේරෙනවා නම් එයින් පැහැදිලි වෙන්නේ එයා අමෝහ සිත්වලින් යුක්ත පුද්ගලයෙකු බව යි. වැහුණු ගතිය නැහැ. තේරිලා තියෙනවා. එයා තීරණය කරනවා නම් ජීවිතය සනසා ගන්ට නම් ඔය විදියේ තමයි කරන්ට තියෙන්නේ, ජීවිතය සනසා ගන්ට නම් ඔය විදියේ නො කර බැහැ කියලා. එ විට එයාගේ මෝහය අයින් වෙලා. මෝහය අයින් වූ නිසා ඉදිරියට එන්නේ ප්‍රඥාව යි. ප්‍රඥාව තියෙනවා නම් මෝහය නෑ. එයා ඒක තේරුම් ගන්නේ කොහොම ද? ඔය විධියට කළොත් හරියනවා වගේ ම එයා තීරණය කරනවා ඔය විධියට මම කරනවා, පුළුවන් විධියට කරනවා, ලෝභ, ද්වේෂ, නැති ව කරනවා කියා.

ලෝභ, ද්වේෂ තියෙනවා නම් එයා කියන්නේ කොහොම ද? "දැන් ම මේවා කරන්ට බැහැ. රස්සාවෙන් අස්වෙන්ට ඕන. පැන්ෂන් එකට ලියන්ට ඕන." ඒක ද්වේෂය. ලෝභය යි ද්වේෂය යි එයාව අරකටත්, මේකටත් ඉක්මන් කරවනවා. ඒක කරන්ට පුළුවන් වෙලාවට ඒක කරනවා. ඒක නො වෙයි කරන්ට තියෙන්නේ. මේක යි දැන් කරන්නේ. මහණ වෙන්ට සිවුරු ගේන්ට යන කොටත් මේක කර-කර යි යන්නේ. මේ සිවුරු ගේන්ට යන්නේ. සිවුරු ඇඳ ගෙන මේවා කරනවා කීවොත් කවදා වත් කෙරෙන්නේ නැහැ. ඒ හිත යනවා ඊළඟට යමක් කමක් ඉගෙන ගන්ට. ඊළඟට නායකයා වෙලා කරන්ට. අන්තිමට වෙන්නේ මැරිලා කරන්ට යි. ඇයි එතකොට පැටිදි වෙන්නේ ? අනිත් අයට

උදව් කරන්ට යි පැවිදි වෙන්නේ. බහා තබන්ට - පැහිල්ල නවත්වන්ට පැවිදි වෙන්ට ඕන නැහැ. මේක මෙහෙම ඉඳගෙන කරන්ට පුළුවනි.

මට දැන් මේ විධියේ දැනීමක් තියෙනවා. දැනීමෙන් මගේ ජීවිතය සාර්ථක කර ගන්නවා. ජීවිතය සාර්ථක යි කියන්නේ මට කිසි දුකක් නැහැ. බොහෝ දෙනා කියනවා ජීවිතය දුක යි කියලා. මිනිස්සු මට බණිනවා, වද දෙනවා. මට පාඩු වෙනවා. නොයෙක් ඒවා හොරු අරන් දුවනවා. ඔය ඔක්කොම මා දන්නවා. නමුත් දුකක් නැහැ. හොරු අරන් ගියා නම් දුක් ගත්තත් නො ගත්තත් හොරා බඩු අරගෙන ගිහිල්ලා. මම දුක් ගත්තත් නො ගත්තත් ඒ මිනිහා බැණලා ඉවර යි. දැන් කට වහන්ට ද? නැහැ. ඒවා සියල්ල ම එහෙම වෙනවා, මාත් සැනසිල්ලේ ජීවත් වෙනවා, කියලා කියන්ට පුළුවන් තත්ත්වයක් යමෙකුට ආවා නම්, එයා සැහෙන දියුණුවකට හිමිකාර කම් කියලා මේ ලෝකයට ආපු කෙනෙක්. එයාට වෙලා තියෙන්නේ හොයා ගන්ට. මේ කියන ශාස්ත්‍රය එයා දන්නේ නැහැ. අහු වුණු හැටියේ ඒ තැන ඉඳන් පටන් ගන්නවා. වියදමක් යන්නෙත් නැහැ. කෙනෙකුට පේන්නෙත් නැහැ. පෙන්වන්නෙත් නැහැ. එයාගේ ඒවා සියල්ල ම රහසිගත ව කෙරෙන වැඩ. මූණ හෝදනවා, නානවා, කෑම කනවා, වැසිකිළි යනවා වගේ වැඩක්. ඒවාත් සමග ජීවත් වෙනවා. ඒ තත්ත්වය සම්පූර්ණත්වයට ආවම කියන්නේ කෝටීත භාවය කියල යි.

කලින් නො පැමිණි යම්කිසි ආසව වර්ධක බලපෑමක් ආවාම, ඒ බලපෑම නිසියාකාර ව තමන්ගේ යහපත සැලසෙන විධියට ඒ කාරණයට එළඹුණා නම්, ඒක එයා හැදුවා නම්, ඒ ධර්මය සමඟ නැවත එයාට හදන්ට එකක් නැහැ. නිදසුනක් ගනිමු. අංශක 60 ක කේන්තියක් ගියා. එයා අර කී ක්‍රමයට පාලනය කරලා සාමකාමී ව ඉරියව් පැවැත්තුවා. ඒ නිසා, වැඩෙන්නට තිබුණු ප්‍රමාණය අඩු වුණා. කලින් තිබුණු තරහව වැඩෙන්ට තිබුණු එක වැඩෙන්ට දුන්නේ නැහැ. ඒ වර්ධනය අඩු වෙල යි එන්නේ. ඒකේ හදන්ට දෙයක් නැහැ. ඊළඟ එකේ හදන්ට තියෙනවා. එදා නැවැත්වීමෙන් අංශක 60 ක තරහෙන් අංශක 10 ක් බැස්සා. ඒ දහයත් එක්ක වැඩ කළා නම් අංශක 70 ක් වෙනවා. දැන් තිබෙන්නේ අංශක 50 ක ද්වේෂයක්. මෙයා පාලනය කළ නිසා අර වැඩෙන්නට තිබුණු ගණන අඩු වෙල යි හැමදා ම එන්නේ.

ඒ අඩු වුණු එක අඩු වුණාම යි. රහතන් වහන්සේ ගැන උදන් අනලා පුදුම වෙන්ට දෙයක් නැහැ. අපේ ජීවිතයේ අද පරිහරණය කරන සෑම දෙයක් ම රහත් ජීවිතයත් සමඟ සම්බන්ධ කරලා වැඩ කළාම අපටත් ටික ටික කෙලෙස් අඩු කරගන්ට පුළුවන් වෙනවා. රහතන් වහන්සේලාට අනුවම යි බෞද්ධයාගේ ජීවිතයේ හැම එකක් ම වැඩ කරන්නේ. පෝය දාට පමණක් රහත් ජීවිතයට අනුව ක්‍රියා කිරීම සීමා කිරීම සුදුසු නැහැ. ඒ තරම් අපතේ යවන්ට වයසක් නැහැ. කොයි මොහොතේ මැරෙයි ද දන්නේ නැහැ. මනුස්ස ජීවිතයක් ලැබිලා තිබෙනවා. මහා වටිනා සාර්ථක නිධානයක් අවුස්සන්නා වගේ වස්තුවක් ලැබිලා තිබෙන්නේ. ඒ නිසා, එයින් ප්‍රයෝජනය ගන්ට යි මේ විග්‍රවලින් පෙන්වා දෙන්නේ.

අපේ ජීවිතයේ පැහෙනවා කාමාසව, භවාසව, දිට්ඨාසව, අවිජ්ජාසව යන මේවා. ඔය ආසව පැහුණු බව දැන ගන්නේ කොහොම ද? හිත දෙස බලන විට මේක මේ ගණනට පැහිලා කියලා තේරෙනවා. පැහෙන ලකුණු යි ඉස්සරහට එන්නේ. පැහි-පැහී බුබුලු දමනවා. එක බුබුලකින් දැනගන්ට පුළුවනි දැන් මෙ පමණ පැහිලා තියෙනවා කියලා. ඒ නිසා, පැහීම නවත්වන්ට ඕන. ජීවිතයේ එක මොහොතක් වත් අස් කරන්ට බැහැ. යමෙක් ජීවිතය වාසනාවන්ත කරගන්ට බලනවා නම් අර පැහිල්ල පරිහරණය නො කර ඉන්ට ඕන. එ විට ජීවත් වෙන්ට බයත් නැහැ. මැරෙන්ට බයත් නැහැ. ඔය හපන්කම, වීරත්වය පසුවට එනවා. ඒ වීරත්වය සාමාන්‍යයෙන් නමින් පෙන්වූ වීරයෝ ළඟ තිබුණේ නැහැ. ඔය කැප්පෙටිපොල වැනි වීරයන් ළඟත් ඒක තිබුණේ නැහැ. සාමාන්‍යයෙන් වීරත්වයක් ආවා ඒ වගේ වැඩ කළ නිසා. බුදු හාමුදුරුවන්ගේ වීරත්වය මහා වීර යි. කිසි ම ප්‍රශ්නයක් කොයි පැත්තෙන් වත් නැහැ. බොහොම එඩිතර යි. ඒ එඩිතර කම ආවේ හිත ඇතුළෙන්. ඒක උන් වහන්සේට පෙනෙනවා මිස වෙන කිසිවෙකුට වත් පෙනෙන්නේ නැහැ.

# 14

හැම ධර්ම ස්වරූපයක් ම, හැම අවස්ථාවක් ම මේ සූත්‍රයේ මුල් කොටස එක්ක සම්බන්ධ වෙන්ට ඕන හරියාකාර ව තේරුම් ගන්ට. ආසව ධර්මයන් තිබී නැති කළා වූ ජීවිතයක් ගැන යි අපි කතා කළේ. ඒ ජීවිතයක් අපි සිහිකරන්නේ ආදර්ශයට ගන්ට යි. පින්තූරයක් අඳින පුද්ගලයා ඒ පින්තූරය ඉදිරියේ තියාගෙන ඒ ආකාරයට තමාගේ කොළයේ ඒක අඳින්ට පුරුදු වෙනවා. එහෙම පුරුදු වෙන්ට අඳින කොට එක්තරා අවස්ථාවකදි ඒ පින්තූරයේ හැඩයට මෙයාට අඳින්ට පුළුවන් වෙනවා. ඒ ආදර්ශය උපකාරයට ගත්ත නිසයි. ඒ විධිය තමයි බෞද්ධ ජීවිතය. රහතන් වහන්සේ ගැන, බුදු පියාණන් වහන්සේ ගැන, හිතන කොට ඒ ඡායාවේ තිබෙන සටහන් ස්වරූපය අපේ ජීවිතයේ කොයි තරම් තියෙනව ද, කොයි තරම් දුරට අඩු ද කියලා බැලිල්ල යි අපි මේ කරගෙන යන්නේ බෞද්ධයන් වශයෙන්. ඒවා සකස් වෙන පමණට යි එයාගේ බුද්ධිමත් කම, බෞද්ධ කම ගොඩ නැගෙන්නේ. බුද්ධිමත් ස්වරූපයට අයිති ක්‍රියා යම් ස්වරූපයක ද තියෙන්නේ, ඒ සිත විතරක් ගත්ත විට ඒ සිතට විතර යි බෞද්ධ කම කියලා කියන්නේ. ඒ ක්‍රියා කොටසේ තියෙනවා තමාව දුකින් නිදහස් කරන ශක්තිය. ඒ වගේ ම සැපයට පමුණුවන ශක්තිය. මේ දේවල් ඒකේ තියෙන නිසා ඒකට කියනවා බුද්ධිමත් කම කියලා.

මෙ තැනදී ඛීණාසව කියන උත්තමයාගේ අරහත් යන පදය යි ගත්තේ. අරහත් කීවේ බැම්ම, සම්බන්ධ කම් කැඩීම යි. ඒ සම්බන්ධ කම් කැඩීමේදී ජීවිතත් එක්ක සම්බන්ධ කම් පවත්වන දේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ යනුවෙන් හැඳින්වූවා. බෞද්ධ දර්ශනයත් එක්ක තිබෙන දේවලුයි පඨවි, ආපෝ, තේජෝ, වායෝ, නීල, පීත, ලෝහිත, ඕදාත ආදි කසිණ කොටස්. අපි දැන් පරිහරණයට වැටිලා තිබෙන්නේ කසිණ මණ්ඩලය කියල යි. මණ්ඩල ස්වරූපය ආශ්‍රිත ව අපි අරගෙන තියෙන්නේ - කවයක්

අරගෙන තිබෙන්නේ. ඒක ඉන්දියාවේ හින්දු ක්‍රමයක්. නමුත්, මෙ තැන පඨවි කසිණ කියන එකේ තියෙන්නේ මොකක් ද? කසිණ කියන ශබ්දයට අයිති වෙන්නේ සියල්ල කියන එක යි. එතකොට දැන් අරහං ගුණයත් එක්ක සම්බන්ධ කම් පවත්වන කසිණ මණ්ඩලයක් තියෙනවා. ඒ පඨවි කසිණ මණ්ඩලය යි. මණ්ඩලය කියන්නේ ඒ සියල්ල අයිති සීමාව යි. පඨවි වර්ග කොපමණ ද කියලා කියන්ට බැහැ.

මේ ලෝකයේ සිටින සත්ව ජාතීන්ගේ ජීවිත නිර්මාණ වෙලා තියෙන්නේ සිත යමක් එක්ක බැඳිච්ච ප්‍රමාණයේ හැටියට යි. සිත යමක් එක්ක බැඳිච්ච එකට කියනවා පඨවි කියලා. ඒ සිතේ තිබෙන පඨවි ගතිය. ඒක නිමිත්ත ආශ්‍රයෙන්, අරමුණත් එක්ක සිත නැමෙනවා. සිත නැමුණු විට ඒකේ තිබෙන සැර කම නිසා බැඳීමට තිබෙන නිදහස ඒකට සම්පූර්ණ උදව් දෙනවා. ඒකට කියනවා ආපෝ කියලා. බැඳීමට තියෙන නිදහස එතෙන්ට ලැබෙන්ට පඨවියේ උපදින්නේ තේජෝ ධාතුව. අපට උහුලන්ට බැරි තරමට තේජස නගිනවා.

දැන් සතෙක් මරන්න ඉදිරිපත් වූ පුද්ගලයාට හිමින් ඒ සතා මරන්ට බැහැ. සැහෙන ඉක්මනක් එයාගේ සිතේ ඒකට තියෙනවා. යොදන්ට පුළුවන් උපරිම යෙදුම යොදනවා. ගත්ත ගමන් බෙල්ල කපන්ට ඕන. බඩවැල් ඉක්මනට අදින්ට ඕන. උපන් තේජස උහුලගන්ට බැරිව යි එයාව ඒ චලනය කරවන්නේ. ඉක්මන් කරවන්නේ වායෝ ධාතුව. වායෝ කියන්නේ චලනය කරන ශක්තිය. ඒකේ මූලික ව තියෙන්නේ කාන්දම් ශක්තිය යි. ඒ පඨවිය ගත්තොත් සිත ඒකට එල්බ ගත්ත තදකම දැන් එයාට අයිතියක් වෙලා තිබෙනවා. ඒ පඨවියෙන් වෙච්ච අයිතිවාසිකම මේ ලෝකයේ එක තැනක තියෙනවා, සතර අපායෙන් කොතනක හරි. ඉතා ම දරුණු පිච්චීම් ස්වරූපයකට හිමිකරුවෙක් වුණා. ඒක පුරුදු කළේ ජීවිතයෙන්. අරහං කීවේ මොක ද? ඒ පඨවියට ඉඩ නො දී, ඒ පඨවිය පරිහරණය නො කර, එකක් කැඩුවා. සතර අපායෙන් එකකට තිබුණු අයිතිය නැති කළා. ඔය පඨවි කසිණයේ කසිණ මණ්ඩලය කීවේ ඔය බැඳීම් සියල්ලට ම. බුදු හාමුදුරුවෝ නොයෙක් චරිතවලට මේ කසිණ දීලා තියෙනවා. ඒ මොක ද චරිත කියල කීවේ? එක එක ස්වරූප එක්ක එයා බැඳන ආකාර තිබෙනවා. ඒ බැඳෙන එක කඩන්න, ඒක ගලවන්න,

මේක ගැන මෙනෙහි කරන්න, බුදු හාමුදුරුවෝ ශාස්ත්‍රයක් එක්ක යි දුන්නේ. නිකම් බලා හිටියට හරියන්නේ නැහැ. අරහත් තත්ත්වයට පත්වෙන උතුමා බැඳීම් සියල්ල ම සම්පූර්ණයෙන් ම කඩලා.

අපි සත්ත්වයෙක් ගත්තේ මොක ද? ඒ හැම සත්ත්වයෙකු තුළ ම ඔහුගේ චිත්ත ප්‍රමාණයක් තියෙනවා. ඒ සිතුවිලි ආකාරය සංවිධානය වුණේ අර නිමිත්ත එක්ක අරමුණේ බැඳිලා. නිමිත්ත ආධාරයෙන් අරමුණේ බැඳිලා හිටපු ප්‍රමාණය අර සතාගේ හිතේ දැන් තියෙනවා. යමක් එක්ක ද තද වුණේ ඒ ප්‍රමාණයට පැහෙනවා. ආසව කියන්නේ පැහීමට යි. පැහෙන ගතිය යි කවුරුත් නවත්වන්ට හදන්නේ. හිතනවා යමක් කරන්ට. හිතෙනවා මිනිහෙකුට ගහන්ට. "ඔවා කරන කොට කොච්චර දේවල් වෙනව ද? ඕක ඔන්න ඔහේ ගියාවේ" කියලා ඉන්නවා. ඒකෙන් කළේ අර පැහෙන ගතිය කාරණා දාලා අඩු කිරීම යි. බැඳීම එක්ක පැහෙන එක හේතු දාලා අඩු කළා. හරියට බත පැහෙන කොට වතුර වැඩි වෙලා උතුරනවා නම් සමහරු ඒක නවත්වන්ට පිඹිනවා. තවත් සමහරු කූරු ගානවා. දෙකෙන් කොයික කලත් හරි. ඒක ගෙනිච්ච ක්‍රමය ගෙනයන්ට දෙන්නේ නැහැ. ඒක වෙනස් කරනවා. අපි කරන්නේ මොකක් ද?. ඒක පැහෙන ගතිය නැති කරනවා. තමා දන්නා ධර්ම කරුණු එතනට දාලා, ඒකෙන් පිඹිනවා. කාට ද පුළුවන් සත්තු වෙලා උපදින්ට? ඒ විධියට හිතන කොට කාරණයට යොමු වීමට තිබෙන පදවිය බහිනවා. ඒ ක්‍රමය මෙ තැන සිටින කවුරුත් වාගේ කරලා තිබෙනවා. ඒක කරපු නිසා, ඒකෙන් ලැබුණු ප්‍රතිඵල නිසා, තවත් ඒකට දේවල් සොයනවා. ඛීණාසව කිව්වේ ඔය විධියට කර කර ප්‍රතිඵල ලබමින් ඉතුරු ටික කරගන්ට ශාස්ත්‍රය සොයමින් ප්‍රතිඵල සාර්ථක කර ගත් උත්තමයන් ගැන යි.

ඊළඟට බහා තැබිල්ලක් ගැන. කලින් කරපු දේවල් ඒ විධියට දැන් කරන්නේ නැහැ. සර්පයෙක් දුටුවොත් මරන එක මුලින් හිතේ තිබුණා. නමුත්, දැන් මරන එක බහා තබලා. දැන් කරන්නේ සර්පයා විසි කරන එක පමණ යි. බහා තැබුවේ සතාව මරන නරක කොටස යි. මේ අප ළඟ තිබෙන ඒවායේ කොටස් ගැන යි කතා කරන්නේ. මේක කවද පටන් ගත්ත ද, කොතනින් පටන් ගත්ත ද කියන්ට බැහැ. මනුෂ්‍ය ජීවිතය පටන් ගැනෙනවා.

කොතනදී හරි සමාජ ආශ්‍රයෙන් හරි, පරිසරයේ උපකාරයෙන් හරි ඒක පටන් ගැනෙනවා. ඒක යි මනුෂ්‍යයෙක් වුණු එකේ අගය. මනුස්ස කම අගය කරන්නේ ඒක යි. එයාට බැහැ ඒක නො කර ඉන්ට. කරන්ට තියෙන ඒවා ඔක්කොම කරල යි මනුස්සයෙක් වෙලා තියෙන්නේ. ගෙම්බෝ, හිකනැල්ලෝ, නයි, කොටි, අලි මේ ඔක්කොම වෙලා ඒ කරන්න තියෙන ඒවා ඔක්කොම කරලා. දැන් එකක් වත් කරන්ට ඉතුරු නැහැ. දැන් මෙ තැන ඉඳලා තියෙන්නේ හොඳ වෙන්ට කරන දේවලුයි. රහතන් වහන්සේ ජීවිතයට දුක් දෙන යම් තරමක් ක්‍රියා තිබුණා නම් ඒ ජීවිතයට දුක් දෙන සියලු ක්‍රියා නැවැත්වීමේ ක්‍රියාව දැන් කරලා අවසාන යි. දැන් රහතන් වහන්සේට කරන්ට වැඩක් නැහැ. එතකොට ජීවිතයට අයිති වැඩය කුමක් ද? දුක් දෙන දේවල් අයින් කරන වැඩය පමණ යි. ඕන ම කෙනෙක් කරලා තියෙන්නේ එච්චර යි. දුක් දෙන ඒවා නවත්වන්න වීරිය කරලා තිබෙනවා.

දැන් මැස්සෙක් පිහානට වැහුවම අත දිග් කරපු හැටියේ උඃ පියාඹන්නේ දුකෙන් බේරෙන්ට යි. ආයිත් වහන්නේ තිරිසන් ගතියට යි. තිරිසන් සතාගේ තියෙන වෙනස කුමක් ද? ඒ සතාත් හැම වේලෙ ම ජීවිතයට දුක් දෙන ඒවා අයින් කරන්න යි නොයෙක් උපක්‍රම යොදන්නේ. නමුත්, කොහොම ද කරගන්නේ කියන එක දන්නේ නැති නිසා ඒ වෙලාවට ඉදිරිපත් වෙන හැටියට එයා කරනවා. නමුත්, ඒ එකක් වත් හරි ගියේ නැහැ. නමුත් මිනිහට ජීවිතයේ දුකෙන් අයින් වෙන දේවල් කරන ක්‍රමය ලැබිලා තියෙනවා. දුකෙන් අයින් වෙන ක්‍රමය හේතු සහිත ව ලැබිලා තියෙනවා. ඒක ලබන්ට බෞද්ධයෙක් වෙන්ට ම ඕන. අත්හරින්ට තියෙන දේවල් අත් හැරිය යුත්තේ, ක්‍රියා අවසන් කළ යුත්තේ, කොහොම ද? දැන් ක්‍රියාවක තියෙනවා කෘත්‍ය ලක්‍ෂණයක්. ඒ හේතුව නිසා මේ කෘත්‍ය ලක්‍ෂණය මතු වෙනවා. ඒ ලක්‍ෂණයෙන් අර ඵලය ලැබෙනවා. එතකොට ජීවිතය ක්‍රියාවක්.

දැන් සතෙක් මරන්න හේතු ලක්‍ෂණයක් ආවා. මොක ද? මේකගෙන් බේරෙන්න. දෂ්ට කළොත් විෂ යි කියලා සතා මරන්න හේතුවක් ආවා. හේතුවක් ආවම ඒ හේතුවට යට වෙලා ඒ කෘත්‍ය ස්වරූපය මතු වුණා. තමාගේ සිත රෞද්‍ර වුණා. ඒක යි ඵලය. භව සංයෝජන වුණා. තවත් එකක් එක්ක සම්බන්ධ වෙන සිද්ධියට කිව්වා භව සංයෝජන කියලා. අපේ සිතේ තියෙනවා සිදුවීම්.

සිදුවීම් මොනව ද? එක එක දේ සිතීම. අපේ සිතේ සිදුවෙන සිද්ධිය සිතුවිල්ල යි. සතෙක් මරපු හැටියේ සිත රෞද්‍ර වුණා. මෙ ලොව වශයෙන් ඒ පුද්ගලයා රෞද්‍ර ස්වරූපයෙන් ජීවත් වෙන පුද්ගලයෙක් වෙනවා. එයාට සාමකාමී හිතක් පහළ කරන්න බැරි වෙනවා. රෞද්‍ර ස්වරූපය මරණය අවස්ථාවේදී මිශ්‍ර වෙලා, දුගතියට යන්ට හේතු වෙනවා.

අපේ සිතුවිලි බැලුවොත් හැම සිතුවිල්ලක ම සංයෝගයක් තියෙනවා. දැන් මට අහවල් දේ ගැන හිතුණා. මගේ ළඟ තියෙන දේපොල ගැන හිතුණා. ඒක ඒ වෙලාවට සිදු වුණු සිද්ධියක්. ඒකට කිව්වා භව කියලා. ඒ භව නැත්නම් ඒ සිතින් සිදු වුණු සිද්ධියේ සංයෝජනයක් තියෙනවා. මේ සිතුවිල්ල, ඒ ක්‍රියාවෙන් උපදවපු ශක්තියේ හැටියට මේ සිත සම්බන්ධ යි දුක් දෙන ප්‍රේත ආත්මයට. දේපල ගැන හිතලා බලාපොරොත්තුවෙන් පීඩා විඳින අවස්ථාවක් නිසා ඒ සිත සම්බන්ධ යි ප්‍රේත ආත්මයට. **නැති කමෙන් පෙළෙන සිතට කියන නම ප්‍රේත යි.** මිනිසාට දේපල තියෙනවා. ඒවා පරිහරණය කරගන්න බැරි ව, පරිහරණය කරන්නේ නැති ව, තවත් ඒකට කීයක් හරි එකතු කරලා තියන්නේ කොහොම ද කියලා හිතාගෙන හිටියේ. එතකොට එයා පෙළිලා තියෙන්නේ නැති කමින්. බැංකුවේ ලක්ෂ දහයක් තියෙන එක ඇත්ත. නමුත් තවත් මෙයාට නැති කමක් තියෙනවා. ඒ මුදලට තව කීයක් හරි එකතු කරන්න ඕන කමක් මෙයාගේ හිතට තිබෙනවා. **ඕන කියන එක යි නැති කමෙයි කියන්නේ.** බැංකුවේ මුදලක් තියෙනවා. මෙ තැන නැති කමක් තියෙනවා. මිනිහා ඒකෙන් පෙළෙනවා. ඒ නැති කමින් පෙළෙන සිතේ සකස් වෙනවා එක්තරා ආකෘතියක්. ඒකට යි කියන්නේ ධර්ම කියලා. ඒකත් එක ධර්මයක සකස් වීමක්. ඒ ධර්ම සකස් වීමට පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වැඩ කරලා තියෙනවා. සිත අදහසෙහි බැඳිලා තියෙනවා. මුදල වැඩිකර ගැනීම කියන අදහසෙහි. ඒ බැඳීමට නිදහස ලැබිලා තියෙනවා. ඒ බැඳුණු ප්‍රමාණයට රත්වෙලා තියෙනවා. රත්වීමෙන් චලනය වෙලා තිබෙනවා, මොක ද කරන්නේ කියලා. එ විට හැම සිතුවිල්ලක ම පඨවි, ආපෝ, තේජෝ, වායෝ තියෙන බව පෙනෙනවා.

අන්තිමට රහතන් වහන්සේට පඨවි, ආපෝ, තේජෝ පමණ යි තියෙන්නේ. වායෝ නැහැ කියලා පෙන්වනවා. රහත් සිතේ කාන්දම නැති නිසා, කම්පනය නො වෙන නිසා, වායෝ නැහැ.

වායෝ කීවේ කෘත්‍ය ලක්ෂණය යි. කාමය කීවේ ධර්ම ලක්ෂණය යි. මේ ධර්ම ලක්ෂණ සහ කෘත්‍ය ලක්ෂණ අපේ සිතේ අඩු වෙන ආකාරයට කටයුතු කරනවා. එ විට ටිකෙන් ටික **පරික්ඛීණ භව** අපේ සිතේ සකස් වෙනවා. ඒවා පරිහරණය නො කරපු තරමට දුක් එක්ක සම්බන්ධ වෙන ගතිය එයාගේ ළඟින් ඉවත් වෙනවා. ඒක එයා ළඟින් ඉවර වෙන බව දැනගන්නේ කොහොම ද? දැන් අපේ ඇඟේ කවුරු හරි හැපුණහම ඔරවන්නේ නැත්නම් අපේ සිතේ කොටි ගතිය ගිහින් තිබෙන බව පෙනෙනවා. ඒ නිසා මැරුණට පසු ව කොටියෙක් වෙන්ට බැහැ. ඇඟේ හැපුණහම ඔරවන්නේ නැත්තේ ඒ ගතිය සිතේ නැති නිස යි. ඒ ලක්ෂණයෙන් අපි තේරුම් ගන්නවා අප ළඟ ඕව නැහැ යි කියලා. ඒක යි බුදු හාමුදුරුවෝ ඕපනයික ගුණයක් මතු කරලා පෙන්නුවේ. ඒ ධර්මය තමන් ළඟ නැති බව දැන ගත්ත නම් ඒ ධර්මයට අයිති හේතු මතු කරන එකත් එක්ක උපනය වෙලා බලන්ට ඕන. ඒකේ ගිලිලා බලන්ට ඕන. දැන් මගේ සතර අපායට යන හේතු කැඩිල ද බලන්න මේ සමාජයේ හැසිරෙන විධිය බලා තීරණය කරන්ට ඕන.

ඊළඟට පෙන්වන්නේ "**සම්මදඤ්ඤා විමුත්තො**" කියන කොටස යි. ඒ කියන්නේ මනාව දනිමින් බේරෙනවා. හැම කාරණයක ම හේතු සම්පත් අදාල සියල්ල බලා මේක වෙන්නේ මෙහෙම යි, මේකෙන් බේරෙන්න මෙහෙම කළ යුතු යි කියලා ඒ විධියට කළා. කළ අවස්ථාවේදී ම ඒකෙන් බේරුණා. සම්මදඤ්ඤා විමුත්ත යි. නිදසුනක් දක්වතොත් දරුවා පියාට බණිනවා. එතකොට තාත්තා දන්නවා මගේ ළඟ තිබුණ ක්‍රෝධය නිස යි මට බණින දරුවෝ ලැබිලා තිබෙන්නේ. බණින දරුවෝ නො ලැබෙන්ට නම් මගේ ළඟ ක්‍රෝධය නැති වෙන්න ඕන. මේ මනුස්සයා මට ක්‍රෝධ කරන්න යි මා ළඟ උපන්නේ. ඒ නිසා, පියා සිතනවා "අනේ පුතේ, උඹ මට බැණලා හරි උඹේ ඔය මානසික වේගය අඩුකර ගනින්. මම අහගෙන ඉන්නම්! මම දැන් උඹට උදව්කාරයෙක්" කියලා. එහෙම යමෙක් හිතපු හැටියේ ඒ සිතුවිල්ල වැටෙන්නේ මෛත්‍රියට යි. මෛත්‍රියෙන් යුක්ත ව ඉන්න කොට එයා දන්නවා අහවල් කාරණය මෙන්න මේ ගාණට ගන්න මේ උත්සාහය යෙදුවා. ඒ උත්සාහයේදී මට කේන්ති ගියේ නැහැ. ඒ අවස්ථාවේදී ඒකට ඉදිරිපත් වීම තරහ නැති ව කළ නිසා දැන් එක්තරා

ප්‍රමාණයකින් තරහෙන් මිදුණා. එක්තරා ප්‍රමාණයක් හදා ගත්තා. ඒකට කියන්නේ සම්මදඤ්ඤා විමුත්ති යි.

දැන් මේක වැටෙහෙන එක්කෙනා කරන්නේ මොකක් ද? ඒ තත්ත්වයට සුදුස්සෙකු වීමට වැඩ ටික කරගෙන යනවා. රහත් කියන උදාර ජීවිත අයිතිවාසිකම අපට අවශ්‍ය වෙලා තියෙනවා නැවත නො ඉපදී ඉන්ට. ඇයි නූපදින්නේ? මේ සෑම දුකක් ම විඳින්න සිද්ධ වෙන්නේ උපන්න නිසයි. ඒ දුක් එකක් වත් අපට ඕන කරන දේවල් නො වෙයි. මේ ඕන නැති දේවල් මැද්දට ආවේ හේතු තිබුණ නිසයි. ඉපදුණොත් ඒ අයිතිවාසිකම් සියල්ල ලබනවා. එතකොට මිනිහෙක් වශයෙන් තියෙන කටයුත්ත කාලා, බීලා, ඇඳලා, දරුවෝ හදලා, දීගතල දීලා අන්තිමට ඇඳේ තපිනවා කියන එක නො වෙයි. මම ජීවිතය දුකට හරවන ඒවා මෙ තරම් ප්‍රමාණයකින් අඩු කළා. ඉස්සර මට කේන්ති ගිය ප්‍රමාණයට දැන් කේන්ති යන්නේ නැහැ. ඉස්සර තරම් ලෝභ නැහැ. ඒ නිසා, අර කියන ඛීණාසව පැත්තට හැරිලා අර රහත් උත්තමයාගේ ජීවිතය සමඟ මගේ ජීවිතය පෙළ ගැහිලා. ඒ පාරෙ යි දැන් ගමන් කරන්නේ. එ විට මේ සම්මදඤ්ඤා විමුත්ති කියන පදනම යටතේ එකක් එකක් පාසා අර ඕපනයික ගුණය යටතේ හප්ප - හප්පා, බල-බලා, ඒවා එනව ද නැද්ද කියලා පරීක්ෂණ පවත්වනවා නම් මේ පරීක්ෂණ තුළින් ගන්න තීරණය සම්මදඤ්ඤා විමුත්තිය යි.

එතකොට දැන් සමහරු කියනවා බීම නැවැත්තුවා කියල. නවත්වලා මාස ගණනක් හිටියා. එයාට වුවමනා වුණා මේ ගැන පරීක්ෂණයක් පවත්වන්න. දවසක් එයා පඩි අරගෙන එන ගමන් ඇත්තට ම ඒ බීම බොන සිත තියෙනව ද කියලා බලන්න තැනකට ගියා ලු. ගිහින් වීදුරුවක් අරගෙන බීම කටට ගන්ට හදන කොට ම හිතෙන් කියනව ලු මොන ජරාවක් ද ඔය ගන්ට යන්නේ කියල. ඒ පුද්ගලයාගේ අතේ බීම වීදුරුව තියෙන කල් හිත ගැස්සෙනව ලු. කලබල යි ලු. පස්සේ බීම වීදුරුව එහෙම ම තියල ඒකේ මුදල් ගෙවලා ගෙදර ගිහින් තියෙනවා. එයා ඒක සම්මදඤ්ඤා විමුත්තිය කියලා දැනගෙන කළා නො වෙයි. ඒවා අත්හැරියා නම් එයාට ඒවා නො කර ඉඳීමේ ශක්තිය තිබෙන්න ඕන. කොයි අතට ලාබ පෙන්නලා මොන ලාභය ඉදිරිපත් කළත් ඒක නො කර ඉඳීමේ හැකියාව ඇති වුණේ **සුපටිපන්න** නිස යි.

මනා ව පිළිපදිනවා. මනාව පිළිපදිනවා නම් එයාට මනා ව පිළිපදින්න උපකාර වෙලා තියෙන්නේ **උජුපටිපන්න** කම යි. ඒ කිව්වේ මොන ම කරුණකට වත් එයාගේ සිත නමන්න බැහැ. සෘජු යි. මේ උජුපටිපන්න ගුණය තියෙන එක්කෙනා යමක් හේතුකොට ගෙන බෙල්ල කපන්ට හදන කොට වත් ඒ ක්‍රියාව කරන්නේ නැහැ.

දැන් සංඝ ගුණය කියන්නේ තමාට යහපත සලසන ගුණ ගොනු කිරීමට යි. මිනිස් ජීවිතයක ඤාණවන්ත එක්කෙනාට පරිහරණය කරන්න යි බුද්ධ, ධම්ම, සංඝ කියලා ක්‍රම තුනක් දුන්නේ. ඔය තුන එක ගොනුවට එන කොට මේ කියන ධර්ම එක්ක ඒ ඔක්කොම සම්බන්ධ යි. ඒ සම්බන්ධතාවය යි ජීවිතය වාසනාවන්ත කරන්නේ.

දැන් රහතන් වහන්සේගේ ආකෘතිය කොහොම ද ඇති වුණේ කියල එ තැනින් ඒක අවසාන යි. නමුත්, ඊට එහා උන් වහන්සේ පිළිපදින හැටි විස්තර කෙරෙනවා.

# 15

මේ අපි කතා කළේ පෘථග්ජන පුද්ගලයෙක් ඒ පෘථග්ජන බව පෙරළා ගැනීම සඳහා ගෙන ගිය ක්‍රියා මාර්ගය යි. පෘථග්ජන කම කීවේ ජීවිතයට පීඩා කරන තත්ත්වය උදා කරන මූලික ධර්ම සකස් වෙන හැටි යි. ඊළඟට රහත් සිත ගැන කතා කළා. එක ම සැප හිත. අන්‍ය වූ අතට දුක් විඳින සිතක් සැප විඳින තත්ත්වයට හැරුණු හැටි රහතන් වහන්සේගේ ජීවිතයෙන් පෙන්වා දුන්නා. ජීවිතය තවත් ඉදිරියට යමින් දුක් විඳීමට තිබුණු ශක්තිය සම්පූර්ණයෙන් නැති වුණා. ඒ තත්ත්වය ඔය ජීවිතය තුළ ඇති වීමට එයා ගත් ක්‍රියා මාර්ගය **"අභිජානාති"** යන වචනයෙන්, විශේෂයෙන් දන්නවා කියන වචනයෙන්, විග්‍රහ කළා. ක්‍රියාවක් ආරම්භ වීමට හේතුව, ක්‍රියාව කෙරෙන හැටි, ඒ ක්‍රියාවේ තිබෙන ශක්ති ප්‍රමාණ, ඒ ක්‍රියාවෙන් මතුවෙන ඵලය, ඒ ඵලය දිග්ගැස්සීමට තිබෙන උපකාරක ධර්ම යන සියල්ල එක කරුණක් ගැන දන්නවා නම් එය යි අභිජානනය.

මේ අභිජානනය පිළිබඳ ව මේ සෙව්වට වැටෙන කොට ඒ වැටුණු සිතුම් ක්‍රමයට බුදු හාමුදුරුවෝ දුන්න නම කසිණ යන්න යි. කසිණ කීවේ හැම එකක ම සියල්ල දැන ගැනීම යි. කසිණ මණ්ඩලය කියලා දෙයකුත් තිබෙනවා. මණ්ඩලය කියන්නේ ඒ ඇතුළත සීමාව යි. මෙන්න මෙ පමණ යි ඒක. දැන් වීවල එක මණ්ඩලයක් ලාහ. ඒ කරුණ මණ්ඩලයට වැටෙනවා. එක කරුණක් පිළිබඳ සිතිය යුතු දේවල් රාශියක් තිබෙනවා.

බුදු හාමුදුරුවෝ දේශනා කළ හැම දෙයක් ම කරන්ට පුළුවන් ඒවා. ඔක්කොම බැරි කම් තමා තුළ යි තියෙන්නේ. ක්‍රියාව බැරිකම නො වෙයි. ඒ ක්‍රියාව අවදි කරන්ට ශක්තිය නැති නිසයි බැරි වෙලා තියෙන්නේ. ඒකට ශක්තිය ලැබෙන විදියට ක්‍රියා කරන්ට යි තිබෙන්නේ. එහෙම ශක්තිය ලැබෙන තුරුත් ක්‍රියාකරන්ට බැරි නම් කරන්ට දෙයක් නැහැ. එතකොට

මේ තදවීම පිළිබඳ ව දැනගන්නවා. ඒක පඨවිය යි. පඨවිය යම් පමණකට ද කිව්වු වෙලා පරමාණුව හැදුණේ ඒ ප්‍රමාණයට රත්වීම තිබෙනවා. රත්වීම වැඩි වෙන විට කාන්දම් නිෂ්පාදනය වැඩි යි. ජීවිතයක් ඇතුළේ තිබෙන ශක්තියට අපි කියනවා කාමය කියලා. යමක් එක්ක ඇදුම් දෙන ගතිය කාමය යි. ඒ ඇදුම් දෙන ශක්තිය අපට පාලනය කරන්ට බැරිව යි අපි ඒකට යට වෙන්නේ. ඒකට කිසි දඬුවමක් නැහැ. එයාට ඒ ක්‍රියාවෙන් දඬුවම් ලැබිලා නිසා අමුතු දඬුවම් අවශ්‍ය නැහැ. නමුත්, එවැනි ක්‍රියාවලදී ලැබුණු දඬුවමක් මතක් වෙලා, අත්දැකීම් ලබලා, ප්‍රත්‍යක්ෂයෙන් තේරුම් ගත්තට පසුව යි තමාගේ ජීවිතය බේරෙන පැත්තට හදන්ට එයා ශාස්ත්‍රය හොයන්නේ. ජීවිතය පිළිබඳ මෙහෙම වෙන්නේ මොක ද කියා කිසිවෙක් හෙව්වේ නැහැ. කවුරුත් හෙව්වේ නැත්තේ ඒ තරම් සියුම් දේ හොයන්ට අවශ්‍ය මානසික ශක්තියක් සාමාන්‍ය අයට නො තිබුණු නිසයි. බුදු හාමුදුරුවන්ට ඒ ශක්තිය තිබුණා.

දැන් මේ පුද්ගලයාට මේ දැනුම අනුව සිදු වෙනවා පඨවි, ආපෝ, තේජෝ, වායෝ පාලනය කරන්ට. අපි පාලනය කරන්නේ ස්වාභාවික ව අපේ ජීවිතයේ තිබෙන අයිතිවාසිකම්. නැත්නම් අපිව පවත්වන ශක්තිය පාලනය කරනවා. මේ මොක ද වෙන්නේ කියලා දැන ගන්ට අපට නිදසුනක් අවශ්‍ය යි. ඒ අභිජානනයට නැත්නම් විශේෂයෙන් දැන ගැනීමට එයා පරීක්ෂණ සමයකට වැටෙන්ට ඕන. එකේ සුලමුල හොයන්ට ඕන. අපි කියමු එ සේ පරීක්ෂණ පවත්වන තරුණයෙකුට තරුණියකගේ දර්ශනයක් හමු වුණා කියලා. එයා දන්නවා එයා දැන් වැටිලා ඉන්නේ අභිජානනයට කියා. ඒ නිසා, ඔහු වෙන මොකුත් හොයන්නේ නැහැ. එයාට වෙන්නේ මොකක් ද කියන එක විතර යි එයා හොයන්නේ. ඒ තරුණිය දුටු විට එයාගේ හිත පැනගෙන යන හැටි, පැන ගෙන ගිහින් ලබා ගන්ට බැරිව දහලන හැටි එයාට පෙනෙනවා. එ විට එයා දැන ගන්නවා නිමිත්තට තද වෙලා බව. ඕකට යි තද වීම කියන්නේ. ඕක පැහැදිලි ව කියන්ට පුළුවන් නිදසුනක් ඔය. කොයි එකෙත් ඔහොම බව වටහා ගන්ට ඕන.

මේ තදවීම මත මොකක් ද වෙන්නේ කියලා මේ පරීක්ෂකයා තව දුරටත් සොයනවා. තද වීමට අවශ්‍ය ඔක්කොම තියෙනවා. ඉන්ද්‍රිය ශක්තිය, ලැබෙන නිදහස ආදිය. තද නො වීමට තිබෙන

නිදහස නැහැ. උපකාරය, සහාය කිසිවක් නැහැ. තද වීමෙන් වෙන්නේ කුමක් ද? තේජෝ ධාතුව නගින එක යි. හිත රත්වෙන එක යි වෙන්නේ. රත් වෙන්ට-වෙන්ට ශරීරයේ ඇති වෙනවා කම්පන. එයින් කාන්දම නිෂ්පාදනය වෙලා දුක් විඳිනවා. මේ වස්තුව හමු වුණු වෙලාවේ ඉඳලා මට වෙලා තියෙන්නේ කුමක් ද? පිච්චිලා තිබෙනවා, කම්පනය වී දහලලා තිබෙනවා. පිච්චිල්ලෙන් නිදහස් වෙන්ට තමන් නො වෙයි දැහලුවේ. මාව දැහලෙව්වා. අනාත්ම යි සිදු වුණේ. මා ළඟ එකතු වෙලා තිබුණු ශක්ති විශේෂයන් නිසා මේ ලෝකෙට පුළුවන් මාව දහලවන්ට. ඉතින් ඒ දහලන කොටස් බුදු හාමුදුරුවෝ ගොනු කරලා කෙලෙස් කියලා නමක් තිබ්බා. ජීවිතය ඇතුළේ තියෙන දහලන කොටස් සියල්ල ම කාමය පදනම් කරගෙන හැදෙන ඒවා. මේ ලෝක ධාතුවේ සෑම දෙයක් එක්ක ම මේ ඉන්ද්‍රියයන් සම්බන්ධ කරගෙන මොනව ද අපේ මේ ජීවිතය ඇතුළේ සකස් වෙන්නේ? හැම වෙලාවෙ ම රත්වීමක් ඇති කරලා, පිච්චීමක් කිරීම පමණ යි කරන්නේ. පිච්චිලි මැද්දේ ජීවත් වෙන වස්තුවක් කියලා වැටහෙනවා.

වර්ණ කියන්නේ මොනව ද? භ්‍රමණ ප්‍රමාණ. ඕනෑ ම එකක ගති ප්‍රමාණ පෙන්වනවා. ඇල්ලුවොත් අතහරින්ට බැහැ. එය නිලෙන් පෙන්වන්නේ. හරියට වඳුරා අල්ලා ගත්තා වගෙ යි. අපේ මිනිස් ජීවිතවල යමකට ඔරොත්තු දීලා නො මගට නො ගිහින් ඉන්ට පුළුවන් ශක්තියක් තියෙනවා. එතෙන්ට බස්සගන්ට යි මේ යන්නේ. යමෙකුගේ තියෙන සියලු කර්කශ ස්වරූප මැදිලා මැදිලා එන්නේ සාමයට යි. සාමය, සෞම්‍යත්වය පෙන්වන්නේ ඕදාතවලින්-සුදුපාටින්. සිත කිසි ම කලබලයක් නැති තත්ත්වයට වැටෙනවා. කර්කශ වර්ණ තුනක බලපෑම සෞම්‍යත්වයෙන් පිළිගන්නවා. විරූපී, සුරූපී දෙයක් හෝ ඕනෑ ම දෙයක් හෝ සියල්ල ම පිළිගන්නේ සෞම්‍යත්වයෙන්. ඒ නිසා මෙයාගේ මට්ටම හරි. ඕදාත තත්ත්වය යි. කොයි තරම් ශුද්ධ කළත් පරීක්ෂණ පවත්වන්ට ඕන.

මේ කියන්නේ රහත් වෙන තැනැත්තා ලෝකය පරිහරණය කරන හැටි යි මේවා දැන් අපටත් පරිහරණය කරන්ට පුළුවන්. කාට වත් හඬ නො නහා මේ වැඩය තමාට හිමිහිට කර ගන්ට පුළුවනි. ඒකට යි පිළිවෙත් කියන්නේ. එහෙම නැති ව ප්‍රසිද්ධ වෙන්ට කරන දෙය පිළිවෙත නො වෙයි. මෙන්න මෙහෙම යි අන්තිම ශ්‍රේෂ්ඨ උත්තමයා හිටියෙත්. ඒ උන් වහන්සේ ලද සැපය

දැන් වත් අප භුක්ති විඳින්ට ඕන. ඒ නිසා, දැන් සිට ම කරමු කියලා හිතපු මිනිහා හරියට ම කරනවා. සිත සෞම්‍යත්වයට පත් වූ පුද්ගලයාගේ සුදක් පේන්නේ නැහැ. සිත සමඵල වෙලා නම් ඇතුළ සෞම්‍යත්වයට පත් වෙලා. ඒ භ්‍රමණය ඉතා ම දුර පරතරයක් තිබිල යි වෙන්නේ. බොහොම දුරින් ඒ තරංගය වැඩ කරන්නේ.

ඊළඟට පෙන්වනවා කසිණ දහයේ ආකාස කසිණය. ආකාස කසිණය කීවේ පරතරය යි. පරතරය කීවේ සිත ඒ ඒ දේවල් සමඟ සම්බන්ධ නො වී සිටීමේ දුර ප්‍රමාණය. මේ වස්තු කිට්ටු කර ගන්නා ශක්තිය දැන් සිතේ නැහැ. ලෝකෙන් ම ඈත් වෙනවා කීවේ ඕකට යි. නිදසුනක් ගනිමු. අර ළමයා අන්තරා වුණා නේ? පරතරය තියෙන්නේ කොහොම ද? එයාට පේන්නේ ඒ ළමයාගේ ආයුෂය ඉවර වුණු බව යි. එපමණ යි. ඒක ගැන තවත් හිතෙන්නේ නැහැ. "බොහොම හොඳ ළමයා! අපිත් බොහොම කල් ඉඳල ඇසුරු කරන්නේ?" මේවා කිසිවක් එයාට මතක් වෙන්නේ නැහැ. බැඳීමක් නැහැ. බැඳෙන්නේ නැහැ. අන්න අහවලා පොට්ටනියක් අරන් ආවා කිව්වත් එයාට ඒකේ ගණනක් නෑ. මෙහාට ගෙනෙයි ද? ඒවායේ තියෙන දේවල් මටත් ලැබෙයි ද? පොට්ටනිය දැම්ම ලෙහයි ද? ඒ එක ම දෙයක් ගැන වත් සිත යෙදෙන්නේ නැහැ. ඒ කාරණාවලට සිතේ අවකාශය - දුර ප්‍රමාණය වැඩි යි. යම් යම් වස්තු පිළිබඳවත් කොයි තරම් හිත ඈත් වෙලා ද බලන්ට ඕන. අන්තිම කෙළවර දක්වා ම පරතරය - අවකාශය ඈත් ම කරලා දමන්ට ඕන.

පරතරය ඈත් කරන කොට මොකක් ද වුණේ? අර මුලින් ම පටන් ගත්ත පරමාණුවේ පඨවි කතාව ආපෝ බවට පත් වුණා. ආපෝ යි මෙතෙන්ට ප්‍රබල වෙලා තියෙන්නේ. තද නො වෙන්ට තිබෙන බුරුල, හේතු සාධක ඉදිරිපත් කර-කර ඉඩ ලබාගත්තා. මේ හැම එකක් ම ඒ තැනැත්තා පරීක්ෂණයට ලක් කරනවා. තද වීමට ශක්ති දැන් නැති නිසා දැන් ඒවායින් මම ඈත් වෙලා. දැන් ආපෝ තත්ත්වය හරි ගිහිල්ලා. ඈත් වෙන්ට - ඈත් වෙන්ට රත් වීම ඇති කරන්නේ එක්තරා ප්‍රමාණයකට යි. ඇතුළේ තියෙන රූප කලාපවලත් ඒ පරතරය හරි යනවා. ඒවායේ රත්වීම නැහැ. ඒවා රත් වෙන්ට ඕන සිත තේජස් වෙන්ට. සිත රත්වෙන්ට ඕන රූප කලාප රත්වෙන්ට. ඒ අන්‍යෝන්‍ය සම්බන්ධතාව යි. සිතෙන සිතුවිල්ල රත් නො වෙන්නෙත් මේ විධියට යි. බුදු හාමුදුරුවන්ගේ

දෙසුම කොයි තරම් ශාස්ත්‍රීය ද? කොයි තරම් විද්‍යාත්මක ද? ලෝක ධාතුවේ කිසි ම විද්‍යාඥයෙක් කතා කළේ නැහැ මේවා ගැන. කතා කරන්ට බැහැ. ඔය පරතරය ඈත් වෙන කොට ඊළඟට එන්නේ විඤ්ඤාණ කසිණය යි.

විඤ්ඤාණ කසිණය කියන්නේ මොකක් ද? අපට දැනෙන හැම දැනිල්ලක් ම රිදෙනවා. රත් වීම දැනීම හැම දෙයකට ම වැඩි නම් එයාගේ දියුණුවත් නැහැ. එයාට දැනෙනවා නම් "දැනෙන දේ එ තරම් පීඩා නැති ව මට දැනෙනවා" කියලා, එයාගේ විඤ්ඤාණ කසිණය හරි. මොකක් ගැන හිතුවත් අමුතු නො සන්සුන් කමක් නැත් නම් එයාගේ විඤ්ඤාණ සිදු වෙන්නේ තේජස අඩු විධියට යි. විඤ්ඤාණ වෙන්නේ මේ තේජස යි. ඒ තේජස මෙ පමණ කල් ආවේ නැහැ. දැන් මෙයාගේ හිත ලෝකීය තත්ත්වයෙන් ලෝකෝත්තර තත්ත්වයට පත් වෙන සෙව්ව පෙන්වනවා. දැන් පවතින රත්වීම උහුලන්ට පුළුවන් රත්වීමක්.

සසරට වැටුණු දා සිට මම මොකක් හදා ගන්නට ද පස්සෙන් ඇවිල්ලා තියෙන්නේ? යම් තරමක් ජීවිත පරිහරණය කළා නම් ඒ හැම ජීවිතයක ම දිවා - රෑ දෙකෙහි ම වෙහෙස වෙලා තියෙන්නේ මේ රත්වීමේ ප්‍රමාණය මට උහුලන්ට පුළුවන් ගාණට ගන්ට යි. රත් වීමට වුවමනා ගාණට සීමා කරන්ට යි. රස කෑම හොයනවා. මොකක් ද මේ රස කෑම? දැනීම රසවත් වෙන කල් මෙයා කනවා. ඒ වෙලාවේ කෑවා. නමුත්, රසය හිටියේ නැහැ. කන කොට විතර යි. එයාට විඤ්ඤාණ කසිණයේදී සියල්ලේ ම සුලමුල තේරෙනවා. මම මෙ පමණ කල් උෂ්ණත්වයේ සීමාව, ප්‍රමාණය සොයමින් ඇවිත් තියෙනවා. මොන ප්‍රමාණයට ද මට සැප තියෙන්නේ? එකක් වත් සැප වෙලා නැහැ. දැන් මොනව ද මට දැනෙන්නේ? දැන් දැනෙන්නෙත් ඒ උෂ්ණය විතර යි. මම මේ රෑකලා තියෙන්නේ මොකක් ද? පරිහරණය කරලා තියෙන්නේ කුමක් ද? මාව උපද්දවලා තියෙන්නේ මොකක් ද? මේ උෂ්ණ ටික යි. ඒක නිසා බුදු හාමුදුරුවෝ නිවන්ට කීවා. නිවන නිසා නිවන කීවා. මොකක් ද මේකේ තේරුම? පුළුවන් ද උෂ්ණයේ ප්‍රමාණය නවත්වන්ට? ගාණ නවත්වන්ට? කිසි ම තේජසක ගණන නවත්වන්ට බැහැ. එක්කෝ අඩු වෙනවා. නැත්නම් වැඩි වෙනවා. ඒ නිසා, මේ නිවන එක කිසි ම දාක අහක දාන්ට එපා. නිවා දාන්ට යි තියෙන්නේ. අහක දාන එක නො වෙයි මනුස්සයින්ට

කරන්ට තියෙන්නේ. ඕක නිවා දාන එක යි කරන්ට තියෙන්නේ.

නිවා දමන්ට ක්‍රියා කරන එක්කෙනා මේක පත්තු වෙන්නේ කොහොම ද, මේක නිවන්නේ කොහොම ද, කියලා හිතනවා. ලෝකයේ යම් යම් දේවල් පිළිබඳ දී තිබෙන තීරණ වැරදි බව පෙනෙනවා. නිත්‍ය යි, සුඛ යි, ආත්ම යි කියලා දීලා තිබෙන තිරණය වැරදි බව වැටහෙනවා. ඒක එහෙම පවතිනව ද? සැනසිල්ලක් ගන්ට පුළුවනි ද? මේවා මට අයිති ද? අයිති යි කියලා හිතාගෙන නේ එක එක දේවල් කන්ඩ අරගෙන යන්නේ? මේ තේජස මේකේ නවත්වන්ට බැහැ. ඒ නිසා, කොහොම ද නිත්‍ය, සුඛ, හොයන්නේ?

මේ තේජස පවත්වන්නේ කුමකට ද? ඒක ධාරණය වූ හැටියේ නිගමනය හරි යනවා. ඔන්න දැන් පඨවියේ ඉඳලා නිවාගෙන ආවා. නිවුණු එක ස්ථිර කිරීමට කරන්ට තියෙන්නේ කුමක් ද? කුසල පැත්තට සිත පත් කරන එක යි. ඇලෙන්නේ නැතිවම යි ඉන්ට ඕන. ඇලෙන්ට තිබුණ හේතු බල-බලා, බේරි-බේරී යි ආවේ. දැන් මෙ තැනදී මොකක් ද දැක්කේ? ඇලෙන්ට හේතුවක් නැහැ. දැන් මට කරන්ට දෙයකුත් නැහැ. ඒක නිසා මම සංයෝග නැති කෙනෙක් වුණා.

# 16

කෙලෙස් සහිත ව හිටපු පුද්ගලයෙක් සම්පූර්ණයෙන් ම කෙලෙස් නැති තත්ත්වයකට ආ බව යි මේ කියන්නේ. කෙලෙස් නැති තත්ත්වයට ආවට පස්සේ තමන්ගේ ජීවිත ක්‍රියාකාරීත්වයේ තිබුණු තත්ත්වය අතික් පැත්තට සම්පූර්ණයෙන් පෙරළෙන බව **''නාභිනන්දති, න මඤ්ඤති''** යන්නෙන් කියනවා. හැඟීමක් ගන්නේ නැහැ කියන එක යි. හැඟීමක් නැහැ කීවාම හැඟීම අප තේරුම් ගත යුතු යි. වෙන් කර ගත යුතු යි. යම් කිසි දෙයක් ඇඟේ හැපුණු විට ඒක තද වශයෙන්, බුරුල් වශයෙන්, දැනීමක් එනවා. සාමාන්‍ය ඇතිල්ලෙන අවස්ථාවක ඇති වෙන "ඇතිල්ලෙනවා" කියන හැඟීම නො වෙයි ඔතන තියෙන්නේ. ඒ ඇතිල්ලීම නිසා ඇති වෙන ලෝභ, ද්වේෂ හැඟීම දැන් එන්නේ නැහැ. ඒක යි "න මඤ්ඤති" කීවේ. අත ගගා ඉඳලා කෙනිත්තුවත් ද්වේෂය එන්නේ නැහැ. ඒක යි.

පඨවි, ආපො, තෙජො, වායො හතරින් මඤ්ඤණයක් නැහැ කියන්නේ ඔය ලක්ෂණය යි ඒකේ තියෙන්නේ. වදිනවා, හැපෙනවා කියන ඒවා රහතන් වහන්සේලා පිළිගන්නවා. පිළිගන්නවා කියන්නේ මේ අහවල් එක යි වුණේ කියලා දැන ගැනීම යි. එහෙම දනෙන්නේ නැති නම් ශරීරය පණ නැති කෙනෙක් වෙනවා. ස්පර්ශයේ ප්‍රමාණයේ හැටියට ඒ ස්පර්ශය විවිධ තරාතිරම්වලට යන විට පෘථග්ජන පුද්ගලයාගේ හිතේ එන හැඟීම් බිඳක් වත් රහතන් වහන්සේට එන්නේ නැහැ. රහතන් වහන්සේගේ ශරීරයේ රසායන එහෙම ම තිබියදී ඒවාට එන සිතුවිලි ස්වරූප එහෙම වැඩ කරන්නේ නැහැ. ක්‍රියාවල් සිද්ධ වෙන ආකාරය රහතන් වහන්සේට දැනෙන අතර අර කෙලෙස්වලින් කෙරෙන අතිරේක හැඟීම් එන්නේ නැහැ. ස්පර්ශයට ඇලුම් කිරීම, ගැටීම එන්නේ නැහැ. මේ රහතන් වහන්සේ පැමිණි තැනට එන්ට පටන් ගන්ට ඕන කොතන ඉඳල ද කියලා පැහැදිලි කරන්ට යි න මඤ්ඤණය

ගැන කියන්නේ. යන පාර හරි බව තේරුම් ගන්ට යි රහත් සිතේ මහ පෙන්වීම ඕන කරන්නේ. රහතන් වහන්සේට දර්ශනය මොන තරම් ප්‍රිය වුණත්, විරූපී වුණත්, ඒ පිළිබඳ ඉපදිය යුතු මඤ්ඤණය උන් වහන්සේට එන්නේ නැහැ. ප්‍රිය කරන්නෙත් නැති, අප්‍රිය කරන්නෙත් නැති හැඟීම් ස්වරූපය යි උන් වහන්සේට පවතින්නේ. ඒ තත්ත්වය ගන්ට යි පෘථග්ජන අපි උත්සාහ කරන්නේ. සිත සමාධි - ධ්‍යාන මට්ටම්වලට පත් වෙන නා නා රස ඒ සිත්වලින් පහළ වෙනවා. ඒ පහළ වෙන සිත්වල තිබෙන ස්වභාවය හඳුනනවා හැර ඒ පිළිබඳ ව හොඳ යි කියන මඤ්ඤණය, හැඟීම යමෙකුට නො එනවා නම් එයාට දැනගන්ට පුළුවනි එයා ගමන් කරන මග කෙලෙසුන් නසන මාර්ගය බව.

කිසි ම කෙනකුට බැහැ තමන්ගේ ජීවිතය නිසි මහට ගන්ට, හරි දැනීම එන තුරු. තමන්ගේ ශාස්තෘවරයා තමන් ම යි. එයාගේ ශාස්තෘත්වය සකස් කර ගැනීමට, අර ලෝකයේ අග්‍රස්ථානයට සැපත් වූ බුදු හාමුදුරුවන්ගේ ජීවිතය සාර්ථක කිරීමට දැරුවා වූ ශාස්තෘත්වය අපට කියා දීලා තිබෙනවා. මේ කියා දෙන්නේ ඒක යි. මේ ධර්මවලට ඇතුල් කර තිබෙන්නේ උන් වහන්සේගේ ජීවිතය. උන් වහන්සේ ඔය තැනට එන්ට යොදපු කරුණු අපි උන් වහන්සේගෙන් ඉගෙන ගෙන අපේ ආචාර්යවරයා නැත්නම් දිසාපාමොක් ආචාර්යවරයා අපගේ ඔළුවේ ම හදාගත යුතු යි. ඒ හදපු දැනීම යි එයාට උපදෙස් දෙන්නේ, දැන් කෙරුවා හරි. දැන් කෙරුවා වැරදි යි කියලා. තමා ළඟ තිබෙන ශාස්තෘත්වයට ඇඟිලි ගසන්ට තව කෙනෙකුට බැහැ. අපි ඒ ඒ අවස්ථාවට පරිහරණය කරන්නේ තමන්ගේ ශාස්තෘත්වය යි. යම් විධියකින් එයාගේ උගත් කම, එයාගේ දැනීම යම් ප්‍රමාණයකට ද අඩු, ඒ ප්‍රමාණයට මේ කාරණය අසාර්ථක යි. ඒ ටිකත් එයා දැන ගන්ට ඕන. ඒ ටික දැන ගත්තට පස්සේ, නැවත වාරයක් ඒ තත්ත්වයට ආවට පස්සේ දැන ගත්ත ටික එතෙන්ට දාලා හදා ගන්නවා. ඒ විධියේ ක්‍රමයක් අපට ලැබිලා තියෙන්නේ. තමන්ගේ ගැලවුම් කාරයා තමන්ම යි කියන්නේ ඔය නීතිය යටතෙ යි. ඔය ක්‍රමය යටතේ එහෙම කියන්ට වෙලා තියනවා. කාට වත් ගලවන්ට බැහැ. තමාගේ ස්පර්ශය දැනෙන - දැනෙන හැම එකකින් ම එයා කල්පනාකාරී ව අර හිත මතුවුණේ නැහැ. ඒ හිත මතුවෙන්නේ නැහැ. දැන් ඒවා හඳුනනවා විතර යි. හිතට ඕනෑ ආකාරයට

තමන්ගේ හිතේ දියුණුව වර්ධනය වෙන්ට මෙයා ඉඩ දෙනවා. ඉඩ දිදී බලන්නේ මොනව ද? මේ නා නා තරාතිරම්වල උසස් සැප මට්ටම් එක්ක මේ සිත ක්‍රියා කරන්නේ මොන විධියට ද කියල යි.

ඒ ක්‍රියා කරන විධි බලන්නේ මොක ද? ඒ හැම එකක් අස්සෙ ම තමාගේ හිත වෙනස් කරලා අර පරණ තත්ත්වයට දාන්ට ශක්තිය තමා ළඟ තියෙනව ද කියලා බලන එක යි ඒ කරන්නේ. නිදසුනක් ගතිතොත්, සිංහල වෙදකමේ හැටියට පිස්සු බල්ලෙක් කෑවම බේත් දෙනවා. බේත් දීලා ඒ බෙහෙත හොඳට පත්තියම් වුණාට පස්සේ ඌරු මස් ටිකක් උයලා එයාට කන්ට දෙනවා. විෂ ගති තියෙනවා නම් ඌරු මස්වලට ඇදිලා එනවා. ඒවා දුන්නම ලෙඩේ නැගී එන්නේ නැත්නම් වෙද මහතා දැන ගන්නවා ලෙඩේ සම්පූර්ණයෙන් සුව බව. මේත් ඒ වගේ වෙදකම් ක්‍රමයක්. තමන් ළඟ තිබුණ කෙලෙස්වල තත්ත්වය ඇදලා දෙනවා සිතෙන් ම. ශක්ති සිතෙන් ම නිෂ්පාදනය වෙනවා.

පෘථග්ජනත්වයේ හිත තිබුණ කෙනෙකුට පළමුවෙන් ම සිත සමාධියට ආ විට ඒ සිතේ ඇති වෙන සැහැල්ලු ගතියට එයා ආසා කරනවා. අන්න හොඳ යි කියන කොට ම ඒක නැති වෙලා යනවා. එතෙන්ට කෙලෙස් ආවා. එ විට කෙලෙස් ගතිය පවත්වන්නේ නැහැ - කෙලෙස් පරිහරණය කරන්නේ නැහැ. එ විට සමාධිය සිතේ පවතිනවා. සමාධියේ සිත තව සැපවත් වෙන්ට අරිනවා. ඒ ධ්‍යාන සිත්වල නා නා ස්වරූප ඇති සැප මට්ටම් තියෙනවා. ප්‍රථම ධ්‍යානයට වඩා ද්විතීය ධ්‍යානය සැප වැඩි යි. ඊට වඩා තෘතීය ධ්‍යානය. ඒ ඕන ම සැප මට්ටමකදී හීන, මධ්‍යම, උච්ච කියන මට්ටමකදී හෝ එයා බලන්නේ සිතට වෙන්නේ කුමක් ද කියල යි. සැපයේ ඉන්ට හදන්නේ නැහැ. හාස්කම් පාන්ට හදන්නේ නැහැ. අන්‍ය ආගමිකයන් බලාපොරොත්තු වෙන්නේ හිතේ යම් යම් මට්ටම් දියුණුවට අරගෙන ඒවා තුළින් මේ ජීවිතයට සැප මට්ටමක්, පුළුවන්කාර කමක්, ලබාගන්ට. එහෙම කරලා විශ්මිත වැඩ කරන්ට. බෞද්ධයන් ඒවා කරන්නේ කුමකට ද? තමන් ළඟ තියෙන කුණු ඇදලා ගන්ට. කුණු තියෙනව ද නැද්ද කියලා දකින චිත්ත මට්ටම්වලට යන්ට. බෞද්ධයෝ සිත දියුණු කරපු එකේ පරමාර්ථය පෙනෙනවා. මෙ සේ හැම ධ්‍යානයකට ම සිත පත් කර කර බලපුවම එක

සිතක වත් සෞම්‍යත්වයට, ප්‍රිය භාවයට එයා ඇලුම් කරන්නේ නැති ව පිළිගන්නා බව පමණක් පෙනෙනවා නම් ක්‍රියාව සාර්ථක බව පෙනෙනවා. හඳුනනවා පමණ යි. අනුලෝම - ප්‍රතිලෝම වශයෙන් එහාට මෙහාට සිත ස්පර්ශ කර-කර තව ඒක තහවුරු කරනවා.

ඒ තහවුරු වුණාට පසු ව, ඒ සිතේ නැති වුණේ මොනව ද කියලා පෙන්වනවා. රාගක්ඛය, දෝසක්ඛය, මෝහක්ඛය යන තුන යි. රාගය කීවේ නැවත ලබන බලාපොරොත්තුවෙන් සිත අලවනවා. ලැබීමත් එක්ක යි ඇලෙන්නේ. ද්වේෂය කීවේ, තමාට ඒ ඇලීමට තරම් සුදුසු තත්ත්වයකින් ඊට වුවමනා කරන, ආකෘතියක ලක්ෂණය එතෙන්ට එක්කාසු නුණා නම්, "ඒක නො වෙයි" කියලා තල්ලු කරන එක. අකැමැති වීම යි ද්වේෂය කීවේ. අරක තල්ලු කරන්නේ එයාට කැමති එක අදින්ට යි. කැමති එකක් නැති වුණොත් ද්වේෂයක් නැහැ. එන ඕන දෙයක් පිළිගන්ට පුළුවන් නම් එය දොසක්ඛය යි. ඒ දෝසක්ඛය වුණේ මෝහක්ඛය නිසයි. පැහැදිලි ව නො පෙනෙන ගති සම්පූර්ණයෙන් ම ඉවත් වෙලා. පැහැදිලි ව පෙනෙන ගතිය නිසා මොහක්ඛය කීවා. ක්ෂය කිරීම යි ඛය කියන්නේ. මෝහය කීවේ තමාට නො පෙනෙන කම යි. පෙනෙන ගතිය යම් ප්‍රමාණයකට ද වැඩි වෙන්නේ, ඒ ප්‍රමාණයට සෑම එකක ම මිම්ම පෙනෙනවා. හරි වැරදි පෙනෙනවා. රහතන් වහන්සේගේ රාග, ද්වේෂ, මෝහ ක්ෂය වුණා. ඒ නිසා, **"අරහං ඛීණාසවෝ"** කීවා.

**සම්මා සම්බුද්ධ:-** අරහත් පෙළේ සම්මා සම්බුද්ධත්වය හෙවත් බුදු හාමුදුරුවෝ, බුදු හිමි එක් රහතන් වහන්සේ නමක්. පළමු වැනි රහතන් වහන්සේ. උන් වහන්සේට සම්මා සම්බුද්ධ කියන විශේෂණ නාමයක් ආවා. ධර්ම සකස් වීමේ අවසානය එ තැන යි. **සබ්බ ධම්ම මූල පරියාය** - අවසාන අවස්ථාවේ ශ්‍රේෂ්ඨ ධර්ම නිෂ්පාදනය වෙන හැටි විස්තර කියාගෙන ඇවිල්ලා බුදු හාමුදුරුවන්ගේ විස්තර මේ පෙන්වන්නේ "**පඨවිං නාභි නන්දති. තං කිස්ස හේතු? නන්දි දුක්ඛස්ස මූලන්ති ඉති විදිත්වා භවා ජාති භූතස්ස ජරාමරණන්ති**" ඒ කියන්නේ මොකක් ද? රහතන් වහන්සේ සිතුවිල්ලක් අභිනන්දනය කරන්නේ නැහැ. අභිනන්දනය කරනවා කියන්නේ ඒකේ රස භුක්ති විඳීමට යොමු වීම යි. රහත් සිත සැප භුක්ති විඳීමට යොමු වීමක් නැහැ. බුදු හාමුදුරුවෝ අභිනන්දනය

නො කිරීමේ අර්ථ කථනය කුමක් ද? ඒක අපට අවශ්‍ය නැහැ යි කියලා හිතෙන්ට පුළුවනි. නමුත්, ඒක යි ඉතා ම අවශ්‍ය. අපි මේ කාගෙන් ද ගුරු හරුකම් ගන්නේ කියලා වැටහෙනවා. එ විට අපි මේ ඉගෙන ගන්නා ක්‍රමය ඉතා ම සාර්ථක ව ඉගෙනීමේ ක්‍රමය බව වැටහෙනවා. අපි සෑහෙන්ට බණ අහනවා. බණ කියනවා. ඒ කියන, අසන බණ පිළිපදින්ටත් අපි කැමති යි. නමුත්, පිළිපැදෙන්නේ නැත්තේ මොක ද? ඒකත් එක රහසක්.

ඒක අපට කියා දීපු උත්තමයා වත්, කියා දීපු කරුණු ටික වත්, තවමත් අපේ හිතෙන් පිළිඅරන් නැහැ. යම් දවසක ද හිතෙන් පිළිගත්තේ එදාට අමුතුවෙන් ප්‍රතිපත්ති රකින්ට ඕන නැහැ. එයාට ඒ ප්‍රතිපත්තිවලින් පිට පනින්ට බැරි වෙන විධියට එයා ප්‍රතිපත්තිවල හිර වෙනවා. ප්‍රතිපත්ති රැකෙන තැනට එයාගේ යෝග ටික ගොනු වෙනවා. මේ ධර්මවලට කන් දීලා වටහාගෙන තියෙන අයට නම් එක්තරා ප්‍රමාණයකට යෝග වීමක් තියෙනවා. කොහොම වුණත් වැරදි යි කියන දේවල් කිරීමට අර හිතේ තියෙන උද්යෝගය බැහැලා. ඒ බැස්ස කෙනෙකුට හිතෙයි මා දැන් ඒ වැරදි කරන්නේ නැහැ යි කියලා. එයා ඒවා කරන්නේ නැහැ නො වෙයි එයාට ඒවා කරන්ට බැහැ. ඒක යි ඇත්ත. ඒවා කරලා තිබුණු ශක්තිය අබිබවා යන වෙන ශක්තියක් ඒකට හේත්තු වෙලා. ඒවා කරන එක හොඳ යි කියපු ශක්තියට වඩා වේගයෙන් ඒවා නරක යි කියපු ශක්තියක් තියෙනවා. ඒ නිසා මෙයාට ඒ වේගයට යටවෙලා ඉන්ට සිදු වෙනවා. නිදසුනක් ගනිමු. යමෙක් ඒක හොඳ යි කියන කොට "කට වහපන්! ඒක නරක යි" කියා අර ශබ්දයට වඩා වැඩි ශබ්දයෙන් කියනවා වගෙ යි. ඒක යි බුදු හාමුදුරුවෝ අපි කරන දෙයක් නැහැ යි කීවේ. අනාත්ම යි කීවේ. ඒවා හේතු සහිත ව සිදු වෙන දේ නිසා අනාත්ම යි කීවා. ඔය අනාත්ම වාදය යටතේ ඒකට යෝග වෙන්ට ඕන. ඒවා පමණක් යෝග වෙන්ට සුදුසුකම් ඇති කරන එක යි ඇත්තේ කියලා බුදු හාමුදුරුවෝ දේශනා කොට වදාළා.

එතකොට දැන් "**තථාගතොපි භික්ඛවෙ අරහං සම්මා සම්බුද්ධො**" කියපු මේ තත්ත්වයට ආපු උත්තමයා ඒ තත්ත්වයට පත් වුණේ "**නන්දි දුක්ඛස්ස මූලන්ති**" යන අර්ථය වටහා ගත් නිසයි. නන්දිය කීවේ ඇදලා ගන්න ශක්තිය යි. ඇදලා ගන්න ශක්තිය නිසා තිබුණු ශක්තිය දූෂණය වුණා. දූෂණයේ මූල ඇදල ගැනීම යි

නැතහොත් ඇදීම යි. ඒ මුල් ශක්තිය යමක ද තිබෙන්නේ, එ තැන භව-ජාති දෙක ද තියෙනවා. අපි උදාහරණයකට ගනිමු ඇටයක් - බීජයක්. ඇටේ කියන්නේ රසායන පොදියක්. ඇටේ ඇත්තේ රසායන වගී. ඒ ඇටේට සම්බන්ධ වෙන රසායන පොළොවේ ද තියෙනවා. ඇටේ පොළොවට දැම්මහම ඇටේ ඇති රසායන නැගිටිනවා. නැගිටලා පොළොවේ රසායන අදිනවා. ඇදලා ඒ තත්ත්වය වෙනස් කරලා වෙනස් ස්වරූපයක් ගන්නවා. ඇටේ ගහක් වෙනවා. ඒකට කියනවා නන්දිය කියලා. "**දුක්ඛස්ස මූලන්ති**" කීවේ ඇටේ තිබුණු සකස් වීම අනුව රසායන නැගිටලා බාහිර රසායන එක්ක සම්බන්ධතාවය ගත්ත නිසා එහි තිබුණු තත්ත්වය වෙනස් වුණා. දැන් ඒක පෝර අදින ඇටයක් වුණා. භව, ජාති කිවේ සිද්ධියක් සිදු වෙනවා. උපතක් සිදු වෙනවා. අර ඇටේ රසායන නැගිටපුවාම බාහිර රසායන අදිනවා. ඒක සිද්ධියක්. ඒක අතරේ උපතක්. පහළ වෙන්නේ ඇටේ ඇතුළේ තිබුණු එකක්. දෙකක් සම්බන්ධ වෙල යි මේ පහළ වීම සිදු වෙන්නේ. ඒ භව ජාති ක්ෂණයක් පාසා ඒ රසායන නැගිට්ටවන ශක්තිය බාහිරේ ද තිබෙනවා. ඇදිල්ල සිදු වෙන විට යමක් පහළ වෙනවා. ගෙඩි, මල්, කොළ හැටියට ඇතුළේ උපන් ඒවා දොට්ට එනවා.

තථාගත සම්මා සම්බුද්ධ පදවිය ගත්තේ, ඒ මග ගත් ගොනුව නිසයි. මානසික වශයෙන් මේ වස්තුවත් රසායන ගොනුවක් - පරමාණු පොදියක් - රූප කලාප ගොඩක්. පරමාණුවේ රසායන වේගයක් නැගිටිනවා. අපේ නැගිටින්නෙත් වේගයක්. ඒකේ ප්‍රමාණයේ හැටියට ඒක කරනවා. මේ වස්තුවේ එ ලෙස පස් පැත්තකින් වැඩ කරනවා. සිතුවිලි උපදවමින් ඇසෙන්, කණෙන්, නාසයෙන් ආදි ඉන්ද්‍රිය පහෙන් රසායන අදිනවා.

හරකා තණකොළ කාගෙන - කාගෙන යනවා. සියල්ල කොපුවේ පිරෙනවා. කාලා - කාලා කකුල්වලින් හිටගන්ටත් අමාරු යි. දැන් මහන්සි යි. පැත්ත වැටිලා අරවා ඉස්සරහට දමනවා. අඹරනවා, ගිලිනවා. අපි කරන්නේ මොකක් ද? අපි කරන්නෙත් කෑම කන වෙලාවට ගිලගෙන - ගිලගෙන යාම යි. බඩේ දමා ගන්නවා. ඊට පසුව යි ආහාරයට ගන්නේ. කාපු කබලිංකාරාහාරයේ රස එ තැන දියුණු වෙනවා. ආහාරයේ රස ධාතුව ඇදලා ගන්නේ සිතුවිලිවල බලයෙන්. ඒවාට කියන්නේ ඵස්ස, මනෝසංචේතනා, විඤ්ඤාණ ආහාර කියල යි. ඒ ඒ

අවස්ථාවල පහළ කරන සිත්වල වේගවල හැටියට අර රසායන ටික ඇතුළට කර ගන්නවා. කේන්ති ගිය විට ආහාරවල රසායන ඇදෙන්නේ රෞද්‍ර විධියට යි. කාමය සිතට ආ විට ඇදෙන්නේ ආහාරවලින් තව වර්ගයක රසායනයක්. කාම රසායනයක්. එ විට මේ ජීවිතය හැදෙන්නේ කොහොම ද? අපි දන්නේ ම නැති ව අර සිත්වල වේගවලින් අපටත් හොරෙන් ජීවිතයේ නා නා තරාතිරම්වල දුක් දෙන ඒවා අර ආහාර තුනෙන් ම ඇදලා ගන්නවා.

සමහර වෙලාවට අපි ගත්තේ හොඳ ම පෝෂ්‍යදායක ආහාර වෙන්ට පුළුවනි. නමුත්, මිනිහා ඒවා අරන් සිතුවිලි පහළ කරලා තියෙන්නේ කේන්ති යන සිතුවිලි. ඒ නිසා, ඒ පෝෂ්‍ය ගුණය යටපත් වෙලා තේජස් අධික ලෙඩ රෝග හදන්ට පුළුවන් ශක්ති තැන්පත් වෙනවා. බලන කොට එයා අරන් තියෙන්නේ ගිනි ගුලි. ගිනි ගුලි සකස් කරන ඒවා යි මෙ තැනින් නිකුත් කළේ. අන්න ඒකට යි කීවේ නන්දිය කියලා. ඒ සම්බන්ධතාවය යි. ඒක උන් වහන්සේ දැනගත්තා. මුළු ජීවිතේ ම උන් වහන්සේ මේ මගට බැස්සා. බැහැලා ජීවිතයේ රහස සෙව්වා. මේ රහස සොයන්ට උන් වහන්සේට සෑහෙන මහන්සියක් - කාලයක් යොදන්න සිද්ධ වුණා. මෙහෙම යි අර සය අවුරුදු දුෂ්කර ක්‍රියා කාලය ගත කළේ. ඒක බොහොම අමාරු දුෂ්කර ක්‍රියාවක්. මහත් පරිශ්‍රමයකින් පරීක්ෂණය කරපු කාලයක් ඒ දුෂ්කර ක්‍රියා සමයේදී ගෙව්වා. ඒවා සොයලා සෙවිල්ල සම්පූර්ණ වුණු විට බෝධි මූලයට ගිහින් එක රාත්‍රියකදී ඒ පදවිය ප්‍රත්‍යක්ෂ කර ගත්තා.

උන් වහන්සේගේ පරීක්ෂණයට පෙනුණා හැම වෙලාවෙ ම යමක් එක්ක සම්බන්ධ වෙන ශක්තිය ඇත්නම් එ තැන ක්‍රියාවක් ඇති බව. කෙනෙක් බිම බලාගෙන ඉන්නවා. එහෙම ඉන්න කල් හිතේ නිශ්ශබ්දතාවය තිබෙනවා. යමක් දෙස බලපු අවස්ථාවේදී ම ඒ තත්ත්වය වෙනස් වෙනවා. අප වෙත සෙවිල්ලකට යොමු කරවන ශක්තියක් තිබෙනවා. බුදු හාමුදුරුවෝ බැලුවා මොකක් ද ඒ ශක්තිය කියා. කාලයක් තිස්සේ සකස් කරපු ශක්තියක් ඒක. ඒ රසායන වැඩි කම නිසා එයාට ලෝකය ම ප්‍රශ්නයක් වෙලා. කන්ට අතට ගත්ත බත් ටිකත් රස ද කියා ප්‍රශ්නයක්. එ සේ ප්‍රශ්න මතු වෙන්නේ අභ්‍යන්තරයේ ඇති රසායනවල ප්‍රමාණ අනුව සෑදී ඇති ධර්ම නිස යි. ඒ වගේ වර්ග වැඩි කම නිස යි. හැම

වෙලාවෙ ම එයාගේ හිතට මුළු ලෝකය ම ප්‍රශ්නයක් වෙනවා. හැම වෙලාවෙ ම එයා ළඟ ප්‍රශ්නයක්. අරයා මොක ද බැලුවේ? අරයා කොහෙ ද යන්නේ ? මොක ද ඒකෙන් වෙන්නේ ? මොක ද මෙහාට එන්නේ ? යනාදි වශයෙන්. ඇඳුමක් අඳින්ට ගත්තත් ඒක හොඳට හිටීද යි ප්‍රශ්නයක්. එයා සොයනවා ප්‍රශ්නයට පිළිතුරු. ඒ අභ්‍යන්තරයේ හැදිලා තියෙන ධර්ම. මූල පරියාය කීවේ ධර්ම හැදෙන හැටි යි. ධර්මවල මුල් පිළිවෙල.

හැම එකකින් ම බලාපොරොත්තුව නවත්වලා ඒක හැදින ගෙන පමණක් ඉන්ට පුළුවන් නම් ප්‍රයෝජනවත්. ඒක දැන ගත්තේ සම්මා සම්බුදු නුවණින්. ඒකට යි ජාති කීවේ. මේ ජාති ස්වරූප නා නා විධියෙන් උපදිනවා. සකස් වෙනවා. සකස් වෙච්ච දේට භූත කියනවා.

අපේ නියපොත්ත වැවෙනවා. වැවෙනවා කියන්නේ නා නා සකස් වීම් ඉස්සරහට එන එක යි. මේක මෝරනවා. කපනවා. නො නැවතී කෙරෙන පරපුරක්. මේ සම්බන්ධතාවය නන්දිය කියන ඇදලා ගන්න ශක්තිය ඇති යොමු වීම යි. ඒක නිසා මේක සිදු වෙනවා. ඒක වැටහෙනවා නම් ඒ කරන ක්‍රියාවේ ආදීනව තේරුණු වෙලාව යි ඒ. එ විට ඒක නැවත්වෙනවා ඇති. ඒක යි "තණ්හක්ඛය" කීවේ. යොමු වෙන එක ක්ෂය කරන්ට ඕන. දැන් මේ ජීවිතයක සම්පූර්ණ සුල-මුල හොයලා සම්මා සම්බුද්ධ කියන නමට හිමිකාරයා වූ හැටි යි මේ කියන්නේ.

අපි දැන් බලමු ඒක දැන් අපි කරනව ද කියලා. තරහ හිතක් උපන්නා. මේක තරහ හිතක් ය කියලා යමෙක් වටහා ගෙන හඳුනා ගෙන ඉන්න කොට නිමිත්තට යොමු වෙන්නේ නැහැ. ඒ ලෙසට යි බේරෙන පැත්තට වැටෙන්නේ. තරහ ක්ෂය වෙන කොට ඒ තරමට සිත වීතරාග වෙනවා. සම්මා සම්බුද්ධ ගුණයේ මහිමයෙන් උන් වහන්සේ පෙන්නූ හැටි මේ කියන්නේ. මෙයාට තරහව ආවේ අතන අරයා දහලන නිසයි. ඒ නිමිත්ත දෙස නො බලා සිත දෙස බැලෙන කොට ද්වේෂය අයින් වෙනවා. අරයා දෙස බැලුවොත් ඒක යි රාගය. ඊළඟට එන්නේ ද්වේෂය යි. තරහ නවත්වන මනසිකාරය එන විට ම රාගය නැති වෙනවා. එ තැන ඇත්තේ විරාගය යි. ඒක නවතින කල් අරක ශුද්ධ වෙන්නේ නැහැ. විරාග වුණු විට එන්නේ නිරෝධය යි. එතකොට

පෙළෙන තත්ත්වය එවෙලේ ම නැති වෙනවා. එ වෙලේ ම අකාලික යි. ඒ කාරණයට පමණක් අකාලික යි. ඊට පස්සේ තවත් කාරණයකට වැටෙන්නට පුළුවන් එයා. ඕවා දැනගන්ට ඕන. තමන්ට දැනෙන කාලයෙන් කරන හැටි යි මේ. එය **"පච්චත්තං වේදිතබ්බ විඤ්ඤූහි"** වෙනවා. හිතට තරහක් ආවොත් මේ ද්වේෂය යි, නැත්නම් මේ රාගය යි කියලා බලන්ඩ ඕනෑ. ඒකේ හොඳක් නරකක් සිතිය යුතු නැහැ. එ විට නිමිත්තට පතින ගතිය පවතින්නේ නැහැ. එ විට දුක් නැහැ.

මේ දුකෙන් බේරුණු එකේ ලක්ෂණය වාග යි කීවා. අවස්ථාවට වුවමනා කරන දේ, උචිත දේ දීලා තියෙනවා. ඒ වේලාවට අරයට දහලන්ට ඕන. එයාට දහලන්ට නිදහස දුන්නා. ඒක වාග යි. ඒ වෙලාවට සියක් නමකට දානයක් දුන්නාට හරි යන්නේ නැහැ. වාග වුණේ සැනසිලි ස්වරූපය මෙයාගේ සිතට ඒ වෙලාවේ ආව නිසයි.

සංඝයා වහන්සේලාට දෙන්නේ, පූජා කරන්නේ ඇයි? සංඝයා වහන්සේලා ලෝකයාගේ යහපත සඳහා මුළු ජීවිතය ම ගත කරලා වැඩ කරනවා. උන් වහන්සේලාට බුදු හාමුදුරුවෝ වදාරලා තිබෙනවා "මුදල් පරිහරණය කරන්ට එපා. පරිහරණය නො කළාට වැඩ ටික කෙරෙයි" කියලා. එ නිසා, සංඝයා වහන්සේව වැඩිකලක් ජීවත් කරවන්ට ලැස්ති යි. ඒ නිසා උන්වහන්සේලාට සිව් පසයෙන් උපස්ථාන කරනවා. කණාටු ගස්වලට පොහොර දානවාට වඩා සශ්‍රීක ගහකට පොහොර දැමීමේ උපමාවෙන් මේක වටහා ගත හැකි වෙනවා. බෝධීන් වහන්සේට දැන් මේ පූජා පවත්වනවා. මොක ද මේකේ අදහස? අපට එ සේ පවත්වන්ට අයිතියක් තිබෙනවා. නො කර බැහැ. මේ වාගේ ධර්මයක් කියා දුන්න උත්තමයාගේ සටහන දැක්කත් වැඳෙනවා. ගරු කෙරෙනවා. අගේ තේරුණු විට, පෙනෙන කොට වැඳලා ඇති. දැන් නම් බෙල්ලෙන් අල්ලගෙන වැන්දුවත් වඳින්නේ නැහැ. මේක යි බුදු හාමුදුරුවෝ වදාළේ ධර්මය දකින්නා මා දකී කියලා. **"යො ධම්මං පස්සති - සො මං පස්සති"**. ඒ නිසා, ඒ තත්ත්වයට සිත පත් නො වූ අය මේවා ඉතා ශ්‍රේෂ්ඨ අන්දමින් කරන අය දෙස බලා ඔවුන් අවතක්සේරු කිරීමට යාම තමන්ට ම අහිතකර කරුණක් බව මෙයින් පැහැදිලි වෙනවා ඇත.

වාගයට ආපු සිත ඊළඟට වැඩ කරන්නේ පටිනිස්සග්ගයට යි. ඒ කියන්නේ නැවත ඇලෙන්ට සිතෙන්නේ නැහැ කියන සිතට යි. නො ඇලී වැඩ කළ විට සැනසිල්ල ලැබෙනවා නම් මොන මෝඩයා ද නැවත ඇලෙන්නේ? එක පාරක් කකුලේ මඩ ගෑවුණු විට ඒකේ නැවත අතුල්ලන මෝඩයෙක් ඉන්නව ද? හැබැයි ඒක දැන ගෙන කරන්න ඕන.

**"අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධෝති"** -ඔන්න ඔව ටික දැන ගත්ත නිසයි සම්මා සම්බුද්ධ වුණේ. ඒවා කීවාට පසුව යි අනිත් අය රහත් වුණේ. ඒ කියපු පිළිවෙලට කරලා කෝටි ගණන් රහත් වුණා. මෙන්න මෙහෙම යි මේක කරන්නේ. පූට්ටු කරලා තියෙන ඇණේ ගලවන්නේ මෙන්න මෙහෙම යි. තල්ලු කරන්නේ මෙහෙම යි ඇහිල්ල තියන්ට ඕන අහවල් තැනට යි කියා කියලා දුන්නා. ඕක සුළු කෙනෙකුට කරන්ට බැහැ. ඇහිල්ල තියන්ට බය යි අහුවෙයි ද කියලා. බුදු හාමුදුරුවෝ ඇහිල්ල තියලා බැලුවා. අහු වුණේ නැහැ. වැඩේ කරගත්තා. බුද්ධ වුණා. ඊට පසු ව, සති හතක පර්යේෂණයකුත් කළා. හැදුණු චිත්ත ශක්ති දින හත බැගින් සති හතක් ස්වභාව ධර්මය සමග, ඉරියව් ක්‍රියාකාරීත්වයත් සමග, පර්යේෂණයට භාජනය කළා. නිරෝධ සමාපත්තියෙන් දින හතක් සිට එයින් නැගිට පර්යේෂණය අවසන් කළා. ඇසිපිය නො හෙළමින් සහ දින හතක වර්ෂාවට තෙමෙමින් ද පරීක්ෂණ පැවැත්තුවා. ඒ එක ම පරීක්ෂණයකින් හෝ බුදු සිතට අබමල් රේණුවක තරම්වත් අබලමක් හෝ හානියක් හෝ නො වුණු බව අවබෝධකර ගත් බැවින් සත් සතියෙන් පසුව යි සම්මා සම්බුද්ධ බව ප්‍රකාශ කළේ.

සියලු ධර්මයන්ගේ මුල් පිළිවෙල කියාගෙන කියාගෙන ඇවිල්ලා සියලු ධර්මයන්ගෙන් බේරෙන ධර්ම බුදු පියාණන් වහන්සේගේ ජීවිතය තුළ පළමුවෙන් හැදුණු බව කීවා. ඒක යි පළමු වැනි ධර්මය. ඊට පස්සේ, ඒ අනුසාරයෙන් කවුරුත් ඒ ධර්ම හැදෙන තැනට ක්‍රියාවන් යොමු කළා.

*--මූල පරියාය සූත්‍රය අවසන්--*

ශ්‍රී කල්‍යාණධම් ග්‍රන්ථකාර මණ්ඩලය
ශ්‍රී කල්‍යාණධම් ආශ්‍රමය
417, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7.
දු. ක:- 696494

රු 100/-

ISBN 955 - 8414 - 19 - 0

මුද්‍රණය : ශ්‍රීදේවි ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් 27, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල.